205609

17A

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව

# 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත

[සහතිකය සටහන් කළේ 1987 අප්‍රේල් මස 16 වන දින]

ආණ්ඩුවේ නියෝගය පරිදි මුද්‍රණය කරන ලදී.

ප්‍රේල් මස 1? වන දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ 1 රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළ දී ලබාගත හැකිය

11 70

තැපැල් ගාස්තුව : රු. 2.30 යි

## පටුන

වගන්තිය | පිටුව


1. ලුහුඬු නාමය සහ ක්‍රියාත්මක වන දිනය ... ... ... 1


### I වන කොටස

### ප්‍රාදේශීය සභාවල සංස්ථාපනය


2. ප්‍රාදේශීය සභාවල සංස්ථාපනය ... ... ... 1
3. ප්‍රාදේශීය සභාවල කර්තව්‍ය ... ... ... 2
4. ප්‍රාදේශීය සභාවල සභිකයන් ... ... ... 2
5. සභිකයන්ගේ ධුර කාලය ... ... ... 2
6. ප්‍රාදේශීය සභාවල ධුර කාලය ආරම්භ වන දිනය සහ ඒ ප්‍රාදේශීය සභා සංස්ථාපනය කරන දිනය ... ... ... ... 3
7. ධුරය අත්හැරීම ... ... ... ... 3
8. සභාපතිවරයා සහ උප සභාපතිවරයා ... ... ... 3
9. ලේකම්වරයා පත් කිරීම, ඔහුගේ බලතල සහ කාර්යයන් ... ... 4


### රැස්වීම්


10. සභාපතිවරයා හෝ උප සභාපතිවරයා ප්‍රාදේශීය සභා රැස්වීම්වල මූලාසන දැරිය යුතු බව ... ... ... ... 4
11. රැස්වීම් ... ... ... ... 5
12. ප්‍රාදේශීය සභා විසින් කාරක සභා පත් කරනු ලැබිය හැකි බව ... 5
13. ගණපූරණය ... ... ... ... 6
14. ප්‍රාදේශීය සභාවල බලතල බහුතරය වෙත සතුවිය යුතු බව ... ... 6
15. වාර්තා ... ... ... ... 6


### II කොටස

### ප්‍රාදේශීය සභාවල නිල තත්ත්වය, බලතල සහ කාර්ය


16. චංචල හා නිශ්චල දේපළ සහ වත්කම් හා බැරකම් ප්‍රාදේශීය සභා වෙත පැවරීම 7
17. එම ඉඩම්වල පරිපාලනය යනාදිය සතු කරනු ලබන ආකාරය ... 7
18. ප්‍රාදේශීය සභා සතු කරන ලද සෙසු දේපළ ... ... 8
19. ප්‍රාදේශීය සභාවල බලතල ... ... ... 9
20. මැනීමට බලය පැවරීමට ඇති බලය ... ... 16


2—ඒ 094615—15,625 (86/12)

## III වන කොටස

### මංමාවත්වලට අදාළ බලතල හා කාර්යයන්

#### මංමාවත්


21. මංමාවත් සහ මාර්ග සම්බන්ධතා පිළිබඳ පොදු අධිකාරිය ප්‍රාදේශීය සභාව විය යුතු බව ... ... ... ... 17

22. මංමාවත් සහ විවෘත භූමිභාග සම්බන්ධයෙන් ප්‍රාදේශීය සභාවේ සාමාන්‍ය බලතල ... ... ... ... 18

23. ප්‍රාදේශීය සභා වෙත සතු කරන ලද මංමාවත් ... ... 18

24. ප්‍රාදේශීය සභාව විසින් සීමා ලකුණු කර පාරවල් සහ පටු මාවත් පිළිබඳ නාම ලේඛනයක් පළ කරනු ලැබිය යුතු බව ... ... ... 18

25. කාලාපගමනය ... ... ... ... 20

26. දුන්වීම් භාරදිය යුතු ආකාරය ... ... ... 20

27. අලුත් මංමාවත් ඉදිකිරීමට සහ දැනට ඇති මංමාවත් වැඩිදියුණු කිරීමට ප්‍රාදේශීය සභාවට ඇති බලය ... ... ... ... 20

28. හැරවීම හෝ ලොකු කිරීම හෝ සඳහා අවශ්‍ය ඉඩම් අක්කර ගැනීම ... 21

29. මංමාවත් හැරවීම හෝ ලොකු කිරීම හෝ සඳහා අවශ්‍ය ඉඩම් තෑගි වශයෙන් දීම ... ... ... ... 22

30. අත්හැර දමූ වීථියක් බැහැර කිරීමේ බලය ... ... 22

31. ගොඩනැගිලි තැනීමේ කාර්ය සඳහා අලුත් වීදියක් යාබද ඉඩම් ගැනීම ... 22

32. ප්‍රාදේශීය සභාවක සෙසු බලතල ... ... ... 22

33. පෞද්ගලික දේපළ හිමියන්ගේ යහපත සඳහා පාරවල් ... ... 23

34. පොදු රථවාහන සේවා ... ... ... ... 23

35. අබලන් වූ සහ අන්තරායදායක තත්ත්වයක තිබෙන නිවාස ... ... 24

36. දුන්වීම් ප්‍රකාර ක්‍රියා කිරීම පැහැර හැරීම ... ... ... 24

37. අබලන් වූ නිවාසවල ද්‍රව්‍ය විකිණීම ... ... ... 24


#### මංමාවත් නඩත්තු කිරීම සහ අලුත්වැඩියා කිරීම


38. මංමාවත් අලුත්වැඩියා කිරීම ආදිය සඳහා ඉඩම් තුළට ඇතුල්වීමට බලය පවරන ලද නිසි නිලධරයන් ... ... ... 25

39. ද්‍රව්‍ය ගැනීමට බලය ... ... ... ... 25

40. ගොඩනැගිලි ඉදි කිරීමට සහ ගවයන් ආදී සතුන් තබා ගැනීමේ ඇති බලය ... 26

41. යාබද ඉඩම්වලට කසළ විසි කිරීමට ඇති බලය ... ... 27

42. තාවකාලික පාරවල් සෑදීමට ඇති බලය ... ... ... 27

43. ගස් කැපීමට ඇති බලය ... ... ... ... 27

44. වැටවල් ඉදි කිරීමට ඇති බලය ... ... ... 28

45. අගල් ආදිය කපා විවෘතව තබා ගැනීමට සහ ප්‍රධාන නළ ආදිය යෙදීමට බලය 28

46. ගල් ආදිය තැබීමට ඇති බලය ... ... ... 28

මංමාවත් ඔස්සේ ගොඩනැගිලි

47. මාංමාවත් ඔස්සේ යෝජිත ගොඩනැගිලි පිළිබඳ දැන්වීම ... ... 29

48. තාවකාලික වැටවල් සහ යොරවු ඉදි කිරීම ... ... 29

49. පාරවල් ඔස්සේ ගොඩනැගිලි සීමා ... ... ... 30

50. ගොඩනැගිලි සීමා ලකුණු කිරීම ... ... ... 31

51. 49 වන වගන්තිය යටතේ සියලු බලපත්‍ර සම්බන්ධයෙන් ඇතුළත් විය යුතු කොන්දේසිය ... ... ... ... 35

52. නීති උල්ලංඝනය වන ලෙස ඉදිකරන ලද ගොඩනැගිල්ලක් මායිම් තාප්පයක් හෝ ගේට්ටුවක් පිළිබඳව ක්‍රියා කිරීමට ප්‍රාදේශීය සභාවට ඇති බලය ... 36

53. ගොඩනැගිලි ඉදිකිරීමෙන් සංවර්ධනය කරන ලද ඉඩම් සම්බන්ධ වන්දි තක්සේරු කිරීමේ ප්‍රතිපත්ති ... ... ... 37

54. ගොඩනැගිලි සීමාවන් ඇතුළත පිහිටි ඉඩම්වල අයිතිකරුවකු සඳහා යාබද ඉඩම් අත්කර ගැනීමට ප්‍රාදේශීය සභාවට ඇති බලය ... ... 38

55. හිමිකම් ඔප්පු ඉදිරිපත් කරන ලෙස ඉල්ලා සිටීමේ බලය ... ... 38

56. ඔප්පු ඉදිරිපත් කරන ලෙස ඉල්ලා සිටීමේ බලයට, පරීක්ෂා කිරීමේ බලය ද, ඇතුළත් විය යුතු බව ... ... ... ... 39

57. ස්ථාන මැනීමට ඇති බලය ... ... ... 39

58. විද්‍යමාන ප්‍රසර්පණයක් පිළිබඳ අයිතිය ඔප්පු කිරීම අයිතිකරුට භාර කාර්යයක් විය යුතු බව ... ... ... ... 40

59. බාධකයන් හෝ ප්‍රසර්පණයන් ඉවත් කිරීම ... ... 40

මංමාවත් ආදියට හානි පැමිණවීම

60. සැතපුම් ගල් පාලම් ආදිය විනාශ කිරීම ... ... ... 42

61. යම් සතකු පිට යැම හෝ යම් යතකු දක්කීම හෝ යම් වාහනයක් ධාවනය කිරීම තහනම් බව ... ... ... ... 44

62. කාණුව උඩින් තමාගේ ගෙට යැමට පාලමක් ආදිය සෑදීමට අයිතිකරු හෝ පදිංචිකරු බැඳී සිටින බව ... ... ... 44

63. වීථිවලට හානි පැමිණෙන අන්දමට ගස් වැවෙන්නට ඉඩ හැරීම ... 44

64. ආසන්න ඉඩම් එළි කිරීමෙන් වතුර බැස්ස වීමෙන් හෝ කැලෑ කැපීමෙන් මංමාවත්වලට හානි සිදු කිරීම ... ... ... 45

### මංමාවත්වල කෙරෙන පීඩා ආදිය

65. වැරදි ... ... ... ... ... 45

66. අයාලේ යන ගවයන් අල්ලා ගැනීම ... ... ... 48

67. ගවයන් අල්ලන්නන්ගේ කටයුතුවලට මැදිහත් වීම ... ... 48

### විශේෂ කාර්යයන් සඳහා මංමාවත් ප්‍රයෝජනයට ගැනීම

68. විශේෂ කාර්යයන් සඳහා මංමාවත් ප්‍රයෝජනයට ගැනීමට බලය පැවරීම සඳහා ප්‍රාදේශීය සභාවට ඇති බලය ... ... ... 49

69. අතුරු ව්‍යවස්ථා ... ... ... ... 49

70. අසාමාන්‍ය රථවාහන ධාවනය නිසා දරන්නට සිදුවන වියදම් ... 51

### නිලධරයන් ආදීන්ගේ බලතල, කාර්ය සහ වගකීම්

71. පොදු වැඩ භාරව සිටින නිලධරයන් වෙත පවරනු ලබන බලතල ක්‍රියාත්මක කළ හැක්කේ කවුරුන් විසින් ද යන වග ... ... 51

72. නිසි නිලධරයන් විසින් කරනු ලබන මැනීම තීරණාත්මක සාක්ෂි විය යුතු බව 52

73. බලයලත් නිලධරයන් විසින් දේපලවලට කරන හානි සඳහා වන්දි ... 52

74. බේරුම් කිරීම ... ... ... ... 52

75. රාත්‍රි කාලයේ දී මහා මාර්ග මත ගල් ආදිය දමා යන නිලධරයන් හෝ කොන්ත්‍රාත්කරුවෝ ... ... ... ... 52

76. ඇතැම් අවස්ථාවල දී හැර මාර්ග නිලධරයකු හෝ මාර්ග කොන්ත්‍රාත්කරුවකු දඬුවමකට යටත් නොවන බව ... ... ... 53

77. පොලිස් නිලධරයන් සහ ග්‍රාම සේවා නිලධරයන් මේ කොටසේ විධිවිධාන බලාත්මක කළ යුතු බව ... ... ... 53

### IV වන කොටස

### මහජන සෞඛ්‍ය පිළිබඳ බලතල සහ කාර්යය

### මහජන සෞඛ්‍යය

78. ප්‍රාදේශීය සභාව පොදු මහජන සෞඛ්‍ය අධිකාරිය විය යුතු බව ... 53

### ජලාපවහනය

79. ප්‍රාදේශීය සභාව පොදු කාණු ඉදි කළ යුතු බව ... ...

80. කාණු අලුත්වැඩියා කිරීම, වෙනස් කිරීම සහ වසා දැමීම ප්‍රාදේශීය සභාව සතු කාර්යයක් බව ... ... ... ... 54

81. වර්ෂා ජලය සහ අපවහන ජලය විට කිරීමට බාධා කිරීම ... ... 54

82. කාණු සම්බන්ධ සාමාන්‍ය පාලනය ... ... ... 55

83. පොදු කාණුවලට සම්බන්ධ වන අන්දමින් බලය රහිතව කාණු සෑදීම පිළිබඳ දණ්ඩනය ... ... ... ... 55

84. ප්‍රාදේශීය සභාවේ එකඟත්වය නොමැතිව කාණු උඩින් ගොඩනැගිලි ආදිය ඉදි නොකළ යුතු බව ... ... ... ... 56

## වැසිකිළි

85. වැසිකිළි පහසුකම් පිළිබඳව ප්‍රාදේශීය සභාවේ කාර්යය ... ... 56

86. අතිරේක වැසිකිළි ඉදිකිරීම ... ... ... 56

87. කම්කරුවන් සේවයෙහි නියුක්ත කරන සේවා යෝජකයන් විසින් වැසිකිළි සැලසීම ඔවුන්ගේ කාර්යයක් බව ... ... ... 57

88. පෞද්ගලික වැසිකිළි කොටු කිරීම නොසලකා හැරීම ... ... 57

89. වැසිකිළි සම්බන්ධයෙන් සාමාන්‍ය පාලනය ... ... 58

90. ප්‍රාදේශීය සභාවේ විධානවලට හෝ අතුරු ව්‍යවස්ථාවලට පටහැනි වන අන්දමින් වැසිකිළි ආදිය සාදන හෝ වෙනස් කරන තැනැත්තන් සඳහා දණ්ඩනය ... 59

91. වැසිකිළි ආදිය පරීක්ෂා කිරීම ... ... ... 59

92. වැසිකිළි කඩා ඉවත් කරන ලෙස හෝ වැසිකිළි වලවල් වසන ලෙස හෝ නියම කිරීමට ප්‍රාදේශීය සභාවට ඇති බලය ... ... ... 60

## මලාපවහනය සහ කසළ ශෝධනය

93. මලාපවහනය සහ කසළ ශෝධනය සම්බන්ධයෙන් ප්‍රාදේශීය සභාවේ කාර්යය 60

94. එකතු කරනු ලබන සියලුම කසළ ප්‍රාදේශීය සභාවේ දේපළ විය යුතු බව ... 61

95. කසළ බැහැර කිරීම සඳහා සහ උපකරණ තැබීම සඳහා ස්ථාන ... 61

## සෞඛ්‍යයට අහිතකර ගොඩනැගිලි

96. සෞඛ්‍යයට අහිතකර ගොඩනැගිලි සම්බන්ධයෙන් ප්‍රාදේශීය සභාවේ කාර්යය... 61

97. පවතින ගොඩනැගිලි සම්බන්ධයෙන් සභාවේ කාර්යය ... ... 61

98. නිවාස තුළ ජනාකීර්ණවීම ... ... ... 62

99. නිවාස පරීක්ෂා කිරීමට සහ ඒවායේ හුණු ගෑමට ප්‍රාදේශීය සභාවට ඇති බලය ... 62

## පීඩා

100. පීඩා පරීක්ෂා කිරීම ... ... ... ... 62

101. පෞද්ගලික ස්ථානවල තිබෙන සෞඛ්‍යාරක්ෂාවට බාධක ජලාශ පුරවා දැමීමේ බලය ... ... ... ... 63

102. ගෝඝාතක ස්ථාන සඳහා බලපත්‍ර දීම ... ... 63

103. ළමයින්ගෙන් සිදුවන පීඩා ... ... ... 64

104. පොදු නාන ස්ථාන ... ... ... ... 64

105. ජලාශවලට හෝ ජල කර්මාන්තවලට ගලන ජලය අපිරිසිදු කිරීම ... 64

106. කර්මාන්තශාලාවලින් සිදුවන පරිසර දූෂණය ... ... 64

107. තැනැත්තන්ගේ හෝ දේපළක ආරක්ෂාවට තර්ජනයක් වන ගස් හෝ ගස්වල අතු හෝ කඳන් හෝ ගෙඩි සම්බන්ධයෙන් ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයාගේ බලතල ... ... ... ... 65

පොදු උපයෝගිතා

108. පොදු උපයෝගිතා සේවා පිහිටුවා පවත්වා ගෙනයාමට ප්‍රාදේශීය සභාවට ඇති බලය ... ... ... ... 66

109. පොදු උපයෝගිතා සේවා සඳහා වූ වියදම් ගෙවීමේ ආකාරය... ... 67

110. ජල හෝ මලාපවහන සේවාවක් සඳහා උපරිම විශේෂ වරිපනම් බද්ද ... 68

111. රජයේ දේපළ විශේෂ වරිපනම් බදුවලට යටත්වීම ... ... 68

112. විශේෂ වරිපනම් බදු තක්සේරු කිරීම හා අය කිරීම ... ... 68

113. යෝජනා සම්මතයක් මගින් විශේෂ වරිපනම් බදුවලින් නිදහස් කිරීම ... 68

ජල සම්පාදනය

114. යාබද ප්‍රදේශවල ස්ථානවලට සැපයීම ... ... ... 68

115. ප්‍රාදේශීය සභාවල සාමාන්‍ය බලතල ... ... ... 69

116. ගෘහ කාර්යයන් සඳහා පොදු ජල කණුවලින් නොමිලේ ලැබෙන ජල සම්පාදනයට බදු ගෙවන්නන්ට අයිතිවාසිකම් ඇති බව ... ... 69

117. ''ගෘහ කාර්යයන්'' යන්නෙහි අර්ථය ... ... ... 69

118. පෞද්ගලික සේවය සඳහා ගිවිසුම ... ... ... 69

වෙළෙඳ පොළවල්

119. ගම්බද පොළවල් සම්බන්ධයෙන් සභාව සතු බලය ... ... 69

120. පෞද්ගලික වෙළෙඳ පොළක් සඳහා බලපත්‍රයක් අවශ්‍ය වන අවස්ථාවක අදාළ වන විධිවිධාන ... ... ... ... 70

121. පෞද්ගලික වෙළෙඳ පොළක් වසා දැමීම සඳහා වන්දි ... ... 70

122. අතුරු ව්‍යවස්ථා සෑදීමේ බලය ... ... ... 71

123. අතුරු ව්‍යවස්ථා අනුමත කිරීම හා ප්‍රසිද්ධ කිරීම ... ... 72

124. අතුරු ව්‍යවස්ථාවල පිටපත් සැපයීම ... 72

125. අවසර නොදීම්වලට හෝ සංශෝධනවලට අතුරු ව්‍යවස්ථා යටත් විය යුතු බව ... 72
126. අතුරු ව්‍යවස්ථාවලට විෂය වන කරුණු ... . ... 72
127. සුසාන භූමි සහ මිනීපිටි ආඥාපනත යටතේ තිබූ බලධරයා ප්‍රාදේශීය සභාව විය යුතු බව ... ... ... ... 83
128. ඉඩම් සහ ගොඩනැගිලි අනිවාර්යයෙන් අත්පත් කර ගැනීම ... ... 83

## V වන කොටස

### මුදල්

129. ප්‍රාදේශීය සභා අරමුදල ... ... ... ... 84
130. ප්‍රාදේශීය සභාවට ලැබුණු මුදල් බැංකුවක තැන්පත් කළයුතු බව ... 85
131. ප්‍රාදේශීය සභා අරමුදලින් යම් කොටසක් ආයෝජනය කිරීමට ඇති බලය ... 85
132. ප්‍රාදේශීය සභා අරමුදල යෙදවීම ... ... ... 85
133. ප්‍රාදේශීය සභා අරමුදලින් ගෙවන වෙක්පත් අණකර ආදිය ... 88

### වරිපනම් සහ බදු

134. වරිපනම් සහ අක්කර බදු ... ... ... 88
135. ප්‍රාදේශීය සභාවක් විසින් නියම කරනු ලබන වරිපනම් බදුවලින් හා අක්කර බදුවලින් නිදහස් කිරීම ... ... ... 89
136. රජයේ දේපළ තක්සේරු කිරීම ... ... ... 90
137. රජයේ දේපළ තහනමට ගැනීමට සහ විකිණීමට යටත් නොවන බව ... 90
138. තක්සේරු කිරීමට දේපළ බෙදීම හෝ ඒකාබද්ධ කිරීම ... ... 90
139. තක්සේරු කිරීමේ කාර්ය සඳහා වූ වාර වාර්තා ... ... 91
140. දේපළවල වාර්ෂික වටිනාකම තක්සේරු කිරීම ... ... 92
141. තක්සේරු ලැයිස්තුව සහ අක්කර බදු ලැයිස්තුව ... ... 92
142. තක්සේරුව ආදියට විරුද්ධතාවයක් ඇති අවස්ථාවක කාර්ය පටිපාටිය ... 93
143. වාර්ෂික වටිනාකම කෙරෙහි බලපාන දේපළවලට කරන ලද වෙනස් කිරීම් මත තක්සේරුව ආදිය බෙදීම ... ... ... 94
144. ඇතැම් අවස්ථාවල දී තක්සේරුව බෙදීම හෝ වරිපනම් සනොයක්ෂණය කිරීම ... 95
145. නිවැසි භාවය නොමැති කාල සීමාව සම්බන්ධයෙන් වරිපනම් ගාස්තු අඩුකිරීම... 95
146. කලින් කරන ලද තක්සේරු හෝ සනොයක්ෂණය කිරීම් සම්මත කර ගැනීම ... 96
147. බදු සහ බලපත්‍ර ගාස්තු නියම කිරීමට ප්‍රාදේශීය සභාවට ඇති බලය ... 96
148. වාහන සහ සතුන් පිළිබඳ බද්ද ... ... ... 97
149. ඇතැම් බලපත්‍ර ගාස්තු අයකිරීම සඳහා ප්‍රාදේශීය සභාවට ඇති බලය ... 98
150. ඇතැම් කර්මාන්ත සම්බන්ධයෙන් වූ බද්ද ... ... 99

151. කර්මාන්ත කිහිපයක් කර ගෙන යන අවස්ථාවක දී ගාස්තුව හෝ බද්ද තීරණය කිරීම 100

152. ඇතැම් වෙළෙඳ ව්‍යාපාර හා වෘත්තීය සම්බන්ධයෙන් වූ බදු ... 100

153. සංවර්ධනය නොකළ ඉඩම් සඳහා බදු ... ... ... 103

154. ඇතැම් ඉඩම් විකිණීම මත බදු අය කිරීම ... ... 103

155. වරිපණම් බදු ආදිය සම්බන්ධයෙන් තහනමට ගැනීමෙන් චංචල දේපළ නිදහස් බව 104

156. අය විය යුතු කුලියෙන් ගෙවන ලද මුදල් ප්‍රමාණ අඩු කිරීම ... ... 104

157. නාම ආදිය සම්බන්ධයෙන් ඇති යම් වැරදීමක් නිසා තක්සේරුව යනාදිය කෙරෙහි දෝෂාභියෝග හෝ බලපෑමකට යටත් නොවිය යුතු බව 105

158. වරිපණම් හා බදු අයකර ගැනීම සඳහා වූ බලපත්‍රය ... ... 105

159. ප්‍රාදේශීය සභාවට ලැබිය යුතු කුලී හා ගාස්තු අයකර ගැනීම සඳහා වූ බලපත්‍රය 106

160. දේපළ තහනමට ගැනීම සම්බන්ධයෙන් වූ සීමාවන් ... ... 106

161. ගාස්තු පරිමාණය ... ... ... ... 107

162. දේපළ තහනමට ගැනීම ... ... ... 108

163. චංචල දේපළ විකිණීම ... ... ... 109

164. විකිණීමෙන් ලැබෙන මුදලෙහි අතිරික්තය... ... ... 110

165. ගෙවල් කඩා විවෘත කිරීමට ඇති බලය ... ... ... 110

166. වරිපනම් බදු හෝ බදු ගෙවීම පැහැර හැරීම ... ... 110

167. මහෙස්ත්‍රාත්වරයා විසින් සමාප්ති ආඥාව කිරීම ... ... 111

### VI වන කොටස

### ප්‍රාදේශීය සභා අධීක්ෂණය කිරීම සහ පාලනය කිරීම

168. අයවැය ලේඛනය ... ... ... ... 112

169. අයවැය ලේඛනය සම්බන්ධයෙන් සභාපතිවරයා සතු බලතල ... 112

170. අයවැය ලේඛනයෙන් යෝජනා කොට ඇති වියදම විචලනය කිරීම ... 113

171. අරමුදල සහ දේපළ පරිපාලනය කිරීම සම්බන්ධයෙන් රීති ... 113

172. ගිණුම් විගණනය කිරීම සහ අධිභාර කිරීම... ... ... 114

173. නියමිත සීමාව ඉක්මවා යන්නේ නම්, වැඩ ක්‍රියාත්මක කිරීම සඳහා වූ ගිවිසුම් ලිඛිතව තිබිය යුතු බව 117

174. 173 වන වගන්තියෙහි සඳහන් ගිවිසුම්වලට ඇතුළත්වීමේ කාර්ය පරිපාටිය 117

175. වැය විෂයක නිත්‍යානුකූලතාව පිළිබඳ සැක දුරු කිරීම ... ... 118

176. විශ්‍රාම වැටුප්, වාර්ෂික, පාරිතෝෂික හෝ විශ්‍රාම ගැනීමේ දීමනා කරුණා සහගතව ගෙවීම 118

177. පාරිතෝෂික යෝජනා ක්‍රමයක් පිහිටුවීමට ඇති බලය ... ... 119

ණය

178. ප්‍රාදේශීය සභාව සතු වරිපනම් බදු හා බදු ඇපයට තබා ණයට ගැනීමේ බලය 119

179. ණයට ගැනීමේ බලතල සීමා කිරීම ... ... ... 120

180. ඇප ආදියෙහි ආකෘතිය ... ... ... ... 120

181. ණය ලබා ගැනීමට අදාළ ප්‍රාදේශීය සභාවේ බලතල සභාපතිවරයා විසින් ක්‍රියාත්මක කළ හැක්කේ කවර විටක ද යන බව 120

182. ප්‍රාදේශීය සභාවට අය විය යුතු මුදල් අත්හැරීම ... ... 120

VII වන කොටස

ප්‍රාදේශීය සභාවලට අදාළ පරිපූරක විධිවිධාන

183. ප්‍රාදේශීය සභාවකට එරෙහිව ප්‍රදානය කරන ලද ගාස්තු ගෙවීම ... 121

184. රැස්වීම පිළිබඳ රීති සහ බදු සහ මුදල් ... ...... ... 121

185. සභාපතිවරයා ඉවත් කිරීම සහ ප්‍රාදේශීය සභාව විසුරුවා හැරීම ... 122

186. අකුරු ව්‍යවස්ථා කඩ කිරීම ... ... ... 124

187. ප්‍රාදේශීය සභා පැහැර හැරීම ආදිය කරනු ලැබූ විට අමාත්‍යවරයා සතු බලය 124

188. 187 වන වගන්තිය යටතේ වාර්තාව ලැබුණු විට ගත යුතු පියවර, අමාත්‍යවරයා විසින් තීරණය කරනු ලැබිය යුතු බව 125

189. ණය ලබා ගැනීම සඳහා විධාන කිරීමට අමාත්‍යවරයා සතු බලය ... 126

190. වියදම් සහතික කිරීමේ බලය ... ... ... 126

191. ණය අත්තිකාරම් කිරීම සඳහා ප්‍රාදේශීය ණය කොමසාරිස්වරුන් සතු බලය ... 126

192. මුල් මුදල සහ පොලිය ප්‍රාදේශීය සභාවෙන් අයකර ගැනීම ... 126

193. පළාත් පාලන කොමසාරිස්වරයාගේ බලතල හෝ කාර්ය සහකාර කොමසාරිස්වරයාට පවරනු ලැබීම – 126

194. ප්‍රාදේශීය සභාවක යම් පොතක් හෝ ලේඛනයක් ගෙන්වා පරීක්ෂා කිරීමට අමාත්‍යවරයා සතු බලය 127

195. ප්‍රතිපත්ති සම්බන්ධයෙන් නිර්දේශ කිරීමට ඇති බලය ... ... 127

196. අමාත්‍යවරයාගේ සහ කොමසාරිස්වරයාගේ බලතල ... ... 127

197. කොමසාරිස්වරයාගේ අතිරේක බලතල ... ... ... 128

198. පාරක් හෝ පටු මගක් නම් කිරීම ... ... ... 128

## VIII වන කොටස

### සාමාන්‍ය කරුණු

#### ගාස්තු සහ වියදම් අය කර ගැනීම


199. අයිතිකරු හෝ පදිංචිකරු විසින් කරන ලද පැහැර හැරීමක දී වැඩ ක්‍රියාත්මක කර වියදම් අයකර ගැනීම සඳහා ප්‍රාදේශීය සභාවක් සතු බලය 128

200. පදිංචිකරුගෙන් ගාස්තු අයකර ගැනීමේ බලය සහ ඔහුට එම ගාස්තු තව කුලියෙන් අඩුකර ගත හැකි බව 128

201. ගෙවිය යුතු කුලී ප්‍රමාණයට වඩා වැඩි මුදලක් ගෙවීමට පදිංචිකරුවන් යටත් නොවන බව 129

202. අයිතිකරු පැහැර හැරීමක් කළ විට පදිංචිකරුවකුට වැඩ ක්‍රියාත්මක කර, කුලියෙන් වියදම් අඩුකර ගත හැකි බව 129

203. පදිංචිකරුවන් විසින් අවහිර කිරීම ... ... ... 129

204. අයිතිකරු හෝ පදිංචිකරු වියදම් නොගෙවත්තෝ නම්, ප්‍රතිකර්මය ... 130

205. අලාභ ගාස්තු ආදිය නිශ්චය කිරීම සහ ආපසු අයකර ගැනීම 130

206. අලාභ අයකර ගැනීම ... ... ... ... 130

207. පෞද්ගලික දේපළ වැඩි දියුණු කිරීම වෙනුවෙන් වියදම් අයකර ගැනීම ... 130


#### වන්දි ගෙවීම


208. ප්‍රාදේශීය සභා විසින් ප්‍රාදේශීය සභා අරමුදලින් වන්දි ගෙවනු ලැබිය හැකි බව 131

209. වන්දිය තීරණය කිරීම සහ ගෙවීම ... ... ... 131


#### කාර්ය පටිපාටිය සහ නඩු කටයුතු


210. දැන්වීම් භාරදීම ... ... ... ... 131

211. ලේකම් විසින් හෝ තත් කාර්ය සඳහා බලය දෙනු ලැබූ වෙනත් යම් නිලධරයකු විසින් දැන්වීම දීම හෝ භාර ගැනීම කරනු ලැබිය හැකි බව 132

212. මහේස්ත්‍රාත්වරයකු විසින් වැරදි විභාග කළ යුතු බව ... ... 132

213. අපරාධ නඩු සීමා කිරීම ... ... ... ... 132

214. දැන්වීම කරනු ලැබ එක් මාසයක් පසු වන තෙක් හෝ නඩු නිමිත්ත ඇති වීමෙන් පසු මාස හයක් ගත වූ පසු ප්‍රාදේශීය සභාවට විරුද්ධව කිසිම නඩුවක් පවරනු නොලැබිය යුතු බව 132

215. ප්‍රාදේශීය සභා සහ එහි නිලධරයන් ආරක්ෂා කිරීම ... ... 133

## නිලධරයන්ගේ බලතල හා වගකීම්


216. ප්‍රාදේශීය සභාවේ නිලධරයන්ට පොදු අධිකාර දීමේ ප්‍රාදේශීය සභාව සතු බලතල ... 133

217. ප්‍රාදේශීය සභාවේ නිලධරයන්ට බාධා කිරීම සම්බන්ධයෙන් දඬුවම ... 134

218. ප්‍රාදේශීය සභා විසින් බලය අනිසි ලෙස යෙදවීම සඳහා දඬුවම් ... 134

219. ප්‍රාදේශීය සභාවල නිලධරයන්ට සහ සේවකයින්ට ගිවිසුම් කෙරෙහි සම්බන්ධතාවක් නොතිබිය යුතු බව 134

220. ප්‍රාදේශීය සභාවල නිලධරයන් හා සේවකයින් රජයේ සේවකයින් විය යුතු බව 134


## අන්තර් කාලීන වැඩ පිළිවෙළවල් සහ විධිවිධාන


221. සුළු නගර සභාවක් හෝ ගම් සභාවක් හෝ පළාත් පාලන ආයතනයක් හෝ පිළිබඳව කවර හෝ ලිඛිත නීතියක ඇති සඳහනක බලපෑම 135

222. ඉවත් කිරීම ... ... ... ... 135

223. විධිවිධාන සලස්වා නොමැති ප්‍රශ්න යථාවත් කිරීම ... ... 135

224. අන්තර් කාලීන විධිවිධාන ... ... ... 135

225. ඉවත් කිරීම සහ අන්තර්කාලීන ප්‍රතිපාදන ... ... 135

226. අර්ථ නිරූපනය ... ... ... ... 136

පළමුවන උපලේඛනය 137

දෙවන උපලේඛනය 137

තුන්වන උපලේඛනය 138

හතරවන උපලේඛනය 139

පස්වන උපලේඛනය 139

හයවන උපලේඛනය 139

# 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත

[සහතිකය සටහන් කළේ 1987 අප්‍රේල් මස 16 වන දින.]

එල්.ඩී.—ඕ. 14/86

පරිපාලන සහ සංවර්ධන කටයුතුවලට අදාළව තීරණ ගැනීමේ ක්‍රියාවලියෙහි ජනතාවට පළාත් මට්ටමින් ඵලදායී ලෙස සහභාගි වීම සඳහා වැඩි අවස්ථා සලසා දීමේ අරමුණ ඇතිව, ප්‍රාදේශීය සභා පිහිටුවීම සඳහා ද එම සභාවල බලතල, කාර්යයන් සහ කර්තව්‍යයන් නිශ්චය කිරීම සඳහා ද ඊට සම්බන්ධ හෝ ආනුෂංගික සියලු කරුණු සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද වූ පනතකි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ.

1. මේ පනත 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත යනුවෙන් හඳුන්වනු ලබන අතර, අමාත්‍යවරයා විසින් ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන නියමයක් මගින් තීරණය කරනු ලබන දිනයක හෝ දිනවල එහි විධිවිධාන සියල්ල හෝ එහි විධිවිධානවලින් කිසිවක් හෝ සම්බන්ධයෙන් මේ පනත ක්‍රියාත්මක විය යුතු ය. — ලුහුඬු නාමය සහ ක්‍රියාත්මක වන දිනය.

## I වන කොටස

### ප්‍රාදේශීය සභාවල සංස්ථාපනය

2. (1) පළාත් පාලන සහ සංවර්ධන කාර්යවලට ඵලදායී ලෙස ජනතාවගේ සහභාගි වීම පහසු කරලීමේ අරමුණ ඇතිව, අමාත්‍යවරයා විසින් ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින්, යම් ප්‍රදේශයක් මේ පනතේ කාර්යයන් සඳහා ප්‍රාදේශීය සභා ප්‍රදේශයක් විය යුතු යයි ප්‍රකාශ කර, එසේ ප්‍රකාශ කරන ලද ප්‍රදේශයේ පරිපාලන සීමා නිශ්චය කරනු ලැබිය හැකි ය. එසේ ප්‍රකාශයට පත් කරනු ලැබූ සෑම ප්‍රාදේශීය සභාවක ම පරිපාලන සීමා, හැකි තාක් දුරට උපදිසාපතිවරයකුගේ කොට්ඨාසය තුළට වැටෙන නාගරිකයකින් හෝ (නගර සභා ආඥාපනතේ අර්ථානුකූලව) නගරයකින් හෝ සමන්විත යම් ප්‍රදේශ හැර, උපදිසාපතිවරයකුගේ කොට්ඨාසයෙහි සීමාවන්ට අනුරූප විය යුතු ය. අමාත්‍යවරයා විසින් එම නියමය මගින් හෝ යම් තදනන්තර නියමයක් මගින් හෝ එම ප්‍රාදේශීය සභා ප්‍රදේශය සඳහා ප්‍රාදේශීය සභාවක් සංස්ථාපනය කර, එම සභාවට නාමයක් පවරනු ලැබිය හැකි ය. — ප්‍රාදේශීය සභාවල සංස්ථාපනය.

(2) (1) වන උපවගන්තිය යටතේ කරන ලද නියමයක් මගින් සංස්ථාපනය කරනු ලබන සෑම ප්‍රාදේශීය සභාවක් ම, අවිච්ඡින්න පැවැත්මක් සහ පොදු මුද්‍රාවක් ඇති සංස්ථාවක් විය යුතු අතර, මේ පනතේ විධිවිධානවලට යටත්ව, දේපළ අත්කර ගැනීමට, ඇසීමට සහ විකිණීමට ද ස්වකීය නාමයෙන් එය විසින් හා එයට විරුද්ධව නඩු පවරනු ලැබීමට ද එයට බලය තිබිය යුතු ය.

(3) ප්‍රාදේශීය සභාවෙහි පොදු මුද්‍රාව එම සභාවේ ලේකම්වරයා භාරයේ තිබිය යුතු අතර, සභාවේ සභාපතිවරයා සහ ලේකම්වරයා ඉදිරිපිට දී මිස, එය ප්‍රාදේශීය සභාව වෙනුවෙන් යම් කොන්ත්‍රාත් ගිවිසුමකට හෝ වෙනත් සාධන පත්‍රයකට හෝ තබනු නොලැබිය යුතු ය. තමන් ඒ අවස්ථාවේ පැමිණ සිටි බවට සාක්ෂි වශයෙන් ඔවුන් විසින් ඒ කොන්ත්‍රාත් ගිවිසුමෙහි හෝ සාධන පත්‍රයෙහි හෝ නම නම් අත්සන් කරනු ලැබිය යුතු ය.

(4) (1) වන උපවගන්තිය යටතේ නියමයක් මගින් සංස්ථාපිත ප්‍රාදේශීය සභාවක කිසිදු ක්‍රියාවක් හෝ කාර්ය පටිපාටියක් එහි සාමාජිකයන් අතර පුරප්පාඩුවක් පැවැතීමේ හෝ එහි සාමාජිකයකු තෝරා පත්කර ගැනීමේ දී යම් දෝෂයක් පැවතීමේ හෝ හේතුව නිසා පමණක් අවලංගු වන ලෙස සලකනු නොලැබිය යුතු ය.

ප්‍රාදේශීය සභාවල කර්තව්‍ය.

3. එක් එක් ප්‍රාදේශීය සභා ප්‍රදේශය සඳහා සංස්ථාපනය කරන ලද ප්‍රාදේශීය සභාව, එම ප්‍රදේශය ඇතුළත පළාත් පාලන ආයතන විය යුතු අතර, මහජන සෞඛ්‍යයට, පොදු උපයෝගිතා සේවාවන්ට සහ පොදු මංමාවත්වලට ද සාමාන්‍යයෙන් එම ප්‍රදේශය ඇතුළත ජනතාවගේ සුඛ විහරණය, පහසුව සහ සුභ සාධනය සහ සියලු පහසුකම් ආරක්ෂා කිරීමට සහ ප්‍රවර්ධනය කිරීමට ද අදාළ සියලු කරුණු විධිමත් කිරීම, පාලනය කිරීම සහ පරිපාලනය කිරීම ඊට භාර විය යුතු ය.

ප්‍රාදේශීය සභාවල සභිකයන්.

4. 2 වන වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ වූ නියමයක් මගින් සංස්ථාපනය කරන ලද ප්‍රාදේශීය සභාවක්. සභාපතිවරයකුගෙන්, උප සභාපතිවරයකුගෙන් සහ එම ප්‍රාදේශීය සභාව සංස්ථාපනය කරනු ලබන්නේ යම් ප්‍රාදේශීය සභා ප්‍රදේශයක් සඳහා ද ඒ ප්‍රදේශයේ ප්‍රමාණය, ජනගහණය සහ ආර්ථික සංවර්ධන මට්ටම ගැන සැලකිලිමත්ව, අමාත්‍යවරයා විසින් ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන නියමයක් මගින් තීරණය කරනු ලබන තෝරා පත්කර ගත් සභිකයන් සංඛ්‍යාවකින් සමන්විත විය යුතු ය.

සභිකයන්ගේ ධුර කාලය.

5. (1) පොදු ඡන්ද විමසීමක දී තෝරා පත් කර ගනු ලබන එක් එක් ප්‍රාදේශීය සභා සභිකයාගේ ධුර කාලය—

(අ) පළමුවන මහජන ඡන්ද විමසීම සම්බන්ධයෙන් වනවිට, අමාත්‍යවරයා විසින් 6 වන වගන්තිය යටතේ නිශ්චය කරන ලද දිනයේ සිට ගණන් බැලිය යුතු ය

(ආ) පළමුවන මහජන ඡන්ද විමසීමෙන් පසුව එන මහජන ඡන්ද විමසීමක දී තෝරා පත් කර ගන්නා ලද සභිකයකු සම්බන්ධයෙන් වන විට, ඊට පෙරාතුව වූ ප්‍රාදේශීය සභාවේ සභිකයන්ගේ ධුර කාලය අවසාන වන දිනයේ සිට ගණන් බැලිය යුතු ය :

තවද, එම ධුර කාලය, ඒ සභිකයා මියයාමෙන්, ඉල්ලා අස්වීමෙන් හෝ ඉවත් කරනු ලැබීමෙන් කලින් ධුරය හිස් කළහොත් මිස, මාස හතලිස් අටක කාල සීමාවක් විය යුතු ය.

(2) අමාත්‍යවරයා විසින්, ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින්,—

(අ) (1) වන උපවගන්තියේ සඳහන් ධුර කාලය අවසාන වන වර්ෂයේ හෝ ඊට පෙරාතුවම වර්ෂයේ හෝ ඒ ධුර කාලය අවසන් වන මාසයට පූර්වයෙන් එන කවර හෝ මාසයක දිනයක් ඒ ධුර කාලය අවසාන වන දිනය වෙනුවට ආදේශ කරමින් නියමයක් කිරීමෙන් ඒ ධුර කාලය අඩු කරනු ලැබිය හැකි ය.

(ආ) (1) වන උපවගන්තිය යටතේ ධුර කාලය අවසන් වන දිනය හෝ මේ උපවගන්තියේ (අ) ඡේදය යටතේ නියම කරන ලද දිනය හෝ වෙනුවට, යම් වර්ෂයක දී ධුර කාලය අවසාන ජේද ඒ වර්ෂයේ හෝ එසේ නිශ්චිතව සඳහන් නැතහොත් නියම කරන ලද වර්ෂයට පසුව එළඹෙන තදනන්තර යම් වර්ෂවල හෝ ධුර කාලය අවසාන වන දිනයට පසුව යම් මාසයක යම් දිනයක් ආදේශ කරමින් එකී ධුර කාලය දීර්ඝ කරනු ලැබිය හැකි අතර එසේ අන්තිම වරට කරන ලද නියමයෙන් දීර්ඝ කරන ලද ධුර කාලය අවසාන වන දිනය වෙනුවට පසුව එළඹෙන දිනයක් ආදේශ කරමින් කලින් කල එකී ධුර කාලය ඉන්පසු දීර්ඝ කරනු ලැබිය හැකි ය :

එසේ වුවද, ධුර කාලය එසේ දීර්ඝ කරනු ලබන කාල සීමාව හෝ ධුර කාලය වරින් වර දීර්ඝ කරනු ලබන කාල සීමාවන්හි එකතුව මාස දොළහක් නොඉක්මවිය යුතු ය.

(3) මිය ගිය, ඉල්ලා අස් වූ හෝ අන්‍යාකාරයකින් ධුරය හිස් කළ ප්‍රාදේශීය සභා සභිකයකු වෙනුවට සභිකයකු තෝරා පත් කර ගනු ලබන අවස්ථාවක, ඔහු, මේ පනතේ විධිවිධානවලට යටත්ව, ඔහුගේ පූර්වගාමියාගේ ධුර කාලයෙන් නොගෙවී ඉතිරිව ඇති කාල සීමාව තුළ ධුරය දැරිය යුතු ය.

**ප්‍රාදේශීය සභාවල ධුර කාලය ආරම්භ වන දිනය සහ ඒ ප්‍රාදේශීය සභා සංස්ථාපනය කරන දිනය.**

6. මේ පනත යටතේ සංස්ථාපනය කරනු ලබන එක් එක් ප්‍රාදේශීය සභාවේ ධුර කාලය, අමාත්‍යවරයා විසින්, ගැසට් පත්‍රයේ පළ කරන නියමයක් මගින් නියම කරනු ලබන දිනයක සිට ආරම්භ වන්නේ ය. ඒ දිනය, මේ පනතේ සියළු කාර්ය සඳහා, ඒ ඒ ප්‍රාදේශීය සභාව ඒ දිනයේදී සංස්ථාපනය කරනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතු ය.

**ධුරය අත්හැරීම.**

7. ප්‍රාදේශීය සභාවක යම් සභිකයකු ඒ ප්‍රාදේශීය සභාවේ අවසරය කලින් ඉල්ලුම් කර ලබා නොගෙන, මාස තුනක කාල සීමාවක් ප්‍රාදේශීය සභාවේ රැස්වීම්වලට සහභාගිවීම පැහැර හැරිය හොත්, ඔහුගේ ධුරය එනයින්ම හිස් වන්නේ ය.

**සභාපතිවරයා. සහ උප සභාපතිවරයා.**

8. (1) ප්‍රාදේශීය සභාවක සභාපතිවරයා, ප්‍රාදේශීය සභාවෙහි ප්‍රධාන විධායක නිලධරයා විය යුතු ය. ප්‍රාදේශීය සභාවක් විසින් කරනු ලැබිය යුතු යයි හෝ ඉටු කරනු ලැබිය යුතු යයි මේ පනතින් හෝ වෙනත් යම් ලිඛිත නීතියකින් හෝ විධානය කරනු ලැබ ඇති හෝ විධානය කරනු ලැබ ඇති හෝ බලය පවරනු ලැබ ඇති හෝ සියලු විධායක ක්‍රියා කිරීම සහ වගකීම් ඉටු කිරීම, පද සම්බන්ධය අනුව පටහැනි අදහසක් පෙනී යයි නම් මිස, සභාපතිවරයා විසින් කරනු ලැබිය යුතු ය ; නැතහොත් ඉටු කරනු ලැබිය යුතු ය.

(2) මේ පනතින් හෝ වෙනත් යම් ලිඛිත නීතියකින් හෝ සභාපතිවරයා වෙත පවරා ඇති හෝ නියම කර ඇති හෝ සතු කර ඇති බලතල, කාර්ය හෝ කර්තව්‍ය කිසිවක් සභාපතිවරයා විසින්, ලියවිල්ලකින් වූ නියමයක් මගින් ප්‍රාදේශීය සභාවේ උප සභාපතිවරයා, ලේකම්වරයා හෝ වෙනත් යම් නිලධරයකු හෝ වෙත පවරනු ලැබිය හැකි ය.

(3) සභාපතිවරයාගේ නියමයක් මගින් ප්‍රාදේශීය සභාවේ උප සභාපතිවරයා හෝ ලේකම්වරයා හෝ වෙනත් යම් නිලධරයකු හෝ වෙත පවරන ලද බලතල, කාර්ය හෝ කර්තව්‍ය කිසිවක් ඒ උප සභාපතිවරයා හෝ ලේකම්වරයා හෝ වෙනත් නිලධරයා හෝ විසින් ක්‍රියාවේ යෙදවීම, ඉටු කිරීම හෝ කිරීම, එම නියමයෙහි කොන්දේසිවලට සහ සීමා කිරීම්වලට යටත් විය යුතු අතර, එහි සඳහන් කාර්යයට හෝ කාර්යයන්ට සීමා විය යුතු ය; තව ද එවැනි යම් පැවරීමක්, සභාපතිවරයාගේ නියමයක් මගින් ඕනෑම අවස්ථාවක වෙනස් කිරීම හෝ අවලංගු කිරීම හෝ කරනු ලැබිය හැකි ය.

(4) අසනීපයක් හෝ වෙනත් නොවැළැක්විය හැකි හේතුවක් හෝ නිසා සභාපතිවරයා පැමිණ නොමැති කාල සීමාව තුළ දී උප සභාපතිවරයා විසින් සභාපතිවරයා මෙන් ම එම බලතලම ක්‍රියාවේ යෙදවීම සහ එම කාර්යයන් ම ඉටු කිරීම කරනු ලැබිය යුතු ය.

ලේකම්වරයා පත් කිරීම, ඔහුගේ බලතල සහ කාර්යයන්.

9. (1) ප්‍රාදේශීය සභාවක ලේකම්වරයා ලෙස හෝ ලේකම් වරයා වශයෙන් කටයුතු කිරීම සඳහා නිසි සහ යෝග්‍ය තැනැත්තකු පත් කරනු ලැබිය යුතු ය.

(2) ප්‍රාදේශීය සභාවේ ලේකම්වරයා, ප්‍රාදේශීය සභාවේ ප්‍රධාන පරිපාලන නිලධරයා විය යුතු අතර, මේ පනතින් හෝ මේ පනත යටතේ සාදන ලද රීති කිසිවක් මගින් හෝ, තත් කාලයෙහි බලාත්මකව පවත්නා වෙනත් යම් ලිඛිත නීතියක් මගින් හෝ ඔහු වෙත පවරා ඇති නැතහොත් නියම කර ඇති බලතල ක්‍රියාවේ යෙදවීම, කාර්යයන් ඉටු කිරීම සහ කර්තව්‍යයන් කිරීම, ඔහු විසින් කරනු ලැබිය යුතු ය.

(3) සභාපතිවරයා සහ උපසභාපතිවරයා විසින් ධුරය දැරීම අවසන් වීම හේතු කොට ගෙන ප්‍රාදේශීය සභාවකට එහි කාර්යයන් කිරීමට නොහැකි වන අවස්ථාවක, එම ධුර සම්බන්ධයෙන් පුරප්පාඩු ඇති වීම සහ පළාත් පාලන ඡන්ද විමසීම් ආඥාපනතේ විධිවිධානවලට අනුව එම පුරප්පාඩු පිරවීම ද අතර වූ යම් කාල සීමාවක් තුළ දී, මේ පනත මගින් හෝ වෙනත් යම් ලිඛිත නීතියක් මගින් හෝ ප්‍රාදේශීය සභාව, සභාපතිවරයා හෝ උපසභාපතිවරයා වෙත පවරා ඇති හෝ නියම කර ඇති හෝ සතු කර ඇති හෝ සියලු අයිතිවාසිකම්, වරප්‍රසාද සහ බලතල දැරීම ද කර්තව්‍ය කිරීම ද කාර්ය ඉටු කිරීම ද ලේකම්වරයා විසින් කරනු ලැබිය යුතු ය.

## රැස්වීම්

සභාපතිවරයා හෝ උප සභාපතිවරයා ප්‍රාදේශීය සභා රැස්වීම්වල මූලසුන දැරිය යුතු බව.

10. ප්‍රාදේශීය සභාවේ සෑම රැස්වීමක ම මූලසුන සභාපතිවරයා විසින් හෝ ඔහු නොමැති අවස්ථාවල උපසභාපතිවරයා විසින් හෝ දරනු ලැබිය යුතු ය. සභාපතිවරයා සහ උපසභාපතිවරයා යන දෙදෙනාම පැමිණ නොමැති නම්, පැමිණ සිටින සභිකයන් විසින් තමන් අතරින් කෙනකු එම රැස්වීමෙහි මූලසුන දැරීම සඳහා තෝරා පත් කර ගනු ලැබිය යුතු ය.

11. (1) මේ පනත යටතේ සාදන ලද හෝ මේ පනත යටතේ සාදන ලදැයි යම් ලිඛිත නීතියක ලා සලකනු ලබන රීති මගින් නියම කරන ලද දිනවල හෝ කාල සීමා අතරතුර ප්‍රාදේශීය සභාවේ සාමාන්‍ය රැස්වීම්, එහි කටයුතු කරගෙන යාම සඳහා පවත්වනු ලැබිය යුතු ය. රැස්වීම්.

(2) විශේෂ රැස්වීමක් පැවැත්වීම අවශ්‍ය යයි සභාපතිවරයා සලකන ඕනෑම අවස්ථාවක ප්‍රාදේශීය මණ්ඩලයේ විශේෂ රැස්වීමක් ඔහු විසින් කැඳවනු ලැබිය හැකි අතර, ප්‍රාදේශීය සභාවේ සාමාන්‍ය රැස්වීමක් සඳහා නියමිත ගණපූරණයේ සංඛ්‍යාවට නො අඩු ප්‍රාදේශීය සභා සභිකයන් සංඛ්‍යාවක් විසින් අත්සන් කොට සභාපතිවරයා වෙත ලියවිල්ලකින් වූ ඉල්ලීමක් ඉදිරිපත් කරන ලද ඕනෑම අවස්ථාවක, ඔහු විසින් එවැනි රැස්වීමක් කැඳවනු ලැබිය යුතු ය.

(3) යම් ඉල්ලීමක් අනුව පැවැත්වෙන විශේෂ සභා රැස්වීම, සභාපතිවරයා වෙත එම ඉල්ලීම ලැබී දින හතක් ඇතුළත දී කැඳවනු ලැබිය යුතු ය.

(4) තමා වෙත ඉදිරිපත් කරන ලද යම් ඉල්ලීමක් ලැබී දින හතක් ඇතුළත දී විශේෂ සභා රැස්වීමක් කැඳවීම යම් ප්‍රාදේශීය සභාවක සභාපතිවරයා විසින් ප්‍රතික්ෂේප කරනු ලැබුවහොත් හෝ ඕනෑකමින් ම පැහැර හරිනු ලැබුවහොත්, ඉන් ඉක්බිති ඕනෑම අවස්ථාවක සහකාර කොමසාරිස්වරයා විසින් විශේෂ සභා රැස්වීමක් කැඳවනු ලැබීම ද ඒ රැස්වීමේ මූලසුන දරනු ලැබීම ද නැතහොත් මූලසුන දැරීමට ආණ්ඩුවේ නිලධරයකු යොදවනු ලැබීම ද නීත්‍යානුකූල වන්නේ ය.

(5) මේ වගන්තිය යටතේ එක් එක් විශේෂ සභා රැස්වීම් සඳහා නියම කර ගන්නා ලද දිනය සහ එහි දී කරනු ලබන කටයුතු පිළිබඳව දින දෙකකට නොඅඩුව කල් තබා දැන්වීමක් ඒ ප්‍රාදේශීය සභාවේ එක් එක් සභිකයා වෙත භාර දෙනු ලැබිය යුතු ය ; නැතහොත් ඒ සභිකයාගේ නිවසෙහි තැබිය යුතු ය.

12. (1) ප්‍රාදේශීය සභාවෙහි බලතල, කාර්යයන් සහ කර්තව්‍ය කිසිවකට හෝ සභාවෙහි සැලකිල්ලට භාජනය පවතින යම් කරුණකට හෝ අදාලව සභාවට උපදෙස් දීමේ කාර්යය සඳහා සභාවේ සභිකයන්ගෙන් හෝ, කොටසක් සභිකයන්ගෙන් සහ කොටසක් ප්‍රාදේශීය සභා ප්‍රදේශයේ පදිංචිකරුවන්ගෙන් සහ ඒ ප්‍රාදේශීය සභා ප්‍රදේශය තුළ පිහිටුවා ඇති ග්‍රාමෝදය මණ්ඩලවල සභාපතිවරුන්ගෙන් හෝ සමන්විත කාරක සභා, ප්‍රාදේශීය සභාවක් විසින් කලින් කල පත් කරනු ලැබිය හැකි අතර, යම් ණයක් ලබා ගැනීමේ, ප්‍රාදේශීය සභා විසින් කාරක සභා පත් කරනු ලැබිය හැකි බව.

රැස්වීම්.

11. (1) මේ පනත යටතේ සාදන ලද හෝ මේ පනත යටතේ සාදන ලදැයි යම් ලිඛිත නීතියක ලා සලකනු ලබන රීති මගින් නියම කරන ලද දිනවල හෝ කාල සීමා අතරතුර ප්‍රාදේශීය සභාවේ සාමාන්‍ය රැස්වීම්, එහි කටයුතු කරගෙන යාම සඳහා පවත්වනු ලැබිය යුතු ය.

(2) විශේෂ රැස්වීමක් පැවැත්වීම අවශ්‍ය යයි සභාපතිවරයා සලකන ඕනෑම අවස්ථාවක ප්‍රාදේශීය මණ්ඩලයේ විශේෂ රැස්වීමක් ඔහු විසින් කැඳවනු ලැබිය හැකි අතර, ප්‍රාදේශීය සභාවේ සාමාන්‍ය රැස්වීමක් සඳහා නියමිත ගණපූරණයේ සංඛ්‍යාවට නො අඩු ප්‍රාදේශීය සභා සභිකයන් සංඛ්‍යාවක් විසින් අත්සන් කොට සභාපතිවරයා වෙත ලියවිල්ලකින් වූ ඉල්ලීමක් ඉදිරිපත් කරන ලද ඕනෑම අවස්ථාවක, ඔහු විසින් එවැනි රැස්වීමක් කැඳවනු ලැබිය යුතු ය.

(3) යම් ඉල්ලීමක් අනුව පැවැත්වෙන විශේෂ සභා රැස්වීම, සභාපතිවරයා වෙත එම ඉල්ලීම ලැබී දින හතක් ඇතුළත දී කැඳවනු ලැබිය යුතු ය.

(4) තමා වෙත ඉදිරිපත් කරන ලද යම් ඉල්ලීමක් ලැබී දින හතක් ඇතුළත දී විශේෂ සභා රැස්වීමක් කැඳවීම යම් ප්‍රාදේශීය සභාවක සභාපතිවරයා විසින් ප්‍රතික්ෂේප කරනු ලැබුවහොත් හෝ ඕනෑකමින් ම පැහැර හරිනු ලැබුවහොත්, ඉන් ඉක්බිති ඕනෑම අවස්ථාවක සහකාර කොමසාරිස්වරයා විසින් විශේෂ සභා රැස්වීමක් කැඳවනු ලැබීම ද ඒ රැස්වීමේ මූලාසන දරනු ලැබීම ද නැතහොත් මූලාසන දැරීමට ආණ්ඩුවේ නිලධරයකු යොදවනු ලැබීම ද නීත්‍යානුකූල වන්නේ ය.

(5) මේ වගන්තිය යටතේ එක් එක් විශේෂ සභා රැස්වීම් සඳහා නියම කර ගන්නා ලද දිනය සහ එහි දී කරනු ලබන කටයුතු පිළිබඳව දින දෙකකට නොඅඩුව කල් තබා දැන්වීමක් ඒ ප්‍රාදේශීය සභාවේ එක් එක් සභිකයා වෙත භාර දෙනු ලැබිය යුතු ය; නැතහොත් ඒ සභිකයාගේ නිවසෙහි තැබිය යුතු ය.

ප්‍රාදේශීය සභා විසින් කාරක සභා පත් කරනු ලැබිය හැකි බව.

12. (1) ප්‍රාදේශීය සභාවෙහි බලතල, කාර්යයන් සහ කර්තව්‍ය කිසිවකට හෝ සභාවෙහි සැලකිල්ලට භාජනය පවතින යම් කරුණකට හෝ අදාලව සභාවට උපදෙස් දීමේ කාර්යය සඳහා සභාවේ සභිකයන්ගෙන් හෝ, කොටසක් සභිකයන්ගෙන් සහ කොටසක් ප්‍රාදේශීය සභා ප්‍රදේශයේ පදිංචිකරුවන්ගෙන් සහ ඒ ප්‍රාදේශීය සභා ප්‍රදේශය තුළ පිහිටුවා ඇති ග්‍රාමෝදය මණ්ඩලවල සභාපතිවරුන්ගෙන් හෝ සමන්විත කාරක සභා, ප්‍රාදේශීය සභාවක් විසින් කලින් කල පත් කරනු ලැබිය හැකි අතර, යම් ණයක් ලබා ගැනීමේ,

යම් වරිපනම් බද්දක් පැනවීමේ හෝ යම් බද්දක් පැනවීමේ බලතල නොවන, සභාවේ බලතල හෝ කාර්යයන් කිසිවක් සභාව විසින් තීරණය කරනු ලැබිය හැකි කොන්දේසිවලට යටත්ව කලින් කල එම කාරක සභා වෙත පවරනු ලැබිය හැකි ය.

(2) මෙහි පහත දැක්වෙන එක් එක් විෂයය සම්බන්ධයෙන් එනම්—

(අ) මුදල් සහ ප්‍රතිපත්ති සැකසීම ;

(ආ) නිවාස සහ ප්‍රජා සංවර්ධනය ;

(ඇ) කාර්මික සේවා ; සහ

(ඈ) පරිසරය සහ පහසුකම්

යන විෂයයන් සම්බන්ධයෙන් ප්‍රාදේශීය සභාවට උපදෙස් දීම පිණිස, (1) වන උපවගන්තිය යටතේ එවැනි කාරක සභාවක් පත් කළ යුතු ය.

ගණපූරණය.

13. ප්‍රාදේශීය සභාවක යම් රැස්වීමක් සඳහා ගණපූරණය, ඒ රැස්වීම පැවැත්වෙන දිනයෙහි ධුරය දරන සභික සංඛ්‍යාවෙන් තුනෙන් එකක් විය යුතු ය. එම සංඛ්‍යාවෙන් තුනෙන් එක පූර්ණ සංඛ්‍යාවක් සහ භාගයක් වන අවස්ථාවක, එම පූර්ණ සංඛ්‍යාවට සහ භාගයට ආසන්නතම ඉහළ පූර්ණ සංඛ්‍යාව මේ වගන්තියේ කාර්යයන් සඳහා තුනෙන් එක ලෙස සලකනු ලැබිය යුතු ය.

ප්‍රාදේශීය සභාවල බලතල බහුතරය වෙත සතුවිය යුතු බව.

14. (1) ප්‍රාදේශීය සභාවක් විසින් තීරණය කරනු ලැබිය යුතු යයි මේ පනතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියකින් හෝ බලය පවරනු ලැබ ඇති සියලු කාරණා සහ ප්‍රශ්න මේ පනතේ විධිවිධාන වලට අනුකූලව, පවත්වනු ලබන ප්‍රාදේශීය සභාවෙහි යම් රැස්වීමකට පැමිණ සිටින සභිකයන්ගේ බහුතර ඡන්දයෙන් තීරණය කරනු ලැබිය යුතු ය.

(2) යම් රැස්වීමකට පැමිණ සිටින සභිකයන්ගේ ඡන්දය, යම් ප්‍රශ්නයක් සම්බන්ධයෙන් සම ලෙස බෙදී තිබෙන අවස්ථාවක, එම රැස්වීමේ මූලාසනය දරන සභාපතිවරයාට, උපසභාපතිවරයාට හෝ රැස්වීමේ මූලාසනය දරන වෙනත් සභිකයාට සභිකයකු වශයෙන් තමාට ඇති ඡන්දයට අමතරව තීරක ඡන්දයක් ඇත්තේ ය.

වාර්තා.

15. ප්‍රාදේශීය සභාවක සියලු කාර්ය කටයුතු, තීරණ, නියමයන් සහ ක්‍රියා, වාර්තා පොතක සටහන් කරනු ලැබිය යුතු ය. ප්‍රාදේශීය සභාවේ ඊළඟ රැස්වීමේ දී අවශ්‍ය විය හැකි සංශෝධන ද සමඟ ඒවා ස්ථිර කරනු ලැබූ විට සභාපතිවරයා විසින් එයට අත්සන් තැබිය යුතු ය. එසේ සටහන් කර අත්සන් තබන ලද වාර්තාවක සභාපතිවරයා විසින් සහතික කරන ලද පිටපතක් ශ්‍රී ලංකාවේ යම් අධිකරණයක හෝ විනිශ්චයාධිකාරයක සාක්ෂි වශයෙන් ආවේශ්‍ය විය යුතු ය.

## II කොටස

### ප්‍රාදේශීය සභාවල නීති තත්ත්වය, බලතල සහ කාර්ය

චංචල හා නිශ්චල දේපළ සහ වත්කම් හා බැරකම් ප්‍රාදේශීය සභා වෙත පැවරීම.

**16.** (1) සංවර්ධන සභාවක් වෙත සතුවී ඇත්තා වූ සහ 1 වන වගන්තිය යටතේ තීරණය කරන ලද දිනයට පෙරාතුවම වූ දිනයේ දී ප්‍රාදේශීය සභා ප්‍රදේශයක් ඇතුළත පිහිටියා වූ හෝ ප්‍රයෝජනයට ගනු ලබන්නා වූ ද අමාත්‍යවරයා විසින් හෝ තත් කාර්යය සඳහා ලියවිල්ලකින් බලය දෙනු ලැබූ කවර හෝ නිලධරයකු විසින් නිශ්චය කරනු ලැබිය හැකි වූ ද සියලු චංචල හෝ නිශ්චල දේපළ ඒ ප්‍රාදේශීය සභා ප්‍රදේශය සඳහා සංස්ථාපිත ප්‍රාදේශීය සභාව වෙත, එම නිශ්චයේ දින සිට සතු වන්නේ ය.

(2) කිසියම් චංචල හෝ නිශ්චල දේපළක්, (1) වන උපවගන්තිය අදාළ වන චංචල හෝ නිශ්චල දේපළක් ද යන්න පිළිබඳව යම් ආරාවුලක් උද්ගත වුවහොත් එය අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත යොමු කරනු ලැබිය යුතු අතර, ඒ පිළිබඳ ව ඔහුගේ තීරණය අවසානාත්මක වන්නේ ය.

(3) සංවර්ධන සභාවක් විසින් ප්‍රාදේශීය සභා ප්‍රදේශයක් සම්බන්ධයෙන් ස්වකීය පළාත් පාලන බලතල ක්‍රියාත්මක කිරීමෙහි ලා අත් කර ගන්නා ලද හෝ දරන ලද සියලු වත්කම් හා බැරකම්, 1 වන වගන්තිය යටතේ තීරණය කරන ලද දිනයේ සිට, ඒ ප්‍රාදේශීය සභා ප්‍රදේශය සඳහා සංස්ථාපිත ප්‍රාදේශීය සභාව වෙත පැවරී ඒ ප්‍රාදේශීය සභාව වෙත සතු වන්නේ ය.

(4) සුළු නගර සභා ආඥාපනත යටතේ හෝ ගම් සභා ආඥාපනත යටතේ හෝ පළාත් පාලනයට අදාළ වෙනත් යම් නීතියක් යටතේ හෝ සංවර්ධන සභාවක් විසින්, ප්‍රාදේශීය සභා ප්‍රදේශයක් ඇතුළත පිහිටි යම් ඉඩමක් හෝ දෙයක් සම්බන්ධයෙන් පනවන ලදුව 1 වන වගන්තිය යටතේ තීරණය කරන ලද දිනයේදී නොගෙවා පවත්නා සියලු වරිපනම්, බදු, අයකර ගැනීම්, ගාස්තු හෝ වෙනත් අයකිරීම්, ඒ දිනයේ සිට සහ ඉන් පසුව, ඒ ප්‍රාදේශීය සභා ප්‍රදේශය සඳහා සංස්ථාපිත ප්‍රාදේශීය සභාවට ගෙවිය යුත්තේ ය.

එම ඉඩම්වල පරිපාලනය ආදිය සතු කරනු ලබන ආකාරය.

**17.** (1) 16 වන වගන්තියේ සඳහන් යම් දේපළක් පැවරීමට බලයලත් නැනැත්තකු විසින් සහ ප්‍රාදේශීය සභාව වෙනුවෙන් එම දේපළ ලැබීමට හෝ බාර ගැනීමට බලයලත් ප්‍රාදේශීය සභාවේ නිලධරයකු විසින් අත්සන් තබන ලද සතු කිරීමේ නියමයක්, සහතිකයක් හෝ වෙනත් වාර්තාවක් ප්‍රමාණවත් වන අතර, එම දේපළ සහ එම දේපළ පිළිබඳ සියලු අයිතිවාසිකම්, උරුමකම් සහ සම්බන්ධතා එම ප්‍රාදේශීය සභාව වෙත සතු කිරීම සඳහා එය සෑම විටම ප්‍රමාණවත්ව පැවති ලෙස සලකනු ලැබිය යුතු ය.

(2) 16 වන වගන්තියෙහි හෝ මේ වගන්තියේ ඉහත සඳහන් විධිවිධානවල හෝ සඳහන් කිසිවක් මගින්—

(i) එම දේපළ සම්බන්ධයෙන් රජයේ යම් අයිතියකට හෝ හිමිකමකට හෝ පොදු කාර්යයන් සඳහා ඕනෑම අවස්ථාවක එම දේපළ රජයට ලබාගැනීමේ හෝ රජය විසින් බැහැර කරනු ලැබීමේ හෝ අයිතිය කෙරෙහි බලපාන්නේ යයි හෝ හානිකර ලෙස ක්‍රියාත්මක වන්නේ යයි; හෝ

(ii) රජය වෙනුවෙන් ඉඩම් පවරනු ලැබ ඇති යම් හමුදා හෝ වෙනත් අධිකාරයක් ඒ දේපළ සම්බන්ධයෙන් දරන හෝ දැරිය හැකි හෝ යම් අයිතියක්, හිමිකමක් හෝ සම්බන්ධතාවයක් කෙරෙහි බලපාන්නේ යයි හෝ හැකිකර ලෙස ක්‍රියාත්මක වන්නේ යයි ; හෝ

(iii) එම දේපළට අදාළ ඉහත සඳහන් සතු කිරීමේ ආඥාවෙහි, සහතිකයෙහි හෝ වෙනත් වාර්තාවෙහි දක්වා ඇති නියම සහ කොන්දේසිවලට අනුව හැර, එවැනි යම් දේපළක් විකිණීමට හෝ අන්‍යාකාරයකින් බැහැර කිරීමට හෝ ප්‍රාදේශීය සභාවට බලය ලැබෙන්නේ යයි හෝ

සලකනු නොලැබිය යුතු ය.

(3) ප්‍රාදේශීය සභා සතු කරන ලද සියලු දේපළ පරිපාලනය කර, ඒවායේ ආදායම මේ පනතේ කාර්යයන් සඳහා උපයෝගී කරගත යුතු ය.

ප්‍රාදේශීය සභා සතු කරන ලද පොදු දේපළ.

18. මේ පනතේ කාර්යයන් සඳහා පහත දැක්වෙන වර්ගවල දේපළ ද වැඩිදුරටත් එක් එක් ප්‍රාදේශීය සභාව වෙත සතු කරනු ලැබිය යුතු ය :—

(අ) ප්‍රාදේශීය සභාව වෙත එම දේපළ පැවරීම කරනු ලැබූවේ යම් භාරයක් හෝ සාධන පත්‍රයක් මගින් ද, ඒ භාරයේ නියමයන්ට හෝ සාධන පත්‍රයේ කොන්දේසිවලට සෑම විටම යටත් ව, ප්‍රාදේශීය සභා විසින්, අත්කර ගන්නා ලද හෝ අන් ලෙසකින් ප්‍රාදේශීය සභාව වෙත පවරන ලද හෝ පොදු උද්‍යාන, වතු සහ විවෘත භූමිභාග සහ එහි ඇති සියලු ඉදිකිරීම් හා වෙනත් නිර්මාණ සහ ඒවායේ උපකරණ ;

(ආ) වෙනත් යම් ප්‍රඥප්තියක් යටතේ වෙනත් යම් අධිකාරයක් සතුව තිබෙන්නා වූ පාරවල්, වීදි, ඇළ මාර්ග සහ පාලම් හැර සියලු ප්‍රසිද්ධ පාරවල්, වීදි, ඇළ මාර්ග සහ පාලම් එම කාර්ය සඳහා භාවිතයට ගනු ලබන ඉඩම් හා එහි සියලු පදික වේදිකා ගල් සහ වෙනත් ද්‍රව්‍ය හා ඒ සඳහා සපයා ඇති සියලු ඉදිකිරීම්, ද්‍රව්‍ය උපකරණ හා වෙනත් දේවල් ;

(ඇ) ඉහත කී පරිදි වූ යම් භාරයකට හෝ කොන්දේසියකට සෑම විටම යටත් ව, මේ පනත යටතේ ඉදි කරනු ලැබිය හැකි, ගොඩනගනු ලැබිය හැකි හෝ සපයනු ලැබිය හැකි නැත හොත් ඉවත් කරන ලද යම් ප්‍රඥප්තියක් යටතේ ඉදි කරන ලද, ගොඩනගන ලද හෝ සපයන ලද නැතහොත් ප්‍රාදේශීය සභාව වෙත පවරනු ලැබිය හැකි හෝ පවරා ඇති මහජනයාගේ යහපත හෝ පහසුව හෝ සඳහා වූ සියලු පොදු වෙළඳ පොළවල්, සියලු කර්මාන්ත, ඉදිකිරීම් හෝ ගොඩනැගීම් සහ ඒවායේ පිහිටි බිම් අනුබද්ධ අංගෝපාංග, ද්‍රව්‍ය, ගෘහභාණ්ඩ සහ උපකරණ ;

(ඈ) ඉහත කී පරිදි වූ යම් භාරයකට හෝ කොන්දේසියකට සෑම විටම යටත් ව, ප්‍රාදේශීය සභාවෙහි අරමුදලින් සම්පූර්ණ වශයෙන් හෝ කොටසක් ලෙසින් ඉදිකරන ලද නැත හොත් සපයන ලද හෝ වෙනත් ආකාරයකින් ප්‍රාදේශීය

සභාව වෙත පවරනු ලැබිය හැකි හෝ වෙනත් සියලු පොදු ගොඩනැගිලි ඒවායේ පිහිටි බිම් අනුබද්ධ අංගෝපාංග. ද්‍රව්‍ය, ගෘහභාණ්ඩ සහ උපකරණ ;

(ඉ) සභාව සමග පවත්නා කොන්ත්‍රාත් ගිවිසුමක් මගින් අන්‍යාකාරයෙන් පාලනය වන තාක් දුරට හෝ පෞද්ගලික දේපළ බවට හෝ පෞද්ගලික අයිතියට යටත් බවට අන් ලෙසකින් පෙන්වා දෙනු ලබන විට හැර, සියලු පහන්, පහන් ලැබූ ආධාරක, පහන් කණු, කොරොව් වේලි, නල, කණු, දම්වැල්, පයිල්, රේල් පීලි කණු සහ වෙනත් සමාන ඉදිකිරීම්වල ද ප්‍රාදේශීය සභා සතු වූ පාරවල්, වීදි සහ ප්‍රසිද්ධ ස්ථාන ද, ඒවායේ, ඒ අවට සහ ඒවාට අයත් සියලු ද්‍රව්‍ය, ගෘහභාණ්ඩ දේවල් ද ඇතුලත් දේපළ.

19. (1) මේ පනත යටතේ ස්වකීය කාර්යයන් ඉටු කිරීමේ කාර්ය සඳහා ප්‍රාදේශීය සභාවකට (ඒ සභාව වෙත විශේෂයෙන්ම පවරන ලද වෙනත් යම් බලතලවලට හානියක් නොවන පරිදි) මේ පනතේ සෙසු විධිවිධානවලට සහ ඒ යටතේ සාදන ලද යම් රීති වලට හා ජාතික රාජ්‍ය සභාවේ 1974 අංක 16 දරන පළාත් පාලන සේවා පනතේ විධිවිධාන වලට ද යටත්ව පහත දැක්වෙන බලතල තිබිය යුතු ය :— ප්‍රාදේශීය සභාවල බලතල.

(i) තනතුර ඇති කිරීම සහ වැටුප් නියම කිරීම සම්බන්ධයෙන් කොමසාරිස්වරයාගේ ලියවිල්ලකින් වූ අනුමතය කලින් ලබා ගැනීමට යටත්ව, ප්‍රාදේශීය සභාව අවශ්‍ය යයි සලකන සියලු තනතුරු හෝ නිල ඇති කිරීම සහ, එවැනි යම් තනතුරකට හෝ නිලයකට එම ප්‍රාදේශීය සභාව සුදුසු යයි සලකන වැටුප් දීමනා හෝ පාරිශ්‍රමික නියම කිරීම ;

(ii) ප්‍රාදේශීය සභාවේ සේවයෙහි යම් තනතුරකට හෝ නිල යකට පත්කිරීම් කිරීම ;

(iii) ප්‍රාදේශීය සභාවේ යම් නිලධරයකු හෝ සේවකයකු ඉවත් කිරීම ;

(iv) ප්‍රාදේශීය සභාවේ සේවයෙහි යම් තනතුරක් හෝ නිලයක් අහෝසි කිරීම ;

(v) ප්‍රාදේශීය සභාවේ නිලධරයන් සහ සේවකයන් සේව යෙන් විශ්‍රාම ගන්නා විට ඔවුනට විශ්‍රාම වැටුප් පිරි නැමීම ;

(vi) එක් එක් ප්‍රාදේශීය සභාවෙහි යම් වැඩක් එකමුතුව නිම කිරීම සඳහා හෝ යම් නිලධරයකු හෝ සේවකයකු සේවයේ නියුක්ත කර පාරිශ්‍රමික ගෙවීම සඳහා හෝ වෙනත් යම් ප්‍රාදේශීය සභාවක් සමඟ යම් ගිවිසුමකට එළඹීම ;

(vii) ප්‍රාදේශීය සභාවේ අරමුදලින් යම් කොටසක් මාතෘ සහ දරක සුභ සාධන සේවාවන්ට, ප්‍රාදේශීය සභාව විසින් පිහිටුවන ලද යම් මාතෘ සේවාවක කාර්ය සඳහා වින්නඹු මාතාවන් පුහුණු කිරීමට, නිවාස යෝජනා ක්‍රමවලට, පුණ්‍යාධාරවලට හෝ වර්ෂාවෙන්, ජල ගැල්මෙන් ගින්නෙන්, භූමි කම්පාවකින්, සාගතයකින් හෝ වසංගතයකින් හෝ සිදු වූ ආපදාවලට සහන සැලසීමේ පියවරක් හෝ අමාත්‍යවරයා විසින් අනුමත කරන ලද වෙනත් යම් කාර්යයක් සඳහා වියදම් කිරීම ;

(viii) යම් ඉඩමක් හෝ ගොඩනැගිල්ලක් මිලට ගැනීම හෝ බද්දට ගැනීම ;

(ix) ප්‍රාදේශීය සභාව සංස්ථාපනය කරන ලද්දේ යම් ප්‍රාදේශීය සභා ප්‍රදේශයක් සඳහා ද ඒ ප්‍රදේශයේ පදිංචිකරුවන් හෝ එම පදිංචිකරුවන්ගෙන් යම් කොටසක් හෝ සඳහා හෝ ප්‍රාදේශීය සභාව විසින් පරිපාලනය කරනු ලබන යම් පොදු සේවාවක කාර්යයන් සඳහා හෝ දේපළ ලබා ගැනීම සහ භාරයක් ලෙස ඇරීම සහ යම් පොදු කාර්යයක් සඳහා භාරකරු ලෙස අන් ලෙසකින් ක්‍රියා කිරීම ;

(x) ඉඩම හෝ ගොඩනැගිල්ල ප්‍රාදේශීය සභාව වෙත පවරන ලද සාධන පත්‍රයෙහි නියම සහ කොන්දේසිවලට යටත්ව, 16 වන වගන්තිය ප්‍රකාර හැර අන් ලෙසකින් ප්‍රාදේශීය සභාව සතුව පවත්නා හෝ එය වෙත සතු කරන ලද හෝ යම් ඉඩමක් හෝ ගොඩනැගිල්ලක් ලියවිල්ලකින් වූ අමාත්‍යවරයාගේ පූර්ව අනුමතය ඇතිව විකිණීම හෝ හුවමාරු කර ගැනීම ;

(xi) ප්‍රාදේශීය සභාව වෙත ඉඩම හෝ ගොඩනැගිල්ල පවරන ලද්දේ හෝ සතු කරන ලද්දේ යම් සාධන පත්‍රයක නියමවලට හෝ කොන්දේසිවලට යටත්ව ද, එම නියම සහ කොන්දේසිවලට යටත්ව පොදු කාර්ය සඳහා, අවශ්‍ය නොවන 16 වන වගන්තිය හෝ 18 වන වගන්තිය හෝ ප්‍රකාර ප්‍රාදේශීය සභාව වෙත සතු කරන ලද යම් ඉඩමක් හෝ ගොඩනැගිල්ලක් අමාත්‍යවරයාගේ ලියවිල්ලකින් වූ පූර්ව අනුමතය ඇතිව, කුලියට දීම හෝ බද්දට දීම ;

(xii) ඉඩම සහ ගොඩනැගිල්ල ප්‍රාදේශීය සභාව වෙත පවරන ලද්දේ හෝ සතු කරන ලද්දේ යම් සාධන පත්‍රයක නියම හා කොන්දේසිවලට යටත්ව ද, එම නියම සහ කොන්දේසිවලට යටත්ව, 16 වන වගන්තිය හෝ 18 වන වගන්තිය හෝ ප්‍රකාර නොවන අන් ලෙසකින් ප්‍රාදේශීය සභාවට අයත් වන්නා වූ හෝ, එය සතු වූ යම් ඉඩමක් හෝ ගොඩනැගිල්ලක් කුලියට දීම හෝ බද්දට දීම :

එසේ වුවද එවැනි යම් ඉඩමක් හෝ ගොඩනැගිල්ලක් අවුරුදු තුනකට වැඩි කාල සීමාවක් සඳහා බද්දට දීමක්, ලියවිල්ලකින් වූ අමාත්‍යවරයාගේ අනුමතය කලින් ලබා ගෙන මිස, ක්‍රියාත්මක නොකළ යුතු ය.

(xiii) කළ යුතු යම් වැඩක්, ඉටු කළ යුතු යම් සේවාවක්, හෝ සැපයිය යුතු යම් භාණ්ඩ හෝ ද්‍රව්‍ය සඳහා යම් තැනැත්තකු සමඟ ගිවිසුමකට එළඹීම ;

(xiv) ප්‍රාදේශීය සභාවේ අරමුදල්වලින් යම් කොටසක් ගමවල වැඩ ඉදි කිරීම හෝ වෙනස් කිරීම, වැඩි දියුණු කිරීම හෝ නඩත්තු කිරීම සහ සභාව වෙත සතු කරන ලද හෝ අන් ලෙසකින් පවරන ලද හෝ සභාව විසින් අත්කර ගන්නා ලද යම් දේපළක් පරිපාලනය කිරීමේ කාර්ය සඳහා හෝ මේ පනතේ විධිවිධාන නැතහොත් එය යටතේ සාදන ලද හෝ වෙනත් යම් ලිඛිත නීතියකින් එය යටතේ සාදන ලදැයි සැලකෙන හෝ යම් අතුරු ව්‍යවස්ථාවක් ක්‍රියාවේ යෙදවීමේ කාර්ය සඳහා වියදම් කිරීම ;

(xv) පොළපලවල් පිහිටුවීම, ප්‍රාදේශීය සභාව විසින් පිහිටුවනු ලබන හෝ නඩත්තු කරනු ලබන යම් පොළපලවල පොළපල බදු අය කිරීම සහ එම පොළපල ආරක්ෂා කිරීම, සහ ඒ සඳහා සාදනු ලබන අතුරු ව්‍යවස්ථා මගින් පෞද්ගලික පොළපලවල් තහනම් කිරීම හෝ සීමා කිරීම ;

(xvi) යම් ප්‍රාදේශීය සභාවක සීමා ඇතුළත යම් ස්ථානයක් සහ වෙනත් යම් ප්‍රාදේශීය සභාවක සීමා ඇතුළත හෝ වෙනත් යම් පළාත් පාලන ආයතනයක පරිපාලන සීමා ඇතුළත හෝ පිහිටි යම් ස්ථානයක් අතර, පිහිටුවා පවත්වා ගෙන යනු ලබන පොළපලක් සම්බන්ධයෙන් වූ විට, අවස්ථාවෝචිත පරිදි ඒ ප්‍රාදේශීය සභාව හෝ

පළාත් පාලන ආයතනය හෝ සමඟ හිමිසුමකට ඇතුළත් වීමෙන් තීරණය කරනු ලබන ආකාරයකට හෝ අනුපාතයකට හෝ එම තොටුපල වෙනුවෙන් පනවනු ලබන හෝ අයකරනු ලබන හෝ තොටුපල බද්ද බෙදා හැරීම සහ, ප්‍රාදේශීය සභාවේ අරමුදලින් යම් කොටසක් එම තොටුපලවලට සම්බන්ධව ගම් ප්‍රදේශයේ සීමාවන්ගෙන් පිටත කරගෙන යනු ලබන යම් ඉදි කිරීමේ හෝ නඩත්තු කිරීමේ වැඩ සඳහා වියදම් කිරීම ;

(xvii) ප්‍රාදේශීය සභාවේ අරමුදලින් කිසියම් කොටසක්, කෘෂිකර්මාන්ත සහ ගෘහාශ්‍රිත සතුන් බෝකිරීම පිළිබඳව පර්යේෂණ පැවැත්වීම සඳහා සහ එම කාර්යය සඳහා පර්යේෂණ ගොවිපලවල් සහ පට්ටි ගවයන් නඩත්තු කිරීම සඳහා වියදම් කිරීම ;

(xviii) ආගමික වත් පිළිවෙත් සහ උත්සව සංවිධානය කිරීමේ, දහම් පාසැල් සහ සාසනාරක්ෂක මණ්ඩල පවත්වාගෙන යාමේ, සාහිත්‍ය සහ සංස්කෘතික උත්සව සංවිධානය කිරීමේ, සාහිත්‍යමය සහ සංස්කෘතික වටිනාකමින් යුත් පොත් පළ කිරීමේ සහ කලාකරුවන්ට, ගත් කතුවරයන්ට සහ ශිල්පීන්ට තෑගි ප්‍රදානය කිරීමේ වියදම් සඳහා දායක වීම ඇතුළුව, ආගම සහ සංස්කෘතිය නංවාලීම පිණිස, ප්‍රාදේශීය සභාවේ අරමුදලින් කිසියම් කොටසක් වියදම් කිරීම ;

(xix) (අ) ප්‍රාදේශීය සභා ප්‍රදේශය තුළ ගොඩනැගිලි, උපකරණ, ක්‍රීඩා භූමි නේවාසිකාගාර, ගුරු නිවාස, ක්‍රීඩා භාණ්ඩ සහ පුස්තකාල පහසුකම් වැනි අධ්‍යාපන පහසුකම් සැලසීම සඳහා වැඩ පිළිවෙලක් සකස් කර නිසි බලධාරී වෙත ඉදිරිපත් කිරීම ;

(ආ) ප්‍රාදේශීය සභා ප්‍රදේශය තුල පාසැල් විවෘත කිරීම, වැසීම, ඒකාබද්ධ කිරීම, නම් කිරීම සහ උසස් කිරීම සම්බන්ධයෙන් නිසි බලධරයා වෙත නිර්දේශ කිරීම ;

(xx) ප්‍රාදේශීය සභා ප්‍රදේශයේ පදිංචිකරුවන් සඳහා රැකියා වැඩ පිළිවෙලවල් සංවිධානය කිරීම ;

(xxi) ප්‍රාදේශීය සභාව පිහිටා ඇත්තේ යම් පරිපාලන දිස්ත්‍රික්කයක සීමාව තුළ ද, ඒ පරිපාලන දිස්ත්‍රික්කය සඳහා පිහිටුවා ඇති සංවර්ධන සභාව විසින් ප්‍රාදේශීය සභාව වෙත පවරා ඇති යම් යෝජනා ක්‍රමයක් හෝ වැඩක් ක්‍රියාත්මක කිරීම ;

(xxii) ප්‍රාදේශීය සභා අරමුදලින් කිසියම් කොටසක් ග්‍රාමීය කාන්තා සංවර්ධන කටයුතු නංවාලීම සඳහාත්, තෝරාගත් ගම්වල ඒකාබද්ධ සංවර්ධන සහ ප්‍රජා සංවර්ධන ව්‍යාපෘති නංවාලීම සඳහාත්, ග්‍රාම සංවර්ධන ව්‍යාපෘතිවලට ද ග්‍රාමෝදය මණ්ඩලවලට සහ ග්‍රාමෝදය මණ්ඩලවල නියෝජනය කරනු ලැබීමට සුදුසුකම් ලත් ග්‍රාම සංවර්ධන සංවිධානවලට ද මුදල් ප්‍රදානය කිරීම සඳහාත් වියදම් කිරීම;

(xxiii) දුගී ජනයාට සහනාධාර සැලසීම සඳහාත්, අසරණ තැනැත්තන් සහ කායිකව, මානසිකව හෝ සමාජීය වශයෙන් ආබාධිත තැනැත්තන් පුනරුත්ථාපනය කිරීම සඳහාත්, ප්‍රාදේශීය සභා අරමුදලින් යම් කොටසක් වියදම් කිරීම;

(xxiv) අමාත්‍යවරයාගේ පූර්ව අනුමතය ඇතිව—

(අ) පිළිවෙළින් මහ නගර සභා ආඥාපනත සහ නගර සභා ආඥාපනත යටතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක් යටතේ හෝ යම් මහ නගර සභාවක නැතහොත් නගර සභාවක් විසින් පිහිටුවා පවත්වා ගෙන යනු ලබන, අවස්ථාවෝචිත පරිදි, පොදු සේවාවන් හෝ පොදු උපයෝගිතා සේවාවන් හෝ සඳහා අවශ්‍ය විය හැකි යන්ත්‍ර, උපකරණ, භාණ්ඩ, ද්‍රව්‍ය සහ බඩු සැපයීම සහ නිෂ්පාදනය කිරීම සඳහා වාණිජ හා කර්මාන්ත ව්‍යවසායන්හි නිරත වීම; සහ

(ආ) ප්‍රාදේශීය සභාව විසින් තීරණය කරණු ලැබ අමාත්‍යවරයා විසින් අනුමත කරන ලද මිල ගණන්වලට එම යන්ත්‍ර, උපකරණ, භාණ්ඩ ද්‍රව්‍ය සහ බඩු යම් නගර සභාවකට හෝ මහ නගර සභාවකට හෝ මහජනයාට විකිණීම;

(xxv) මේ පනත හෝ එය යටතේ සාදන ලද අතුරු ව්‍යවස්ථා හෝ රීති උල්ලංඝනය කරමින් සිදු කරනු ලබන පීඩාකාරී කටයුතු සොයා දැන ගැනීම සහ ඒවා වැළැක්වීම සහ නතර කිරීම, හෝ අයිතිකරු හෝ පදිංචිකරු හෝ විසින් පැහැර හරිනු ලැබ ඇති නැතහොත් පැහැර හරිනු ලැබ ඇතැයි සලකන මේ පනත යටතේ කළ යුතු වූ ක්‍රියා කරවීම හෝ සඳහා, අවශ්‍ය විය හැකි ඉඩම්වලට සහ ගොඩනැගිලිවලට ඇතුළුවීම සහ සියලු පරීක්ෂාවන් කිරීම සඳහා බලය පවරන ලද ස්වකීය නිලධරයන් සහ ඔවුන් සමග යන සේවකයන් සහ කම්කරුවන් මගින්, එම කටයුතු කිරීම;

(xxvi) මේ පනතේ කිසියම් කාර්යයන් සඳහා සභාපතිවරයා අවශ්‍ය යයි සලකන සියලු පරීක්ෂණ, සභාපතිවරයා විසින් හෝ ඔහු විසින් බලය පවරන ලද වෙනත් නිලධරයන් විසින් හෝ පැවැත්වීම සහ එවැනි සියලු පරීක්ෂණවල කාර්ය සඳහා දිවුරුම් ගැනීම් සහ සාක්ෂි කැඳවීම ;

(xxvii) ප්‍රාදේශීය සභා අරමුදලින්, අමාත්‍යවරයා විසින් අනුමත කරනු ලබන දායක මුදලක් ප්‍රාදේශීය පරිපාලනයට අදාල කරුණු පිළිබඳව සලකා බැලීම සඳහා පළාත් පාලන ආයතනවල යම් සංගමයක වියදම් වෙනුවෙන් වෙන් කිරීම ;

(xxviii) සභාපතිවරයා, උපසභාපතිවරයා සහ සෙසු සභිකයන් වෙත, රීති මගින් නිශ්චය කරනු ලබන ප්‍රමාණ මත දීමනා ගෙවීම, සඳහා ප්‍රාදේශීය සභා අරමුදලින් යම් කොටසක් වියදම් කිරීම ;

(xxix) ප්‍රාදේශීය සභාවේ රැස්වීම්වලට සහභාගිවීම සඳහා ප්‍රාදේශීය සභාවේ සභිකයන්ට හෝ, ප්‍රාදේශීය පරිපාලනයට අදාළ කරුණු පිළිබඳව සලකා බැලීම සඳහා ප්‍රාදේශීය සභාවේ අනුමතය ඇතිව, ප්‍රාදේශීය සභා සභිකයන්ගේ හෝ නිලධරයන්ගේ යම් රැස්වීමකට හෝ සම්මේලනයකට සහභාගි වන ප්‍රාදේශීය සභාවේ නිලධරයන්ට හෝ සභිකයන්ට ගමන් වියදම් දීමනා ගෙවීම සඳහා ප්‍රාදේශීය සභා අරමුදලින් යම් කොටසක් වියදම් කිරීම ;

(xxx) ප්‍රාදේශීය සභාවේ හෝ මහජනතාවගේ හෝ අයිතිවාසිකම් ක්‍රියාත්මක කිරීමේ හෝ ආරක්ෂා කිරීමේ කාර්යය සඳහා නැතහොත් එහි සභිකයන් හෝ නිලධරයන් විසින් ස්වකීය කාර්ය ඉටු කිරීමේ දී හෝ ඉටු කිරීමට අදහස් කිරීමේ දී ඔවුන් ආරක්ෂා කිරීමේ කාර්යය සඳහා යම් නඩු පැවරීමක් හෝ විත්තිවාචකයක් ඉදිරිපත් කිරීමක් අවශ්‍ය යයි ප්‍රාදේශීය සභාව අදහස් කරන්නේ නම් එවැනි නඩු පැවරීම හෝ විත්තිවාචක ඉදිරිපත් කිරීම ;

(xxxi) මේ පනත යටතේ සාදන ලද හෝ සාදන ලදැයි සලකනු ලබන අතුරු ව්‍යවස්ථා ක්‍රියාවේ යෙදවීමේ සහ, එවැනි අතුරු ව්‍යවස්ථා කඩ කිරීම සම්බන්ධයෙන් මහෙස්ත්‍රාත් අධිකරණයෙහි නඩු පැවරීම ;

(xxxii) සාමාන්‍යයෙන්, ප්‍රාදේශීය සභාවල බලතල සහ කාර්ය යන්, ඵලදායි ලෙස ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය වන්නා වූ සියලු දේවල් කිරීම.

(2) (අ) යම් වාණිජ හෝ කර්මාන්ත ව්‍යවසායක—

(i) ආර්ථික ස්ථාසීභාවය;

(ii) එම ව්‍යවසාය පවත්වාගෙන යාමෙන් යම් ප්‍රාදේශීය සභාවකට හෝ මහජනයාට හෝ ලැබෙන ප්‍රතිලාභ; සහ

(iii) එම ව්‍යවසායේ නිරත වන ප්‍රාදේශීය සභාවේ මුදල් තත්ත්වය

සැලකිල්ලට ගෙන අමාත්‍යවරයා විසින් (1) වන උපවගන්තියේ (xxiv) වන ඡේදය යටතේ එවැනි යම් ව්‍යවසායක් අනුමත කරනු ලැබිය හැකි ය.

(ආ) පාර්ලිමේන්තුව විසින් 129 වන වගන්තියේ (2) වන උප වගන්තියේ (ඇ) හෝ (ඈ) හෝ (එ) ඡේද යටතේ යම් ප්‍රාදේශීය සභාවක් සඳහා වෙන් කරන ලද හෝ ප්‍රදානය කරන ලද හෝ කිසිදු මුදලක් යම් කර්මාන්ත හෝ වාණිජ ව්‍යවසායක් පිහිටුවීමේ නැතහොත් පවත්වාගෙන යාමේ කාර්යය සඳහා ප්‍රාදේශීය සභාවක් විසින්, උපයෝගී කර ගනු නොලැබිය යුතු ය.

(ඇ) යම් ප්‍රාදේශීය සභාවක යම් වාණිජ හෝ කර්මාන්ත ව්‍යවසායක් දිගටම පවත්වා ගෙන යාම නැතහොත් අයථා කළමනාකරණයේ හෝ ඒ සභාවට මුදලින් අලාභයක් ඇතිවීමට ඉඩ තිබීමේ හෝ හේතුවෙන් ඒ සභාවේ යහපතට හානිකර වන බව අමාත්‍ය වරයාගේ මතය වන අවස්ථාවක, අමාත්‍යවරයා විසින්, සභාව විමසීමෙන් පසුව, ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන නියමයක් මගින්, එම ව්‍යවසාය පවත්වා ගෙන යාම අවසන් කරනු ලැබිය හැකි අතර, ඒ ව්‍යවසායේ සියලු පොත්, වාර්තා සහ වත්කම් භාර ගන්නා ලෙස ද, එම නියමය ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය පියවර ගන්නා ලෙස ද විධාන කරනු ලැබිය හැකි ය.

(3) යම් වාණිජ හෝ කර්මාන්ත ව්‍යවසායක නිරත යම් ප්‍රාදේශීය සභාවක් වෙත, එය පවත්වා ගෙන යාම හෝ, එහි කටයුතු කර ගෙන යාම හෝ පිළිබඳව සාමාන්‍ය හෝ විශේෂ විධාන අමාත්‍යවරයා විසින් හෝ කොමසාරිස්වරයා විසින් හෝ කලින් කල දෙනු ලැබිය හැකි අතර, සභාව විසින් එම විධාන ඉටු කරනු ලැබිය යුතු ය.

(4) ව්‍යවසායේ කටයුතු සම්බන්ධව, අමාත්‍යවරයාට හෝ කොමසාරිස්වරයාට හෝ අවශ්‍ය විය හැකි ආකෘතියක වාර්තා, ගිණුම් සහ වෙනත් තොරතුරු තමන් වෙත සපයන ලෙස අමාත්‍යවරයා හෝ කොමසාරිස්වරයා හෝ විසින් සභාව වෙත කලින් කල ලියවිල්ලකින් විධාන කරනු ලැබිය හැකි අතර, සභාව විසින් එවැනි සෑම විධානයක් ම ඉටු කරනු ලැබිය යුතු ය.

මැනීමට බලය පැවරීමට ඇති බලය

20. (1) ප්‍රාදේශීය සභාව සංස්ථාපනය කර ඇත්තේ යම් ප්‍රදේශයක් සඳහා ද එම ප්‍රදේශයේ යම් පොදු කාර්යයක් සඳහා යම් පෞද්ගලික ඉඩමක්, ගොඩනැගිල්ලක් හෝ ස්ථානයක් පරීක්ෂා කිරීම හෝ මැනීම අවශ්‍ය යයි, යම් ප්‍රාදේශීය සභාවක සභාපතිවරයාට පෙනී යන කවර අවස්ථාවක වුව ද, එම පරීක්ෂණය හෝ මැනීම කරන ලෙස, එම ප්‍රාදේශීය සභාවේ යම් නිලධරයකු හෝ සේවකයකු වෙත සභාපතිවරයා විසින් විධාන කරනු ලැබීම නීත්‍යනුකූල විය යුතු ය. එවිට එම නිලධරයා හෝ සේවකයා සහ ඔහුගේ කම්කරුවන් විසින් එම ඉඩමට, ගොඩනැගිල්ලට හෝ ස්ථානයට ඇතුලු වී පහත සඳහන් ක්‍රියාවලින් කිසිවක් ඒ මත කිරීම, නීත්‍යනුකූල විය යුතු ය :—

(අ) මැනීම සහ මට්ටම් ගැනීම ;

(ආ) යටිපස තුළට හෑරීම හෝ කැණීම ;

(ඇ) ඉඩම, ගොඩනැගිල්ල හෝ ස්ථානය එවැනි පොදු කාර්යයක් සඳහා යොදා ගත හැකි ද යන්න නිශ්චය කර ගැනීම සඳහා කළ යුතු වෙනත් ක්‍රියා කිරීම ;

(ඈ) අත්කර ගැනීමට යන යම් ඉඩමක මායිම් හෝ වීදි මායිම් රේඛා හෝ කිරීමට අදහස් කර ඇති යම් වැඩක මායිම් රේඛා හෝ දැක්වීම ;

(ඉ) කාරණාවට අවශ්‍ය වන පරිදි, පවත්නා ගොඩනැගිලිවල, ගස් වල, කාණුවල, බිත්තිවල, වැටවල්වල හෝ වෙනත් ස්ථාපිත ද්‍රව්‍යවල ස්ථිර සළකුණු පිහිටුවීමෙන් හෝ අලුත් සළකුණු තැබීමෙන් හෝ අගල් කැපීමෙන් මට්ටම්, මායිම් හෝ රේඛා ඇති කිරීම ;

(ඊ) වෙනත් හේතුවක් නිසා මැනීමක් සම්පූර්ණ කිරීමට හෝ මට්ටම් ගැනීමට හෝ මායිම් සහ රේඛා සළකුණු කිරීමට හෝ නොහැකි වන අවස්ථාවක, එවැනි වැඩක් කිරීමේ දී, අවහිර කරන්නා වූ යම් බාධකයක් කපා දැමීම හෝ ඉවත් කිරීම.

(2) (1) වන උපවගන්තියෙහි සඳහන් ක්‍රියාවලින් කිසිවක් කිරීමෙන්, යම් ඉඩමකට හෝ ඒ මත පිහිටි යම් දෙයකට හෝ යම් අලාභ හානියක් සිදු වන අවස්ථාවක ප්‍රාදේශීය සභාව විසින්, සම්පූර්ණ වන්දිය අයිතිකරු වෙත හෝ ඊට හිමිකම් ඇති වෙනත් තැනැත්තා වෙත හෝ ගෙවනු ලැබිය යුතු ය.

(3) (1) වන උපවගන්තියෙහි සඳහන් කාර්යයන් සඳහා යම් ගොඩනැගිල්ලකට හෝ යම් පදිංචි නිවාසයකට සම්බන්ධ කොටුවකට හෝ ඇතුළුවීම, එහි පදිංචිකරුගේ ලියවිල්ලකින් වූ කැමැත්ත හෝ, එම කැමැත්ත දෙනු නොලැබේ නම්, ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයාගේ ලියවිල්ලකින් වූ අනුමතය හෝ ඇතිව මිස, කිසිම තැනැත්තකු විසින් කරනු නොලැබිය යුතු ය.

(4) මේ වගන්තිය යටතේ යම් ඉඩමක පිහිටුවනු ලබන සෑම සලකුණක්ම, ප්‍රාදේශීය සභාවේ දේපළ ලෙස සලකනු ලැබිය යුතු ය.

## III වන කොටස

### මංමාවත්වලට අදාළ බලතල හා කාර්යයන්

### මංමාවත්

21. (1) වෙනත් යම් අධිකාරියකට නීතියෙන් පවරන ලද බලතල සහ වගකීම්වලට යටත්ව, ප්‍රාදේශීය සභාවේ පරිපාලන සීමා ඇතුළත ප්‍රධාන මංමාවත් නොවන සියලු මංමාවත් සහ මාර්ග සම්බන්ධතා පිළිබඳ කාර්ය සඳහා, ප්‍රාදේශීය සභාව, මේ පනත නිවාස සහ නගර සංවර්ධන ආඥාපනත සහ ඒ සඳහා කලින් කල පනවනු ලබන වෙනත් යම් ප්‍රඥප්ති යටතේ එම සභාව වෙත පැවරී ඇති සියලු බලතල සමඟ සාමාන්‍ය පරිපාලන අධිකාරිය විය යුතු ය.

මංමාවත් සහ මාර්ග සම්බන්ධතා පිළිබඳ පොදු අධිකාරිය ප්‍රාදේශීය සභාව විය යුතු බව.

(2) ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන නියමයන් මගින් අමාත්‍යවරයා විසින් කලින් කල කරනු ලබන විධානවලට යටත්ව ප්‍රාදේශීය සභාව, එහි ප්‍රදේශය ඇතුළත පිහිටි යම් ප්‍රධාන මංමාවත් ආරක්ෂා කිරීමේ කාර්යය සඳහා පරිපාලන බලධරයා විය යුතු ය. තව ද එම කාර්ය සඳහා මංමාවත් අසලින් ඇති ගොඩනැගිලිවලට, මංමාවත්වලට අවහිර කිරීමට, මංමාවත් අයුතු ලෙස ඇඳා ගැනීමට, මංමාවත්වලට හානි කිරීමට සහ මංමාවත් මත පීඩාවන් කිරීමට අදාළව 43 සිට 67 දක්වා වූ වගන්ති (ඒ දෙකම ඇතුළත්ව) මගින් පවරා ඇති බලතලවලින් හෝ නියම කොට ඇති කාර්යයන්ගෙන් හෝ කිසිවක් එවැනි යම් ප්‍රධාන මංමාවතකට අදාළව ක්‍රියාවේ යෙදවීමේ හෝ ඉටු කිරීමේ හිමිකම එම ප්‍රාදේශීය සභාවට තිබිය යුතු ය.

මංමාවත් සහ විවෘත භූමිභාග සම්බන්ධයෙන් ප්‍රාදේශීය සභාවේ සාමාන්‍ය බලතල.

22. වෙනත් යම් අධිකාරියකට නීතියෙන් පවරන ලද බලතල සහ වගකීම්වලට යටත්ව, ප්‍රාදේශීය සභාවෙහි ප්‍රදේශය තුළ පිහිටි සියලු මංමාවත්වලින් හෝ විවෘත භූමිභාගවලින් හෝ ඒවා සම්බන්ධයෙන් හෝ උද්ගත වන සියලු පොදු අයිතිවාසිකම්, සම්බන්ධතා සහ පහසුකම් ආරක්ෂා කිරීම සහ නඩත්තු කිරීම සඳහා ද එම මංමාවත් හෝ විවෘත භූමිභාග පොදු කාර්යයන් සඳහා උපයෝගී කර ගැනීම විධිමත් කිරීම, සකස් කර ගැනීම සහ සංවර්ධනය කිරීම සඳහා ද අවශ්‍ය සියලු පියවරවල් ගැනීම සෑම ප්‍රාදේශීය සභාවක ම කාර්යය විය යුතු අතර, එසේ පියවර ගැනීමට එම ප්‍රාදේශීය සභාවලට මෙයින් බලය පවරනු ලැබේ.

ප්‍රාදේශීය සභා වෙත සතු කරන ලද මංමාවත්.

23. යම් ප්‍රඥප්තියක් ප්‍රකාර දැනටමත් පැවරී ඇත්නම් හැර ප්‍රධාන මංමාවත් නොවන යම් ප්‍රදේශයක් තුළ පිහිටා ඇති වෙනත් සියලු මංමාවත් ඒ ප්‍රදේශයේ ප්‍රාදේශීය සභාව සතු වී ඇති ලෙස සලකනු ලැබිය යුතු ය.

ප්‍රාදේශීය සභාව විසින් සීමා ලකුණු කර පාරවල් සහ පටු මංවත් පිළිබඳ නාම ලේඛනයක් පළ කරනු ලැබිය යුතු බව.

24. (1) මෙම විධිවිධාන ක්‍රියාත්මක වීමෙන් අවුරුදු පහක් ඇතුළත හෝ යම් අවස්ථාවක විශේෂ අවස්ථානුගත කරුණු අනුව අමාත්‍යවරයා විසින් අවසර දෙනු ලැබිය හැකි වූ යම් වැඩිදුර කාලයක් ඇතුළත හෝ—

(අ) ප්‍රාදේශීය සභාව විසින් පවත්වාගෙන යනු ලබන පාරවල්වල සහ පටු මාවත්වල ස්ථිර සලකුණු සහ සීමා ලකුණු කිරීම ද එම පාරවල්වල සහ පටු මාවත්වල සැලැස්මවල් පිළියෙල කිරීමට කටයුතු සැලැස්වීම ද;

(ආ) එම පාරවල්වල සහ පටු මාවත්වල නාමලේඛනයක් දක්වමින් නියෝගවල නියම කර ඇති ආකාරයට දැන්වීම් පළ කිරීමට කටයුතු සැලැස්වීම් ද

සෑම ප්‍රාදේශීය සභාවකම කාර්යය විය යුතු ය.

(2) එවැනි දැන්වීම් පළ කරනු ලැබූ විට එවැනි පාරක් හෝ පටු මාවතක් ලකුණු කරනු ලැබ ඇත්තේ යම් ඉඩමක් හරහා ද එම ඉඩමේ අයිතිකරු ලෙස හිමිකම් පාන යම් පාර්ශ්වයක් විසින් එම දැන්වීමේ නියම කර ඇති කාලසීමාව ඇතුළත එම ඉඩමට තමන්ගේ ඇති අයිතිය ඔප්පු කිරීම සඳහා නිසි අධිකරණයෙහි නඩුවක් පැවරිය යුතු ය.

(3) (1) වන උප වගන්තිය යටතේ වූ දැන්වීම් ගැසට් පත්‍රයේ පළ කරනු ලැබූ දින සිට මාස තුනක කාලසීමාවක් අවසන් වීමෙන් පසු සහ මාස හයක කාල සීමාවක් අවසන් වීමට පෙර—

(අ) (2) වන උපවගන්තිය මගින් නියම කරනු ලැබ ඇති පරිදි පවරනු ලැබූ නඩුවක දී අවසාන තීරණයක් දෙනු නොලැබ ඇත්තේ යම් පාරක් සහ පටු මාවතක් හෝ පාරක කොටසක් සහ පටු මාවතක කොටසක් හෝ සම්බන්ධයෙන් ද එම පාර සහ පටු මාවත හෝ පාරේ කොටස සහ පටු මාවතේ කොටස හැර; සහ

(ආ) එම පාරවල්වල සහ පටු මාවත්වල සීමාවන් ලකුණු කිරීමේ දී සහ (2) වන උපවගන්තිය මගින් නියම කරනු ලැබ ඇති ලෙස පවරනු ලැබූ යම් නඩුවක දී අවසාන තීරණයක් දෙනු ලැබ ඇත්තේ යම් සැලැස්මක් සම්බන්ධයෙන් ද එම සැලැස්මෙහි අවශ්‍ය වෙනස් කිරීම් කරනු ලැබ

(1) වන උපවගන්තිය යටතේ පළ කරනු ලැබූ දැන්වීමක දක්වා ඇති සියලු පාරවල්වල සහ පටු මාවත්වල ලේඛනයක් දක්වන දැන්වීමක් නියමිත ආකාරයෙන් පළ කිරීමට, ප්‍රාදේශීය සභාව කටයුතු සැලැස්විය යුතු ය.

(4) (2) වන උපවගන්තිය මගින් නියම කර ඇති පරිදි පවරනු ලැබ ඇති යම් නඩුවක දී (3) වන උපවගන්තිය යටතේ වූ දැන්වීමක් පළ කිරීමෙන් පසු අවසාන තීරණයක් දෙනු ලැබ ඇති අවස්ථාවක දී එවැනි සෑම පාරක් සහ පටු මාවතක් හෝ පාරක කොටසක් සහ පටු මාවතක කොටසක් හෝ ඇතුළත් අතිරේක නාම ලේඛනයක් දක්වමින් නියමිත ආකාරයට දැන්වීමක් පළ කිරීමට ප්‍රාදේශීය සභාව විසින් සලස්වනු ලැබිය යුතුය. එමම දැන්වීම පළ කිරීමට පෙර (2) වන උපවගන්තිය මගින් නියම කර ඇති පරිදි පවරනු ලැබූ යම් නඩුවක් සම්බන්ධයෙන් දෙනු ලැබූ අවසාන තීරණයෙහි පදනම මත පාරවල්වල සහ පටු මාවත්වල සීමාවන් ලකුණු කිරීම සහ සැලැස්මවලට අදාළව අවශ්‍ය වෙනස් කිරීම් කරනු ලැබිය යුතු ය.

(5) (3) වන හෝ (4) වන හෝ උපවගන්ති යටතේ වූ දැන්වීමක් පළ කරනු ලැබූ විට, එම දැන්වීමේ විස්තර කර ඇති සහ එම සැලැස්මවල් මගින් පෙන්නුම් කර ඇති සියලු පාරවල් සහ පටු

මාවත් හෝ එම පාරවල්වල හෝ පටු මාවත්වල කොටස් හෝ ප්‍රාදේශීය සභාව වෙත සතු කරනු ලැබ ඇති ලෙස සලකනු ලැබිය යුතු ය.

(6) ප්‍රාදේශීය සභාව වෙත සතු කරනු ලැබූ යම් පාරක් හෝ පටු මාවතක් හෝ යම් පාරක හෝ පටු මාවතක යම් කොටසක් හෝ පාරක් හෝ පටු මාවතක් ලෙස පාවිච්චි කිරීම අවසන් වන කවර අවස්ථාවක වුවද ප්‍රාදේශීය සභාව විසින් (3) වන හෝ (4) වන හෝ උපවගන්තිය යටතේ දැන්වීමට සංශෝධනයක් පළ කරනු ලැබිය යුතු ය.

කාලාපගමනය.

**25.** කාලාපගමන ආඥාපනතේ විධිවිධාන හෝ සන්තකයට ගැනීම හෝ ප්‍රයෝජනයට ගැනීම ප්‍රකාර අයිතිවාසිකම් ලබා ගැනීමට අදාල වෙනත් යම් නීතියක විධිවිධාන හෝ, ප්‍රාදේශීය සභාවේ සීමා වන් ඇතුළත පිහිටි පාරවල් සම්බන්ධයෙන් අදාල නොවිය යුතු අතර, යම් තැනැත්තකු විසින් මේ පනත ක්‍රියාත්මක වීමට පෙර හෝ ඊට පසු හෝ එවැනි පාරක හෝ එහි යම් කොටසක සන්තකය දැරීමේ හෝ කුමන හෝ අන්දමේ ප්‍රයෝජනයක් ගැනීමේ හෝ හේතුවෙන් එම තැනැත්තාට එම පාරේ හෝ එහි යම් කොටසක හෝ හිමිකම පිළිබඳ පරම අයිතියකට හෝ සන්තකය දැරීමකට හෝ ප්‍රයෝජනයට ගැනීමකට හෝ හිමිකම් නොතිබිය යුතු ය.

දැන්වීම් භාරදිය යුතු ආකාරය.

**26.** මෙම පරිච්ඡේදය යටතේ දෙනු ලැබීමට නියමිත සෑම දැන්වීමක්ම එම තැනැත්තා වෙත පුද්ගලිකව භාර දීම හෝ ඔහුගේ නිවසේ සාමාජිකයකුට භාර දීම හෝ ඔහුගේ නිවසේ ප්‍රකටව පෙනෙන කොටසක ඇලවීම හෝ මගින් කරනු ලැබිය හැකි ය.

අලුත් මංමාවත් ඉදිකිරීමට සහ දැනට ඇති මංමාවත් වැඩිදියුණු කිරීමට ප්‍රාදේශීය සභාවට ඇති බලය.

**27.** එක් එක් ප්‍රාදේශීය සභා ප්‍රදේශයක් ප්‍රාදේශීය සභාවක් විසින් ම, එම ප්‍රදේශය තුළ—

(අ) අලුත් පාරවල්, වීථි, පාලම්, උමං සහ වෙනත් මංමාවත් සැලසුම් කිරීම සහ ඉදි කිරීම ;

(ආ) ප්‍රධාන මාවතක් නොවන යම් ප්‍රසිද්ධ වීථියක් හෝ මංමාවතක් සම්පූර්ණයෙන් හෝ කොටසක් වශයෙන් මහාමාර්ග විෂය භාර අමාත්‍යවරයාගේ අනුමතය ඇතිව යම් ප්‍රධාන මාවතක් ද පුළුල් කිරීම, විවෘත කිරීම, ලොකු කිරීම හෝ වෙනත් අන්දමකින් වැඩි දියුණු කිරීම හෝ හැරවීම, වෙනත් අතකට යොමු කිරීම, විසා දැමීම සහ අවසන් කිරීම

ඒ කාර්යය සඳහා අවශ්‍ය වන යම් දේපළක අයිතිකරුවන්ට හෝ පදිංචිකරුවන්ට හෝ ස්වකීය නීත්‍යානුකූල අයිතිවාසිකම් කැඩී ඇත්තේ යම් තැනැත්තන්ගේ ද ඒ තැනැත්තන්ට හෝ හිමි වන්දි මුදල් ගෙවා, සිදු කරනු ලැබිය හැකි ය.

හැරවීම හෝ ලොකු කිරීම හෝ සඳහා අවශ්‍ය ඉඩම් අත් කර ගැනීම.

28. (1) හැරවීම, වෙනත් අතකට යොමු කිරීම, පුළුල් කිරීම, විවෘත කිරීම, ලොකු කිරීම හෝ යම් මංමාවතක් වැඩි දියුණු කිරීම සම්බන්ධයෙන් යම් තැනැත්තකුගේ ඉඩමක සන්තකය පොදු කාර්යයක් සඳහා ලබා ගැනීමට ප්‍රාදේශීය සභාවට අවශ්‍ය වූ විට, කලින් තිබූ මංමාවතෙහි බිම් ප්‍රමාණයක හෝ ඉන් කොටසක සන්තකය ඒ තැනැත්තාට ලබා දීමෙන් හෝ ඒ වෙනුවට වෙනත් ඉඩමක් ලබා දීමෙන් හෝ මුදල් ගෙවීමෙන් හෝ එවැනි ක්‍රම දෙකකින් හෝ ඊට වැඩි ගණනකින් හෝ ඒ ඉඩම හෝ එහි යම් ගොඩනැගිල්ලක්, තාප්පයක්, ගේට්ටුවක්, වැටක් හෝ එහි ඇති යම් ගසක් හෝ වෙනුවෙන් වන්දි ගෙවීම සඳහා ඒ අයිතිකරු සමග ප්‍රාදේශීය සභාව ගිවිසුමකට එළඹීම නීත්‍යානුකූල විය යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ යම් ගිවිසුමක් අනුව ක්‍රියා කිරීමේ දී සන්තකය අත්කර ගනු ලැබූ යම් ඉඩමක්, එහි ඩිඩිමත් පැවරීමක් නොමැතිව ප්‍රාදේශීය සභාව වෙත සතු විය යුතු අතර, (1) වන උපවගන්තිය යටතේ හුවමාරු කිරීමක් වශයෙන් දෙනු ලැබූ ඉඩමක යම් කොටසක හෝ කලින් තිබුණු පාරක හෝ වෙනත් ඉඩමක සන්තකය ඇරීමට ප්‍රාදේශීය සභාව විසින් යම් තැනැත්තකුට අවසර දෙනු ලැබූ බවට සභාපතිවරයා විසින් නිකුත් කරනු ලැබූ සහතිකයක් සමග වූ එහි මැනුම් පිඹුරක් ඒ බිම් ප්‍රමාණය හෝ ඉඩම් පිළිබඳ ඒ තැනැත්තාගේ අයිතිය පිළිබඳ ප්‍රමාණවත් සාක්ෂියක් විය යුතු ය.

(3) (1) වන උපවගන්තිය යටතේ ගෙවිය යුතු වන්දි සම්බන්ධයෙන් යම් ඉඩමක අයිතිකරු සමග ප්‍රාදේශීය සභාවට එකඟවීමට නොහැකි අවස්ථාවක දී හෝ එහි අයිතිකරු සොයාගත නොහැකි අවස්ථාවක දී හෝ යම් ඉඩමක අයිතිකරු සමග එකඟත්වයකට පැමිණීම ප්‍රඥාගෝචර නොවේ යයි ප්‍රාදේශීය සභාව සලකන අවස්ථාවක දී හෝ ඒ ඉඩමේ සන්තකය ලබා ගැනීමට සහ අයිතිකරු වෙත වන්දි ගෙවීමට 128 වන වගන්තියෙන් නියම කර ඇති ආකාරයට කටයුතු කළ යුතු ය.

(4) (1) වන උපවගන්තිය යටතේ වූ සෑම ගිවිසුමක්ම ලියවිල්ලකින් විය යුතු අතර වංචා වැළැක්වීමේ ආඥාපනතේ 2 වන වගන්තිය, එවැනි යම් ගිවිසුමකට හෝ (1) වන උපවගන්තිය යටතේ කරනු ලබන යම් සම්ප්‍රදානයකට හෝ අදාළ නොවිය යුතු ය.

මංමාවත් හැරවීම හෝ ලොකු කිරීම හෝ සඳහා අවශ්‍ය ඉඩම් ත්‍යාග වශයෙන් දීම.

**29.** හැරවීම, වෙනත් අතකට යොමු කිරීම, පුළුල් කිරීම, විවෘත කිරීම, ලොකු කිරීම හෝ යම් මංමාවතක් වැඩි දියුණු කිරීම සම්බන්ධයෙන්, යම් තැනැත්තකුගේ ඉඩමක් පොදු කාර්යයක් සඳහා ප්‍රාදේශීය සභාවට සන්තකය ලබා ගැනීමට අවශ්‍ය වූ විටක ඉඩමේ අයිතිකරු ලෙස හිමිකම් පාන තැනැත්තා ඒ කාර්යය සඳහා ඒ ඉඩම ප්‍රාදේශීය සභාවට භාර කිරීමට කැමති නම්, සභාපතිවරයා හෝ ඔහු විසින් ඒ සඳහා ලියවිල්ලකින් බලය පවරන ලද වෙනත් තැනැත්තකු ඉදිරියේ ඒ තැනැත්තා විසින් නියම පරිදි අත්සන් කරන ලද ලියවිල්ලකින් වූ ප්‍රාර්ථනාවක්, ඒ ඉඩම ප්‍රාදේශීය සභාව වෙත සතු කිරීම සඳහා ප්‍රමාණවත් විය යුතු ය. ප්‍රසිද්ධ නොතාරිස්වරයකු සහ සාක්ෂිකරුවන් විසින් සහතික නොකිරීම යන වංචා වැළැක්වීමේ ආඥාපනතේ (2) වන වගන්තියේ අවශ්‍යතාවලට අනුව ක්‍රියා නොකිරීමේ හේතුව නිසා පමණක් ඒ ප්‍රාර්ථනාව අවලංගු ලෙස හෝ නීතියෙහි ලා බල රහිත ලෙස හෝ සලකනු නොලැබිය යුතු ය.

අත්හැර දැමූ වීථියක් බැහැර කිරීමේ බලය.

**30.** ප්‍රාදේශීය සභාව වෙත සතු කරන ලද යම් වීථියක් හෝ වෙනත් මංමාවතක් හෝ යම් වීථියක හෝ මංමාවතක කොටසක්, වීථියක් හෝ මංමාවතක් ලෙස භාවිතා කිරීම අවශ්‍යත්ව ඇති නොවන අවස්ථාවක වුව ද ප්‍රාදේශීය සභාව විසින්, අමාත්‍යවරයාගේ පූර්ව අනුමතය ඇතිව, ඒ වීථිය හෝ මංමාවත හෝ එහි කොටස විකිණීම, බදු දීම හෝ හුවමාරු කිරීම කරනු ලැබිය හැකි ය.

ගොඩනැගිලි තැනීමේ කාර්ය සඳහා අලුත් වීථියක් යාබද ඉඩම් ගැනීම.

**31.** යම් අලුත් වීථියක් හෝ මංමාවතක් සැලසුම් කිරීමේ දී හෝ ඉදි කිරීමේ දී හෝ යම් වීථියක් හෝ මංමාවතක් හැරවීමේ දී, වෙනත් අතකට යොමු කිරීමේ දී, පුළුල් කිරීමේ දී, විවෘත කිරීමේ දී, ලොකු කිරීමේ දී හෝ වෙනත් අයුරකින් වැඩිදියුණු කිරීමේ දී, ප්‍රාදේශීය සභාව විසින්, වාහන මාර්ගය සහ අඩි පාර සඳහා අවශ්‍ය ඉඩම් ප්‍රමාණයට අමතරව, ඒ වීථිය හෝ මංමාවත දෙපස නිවාස සහ ගොඩනැගිලි තැනීම සඳහා අවශ්‍ය ඉඩම් මිල දී ගනු ලැබිය හැකි අතර 18 වන වගන්තියේ (x) වන, (xi) වන සහ (xii) වන ඡේද වල විධිවිධානවලට යටත්ව සහ එසේ ඉදි කළ යුතු නිවාස සහ ගොඩනැගිලිවල පංතිය සහ විස්තරය පිළිබඳව ප්‍රාදේශීය සභාව සුදුසු යයි සිතන නියමවලට සහ කොන්දේසිවලට යටත් ව, ඒ ඉඩම් විකිණීම, බද්දට දීම හෝ වෙනත් අයුරකින් බැහැර කිරීම කළ හැකි ය.

ප්‍රාදේශීය සභාවල පොදු බලතල.

**32.** ප්‍රාදේශීය සභාවක් වෙත සතු කොට ඇති වෙනත් යම් බලතලවලට හානියක් නොමැතිව, ප්‍රාදේශීය සභාවක් විසින් පහත සඳහන් ක්‍රියා අතුරින් කිසිවක් කිරීම නීත්‍යානුකූල විය යුතු ය :—

(අ) වීථිවලට ජලය සැපයීම ;

(ආ) යම් වීථියක හෝ මංමාවතක අයුතු ලෙස අල්ලා ගැනීමක් හෝ බාධකයක් ගැන වගකිව යුතු තැනැත්තා ප්‍රාදේශීය සභාව දැන සිටින අවස්ථාවක දී, ඔහුට දැන්වීමක් කර ලැබ, එකී දැන්වීමේ සඳහන් කළ හැකි කාලය ඇතුළත හෝ අනලස්ව එකී අයුතු අල්ලා ගැනීම හෝ බාධක

බැහැර කිරීම ඔහු පැහැර හැරියහොත් පමණක් ප්‍රාදේශීය සභාව විසින් එය බැහැර කරනු ලැබිය යුතු ය යන කොන්දේසියට යටත් ව, එබඳු යම් වීදියක හෝ ප්‍රසිද්ධ පාරක ඇති එබඳු අයුතු අල්ලා ගැනීම හෝ බාධකයක් ඉවත් කිරීම;

(ඇ) වීදිවල නම් පින්තාරු කිරීම සහ යම් පෞද්ගලික දේපළක පිහිටි නිවාසවල හෝ ගෙපත්වල අංක ඇඳීම;

(ඈ) පැළ ගෙවල් වසා තැබීම සහ ආරක්ෂා කිරීම;

(ඉ) මෙහි (ආ) සහ (ඇ) ඡේද යටතේ කළ යම් ක්‍රියාවක් නිසා දරන්නට වූ වියදම්, එකී ක්‍රියා අවශ්‍ය වූයේ යම් තැනැත්තකුගේ ක්‍රියාවක් හෝ නොසැලකිල්ලක් නිසා ද ඒ තැනැත්තාගෙන් මෙහි මින්මතු විධිවිධාන සලස්වනු ලැබ ඇති අන්දමින් අය කර ගැනීම.

33. යම් ප්‍රාදේශීය සභාවක් විසින්, ඒ ප්‍රාදේශීය සභා ඇතුළත පිහිටි යම් වතුයාය එකක හෝ වැඩි ගණනක හෝ යම් කර්මාන්ත ව්‍යාපාරයක හෝ වැඩි ගණනක අයිතිකරු හෝ අයිතිකරුවන් විසින් කරනු ලබන ඉල්ලීමක දී, එසේ ඉල්ලීමක් කරනු ලැබූ නිසා නොවේ නම් ඒ ප්‍රදේශය තුළ පාරක් ඉදිකිරීම හෝ නඩත්තු කිරීම පොදු යහපත සැලකීමේ දී සාධාරණ නොවන බව ප්‍රාදේශීය සභාවේ මතය වන යම් අවස්ථාවක දී, ප්‍රශ්නයට භාජනය වී ඇති වතුයායේ, හෝ වතුයායවල්වල හෝ ව්‍යාපාරයේ හෝ ව්‍යාපාරවල ප්‍රයෝජනය සඳහා පාරක් ඉදිකිරීම හෝ නඩත්තු කිරීම සඳහා, එකී ඉදිකිරීම හෝ නඩත්තු කිරීම පිළිබඳව වන වියදම් වෙනුවෙන් ප්‍රාදේශීය සභාව විසින් අනුමත කරනු ලැබිය හැකි පරිදි, දායක මුදලක් ගෙවීමට යටත්ව මෙන්ම, සුදුසු සාධන පත්‍රයක් මාර්ගයෙන් එකී පාර ප්‍රසිද්ධ පාරක් ලෙස සංස්ථාපනය කරන ලද බවට සහ ප්‍රාදේශීය සභාව සතු කර ඇති බවට කොන්දේසියකට යටත්ව ද, එකී අයිතිකරු හෝ අයිතිකරුවන් සමග ගිවිසුමකට බැඳිය හැකි ය. තවද එකී ගිවිස ගන්නා ලද සියළුම දායක මුදල් ප්‍රයෝජනය ලත් ඉඩම් සඳහා නියම කරන ලද විශේෂ වරිපණම් මුදලක් ලෙස සැළකිය යුතු අතර ඒවා මේ පනත යටතේ නියම කර ගන්නා ලද වරිපණම් අයකර ගන්නා ආකාරයෙන්ම ලබා ගත හැකි විය යුතුවාක් මෙන්ම වරිපණම් සම්බන්ධයෙන් මේ පනතේ සියළුම විධිවිධාන ඊට අදාළ විය යුතු ය.

පෞද්ගලික දේපළ හිමියන්ගේ යහපත සඳහා පාරවල්.

34. ප්‍රාදේශීය සභාවක් විසින්, වෙනත් යම් ලිඛිත නීතියකින් මේ සම්බන්ධයෙන් නියම කරනු ලැබිය හැකි තහනම් කිරීම් සහ සීමා කිරීම්වලට යටත්ව ද, ඉන් යම් ප්‍රධාන මංමාවතකට බලපෑමක් සිදුවිය හැකි ප්‍රමාණයකට ද, මහා මාර්ග පිළිබඳ විෂය භාරව සිටින අමාත්‍යවරයාගේ අනුමතියට යටත්ව ද, ප්‍රාදේශීය සභාව සහ එහි නිලධරයන් විසින් නොඑසේ නම් සභාවේ ප්‍රවර්ධකයක හෝ ප්‍රවර්ධකයන් සමග එකතුවීමක් මගින් ප්‍රාදේශීය සභාවේ පරිපාලන සීමා ඇතුළත යම් ප්‍රදේශයක පදිංචිකරුවන්ට සේවය කිරීම සඳහා, යම් ආකාරයක පොදු රථවාහන සේවයක් සංවිධානය කොට නඩත්තු කරනු ලැබිය හැකි ය.

පොදු රථවාහන සේවා.

අබලන් වූ සහ අන්තරාය දායක තත්ත්වයක තිබෙන නිවාස.

**35.** යම් ප්‍රදේශයක යම් වීදියකට හෝ මංමාවතකට යාවූ යම් නිවසක්, ගොඩනැගිල්ලක්, මායිම් තාප්පයක් හෝ ගේට්ටුවක් හෝ ඊට සවිකර ඇති යම් කිසිවක්, අන්තරාදායක වුව ද නොවුව ද, අබලන් වූ තත්ත්වයක පවතී යයි හෝ ඇද වැටීමට ඉඩ තිබේ යයි එම ප්‍රදේශයේ ප්‍රාදේශීය සභාව විසින් සලකනු ලැබුවහොත්, ඒ වීදිය හෝ මංමාවත පාවිච්චි කරන තැනැත්තාගේ ආරක්ෂාව සඳහා නිසි ලෑලි ආවරණයක් හෝ වැටක් හෝ අවශ්‍ය යයි පෙනියන්නේ නම් එවැනි ආවරණයක් හෝ වැටක් ප්‍රාදේශීය සභාව විසින් වහාම ඉදිකරවිය යුතු අතරම ඒ නිවස, ගොඩනැගිල්ල, මායිම් තාප්පය ගේට්ටුව හෝ එහි සවිකර ඇති දෙය පවතින තත්ත්වය අනුව අවශ්‍ය පරිදි, වහාම කඩා දමන ලෙස, ස්ථාවර කරන ලෙස හෝ අලුත්වැඩියා කරන ලෙස අයිතිකරු වෙත හෝ පදිංචිකරු වෙත ලියවිල්ලකින් වූ දැන්වීමක් භාර දීමට ද සැලැස්විය යුතු ය.

දැන්වීම ප්‍රකාර ක්‍රියා කිරීම පැහැර හැරීම.

**36.** 35 වන වගන්තිය යටතේ ප්‍රාදේශීය සභාවක් විසින් හෝ ඒ වෙනුවෙන් හෝ දැන්වීමක් භාර දෙනු ලැබුයේ යම් තැනැත්තකු වෙත ද, ඒ තැනැත්තා විසින්, එය භාර දුන් දින සිට දින අටක් ඇතුළත ඒ දැන්වීම ප්‍රකාර ක්‍රියා කිරීමට පටන් ගනු නොලැබුව හොත් හෝ නිසි අනලස් භාවයෙන් යුතුව ඒ කටයුත්ත සම්පූර්ණ කරනු නොලැබුවහොත් ප්‍රාදේශීය සභාව විසින් සම්පූර්ණ කටයුත්ත හෝ කටයුත්තෙහි ඉටු කිරීමට අවශ්‍ය යයි ප්‍රාදේශීය සභාව අදහස් කරන යම් කොටසක් ක්‍රියාත්මක කිරීමට සැලැස්විය හැකි අතර ප්‍රාදේශීය සභාව විසින් දරන ලද සියළුම වියදම් ඒ තැනැත්තා විසින් ගෙවිය යුතුවාක් මෙන්ම එම වියදම් මෙහි මින්මතු විධිවිධාන සලස්වා ඇති අයුරින් අයකර ගත හැකි විය යුතු ය.

අබලන් වූ නිවාසවල ද්‍රව්‍ය විකිණීම.

**37.** 36 වන වගන්තිය යටතේ යම් ප්‍රාදේශීය සභාවක් විසින් යම් නිවසක්, ගොඩනැගිල්ලක් හෝ බිත්තියක් හෝ ඉන් යම් කොටසක් හෝ කඩා දමනු ලැබුවහොත් එහි ද්‍රව්‍ය හෝ කඩා දමනු ලැබූ කොටසෙහි ද්‍රව්‍ය ප්‍රමාණය ඒ ප්‍රාදේශීය සභාව විසින් විකුණනු ලැබිය හැකි අතරම, ඒ විකිණීමෙන් ලත් මුදල්, දරන ලද වියදම් ගෙවීමෙහි ලා යොදවනු ලැබිය හැකිය; තවද ඒ විකිණීමෙන් ලැබෙන යම් අතිරික්තයක්, ඒ නිවසේ ගොඩනැගිල්ලේ හෝ බිත්තියේ අයිතිකරු ඉල්ලා සිටි විට ප්‍රාදේශීය සභාව විසින් එය ගෙවනු ලැබිය යුතු ය :

එසේ වුවද එලෙස ඉල්ලීමක් කිරීමට අයිතිවාසිකම් ඇති යම් තැනැත්තකු විසින් මාස දොළහක් ඇතුළත ඒ අතිරික්තය සඳහා ඉල්ලීමක් කරනු නොලැබූ කල්හි, ප්‍රාදේශීය සභාවේ අරමුදලේ බැරට ඒ අතිරික්තය ගෙවීමට සෑම විටම ප්‍රාදේශීය සභාවට නිදහස තිබිය යුතු අතරම, ඒ අයිතිවාසිකම් ඉදිරිපත් නොකළ අතිරික්තය සඳහා හෝ ඒ සම්බන්ධයෙන්, එය ගෙවීමට හෝ ඒ පිළිබඳව වග කීමට ඇති බැඳීමෙන් ප්‍රාදේශීය සභාව නිදහස් විය යුතු ය :

එසේම තවදුරටත්, ඉහත සඳහන් කාර්යයන් සඳහා එකී ද්‍රව්‍ය ප්‍රාදේශීය සභාව විසින් විකුණනු ලැබ තිබිය හැකි වුවද, විකිණීමෙන් ලත් මුදල යෙදීමෙන් පසුවත් අයවිය යුතුව ඇති යම් වියදම් ප්‍රමාණයක් වේ නම්, එය ගෙවන ලෙස බලකිරීමට, සම්පූර්ණ වියදම් ගෙවන ලෙස බලකිරීම සඳහා මේ පනතින් ප්‍රාදේශීය සභාවට සැළසී ඇති ප්‍රතිකර්ම ම යොදාගත හැකි විය යුතු ය.

### මංමාවත් නඩත්තු කිරීම සහ අලුත්වැඩියා කිරීම

38. යම් ප්‍රාදේශීය සභාවක නිසි නිලධරයා විසින් සහ ඔහු විසින් හෝ ඔහු යටතේ හෝ සේවයෙහි නියුක්ත කොට ඇති සේවකයන්, වැඩකරුවන්, සහ කම්කරුවන් විසින් සියළු වේලාවන්හි දී සියළුම අවශ්‍ය සහ සුදුසු රථ, කරත්ත, සතුන් සහ සෙසු සියළු උපකරණ ද සහිතව, ඒ ප්‍රදේශය ඇතුළත පවතින හෝ යෝජිත යම් මංමාවතකට යාබද හෝ ඒ අසළ ඇති යම් ඉඩමකට ඇතුල්වීම සහ එහිදී එවැනි යම් මංමාවතක් අනාරේඛනය කිරීමේ, මැනීමේ, සෑදීමේ, නිර්මාණය කිරීමේ, විවෘත කිරීමේ, වෙනස් කිරීමේ, හැරවීමේ, අලුත්වැඩියා කිරීමේ, ශුද්ධ කිරීමේ, වැඩි දියුණු කිරීමේ සහ ඊට වැටක් නැතීමේ කාර්යයන් සඳහා හෝ එහි ඇති හෝ ඊට යම් අන්දමකින් සම්බන්ධ යම් පාලමක්, වැටක්, කාණුවක්, වේල්ලක් හෝ අගලක්, ඉදි කිරීම, කැණීම, අලුත්වැඩියා කිරීම, ශුද්ධ කිරීම, හෝ වැඩි දියුණු කිරීම සඳහා හෝ මේ පනතේ විධිවිධාන යටතේ යම් ක්‍රියාවක්, කරුණක් හෝ දෙයක් ඉටු කිරීම සඳහා අවශ්‍ය සියළු ක්‍රියා සහ කාරුණු හෝ දේවල් වෙන් වෙන් වශයෙන් කිරීම සහ ඉටු කිරීම නීත්‍යානුකූල විය යුතු ය.

මංමාවත් අලුත්වැඩියා කිරීම ආදිය සඳහා ඉඩම්වලට ඇතුළුවීමට බලය පවරනු ලද නිසි නිලධරයන්

39. යම් ප්‍රාදේශීය සභාවක නිසි නිලධරයා විසින් සහ ඔහු විසින් හෝ ඔහු යටතේ හෝ සේවයෙහි නියුක්ත කොට ඇති සේවකයන්, වැඩකරුවන් සහ කම්කරුවන් විසින් සියළු සාධාරණ වේලාවන්වල අවශ්‍ය සහ සුදුසු රථ, කරත්ත, සතුන් සහ සෙසු උපකරණවලින් යුක්තව ඒ ප්‍රාදේශීය සභා ප්‍රදේශයෙහි වූ යම් පවතින හෝ යෝජිත මංමාවතක් අනාරේඛනය කිරීමේ, මැනීමේ සෑදීමේ, නිර්මාණය කිරීමේ, විවෘත කිරීමේ, වෙනස් කිරීමේ හැරවීමේ, අලුත්වැඩියා කිරීමේ, ශුද්ධ කිරීමේ, වැඩි දියුණු කිරීමේ, හෝ ඊට වැටක් නැතීමේ කාර්යය සඳහා හෝ අනුරේඛනය කිරීම, මැනීම, සෑදීම, නිර්මාණය කිරීම, විවෘත කිරීම, වෙනස් කිරීම, හැරවීම, අලුත්වැඩියා කිරීම, ශුද්ධ කිරීම, වැඩිදියුණු කිරීම හෝ ඊට වැටක් නැතීම සම්බන්ධයෙන් යම් ආකාරයකින් සහාය වීම සඳහා හෝ එහි ඇති හෝ ඊට යම් අන්දමකින් සම්බන්ධ යම් පාලමක්, වැටක්, කාණුවක්, වේල්ලක් හෝ අගලක් ගොඩනැගීමේ, කැණීමේ, අලුත්වැඩියා කිරීමේ, ශුද්ධ කිරීමේ, හෝ වැඩිදියුණු කිරීමේ කාර්යය සඳහා හෝ ; ඉහත සඳහන් ප්‍රකාර යම් නිලධරයකුගේ හෝ ඔහු යටතේ සේවයෙහි නියුක්ත කොට ඇති යම් වැඩකරුවන්ගේ සතුන්ගේ, රථවල, තැනැත්තන්ගේ හෝ දේවල්වල ප්‍රයෝජනය සඳහා, එබඳු යම් මංමාවතක හෝ ඒ අසල අවශ්‍ය කරන්නා වූ කවර අන්දමට හෝ කම්කරු නිවාස හෝ ගොඩනැගිලි ඉදිකිරීමට හෝ අලුත්වැඩියා

ද්‍රව්‍ය ගැනීමට බලය.

කිරීම සඳහා එවැනි යම් මංමාවතකට යාවූ හෝ ඒ අසල ඇති යම් ඉඩමක් තුළින් හෝ ඉඩමකින් ජලය, යම් ඇට දඬුවක්, කැඩූ අත්තක්, ගල්, බොරලු මැටි හෝ වෙනත් කවර හෝ ද්‍රව්‍යයක් සොයා බැලීම, හෑරීම, කැපීම, ගැනීම සහ ඉවත ගෙන යාම සහ එය, යම් තැනැත්තකුගේ ඉඩමක් මැදින්, අයුතු අන්දමින් ඇතුල්වන්නකු ලෙස නොසැලකී, ඉවත ගෙනයාම, නීත්‍යානුකූල විය යුතු ය :

එසේ වුවද, ඒ ආසන්නයේ ඇති මුඩු බිම් හෝ පොදු හෝ අත් හැර ඇති භූමිවලින් පහසුවෙන් සෑහෙන තරම් ද්‍රව්‍ය ලබාගත නොහැකි නම් මිස, ගෙමිදුලකින්, ගෙයකට ප්‍රවේශවන මාර්ගයකින්, තණ බිස්සකින්, හෝ කොටුකර ඇති යම් වත්තකින්, වැසිල්ලකින්, කුඹුරකින්, හෝ කැලයකින්, හෝ ඒ මත, එහි අයිතිකරුගේ එකඟත්වය නොමැතිව, එවැනි ද්‍රව්‍ය හෑරීම, කැපීම, හෝ ඉවතට ගෙන යාම නොකළ යුතු අතර, එසේ ලබාගත හැකි අවස්ථාවක එකී නිලධරයාට පහසුවෙන් ලබා ගත හැකි ස්ථානයකින් ඔහු විසින් ද්‍රව්‍ය වලින් කිසිවක් ලබා ගත හැකි ය :

එසේ ද වුවත්, එසේ ලබාගත් සියළු ද්‍රව්‍ය සඳහා සහ ද්‍රව්‍ය ගැනීමේ දී සහ ඉවතට රැගෙන යාමෙහි දී වූ අලාභ සඳහා යුක්ති සහගත වන්දියක්, එහි අයිතිකරුට දිය යුතු ය :

එසේම තවදුරටත්, එවැනි ද්‍රව්‍ය කිසිවක් ගන්නා ලද යම් ගල් වලක් හෝ වළක් යම් තැනැත්තකුට හෝ සත්වයකුට අන්තරාදායක නොවිය හැකි වන අයුරින් ඒ නිලධරයා විසින් කොටු කිරීම කරනු ලැබිය යුතු ය.

ගොඩනැගිලි ඉදි කිරීමට ගල ගවයන් ආදී සතුන් යොදා ගැනීමේ ඇති බලය.

**40.** යම් ප්‍රාදේශීය සභා ප්‍රදේශයක් තුළ පවතින හෝ යෝජිත යම් මංමාවතක් අනුරේඛනය කරන, මනින, සාදන, නිර්මාණය කරන, විවෘත කරන, වෙනස් කරන, හරවන, අලුත්වැඩියා කරන, ශුද්ධ කරන, හෝ වැඩිදියුණු කරන විටක, හෝ එහි ඇති හෝ ඊට යම් අන්දමකින් සම්බන්ධ යම් පාලමක්, වැටක්, කාණුවක්, වේල්ලක්, හෝ අගලක් ගොඩනගන, කණින, අලුත්වැඩියා කරන, ශුද්ධ කරන හෝ වැඩිදියුණු කරන විටක, ප්‍රාදේශීය සභාවේ නිසි නිලධරයා විසින්—

(අ) ඒ කටයුත්ත කරගෙන යන අතරතුර, ඒ නිලධරයාගේ හෝ ඒ නිලධරයා විසින් සේවයෙහි නිරත කොට ඇති සේවකයන්, වැඩකරුවන්, කම්කරුවන්, සතුන්, රථ හෝ දේවල් සඳහා ඉඩ පහසුකම් සැලසීම පිණිස ඊට යාවූ හෝ ඒ අසල ඇති යම් වත්තක තාවකාලික ගොඩනැගිලි සෑදීම සහ ඉදි කිරීම ; සහ

(ආ) ඔහු විසින් සේවයෙහි නිරත කොට ගනු ලැබිය හැකි එබඳු සියළුම සතුන්, ඊට යාව හෝ ඒ අසළ හෝ ඇති ඉඩම්වල නිසි ලෙස දිගේලි කිරීම සහ බැඳ තැබීම සහ අවශ්‍ය විය හැකි යම් කාලයක් ඒ සතුන් ඒ ඉඩම්වල දිගටම තබා ගැනීම :

එසේ වුවද, තත් කාර්යය සඳහා තදාසන්න මුඩුබිම් හෝ පොදු හෝ අත්හල ඉඩම් තිබෙන, යම් ප්‍රදේශයක් තුළ පිහිටියා වූ හෝ වගා කර ඇත්තා වූ යම් ඉඩමක එවැනි කිසිම ගොඩනැගිල්ලක් ඉදි කිරීම හෝ එබඳු යම් සතකු තැබීම හෝ නොකළ යුතු ය:

එසේම තවදුරටත්, ඉඩමට යම් අලාභයක් කරන ලද සියලු අවස්ථාවල දී එහි අයිතිකරුට සාධාරණ වන්දියක් දිය යුතු ය.

41. යම් ප්‍රාදේශීය සභා ප්‍රදේශයක් ඇතුළත පවතින හෝ යෝජිත යම් මංමාවතක් අනුරේඛනය කිරීමෙහි, මැනීමෙහි, සෑදීමෙහි, නිර්මාණය කිරීමෙහි, වෙනස් කිරීමෙහි, හැරවීමෙහි, ශුද්ධ කිරීමෙහි, හෝ අලුත්වැඩියා කිරීමෙහි ලා, හෝ එහි ඇති හෝ ඊට යම් අන්දමකින් සම්බන්ධ යම් පාලමක්, වැටක්, කාණුවක්, වේල්ලක් හෝ අගලක් ගොඩනැගීමෙහි, කැණීමෙහි, අලුත්වැඩියා කිරීමෙහි, ශුද්ධ කිරීමෙහි හෝ වැඩිදියුණු කිරීමෙහි ලා යම් වැඩ බිමකින් ඉවත් කිරීමට අවශ්‍ය විය හැකි, පස්, කුණු හෝ ද්‍රව්‍ය ඒ ප්‍රදේශයේ ප්‍රාදේශීය සභාවේ නිසි නිලධරයා විසින් මංමාවතකට යාබද හෝ ඒ අසල ඇති ඉඩම් මතට විසි කිරීම, නීත්‍යනුකූල විය යුතු ය: යාබද ඉඩම් වලට කසළ විසි කිරීමට ඇති බලය.

එසේ වුවද, නිසි නිලධරයකු විසින්, එවැනි යම් ඉඩමකට විසි කරන ලද සියළුම පස්, කුණු හෝ ද්‍රව්‍ය ඔහු විසින් සාධාරණ කාලයක් ඇතුළත ඒ ඉඩමෙන් ඉවත් කරනු ලැබිය යුතු ය.

42. යම් ප්‍රාදේශීය සභා ප්‍රදේශයක දැනට පවතින හෝ යෝජිත යම් මංමාවතක යම් කටයුත්තක් හෝ ඊට යම් අන්දමකින් සම්බන්ධ කටයුත්තක් ක්‍රියාත්මක කිරීමේ දී ඒ ප්‍රාදේශීය සභාවේ නිසි නිලධරයා විසින් ඒ මංමාවතට යාබද හෝ ඒ අසළ ඇති හෝ භූමි මැදින් තාවකාලික පාරක් ඉදිකිරීම නීත්‍යනුකූල විය යුතු ය: තාවකාලික පාරවල් සෑදීමට ඇති බලය

එසේ වුවද, යම් ගොඩනැගිල්ලක් පිහිටා ඇති යම් භූමියක් උඩින් හෝ කොටු කොට ඇති වත්තක් හෝ මිදුලක් උඩින් එවැනි පාරක් ඉදි නොකළ යුතු ය.

43. යම් ප්‍රදේශයක ප්‍රාදේශීය සභාවේ නිසි නිලධරයා විසින් ඒ ප්‍රාදේශීය සභා ප්‍රදේශය තුළ මංමාවතක වැවෙන හෝ ඊට නැමී ඇති නැතහොත් ඒ මංමාවතට අවහිරයක්ව පවතින සියළුම ගස් පඳුරු, හෝ අකුල් සහ ගස්වල සියළු කොළ, අතු හෝ මුල් කපා ඉවත් කිරීම සහ යාබද හෝ අසල පිහිටි යම් ඉඩමක් මත දැමීම සහ ඒ කාර්යය සඳහා අවශ්‍ය විය හැකි තැනැත්තන්, සතුන්, සහ උපකරණ ද ගෙන යම් ඉඩමකට හෝ ස්ථානයකට ඇතුල් වී, එහිදී ඒ ගස්, පඳුරු, අකුල්, කොළ, අතු හෝ මුල් කැපීම, සිඳීම, හෝ ඉවත් කිරීම සඳහා අවශ්‍ය විය හැකි සියළු දේ කිරීම නීත්‍යනුකූල විය යුතු ය: ගස් කැපීමට ඇති බලය.

එසේ වුවද, නිසි නිලධරයා විසින් එබඳු යම් ඉඩමක් මත දමන ලද සියළුම ගස්, පඳුරු හෝ අතුල් සහ ගස්වල සියළුම කොළ, හෝ අතු හෝ මුල්, ඔහු විසින් ඒ ඉඩමෙන් සාධාරණ කාලයක් ඇතුළත ඉවත් කරනු ලැබිය යුතු ය.

වැටවල් ඉදිකිරීමට ඇති බලය.

44. යම් ප්‍රදේශයක ප්‍රාදේශීය සභාවේ නියම නිලධරයා විසින් ඒ ප්‍රාදේශීය සභා ප්‍රදේශය ඇතුළත ඇති මංමාවතක් අසිනෙන් අවශ්‍ය යයි ඔහුට පෙනී යන කවර අවස්ථාවක වුව ද. වැටවල්, බඩ වැටි, අගල්, කාණු හෝ ඉවුරු ඉදිකිරීම හෝ සෑදීම නීත්‍යනුකූල වන අතර, එවැනි වැටවල්, බඩවැටි, අගල් කාණු හෝ ඉවුරුවලට යාබද එක් එක් ඉඩමක අයිතිකරු විසින් හෝ පදිංචිකරු විසින් ඒවා මනා සහ ප්‍රමාණවත් අලුත්වැඩියා තත්ත්වයෙන් හා ක්‍රමවත්ව තබා ගත යුතුවාක් හැර එසේ කිරීමට ඔහුට මෙයින් නියම කරනු ලැබේ.

අගල් ආදිය සහා විවෘතව තබා ගැනීමට සහ ප්‍රධාන නළ ආදිය යෙදීමට බලය.

45. යම් ප්‍රාදේශීය සභා ප්‍රදේශයක් ඇතුළත යම් මංමාවතක් ඔස්සේ තිබෙන සියළු අගල්, පීලි, කාණු හෝ ජලමාර්ග තැනීමට සෝදා හැරීමට, ශුද්ධ පවිත්‍ර කිරීමට සහ විවෘත කර තැබීමට සහ යම් ප්‍රසිද්ධ පාරක් ආරක්ෂා කිරීම, සංරක්ෂණය කිරීම, දියුණු කිරීම සඳහා අවශ්‍ය යයි ඔහු විසින් සලකිය හැකි වූ ද එවැනි මංමාවතක හෝ යෝජිත මංමාවතකට යාව හෝ ඒ අසල හෝ ඇත්තා වූ ද යම් ඉඩම් හෝ භූමි තල හෝ ඒ මැදින් හෝ එවැනි කාණු, ජල මාර්ග ප්‍රධාන නළ, උමං පීඩලි හෝ පාලම්, තැනීමට සහ යෙදීමට, ඒ ප්‍රදේශයේ ප්‍රාදේශීය සභාවේ නිසි නිලධරයාට බලය තිබිය යුතු ය.

ගල් ආදිය තැබීමට ඇති බලය

46. යම් ප්‍රදේශයක ප්‍රාදේශීය සභාවේ නිසි නිලධරයාට ප්‍රාදේශීය සභා ප්‍රදේශය ඇතුළත යම් මංමාවතක් මත යම් ගොඩක්, හෝ යම් ලී කඳක් හෝ වෙනත් කවර හෝ ද්‍රව්‍යයක් හෝ දෙයක් තැබීමට සහ ඒ පාර අලුත්වැඩියා කරන කාලය තුළත් අලුත්වැඩියා කිරීම් ආරම්භ කිරීමට පෙර සහ අලුත්වැඩියා කිරීම් නිම කිරීමෙන් පසුවත් එම අලුත්වැඩියා කිරීම් පහසු කිරීම සඳහා හෝ මෑතක දී අලුත්වැඩියා කරන ලද එවැනි පාරකට අලාභ හානි වීම වැළැක්වීම සඳහා හෝ අවශ්‍ය විය හැකි කාලයක් ඒ ද්‍රව්‍යය එහි තැබීමට ඉඩ හැරීමට බලය තිබිය යුතු ය. එහෙත් ඒ පාර ඔස්සේ ගමන් කරන තැනැත්තන්ට අනතුරක් හෝ පීඩාවක් සිදුවීම වැළැක්වීම සඳහා නිසි සහ සෑහෙන පූර්වාරක්ෂක විධිවිධාන ඔහු විසින් සලසනු ලැබිය යුතු ය.

## මංමාවත් ඔස්සේ ගොඩනැගිලි

මංමාවතක් ඔස්සේ යෝජිත ගොඩනැගිලි පිළිබඳ දැන්වීම.

**47.** (1) ප්‍රදේශයේ ප්‍රාදේශීය සභාවට එක් ලිත් මාසයකට කලින් ලියවිල්ලකින් දැන්වීමක් නොකර යම් තැනැත්තකු විසින් ඒ ප්‍රාදේශීය සභා සීමාව ඇතුළත යම් මංමාවතක් ඔස්සේ යම් ගොඩනැගිල්ලක්, මායිම් තාප්පයක්, ගේට්ටුවක් හෝ වැටක් ඉදිකිරීම නැතහොත් එවැනි යම් ගොඩනැගිල්ලක්, මායිම් තාප්පයක් හෝ ගෙට්ටුවක් ඉදිකිරීම ආරම්භ කිරීමේ හෝ අලුත්වැඩියා කිරීමේ හෝ කාර්යය සඳහා එවැනි යම් මංමාවතක යම් තාවකාලික වැටක් හෝ කොරටුවක් ඉදිකිරීම නීත්‍යානුකූල නොවිය යුතු ය.

(2) (1) වන උපවගන්තියෙන් නියමිත දැන්වීම දීම පැහැර හරින හෝ එම දැන්වීම නොකොට ඉදිකරන ලද යම් ගොඩනැගිල්ලක්, මායිම් තාප්පයක්, ගේට්ටුවක් හෝ වැටක් කඩා ඉවත් කරන ලෙස මේ උපවගන්තිය යටතේ ප්‍රාදේශීය සභාව විසින් ලියවිල්ලකින් නියම කරන ලද විටක, එසේ කිරීම පැහැර හරින යම් තැනැත්තකු රුපියල් පනහකට නොවැඩි දඩයකින් සහ ඉහත සඳහන් පරිදි, ඒ ගොඩනැගිල්ල, මායිම් තාප්පය, ගේට්ටුව හෝ වැට ඉවත් කරන ලෙස නියම කරනු ලැබීමෙන් පසුව ඒ ගොඩනැගිල්ල, මායිම් තාප්පය, ගේට්ටුව හෝ වැට එසේම තබා ගන්නා හෝ තබා ගැනීමට ඉඩ දෙන හෝ එක් එක් දිනයක් සඳහා රුපියල් විස්සකට නොවැඩි වැඩිපුර දඩයකින් ද දඬුවම් ලැබිය හැකි වරදකට වරදකරු විය යුතු ය.

(3) (1) වන උපවගන්තියෙන් නියමිත දැන්වීම නොකොට ඉදිකිරීමට ආරම්භ කරන ලද හෝ ඉදි කරන ලද හෝ යම් ගොඩනැගිල්ලක්, මායිම් තාප්පයක්, ගේට්ටුවක්, වැටක්, හෝ කොටුවක් ප්‍රාදේශීය සභාව විසින් කඩා ඉවත් කිරීම හෝ ඉවත් කරවීම, සහ එලෙස කඩා ඉවත් කිරීමේ ගාස්තුව, 59 වන වගන්තියේ සඳහන් ගාස්තු අය කර ගැනීම සඳහා එහි විධිවිධාන සලස්වා ඇති ආකාරයෙන්, අයකර ගැනීම නීත්‍යානුකූල වන්නේ ය.

(4) මංමාවත් අයුතු ලෙස අල්ලා ගැනීමක් ලෙස පසු කලක එළිදරව් විය හැකි එවැනි යම් ගොඩනැගිල්ලක්, මායිම් තාප්පයක්, ගේට්ටුවක්, වැටක් හෝ කොරටුවක් සම්බන්ධයෙන් (1) වන උපවගන්තිය යටතේ දෙනු ලබන දැන්වීම පිළිබඳව යම් ප්‍රාදේශීය සභාවක් විසින් කිසිදු ක්‍රියා මාර්ගයක් ගෙන නොතිබුණේ වුව ද, එවැනි ගොඩනැගිල්ලක්, මායිම් තාප්යක්, ගේට්ටුවක්, වැටක් හෝ කොරටුවක් කඩා ඉවත් කිරීම සඳහා මෙහි මින් පසුව ඒ ප්‍රාදේශීය සභාවට පවරනු ලබන බලය, මෙහි ඇතුළත් වූ කිසිවක් නිසා ඒ ප්‍රාදේශීය සභාවට අහිමි වේ යයි නොසැලකිය යුතු ය.

තාවකාලික වැටවල් සහ කොරටු ඉදි කිරීම.

**48.** (1) 47 වන වගන්තියේ සඳහන් කිසිවකින්, පොදු සේවය සඳහා යම් මංමාවතක යම් කොටසක් තාවකාලික ලෙස ප්‍රයෝජනයට ගැනීම සඳහා යථා පරිදි බලය දෙනු ලැබූ යම් රජයේ නිල

5—ඒ 094615 (86/12)

ධරයකු ඉන් වළක්වන බව හෝ ප්‍රාදේශීය සභා ප්‍රදේශය ඇතුළත පදිංචිකරුවන්ට නිවාස සහ වෙනත ගොඩනැගිලි ඉදිකිරීම, කඩා දැමීම හෝ අලුත්වැඩියා කිරීම සම්බන්ධයෙන් යම් මංමාවතක් මත තාවකාලික වැටවල් සහ කොරටු ඉදිකිරීම සඳහා හෝ ප්‍රාදේශීය සභා ප්‍රදේශය ඇතුළත තාවකාලික සැරසිලි කිරීම සඳහා හෝ ප්‍රාදේශීය සභාව විසින්—

(අ) එකී කොරටුවල දිග, පළල සහ උස ;

(ආ) මංමාවත ඔස්සේ රථ, කරත්ත හෝ බෝට්ටුවලට යාම ඊම සඳහා තැබිය යුතු ඉඩ ; සහ

(ඇ) බලපත්‍රය ලබන තැනැත්තා විසින්, වැට හෝ කොරටුව නියම වශයෙන් පිහිටි අන්දම හෝ ඉන් සිදු වී ඇති යම් බාධකයක් පැහැදිලිව දැක්වීමට ප්‍රමාණවත් ආලෝකයක් ඔහු විසින් වැට හෝ කොරටුව නඩත්තු කරනු ලබන හෝ පවත්වා ගෙන යනු ලබන කාල සීමාව තුළ හිරු බැසීම සහ හිරු උදාව අතර කාලය තුළ දිනපතා ප්‍රදර්ශනය කිරීම

යන කරුණු සම්බන්ධ කොන්දේසි ඇතුළුව, ප්‍රාදේශීය සභාව විසින් සුදුසු යයි සැලකිය හැකි නියම සහ කොන්දේසි මත බලපත්‍රයක් දීම වළක්වන බව තේරුම් නොගත යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ නිකුත් කරන ලද බලපත්‍රයක කොන්දේසිවලින් කිසිවක් උල්ලංඝනය කරන්නා වූ, ඒ බලපත්‍රයක් දරන සෑම තැනැත්තකු ම සහ ඒ බලපත්‍රයේ කොන්දේසිවල නියමයන් ප්‍රකාර තබා තිබෙන යම් ආලෝකයක් ඉවත් කරන හෝ නිවා දමන සෑම තැනැත්තකු ම රුපියල් දහයකට නො වැඩි දඩයකින් දඬුවම් ලැබිය හැකි වරදකට වරදකරු විය යුතු ය.

පාරවල් ඔස්සේ ගොඩනැගිලි සීමා.

49. නිවාස සහ නගර සංවර්ධන ආඥාපනතෙහි හෝ වෙනත් නීතියක හෝ කුමක් සඳහන්ව තිබුණද, කවර හෝ තැනැත්තකු විසින්,—

(අ) යම් ප්‍රාදේශීය සභා ප්‍රදේශයක් ඇතුළත රථවාහන ගමනා ගමනය සඳහා යෝජිත හෝ ප්‍රයෝජනයට ගන්නා වූ සහ මේ පනත යටතේ හෝ නිවාස සහ නගර සංවර්ධන ආඥාපනත යටතේ පළලින් අඩි පනහකට වැඩි පාරක් සඳහා ඉඩ සළසන වීදි රේඛා නියම කර නොමැත්තා වූ යම් පාරක මධ්‍යයේ සිට අඩි විසිපහක් වූ (මෙහි මින් මතු "ගොඩනැගිලි සීමාව" යනුවෙන් සඳහන් කරනු ලබන) සීමාවක් ඇතුළත යම් ගොඩනැගිල්ලක්, මායිම් තාප්පයක් හෝ ගේට්ටුවක් ඉදි කිරීම නීත්‍යානුකූල නොවන්නේ ය:

එසේ වුවද මායිම් තාප්පය හෝ ගේට්ටුව පිහිටි ඉඩම පොදු කටයුත්තක් සඳහා අවශ්‍ය වුවහොත් ඒ තාප්පය හෝ ගේට්ටුව සඳහා වන්දි මුදලක් ගෙවනු නොලබන බවට, පොරොන්දුවක් ඉඩමේ අයිතිකරුවන් විසින් ලියා අත්සන් කර දීමේ කොන්දේසිය මත, මායිම් තාප්පයක් හෝ ගේට්ටුවක් ඉදි කිරීම සඳහා අවසර දීමට ප්‍රාදේශීය සභාවට බලය ඇත්තේ ය.

(ආ) ප්‍රදේශයේ ප්‍රාදේශීය සභාව විසින් දෙන ලද බලපත්‍රයක බලය යටතේ හැර එකී සීමාවන් ඇතුළත වූ එවැනි යම් ගොඩනැගිල්ලක් මායිම් තාප්පයක් හෝ ගේට්ටුවක් නැවත ඉදිකිරීම හෝ ඒ යමකට යම් කොටසක් එකතු කිරීම නීත්‍යනුකූල නොවන්නේ ය :

එසේ වුවද, සෑම විටම, ප්‍රාදේශීය සභාවක් සංස්ථාපනය කරන ලද දිනයෙහි දී පැවති යම් ගොඩනැගිල්ලක, මායිම් තාප්පයක හෝ ගේට්ටුවක යම් අලුත්වැඩියා කිරීම්වලට හෝ—

(i) පයින් යාම ඊම සඳහා පමණක් අදහස් කරන ලද, පළලින් අඩි විස්සකට නොඅඩු යම් වීදියක් සම්බන්ධයෙන් වන විට හෝ

(ii) කසළශෝධනය හෝ වසුරු බැහැර කිරීම යන කාර්ය සඳහා හෝ වෙනත් විශේෂ සෞඛ්‍යාරක්ෂක කාර්ය යක් සඳහා පමණක් අදහස් කරන ලද පළලින් අඩි දහයකට නොඅඩු යම් පසුපස පටු පාරක් හෝ වෙනත් සේවා මගක්, සම්බන්ධයෙන් වන විට,

ප්‍රාදේශීය සභාව විසින් ඒ වීදියේ, පටු මගේ හෝ පටු පාරේ මායිම් නියම කරනු ලැබ හෝ එය අනුමත කරනු ලැබ ඇති අවස්ථාවක දී මේ උපවගන්තියේ ඇතුළත් කිසිවක් අදාළ නොවිය යුතු ය.

මේ උපවගන්තියේ මීට පෙරාතුව වූ විධිවිධානවල කාර්ය සඳහා "අලුත් වැඩියා කිරීම්" යන්නට යළි ඉදිකිරීම හෝ යළි ගොඩනැගීම හෝ යම් අලුත් කොටසක් එකතු කිරීම හෝ ඇතුළත් වන්නේ නොසැලකිය යුතු ය.

50. (1) ප්‍රාදේශීය සභාව සංස්ථාපනය කරන ලද දිනයෙන් පසු අවුරුදු තුනක් ඇතුළත හෝ යම් අවස්ථාවකට අදාළ විශේෂ කරුණු අනුව අමාත්‍යවරයා විසින් ඉඩදිය හැකි වැඩිපුර කාල සීමාවක් ඇතුළත හෝ අමාත්‍යවරයාගේ විධානය මත සහ ඔහු විසින් අවසර දෙනු ලැබූ යම් කාලසීමාවක් වේ නම් ඒ කාලසීමාව ඇතුළත— ගොඩනැගිලි සීමා ලකුණු කිරීම.

(අ) 49 වන වගන්තියේ සඳහන් සෑම පාරකම, ඒ වගන්තියෙන් නියම කර ඇති ගොඩනැගිලි සීමා, ස්ථිර සලකුණුවලින් ලකුණු කිරීම ;

(ආ) එසේ ගොඩනැගිලි සීමා ලකුණු කරනු ලැබූ එක් එක් පාරක් සම්බන්ධයෙන් වූ විට ඒ සීමා ඇතුළත පිහිටි හෝ ඒ සීමා තුළට පැතිරී තිබෙන එක් එක් ගොඩනැගිල්ලෙහි, මායිම් තාප්පයෙහි, හෝ ගේට්ටුවෙහි හෝ ඉන් කොටසෙහි වටිනාකම නිශ්චය කොට වාර්තාගත කිරීම ; සහ

(ඇ) ගොඩනැගිලි සීමා ලකුණු කර නොමැති යම් පාරක් සම්බන්ධ යෙන් වූ විට, යම් යලි ඉදිකිරීමක හෝ එකතුකිරීමක කාර්ය සඳහා ප්‍රාදේශීය සභාව විසින් 49 වන වගන්තිය යටතේ බලපත්‍රයක් දෙනු ලැබූ එක් එක් ගොඩනැගිල්ලෙහි මායිම් තාප්පයෙහි හෝ ගේට්ටුවෙහි වටිනාකම නිශ්චය කොට වාර්තා ගත කිරීම

සෑම ප්‍රාදේශීය සභාවකම කාර්යය විය යුතු ය.

(2) (1) වන උපවගන්තියෙහි කාර්ය සඳහා යම් ගොඩනැගිල්ලක, මායිම් තාප්පයක හෝ ගේට්ටුවක වටිනාකම—

(අ) ප්‍රාදේශීය සභාව සහ ගොඩනැගිල්ල, මායිම් තාප්පය හෝ ගේට්ටුව අයිතිකරු හෝ අයිතිකරුවන් අතර වූ එකඟවීම කින් නියම කළ යුතු ය ; නැතහොත්

(ආ) එකඟවීමකින් එසේ නියමකරනු නොලැබූ අවස්ථාවක දී ගොඩනැගිල්ල, මායිම් තාප්පය හෝ ගේට්ටුව අයිතිකරු හෝ අයිතිකරුවන් විසින් නාම... එක් බේරුම්කරුවකු ද ... බේරුම්කරුවකු ද ප්‍රාදේශීය සභාව විසින් නාමිත තවත් ... කරනු ලබන වශයෙන්, බේරුම්කරුවන් දෙදෙනකු විසින් ... බේරුම්කරුවන්ට බේරුම් කිරීමක් මගින් කළ යුතු ය ; ඒ බේරුම් ... එකී වටිනාකම ගැන එකඟත්වයකට එළඹීමට නො ... වුවහොත් බේරුම්කරුවන් විසින් හවුලේ තෝරා ගනු ලද තීරකයකු විසින් නිශ්චය කළ යුතු ය.

(3) යම් ගොඩනැගිල්ලක, මායිම් තාප්පයක හෝ ගේට්ටුවක හෝ ඉන් යම් කොටසක වටිනාකම, (2) වන උපවගන්තියේ කාර්ය සඳහා නිශ්චය කිරීමෙහිලා, පහත දැක්වෙන මූල ධර්ම පිළිපැදිය යුතු ය :—

(අ) යම් ගොඩනැගිල්ලක්, මායිම් තාප්පයක් හෝ ගේට්ටුවක් යම් පාරක ගොඩනැගිලි සීමා ඇතුළත පිහිටා ඇති අවස්ථා වක දී හෝ යම් ගොඩනැගිල්ලක මායිම් තාප්පයක හෝ ගේට්ටුවක කොටසක් යම් පාරක ගොඩනැගිලි සීමාව ඇතුළත පිහිටා ඇත්තා වූ ද ඒ කොටස ඉවත් කළහොත්, ඒ ගොඩනැගිල්ලේ, මායිම් තාප්පයේ හෝ ගේට්ටුවේ ඉතිරි කොටස නිෂ්ප්‍රයෝජන වන්නා වූ ද ඒ හේතුව නිසාම පාර පළල් කරන අවස්ථාවක ගොඩනැගිල්ල, මායිම් තාප්පය හෝ ගේට්ටුව සම්පූර්ණයෙන්ම කඩා ඉවත් කිරීම අවශ්‍ය වන්නා වූ ද අවස්ථාවක දී, සම්පූර්ණ ගොඩනැගිල්ලේ, මායිම් තාප්පයේ හෝ ගේට්ටුවේ වටිනා

කම නිශ්චය කළ යුතු ය ; තවද ඒ වටිනාකම විය යුත්තේ ගොඩනැගිලි සීමා නියම කරන වේලාවේ දී, ඒ ස්ථානයේ, එනම්, ගොඩනැගිල්ලේ, මායිම් තාප්පයේ හෝ ගේට්ටුවේ සහ ඊට සම්බන්ධ ඉඩමේ ද වෙළෙඳ වටිනාකම සහ ගොඩනැගිල්ල, මායිම් තාප්පය හෝ ගේට්ටුව රහිතව ඉඩමෙහි ඒ වේලාවේ ඇති වෙළෙඳ වටිනාකම අතර වන වෙනස ය.

(ආ) ගොඩනැගිල්ලක, මායිම් තාප්පයක හෝ ගේට්ටුවක කොටසක් පමණක්, යම් පාරක ගොඩනැගිලි සීමා ඇතුළත පිහිටා ඇති අවස්ථාවක, ඒ කොටස වෙන් කරනු ලැබූ හෝ කඩා ඉවත් කරනු ලැබූ පසු, ඉතිරි කොටස, ගොනැගිල්ලේ, මායිම් තාප්පයේ හෝ ගේට්ටුවේ මුල් කාර්යය සඳහා, හෝ නීතියෙන් අවසර ඇති වෙනත් යම් කාර්යයක් සඳහා හෝ සකස් කරගත හැකි වන අවස්ථාවක දී, ගොඩනැගිලි සීමා ඇතුළත වූ කොටසේ වටිනාකම පමණක් නිශ්චය කළ යුතු ය :

තවද ඒ වටිනාකම විය යුත්තේ—

(i) ගොඩනැගිල්ලේ, මායිම් තාප්පයේ හෝ ගේට්ටුවේ එම කොටස වෙන් කිරීමේ සහ කඩා ඉවත් කිරීමේ ඇස්තමේන්තු කළ වියදමෙහි ; සහ

(ii) ගොඩනැගිල්ලක් සම්බන්ධයෙන් වූ විට, ගොඩනැගිල්ලේ කොටස ගොඩනැගිලි සීමා ලකුණු කරනු ලැබූ වේලාවේ දී, ගොඩනැගිල්ල ප්‍රයෝජනයට ගනු ලැබූ කාර්යය සඳහා පවතින තත්ත්වයට පත්වන අන්දමින් ඒ ගොඩනැගිලි කොටස සකස් කිරීමේ ඇස්තමේන්තු කළ වියදමෙහි සහ මායිම් තාප්පයක් හෝ ගේට්ටුවක් සම්බන්ධයෙන් වූ විට, අවශ්‍ය විය හැකි පරිදි එකතු කිරීම් හෝ අලුත්වැඩියා කිරීම් පරිසමාප්ත කිරීමේ ඇස්තමේන්තු කළ වියදමෙහි

මුළු එකතුව වේ.

(iii) යම් ගොඩනැගිල්ලක, මායිම් තාප්පයක හෝ ගේට්ටුවක වටිනාකම ප්‍රාදේශීය සභාව සංස්ථාපනය කරන ලද දිනයෙන් පසුව, ගොඩනැගිල්ලෙහි, මායිම් තාප්පයෙහි හෝ ගේට්ටුවෙහි කරන ලද යම් වෙනස් කිරීමක් හෝ වැඩි දියුණු කිරීමක් නිසා වැඩි වී ඇතැයි යම් පාරක ගොඩනැගිලි සීමාවන් ලකුණු කරනු ලබන වේලාවේ දී, දැනගත් අවස්ථාවක, ඒ වෙනස් කිරීම හෝ වැඩිදියුණු කිරීම සඳහා 49 වන වගන්තිය යටතේ වූ බලපත්‍රයක් මගින්

බලය දී තිබුණ ද, ගොඩනැගිල්ල, මායිම් තාප්පය හෝ ගේට්ටුව යථා තත්ත්වයෙන් පවත්වා ගැනීම සඳහා ඒ වෙනස් කිරීම හෝ වැඩි දියුණු කිරීම අවශ්‍ය වූයේ නම් මිස, වැඩි වූ වටිනාකම් ප්‍රමාණය ගණන් නොගත යුතු ය.

(4) යම් ගොඩනැගිල්ලක, මායිම් තාප්පයක හෝ ගේට්ටුවක හෝ ඉන් කොටසක වටිනාකම සම්බන්ධයෙන් (2) වන උප වගන්තිය යටතේ, අවස්ථාවෝචිත පරිදි ගනු ලැබූ සෑම තීරණයෙහිම හෝ ඇතුළත් වුනු සෑම එකඟවීමෙහි ම ඉහත කී වටිනාකම නියම කරනු ලැබුයේ හෝ නිශ්චය කරනු ලැබුයේ, (3) වන උප වගන්තියේ කිනම් ඡේදය හෝ ඡේද අනුව ද යන වග, නිශ්චිත වම සඳහන් විය යුතු ය.

(5) ගොඩනැගිලි සීමා ඇතුළත පිහිටි එක් එක් ගොඩනැගිල්ලක, මායිම් තාප්පයක හෝ ගේට්ටුවක හෝ ඉන් කොටසක, (2) වන උපවගන්තියේ විධිවිධාන සලස්වා ඇති පරිදි නියම කරන ලද හෝ නිශ්චය කරන ලද වටිනාකම ප්‍රාදේශීය සභා කාර්යාලයේ වාර්තා ගත කර තැබිය යුතු අතර, ඒ සමගම, එසේ වාර්තා ගත කර තබන ලද වටිනාකම සත්‍යායනය කර ගත හැකි සියලුම එකඟවීම් හෝ තීරණ ද වාර්තා ගත කර තැබිය යුතු ය.

(6) යම් පාරක ගොඩනැගිලි සීමා ලකුණු කිරීමේ කාර්යය සඳහා ප්‍රාදේශීය සභාවේ යම් නිලධරයකු, සේවකයකු හෝ කම්කරුවකු විසින්, පාරට යාවූ යම් පෞද්ගලික ඉඩමකට ඇතුළු වී, ඒ ඉඩමට හැකිතාක් දුරට අඩුම අලාභයක් සිදුවන බවට වගබලා ගැනීම පිණිස අවශ්‍ය සියලු පූර්වාරක්ෂක විධිවිධාන සලස්වමින් පහසු ස්ථානවල ස්ථිර සලකුණු සවි කිරීම, නීත්‍යානුකූල වන්නේ ය. එයින් සිදුවන යම් අලාභයක් සඳහා ප්‍රාදේශීය සභාව විසින් වන්දි ගෙවිය යුතු ය.

(7) මේ වගන්තිය යටතේ, යම් පාරක ගොඩනැගිලි සීමා ලකුණු කරනු ලැබූ අවස්ථාවක දී, ඒ ගොඩනැගිලි සීමා ඇතුළත නො[illegible] පාරක යම් කොටසක් ; පාර ඔස්සේ ගොඩනැගිලි පහසුකම් සැලසීමේ කාර්යය සඳහා කුලියට දීමෙන් හෝ බදු දීමෙන් හෝ එවැනි කොටසක් යම් පොදු කාර්යයක් සඳහා ප්‍රයෝජනයට ගැනීමෙන් හෝ ප්‍රයෝජනයට ගැනීමට ඉඩදීමෙන් ප්‍රාදේශීය සභාව වැළැක් වීම මේ පනතේ සෙසු විධිවිධාන අතුරින් යමක සඳහන් කිසිවකින් සිදුවන බව නොසැලකිය යුතු ය.

(8) මේ පනත යටතේ හෝ නිවාස සහ නගර සංවර්ධන ආඥා පනත යටතේ හෝ වෙනත් යම් නීතියක් යටතේ හෝ පළලින් අඩි පනහකට වැඩි පාරක් සඳහා ඉඩ සලසන වීදි රේඛා සලකුණු කරනු ලැබූ යම් පාරකට හෝ පාරක් සම්බන්ධයෙන් හෝ මේ වගන්තියේ කිසිවක් අදාළ නොවිය යුතු ය.

51. (1) යම් පාරක ගොඩනැගිලි සීමාවන් ඇතුළත වූ යම් ගොඩනැගිල්ලක්, මායිම් තාප්පයක් හෝ ගේට්ටුවක පිහිටා තිබෙන ඉඩම, පාර පළල් කිරීමේ කාර්යය සඳහා පසු කලෙක අත්කර ගනු ලබන විටක, ඒ ගොඩනැගිල්ල, මායිම් තාප්පය හෝ ගේට්ටුව සම්බන්ධයෙන් ගෙවිය යුතු වන්දි 53 වන වගන්තියේ විධිවිධාන අනුව නිශ්චය කළ යුතුය යන්න ඒ ගොඩනැගිල්ල, මායිම් තාප්පය හෝ ගේට්ටුව යළි ඉදි කිරීම සඳහා හෝ ඊට යම් කොටසක් එකතු කිරීම සඳහා 49 වන වගන්තිය යටතේ ප්‍රාදේශීය සභාවක් විසින් දෙන යම් බලපත්‍රයක ඇතුළත් කොන්දේසියක් විය යුතු ය.

49 වන වගන්තිය යටතේ සියලු බලපත්‍ර සම්බන්ධයෙන් ඇතුළත් විය යුතු කොන්දේසිය.

(2) (අ) (1) වන උපවගන්තියේ විස්තර කර ඇති කොන්දේසිය ඇතුළත් සෑම බලපත්‍රයක් පිළිබඳව ද ඒ කොන්දේසිය අදාළ ඉඩම් සහ ගොඩනැගිල්ල, මායිම් තාප්පය හෝ ගේට්ටුව පිළිබඳව ද සම්පූර්ණ විස්තර ප්‍රාදේශීය සභා කාර්යාලයේ ඒ කාර්යය සඳහා තබා ගත යුතු ලේඛනයක ප්‍රාදේශීය සභාව විසින් සටහන් කළ යුතු අතර සභාපතිවරයා විසින් එක් එක් ඉඩම සහ ගොඩනැගිල්ල, මායිම් තාප්පය හෝ ගේට්ටුව සහ ඊට අදාළ බලපත්‍රයේ කොන්දේසි සම්බන්ධයෙන් එසේ කරන ලද සටහනේ සහතික පිටපත් ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයෙහි ලියාපදිංචි කිරීමට සැලැස්විය යුතු ය. ඉඩම් රෙජිස්ට්‍රාර්වරයා විසින් එවැනි සියලුම පිටපත් යම් ගාස්තුවකින් හෝ අය කිරීමකින් තොරව, ලියාපදිංචි කළ යුතු ය.

(ආ) මේ උපවගන්තිය යටතේ යම් සටහනක් ලියාපදිංචි කරනු ලැබූ විට, ඒ ඉඩම හෝ ගොඩනැගිල්ල හෝ මායිම් තාප්පය හෝ ගේට්ටුව කවර හෝ වේලාවක කවර තැනැත්තකුගේ අයිතියට හෝ සන්තකයට පත් විය හැකි වුව ද, ඒ සටහනේ දක්වා ඇති බලපත්‍රයේ කොන්දේසි බලපාන්නා වූ ඉඩම හෝ ගොඩනැගිල්ල හෝ මායිම් තාප්පය හෝ ගේට්ටුව ඒ කොන්දේසියේ භාවය අනුව ඒ කොන්දේසියට යටත් විය යුතු ය.

(ඇ) ප්‍රාදේශීය සභා කාර්යාලයේ තබා ඇති ලේඛනය, කාර්යාලීය කටයුතු සඳහා කාර්යාලය විවෘතව ඇති ඕනෑම වේලාවක ඊට සම්බන්ධතාවක් ඇති කවර හෝ තැනැත්තකු විසින් පරීක්ෂා කරනු ලැබීම සඳහා, සූදානම්ව තැබිය යුතු ය.

(ඈ) වංචා වැළැක්වීමේ ආඥාපනතේ 2 වන වගන්තියේ විධිවිධාන මේ උපවගන්තියේ සඳහන් යම් සටහනකට හෝ සටහනක පිටපතකට අදාළ නොවිය යුතු ය.

(3) (2) වන උපවගන්තියේ සඳහන් කොන්දේසිවලට යටත්ව යම් ගොඩනැගිල්ලක්, මායිම් තාප්පයක් හෝ ගේට්ටුවක් යළි ඉදි කිරීම සඳහා හෝ ඊට යම් කොටසක් එකතු කිරීම සඳහා, අන්‍යාකාරයෙන් හිමිකම් ඇති යම් තැනැත්තකුට, 49 වන වගන්තියේ නිශ්චිතව සඳහන්ව ඇති ගොඩනැගිලි සීමා ඇතුළත ඒ ගොඩනැගිල්ල, මායිම් තාප්පය හෝ ගේට්ටුව යළි ඉදි කිරීම පිණිස හෝ ඊට එවැනි එකතුවක් කිරීම පිණිස බලපත්‍රයකට හිමිකම තිබිය යුතු ය :

එසේ වුවද, එසේ යළි ඉදි කරන ලද විට හෝ කොටසක් එකතු කරන ලද විට එසේ යළි ඉදි කරන ලද හෝ කොටසක් එකතු කරන ලද ගොඩනැගිල්ලක, මායිම් තාප්පයක හෝ ගේට්ටුවක කිසි කොටසක්, මුල් අවස්ථාවේ පාර මධ්‍යයට තිබුණු දුර ප්‍රමාණයට වඩා ළං නොවිය යුතු ය.

(4) ගොඩනැගිල්ලක් සම්බන්ධයෙන් "යළි ඉදිකිරීම" යන යෙදුමට, කඩා දමන ලද හෝ අන්‍යාකාරයකින් විනාශ කරන ලද ගොඩනැගිල්ලක කොටසක් වන යම් බිත්තියක් හෝ ගොඩනැගිල්ලකට දී ඇති රුකුලක් බිම සිට අඩි පහක දුර ප්‍රමාණයකට හෝ අඩි පහක දුර ප්‍රමාණයක් ඇතුළත ප්‍රතිසංස්කරණය කිරීමක් ඇතුළත් වන නමුත් ප්‍රාදේශීය සභාවේ මතය අනුව බිත්තියෙහි හෝ රුකුලෙහි අලුත්වැඩියා කිරීමක් ලෙස සාධාරණ අන්දමින් සැලකිය හැකි යම් ක්‍රියාවලියක් ඊට ඇතුළත් නොවේ.

නීති උල්ලංඝනය වන ලෙස ඉදිකරන ලද ගොඩනැගිල්ලක් මායිම් තාප්පයක් හෝ ගේට්ටුවක් පිළිබඳව ක්‍රියා කිරීමට ප්‍රාදේශීය සභාවට ඇති බලය.

52. යම් තැනැත්තකු විසින් 49 වන වගන්තියේ විධිවිධාන උල්ලංඝනය කරමින් යම් ප්‍රාදේශීය සභා ප්‍රදේශයක් ඇතුළත ගොඩනැගිල්ලක්, මායිම් තාප්පයක් හෝ ගේට්ටුවක් ඉදි කරනු ලැබුව හොත්, හෝ යළි ඉදි කරනු ලැබුවහොත්, හෝ යම් ගොඩනැගිල්ලකට, මායිම් තාප්පයකට හෝ ගේට්ටුවකට යම් කොටසක් එකතු කරනු ලැබුවහොත්, ඒ ගොඩනැගිල්ල, මායිම් තාප්පය හෝ ගේට්ටුව හෝ එකතු කරන ලද ඒ කොටස යම් නිලධරයකු හෝ සේවකයකු ලවා කඩා දැම්මවීමට හෝ ඉවත් කිරීමට ඒ ප්‍රදේශයේ ප්‍රාදේශීය සභාවට හිමිකම ඇති අතර, එම කාර්යය සඳහා මංමාවතක යම් බාධකයක් හෝ අයුතු අල්ලා ගැනීමක් හෝ සංකල්පිත බාධකයක් හෝ සංකල්පිත අයුතු අල්ලා ගැනීමක් නතර කිරීමේ හෝ ඉවත් කිරීමේ කාර්ය සඳහා ප්‍රාදේශීය සභාවක් වෙත මේ කොටසින් පවරනු ලැබ ඇති පරිදි ඇතුල්වී පරීක්ෂා කිරීමට ඇති අයිතිවාසිකම මෙන් ම එය ඉවත් කිරීම්, නතර කිරීම් සහ ගාස්තු අයකර ගැනීම් සඳහා ඇති බලය ද ඒ ප්‍රාදේශීය සභාවට ඇති අතර, ඒ අනුව එවැනි බාධකවලට හෝ අයුතු අල්ලා ගැනීම්වලට අදාළ මේ කොටසේ ඇති සියලුම විධිවිධාන, ඒවා අදාළ කර ගත හැකි තාක් දුරට අවශ්‍ය යයි විය හැකි සුළු වෙනස් කිරීම් සහිතව අදාළ විය යුතු ය.

53. (1) පාරක් ලකුණු කර ඇති ගොඩනැගිලි සීමා ඇතුළත පිහිටා ඇති සහ ගොඩනැගිලි සීමා ඇතුළත සම්පූර්ණයෙන් හෝ කොටසක් වශයෙන් හෝ පිහිටන ලෙස ගොඩනැගිල්ලක් ඉදි කිරීමෙන් සංවර්ධනය කරන ලද, යම් ඉඩමක් එම පාර පළල් කිරීමේ කාර්යය සඳහා අත්කර ගත් අවස්ථාවක, ඉඩම්, අත්කර ගැනීමේ පනත යටතේ, එවැනි අවස්ථාවක දී, ගෙවිය යුතු වන්දිය නිශ්චය කිරීම, එම පනතෙහි පටහැනිව කුමක් සඳහන් වුවද පහත සඳහන් විශේෂ විධිවිධානවලට යටත් විය යුතු ය. ගොඩනැගිලි ඉදිකිරීමෙන් සංවර්ධනය කරන ලද ඉඩම් සම්බන්ධ වන්දි තක්සේරු කිරීමේ ප්‍රතිපත්ති.

(අ) ප්‍රාදේශීය සභාව සංස්ථාපනය කරන ලද දිනයෙන් පසුව, යම් අවස්ථාවක, 49 වන වගන්තිය උල්ලංඝණය කරමින් ඉදි කරන ලද හෝ එම වගන්තියෙන් නියමිත බලපත්‍රය රහිතව, යළි ඉදි කරන ලද හෝ කොටස් එකතු කරන ලද හෝ යම් ගොඩනැගිල්ලක්, මායිම් තාප්පයක් හෝ ගේට්ටුවක් සඳහා වන්දි නොගෙවිය යුතු ය ;

(ආ) ඉඩමෙහි පිහිටි ගොඩනැගිලිවලින් තොරව ඉඩමට නියම කරන වටිනාකම විය යුත්තේ අත්කර ගන්නා වේලාවේ දී ඉඩමේ වෙළෙඳ වටිනාකම ය.

(ඇ) ඉඩම, යම් ඒක් තැනැත්තකුට හෝ තැනැත්තන් කණ්ඩායමකට අයිති යම් ස්ථානයක කොටසක් පමණක් වන අවස්ථාවක—

(i) ඒ ස්ථානයේ ඉතිරි කොටස, අත්කර ගැනීමට ඇති ගොඩනැගිල්ලට සමාන ස්වභාවයකින් යුත් ගොඩනැගිල්ලක් නම් ඉඩමට නියම කරන වෙළෙඳ වටිනාකම විය යුත්තේ අවට ප්‍රදේශයේ පාරකට මුහුණ ලා ඇති ඒ සමාන ඉඩමක එම වේලාවේ දී පවත්නා වටිනාකමින් අඩකි ; තවද,

(ii) ඒ ස්ථානයේ ඉතිරි කොටසේ ඉදිරිපස සිට පසු පස දක්වා ඇති ඉඩ, (i) වන අනුඡේදයේ සඳහන් කාර්යය සඳහා ප්‍රමාණවත් නොවේ නම්, ඉඩමට නියම කරන වෙළෙඳ වටිනාකම විය යුත්තේ අවට ප්‍රදේශයේ පාරකට මුහුණලා ඇති ඒ සමාන ඉඩමක එම වේලාවේ දී පවත්නා වටිනාකම ය ;

(ඈ) ඉඩම අත්කර ගැනීමෙන් හෝ එහි පිහිටි යම් ගොඩනැගිල්ලක්, මායිම් තාප්පයක් හෝ ගේට්ටුවක් කඩා දැමීමෙන් පසුව පාරෙහි කරන ලද යම් පළල් කිරීමක් නිසා එම අයිතිකරුට හෝ අයිතිකරුවන්ට අයිති වෙනත් යම් ඉඩමක හෝ ගොඩනැගිල්ලක වටිනාකමෙහි සිදු විමට ඉඩ ඇති යම් වැඩිවීමක් පිළිබඳව සැලකිල්ල දැක්විය යුතු ය ;

(ඉ) ගොඩනැගිල්ල සම්බන්ධයෙන් වුවද ඉඩම සම්බන්ධයෙන් වුවද අත්කර ගැනීමේ අනිවාර්ය ස්වභාවය සලකා කිසිම අතිරේක වන්දියක් නොගෙවිය යුතු ය.

(2) (1) වන උපවගන්තියේ (ඇ) (ii) වන අනුඡේදයේ සඳහන් යම් අවස්ථාවක දී, ප්‍රාදේශීය සභාව මුලින් අත්කර ගැනීමට අදහස් කළ කොටස සඳහා එම ඡේදය යටතේ නියම කරන ලද වට්නාකම් ප්‍රමාණය අනුව තමාගේ සම්පූර්ණ ස්ථානයම අත්කර ගන්නා ලෙස ප්‍රාදේශීය සභාවට නියම කිරීමේ විකල්පය අයිතිකරුට තිබිය යුතු ය.

ගොඩනැගිලි සීමාවන් ඇතුළත පිහිටි ඉඩම් වල අයිතිකරුවකු සඳහා යාබද ඉඩම් අත්කර ගැනීමට ප්‍රාදේශීය සභාවට ඇති බලය.

54. ප්‍රාදේශීය සභා ප්‍රදේශයක් තුළ පිහිටි පාරකට යාව ඇති යම් ඉඩමක ගොඩනැගිල්ලක් ඉදි කිරීමට යම් තැනැත්තකුට ඇති අයිතිය ඒ පාරෙහි ලකුණු කර ඇති ගොඩනැගිලි සීමාවන් නිසා සීමා වන්නා වූ ද ඒ තැනැත්තා එම ඉඩමෙහි ගොඩනැගිල්ලක් ඉදි කිරීමට කැමැත්තෙන් සිටින්නා වූ ද අවස්ථාවක එකී මුලින් සඳහන් ඉඩමට පිටුපසින් පිහිටියා වූ ද, ඒ සීමා කිරීම නොවිණි නම්, ඒ අයිතිකරු විසින් භුක්ති විඳිය හැකිව තිබුණු ස්වභාවයේම ගොඩනැගිලි පහසුකම් ඔහුට සැලසෙන තරම් සෑහෙන ප්‍රමාණයකින් යුක්ත වූ යම් ඉඩමක් ඒ තැනැත්තාගේ ඉල්ලීම පිට ඔහුගේ වියදමින් ඔහු සඳහා ප්‍රාදේශීය සභාව විසින් අත්කර ගනු ලැබිය හැකි ය. එවැනි යම් කාර්යයක් සඳහා අවශ්‍ය වන සියලු ඉඩම් පොදු කටයුත්තක් සඳහා අවශ්‍ය ඉඩම් ලෙස සැලකිය යුතු අතර, ඒ ඉඩම් තක්සේරු කිරීමෙහි ලා 53 වන වගන්තියේ විධිවිධාන අදාළ විය යුතු ය.

හිමිකම් ඔප්පු ඉදිරිපත් කරන ලෙස ඉල්ලා සිටීමේ බලය.

55. (1) යම් ප්‍රාදේශීය සභාවක පාලනයට අයත් යම් මංමාවතක හෝ ඒ පාරට යාබදව පිහිටියා වූ ද, රජයට අයිති වූ ද, යම් මුඩු ඉඩමක හෝ වෙනත් ඉඩමක යම් ගොඩනැගිල්ලක් හෝ කොරටුවක් ඉදිකර ඇති බව හෝ එවැනි පාරකට හෝ ඉඩමකට යම් බාධාවක් පමුණුවා ඇති බව ඒ ප්‍රාදේශීය සභාවට පෙනී ගිය කවර අවස්ථාවක දී, ඒ ගොඩනැගිල්ල හෝ කොරටුව ඉදිකරන ලද හෝ ඒ බාධකය පමුණුවන ලද ස්ථානයේ අයිතිකරු ලෙස හිමිකම් පාන තැනැත්තා වෙත ඔහුගේ ඒ හිමිකමට පදනම වූ සෑම ඔප්පුවක්, ලේඛනයක් සහ සාධන පත්‍රයක් ම ඉදිරිපත් කරන ලෙස ඉල්ලමින් ඒ ප්‍රාදේශීය සභාව විසින් ලිඛිත දැන්වීමක් භාරදීම නීත්‍යානුකූල විය යුතු ය.

(2) පහත සඳහන් අවස්ථාවලින් කවර හෝ අවස්ථාවක, එනම්–

(අ) යම් ස්ථානයක අයිතිකරු යයි කියන තැනැත්තාගේ නම සහ පදිංචිය පිළිබඳ සම්පූර්ණ තොරතුරු දන්වන ලෙස ප්‍රාදේශීය සභාව විසින් ඉල්ලා සිටින ලදුව, ඒ ස්ථානයේ අයිතිකරු තමාම යයි කියා නොසිටින පදිංචිකරු විසින්, එසේ තොරතුරු දැන්වීමට ප්‍රතික්ෂේප කරන ලද අවස්ථාවක දී; හෝ

(ආ) යම් ස්ථානයක අයිතිකරු යයි කියන තැනැත්තා ඒ ස්ථානයට ඔහුගේ හිමිකම් ඇමට පදනම් කරගත් සහ ඔහු සන්තකයේ ඇති සෑම ඔප්පුවක්, ලේඛනයක් සහ සාධන පත්‍රයක් ම දින දහයක් ඇතුළත ඉදිරිපත් කරන ලෙස ඉල්ලා සිටිනු ලැබීමෙන් පසුව ඒවා එසේ ඉදිරිපත් කිරීමට ප්‍රතික්ෂේප කරන ලද අවස්ථාවක දී; හෝ

(ආ) එවැනි යම් ඔප්පුවක, ලේඛනයක හෝ සාධක පත්‍රයක සන්තකය දරන තැනැත්තාගේ නම සහ පදිංචිය පිළිබඳ සම්පූර්ණ විස්තර දන්වන ලෙස ප්‍රාදේශීය සභාව විසින් ඉල්ලා සිටින ලදුව ඒ ඔප්පුව, ලේඛනය හෝ සාධක පත්‍රය තමා සන්තකව තැත්තා වූ ද යම් ස්ථානයක අයිතිකරු යයි කියන්නා වූ ද තැනැත්තා විසින් එසේ ප්‍රාදේශීය සභාවට ඒ සන්තකය දරන තැනැත්තාගේ විස්තර දන්වීමට ප්‍රතික්ෂේප කරන ලද අවස්ථාවක දී; හෝ

(ඇ) එවැනි යම් ඔප්පුවක්, ලේඛනයක් හෝ සාධක පත්‍රයක් ඉදිරිපත් කරන ලෙස ප්‍රාදේශීය සභාව විසින් ලියවිල්ලක් මගින් ඉල්ලා සිටින ලදුව, එය තමා සන්තකයේ ඇති යම් තැනැත්තකු විසින් දින දහයක් ඇතුළත එය ඉදිරිපත් කිරීමට ප්‍රතික්ෂේප කරන ලද අවස්ථාවක දී,

එසේ ප්‍රතික්ෂේප කරන ඒ සෑම පදිංචිකරුවකුම, අයිතියක් ඇතැයි කියන්නකුම හෝ තැනැත්තකුම වරදකට වරදකරු විය යුතු අතර, වරදකරු කරනු ලැබූ විට රුපියල් පන්සියයකට නොවැඩි දඩයකින් දඬුවම් කරනු ලැබීමට යටත් වන්නේ ය.

**56.** (1) 55 වන වගන්තිය යටතේ ඉදිරිපත් කරන ලෙස ප්‍රාදේශීය සභාවක් විසින් ඉල්ලා සිටින ලද සෑම ඔප්පුවක්, ලේඛනයක් හෝ සාධකපත්‍රයක් ම එය අදාළ වන ස්ථානයේ දී හෝ ප්‍රාදේශීය සභාව විසින් නියම කළ හැකි වෙනත් ස්ථානයක දී හෝ ඉදිරිපත් කළ යුතු අතර, ඒවා ඉදිරිපත් කරන ලෙස ඉල්ලා සිටීමට එම වගන්තියෙන් පවරන ලද බලයට, අවශ්‍ය විය හැකි පරිදි ඔප්පු, ලේඛන සහ සාධක පත්‍ර පරීක්ෂා කිරීමේ සහ ඒවායේ පිටපත් ගැනීමේ බලය ද ඇතුළත් වන බව සැලකිය යුතු ය. ඔප්පු ඉදිරිපත් කරන ලෙස ඉල්ලා සිටීමේ බලයට, පරීක්ෂා කිරීමේ බලය ද ඇතුළත් විය යුතු බව.

(2) යම් ඔප්පුවක්, ලේඛනයක් හෝ සාධක පත්‍රයක් පරීක්ෂා කිරීමට හෝ එහි පිටපත් ගැනීමට, ප්‍රාදේශීය සභාව විසින් බලය දෙන ලද යම් තැනැත්තකුට ඊට ඉඩ දීම ප්‍රතික්ෂේප කරන හෝ පැහැර හරින සෑම තැනැත්තකුම වරදකට වරදකරු විය යුතු අතර, වරදකරු කරනු ලැබූ විට, රුපියල් පන්සියයකට නොවැඩි දඩයකින් දඬුවම් කරනු ලැබීමට යටත් වන්නේ ය.

**57.** 55 වන වගන්තියේ (1) වන උපවගන්තියෙහි සඳහන් යම් අවස්ථාවක දී, යම් ස්ථානයක ඉදි කරන ලද ගොඩනැගිල්ලකින් හෝ කොරටුවකින් හෝ සිදු කරන ලද බාධකයකින් යම් මංමාවතක් හෝ මාවතකට යාව පිහිටි යම් රජයේ ඉඩමක් ප්‍රසර්පණය කර තිබේ දැයි නිශ්චය කර ගැනීම සඳහා ප්‍රාදේශීය සභාවට හැකිවීම පිණිස ප්‍රාදේශීය සභාව විසින් තත් කාර්ය සඳහා බලය දෙන ලද යම් තැනැත්තකු විසින් අවශ්‍ය විය හැකි පරිදි ඒ ස්ථානය මැනීමත් ඒ මැනීමේ කාර්යයන් සඳහා ඒ ස්ථානයට සහ ඔහුගේ මතය අනුව ඇතුල් වීමට අවශ්‍ය විය හැකි කවර හෝ වෙන යම් ස්ථානයකට ඇතුල් වීමත් නීත්‍යානුකූල වන්නේ ය. ස්ථාන මැනීමට ඇති බලය.

විද්‍යාමාන ප්‍රසර්පණයක් පිළිබඳ අයිතිය ඔප්පු කිරීම අයිතිකරුට භාර කාර්යයක් විය යුතු බව.

**58.** (1) යම් ප්‍රාදේශීය සභාවක පාලනයට යටත් යම් මංමාවතක වීදි රේඛාව නියි බලය නොමැතිව වෙනස් කරනු ලැබ තිබෙන බව හෝ නවත්වා තිබෙන බව හෝ ඊට අවහිරයක් කර තිබෙන බව හෝ එය ප්‍රසර්පණය කර තිබෙන බව හෝ ඒ ප්‍රාදේශීය සභාවට පෙනී යන කවර අවස්ථාවක හෝ මංමාවත වෙන පැත්තකට හරවන ලදැයි කියන්නේ හෝ සැක කරනු ලබන්නේ යම් ඉඩමකින් ද, ඒ ඉඩමේ හෝ ඒ නැවැත්වීම හෝ බාධකය සිදු කරන ලදැයි හෝ ප්‍රසර්පණය කරන ලදැයි කියන්නේ හෝ සැක කරනු ලබන්නේ යම් ඉඩමක ද, ඒ ඉඩමේ පදිංචිකරු වෙත, ප්‍රාදේශීය සභාවේ විධානය පරිදි ඉඩම මැන තිබෙන බවට ලියවිල්ලකින් වූ දැන්වීමක් ප්‍රාදේශීය සභාව විසින් දිය යුතු අතර ඒ දැන්වීමේ සඳහන් කරනු ලැබිය යුතු ස්ථානයක දී ඒ මැනුම් පිඹුර ඒ පදිංචිකරු විසින් පරීක්ෂා කරනු ලැබිය හැකි බවද, ඒ දැන්වීම භාරදුන් දින සිට එක් මාසයක් ඇතුළත ඔහු විසින් හෝ ඔහු පදිංචිව සිටින්නේ යම් තැනැත්තකුගේ බලය යටතේ ද, ඒ තැනැත්තා විසින් ඒ ඒ ඉඩමට ඔහුගේ අයිතිය තහවුරු කිරීම සහ එබඳු යම් බාධකයක් හෝ ප්‍රසර්පණයක් ඉවත් කිරීම වැළැක්වීම සඳහා නීති කෘත්‍ය පවරනු ලැබුවහොත් මිස, 59 වන වගන්තියෙන් විධිවිධාන සලස්වනු ලැබ ඇති අන්දමින් ඒවා ඉවත් කිරීම සඳහා ප්‍රාදේශීය සභාව විසින් ක්‍රියා කරනු ලැබිය හැකි බව ද දැන්විය යුතු ය.

(2) (1) වන උපවගන්තියේ නිශ්චිතව සඳහන් කාලය ඇතුළත නීති කෘත්‍ය ඉදිරිපත් කරනු නොලැබුවහොත් හෝ නීති කෘත්‍ය ඉදිරිපත් කරනු ලැබූ මුත් යථා පරිදි නඩු පවරනු නොලැබුවහොත්, 59 වන වගන්තියේ විධිවිධාන සලස්වනු ලැබ ඇති පරිදි එවැනි යම් බාධකයක් හෝ ප්‍රසර්පණයක් වහාම ඉවත් කරනු ලැබීමට සැලැස්වීම ප්‍රාදේශීය සභාවේ කාර්යය විය යුතු ය.

(3) නීති කෘත්‍ය ඉදිරිපත් කරනු ලැබූ අවස්ථාවක දී, යම් මංමාවතක රේඛාව වෙනස් කරන ලදැයි හෝ වෙන පැත්තකට හරවන ලදැයි කියන්නේ යම් ඉඩමකින් ද ඒ ඉඩමට හෝ නැවැත්වීම හෝ බාධකය සිදු කරන ලදැයි ප්‍රසර්පණයක් කරන ලදැයි කියන්නේ යම් ඉඩමක ද, ඒ ඉඩමට ඇති අයිතිය ඔප්පු කිරීම ඒ ඉඩමේ අයිතිකරු යයි කියා සිටින පාර්ශ්වකරුට භාර කාර්යයක් විය යුතු ය.

බාධකයක් හෝ ප්‍රසර්පණයක් ඉවත් කිරීම.

**59.** (1) ප්‍රාදේශීය සභාවක පාලනයට යටත් යම් මංමාවතක් මත වූ බාධකයක් හෝ ප්‍රසර්පණයක් වහාම ඉවත් කරන ලෙස හෝ නතර කරන ලෙස ඒ බාධකය සිදු කළ හෝ ප්‍රසර්පණය කළ යම් තැනැත්තකු වෙත ඒ ප්‍රාදේශීය සභාව විසින් නත් කාර්යය සඳහා ඒ ප්‍රාදේශීය සභාව විසින් බලය පවරන ලද යම් තැනැත්තකුගේ මාර්ගයෙන් වාචිකව හෝ ලියවිල්ලකින් වූ දැන්වීමකින් නියමයක් කිරීම නීත්‍යානුකූල වන අතර, ඒ නියමය ලැබූ යම් තැනැත්තක විසින් යුක්ති සහගත කාලයක් ඇතුළත ඒ නියමය අනුව ක්‍රියා කිරීම ප්‍රතික්ෂේප කරනු ලැබුවහොත් හෝ පැහැර හරින ලැබුවහොත් හෝ ඒ නියමය කරනු ලැබිය යුතු නියම තැනැත්තා කවුරුන් ද යන වග සම්බන්ධයෙන් යම් සැකයක්

ඇති වුවහොත් ඒ බාධකයෙහි හෝ ප්‍රසර්පණයෙහි ඒ දැන්වීම යුක්ති සහගත කාලයක් සවි කර තිබීමෙන් පසුව ප්‍රාදේශීය සභාව විසින් ඒ බාධකය හෝ ප්‍රසර්පණය වහාම ඉවත් කරනු ලැබීමට සැලැස්වීම නීත්‍යානුකූල වන්නේ ය.

(2) (1) වන උපවගන්තිය යටතේ යම් බාධකයක් හෝ ප්‍රසර්පණයක් ඉවත් කිරීමේ හෝ නතර කිරීමේ කාර්යය සඳහා ප්‍රාදේශීය සභාව විසින් හෝ ප්‍රාදේශීය සභාව විසින් ලියවිල්ලකින් බලය දෙන ලද යම් තැනැත්තකු විසින් අවශ්‍ය විය හැකි තැනැත්තන් සමග සහ අවශ්‍ය විය හැකි උපකරණ සහ ද්‍රව්‍ය ද රැගෙන යම් ගෙයකට හෝ වෙනත් ස්ථානයකට, ගොඩනැගිල්ලකට, වත්තකට, කොරටුවකට ඇතුල්වී, එලෙස ඉවත් කිරීම හෝ අස් කිරීම සඳහා එහි දී අවශ්‍ය විය හැකි සියළුම ක්‍රියාමාර්ග ගැනීම හෝ ක්‍රියාවක් කිරීම නැතහොත් ක්‍රියා මාර්ග ගැනීමට හෝ ක්‍රියාවක් කිරීමට සැලැස්වීම නීත්‍යානුකූල වන්නේ ය.

(3) යම් බාධකයක් හෝ ප්‍රසර්පණයක් ඉවත් කිරීමෙහිලා හෝ නතර කිරීමෙහිලා ප්‍රාදේශීය සභාව විසින් දරන ලද වියදම එය එසේ දරන්නට හේතු වූ (1) වන උපවගන්තිය යටතේ වූ නියම යන් පිළිපැදීම පැහැර හැරීම කරන ලද්දේ යම් තැනැත්තකු විසින් ද, ඒ තැනැත්තා විසින් ගෙවනු ලැබිය යුතු ය; තව ද ගෙවන ලෙස ඉල්ලා සිටින ලදුව ඒ තැනැත්තා විසින් ඒ වියදම නොගෙවන ලද අවස්ථාවක දී ඒ තැනැත්තා පදිංචි ප්‍රදේශය සම්බන්ධයෙන් අධිකරණ බලය ඇති මහේස්ත්‍රාත් අධිකරණය වෙත ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා විසින් ඒ වියදම පිළිබඳව සහතික කළ යුතු ය. එවිට ඒ අධිකරණය විසින් පනවන ලද දඩයක් අය කර ගන්නා ආකාරයට ඒ වියදම අධිකරණය විසින් අයකර ගත යුතු අතර එසේ අය කරන සියලුම මුදල් අධිකරණය විසින් ප්‍රාදේශීය අර මුදලට ගෙවිය යුතු ය.

(4) යම් බාධකයක් හෝ ප්‍රසර්පණයක් ඉවත් කිරීම හෝ නතර කිරීම ඒ ස්ථානයට ඇති හිමිකම දක්වන සියලුම ඔප්පු, ලේඛන සහ සාධන පත්‍ර යථා පරිදි ඉදිරිපත් කිරීමෙන් පසුව කරන ලද නමුත් ඒ ස්ථානය ඊට හිමිකම කියන පාර්ශ්වකරුගේ දේපළ යැයි විනිශ්චය කරනු ලැබූ අවස්ථාවක දී, ඉන් සිදුවන සියළුම පාඩු හා හානි සඳහා ප්‍රාදේශීය සභාවෙන් වන්දි ලැබීමට ඒ පාර්ශ්ව කරුට හිමිකම් ඇත්තේ ය. එහෙත් ඒ සියලු ඔප්පු, ලේඛන සහ සාධන පත්‍ර ඒ ස්ථානයේ අයිතිකරු බවට හිමිකම් පාන පාර්ශ්වකරු විසින් ඉදිරිපත් කිරීම ප්‍රතික්ෂේප කරනු ලැබුවහොත් හෝ අතපසු කරනු ලැබුවහොත් එසේ නැතහොත් ඒ ඔප්පු, ලේඛන සහ සාධන පත්‍ර ඒ වෙනුවෙන් ඉල්ලීමක් කරනු ලැබූ දවස් දහයක් ඇතුළත ඉදිරිපත් කරනු නොලැබුවහොත් සහ එසේ තිබිය දී ඒ ගොඩනැගිල්ලක්, කොරටුවක් හෝ ප්‍රසර්පණයක් ප්‍රාදේශීය සභාව විසින් ඉවත් කිරීමට සලස්වනු ලැබූ අවස්ථාවක ඒ ස්ථානය එහි අයිතිකරු බවට හිමිකම් පාන පාර්ශ්වකරුගේ දේපළ බවට විනිශ්චය කරනු ලැබුව ද ඉන් සිදු වූ යම් පාඩුවක් හෝ හානියක් සඳහා වන්දියක් ලැබීමට ඒ පාර්ශ්වකරු හිමිකම් නොලබන්නේ ය.

## මංමාවත් ආදියට හානි පැමිණවීම

සැතපුම් ගල් පාලම් ආදිය විනාශ කිරීම.

**60.** පහත දැක්වෙන යම් ක්‍රියාවක් කරන සෑම තැනැත්තකුම වරදකට වරදකරු විය යුතු අතර, වරදකරු කරනු ලැබූ විට රුපියල් පන්සියයකට නොවැඩි දඩයකට ඔහු යටත් වන්නේ ය :—

(i) යම් මංමාවතකට අයත් වූ හෝ පාරවල් සෑදීමේ ද්‍රව්‍ය ලබා ගැනීම සඳහා ප්‍රයෝජනයට ගනු ලබන හෝ ඒ ද්‍රව්‍ය ලබා ගැනීම සඳහා කපා ඇති හෝ යම් වලක් හෝ ගල් වලක හෝ ඒ ආසන්නයේ ඉදි කර ඇති යම් සැතපුම් ගලක් සැතපුම් කණුවක්, මායිම් ගලක්, මායිම් කණුවක්, ලාම්පු කණුවක්, නියාමක කණුවක් හෝ යම් පාලමක්, බෝක්කුවක්, තාප්පයක්, ආරුක්කුවක්, බිත්තියක්, වේල්ලක්, කාණුවක්, සොරොව්වක්, පිල දොරක්, ඉවුරක්, ආධාරක බැම්මක්, ගොඩැල්ලක්, කරුවක්, කුළුණක්, ලාම්පුවක්, අත්වැලක්, දම්වැලක් හෝ වැටක් ඕනෑකමින් ම හෝ නොසැලකිලිමත්කමින් විනාශ කිරීම, උගුල්ලා දැමීම, විකෘත කිරීම, පෙරලා දැමීම, කැඩීම හෝ ඊට හානි පැමිණ වීම ;

(ii) යම් මාවතක් ප්‍රයෝජනයට ගනු ලැබීම තාවකාලික ලෙස වැළැක්වීම සඳහා හෝ එය අලුත්වැඩියා කරනා අතර එහි එහා මෙහා ගමන් කරන තැනැත්තකුට අනතුරක් හෝ හානියක් සිදුවීම වැළැක්වීම සඳහා යම් නිසි බලධරයකුගේ විධානය මත එහි තබන ලද හෝ ඉදි කරන ලද යම් වැටක්, කණුවක්, ගලක් ලී කොටයක් හෝ වෙනත් දෙයක් ඕනෑකමින්ම හෝ නිකරුණේ ඉවත් කිරීම ;

(iii) නිසි බලධරයකුගේ අවසරය නොමැතිව යම් මංමාවතකින් යම් ගල්, බොරලු, වැලි හෝ වෙනත් ද්‍රව්‍යයක් හෝ මඩ, කුණු, සුළඟට ගසා ගෙන යන දේ හෝ පස් එකතු කිරීම, ගොඩ ගැසීම හෝ රැගෙන යෑම ;

(iv) යම් මංමාවතකට හානි සිදුවන අන්දමින් ඒ මංමාවතෙන් හෝ මංමාවත මත හෝ මහා මාර්ගය තුළට යම් හස්තියකු, ගවයකු, අශ්වයකු, ඌරකු හෝ වෙනත් සතකු හෝ යම් වාහනයක් ගෙන යෑම හෝ දක්කීම හෝ ඒ මංමාවතකට අලාභහානි කිරීමට එහි යම් සතකුට ඉඩ හැරීම ;

(v) යම් මංමාවතකට යාබද යම් ඉඩමක අයිතිකරු හෝ පදිංචිකරුව සිටිමින් ඒ මංමාවතේ සිට හෝ ඒ මංමාවතේ සිට දිවෙන යම් අගලක හෝ කාණුවක සිට තමාගේ ඉඩම මැදින් හෝ ඉඩම තුළට ගලන ජලය එසේ ගලායෑම අවහිර වීමට ඉඩ හැරීම හෝ ඒ ඉඩමේ හෝ ගෙයි සිට

වතුර කැළිකසළ හෝ වෙනත් ද්‍රව්‍යයක් හෝ දෙයක් එකී යම් මංමාවතකට ගලාගෙන ඒමට හෝ ගසාගෙන ඒමට ඉඩහැරීම හෝ ඔහුගේ ගෙය හෝ ඉඩම ඉදිරිපිට ඇති යම් කාණුවක ජලය ගලා යෑමට බාධාවන පරිදි ඒ කාණුවේ කුණු හෝ අපවිත්‍ර ද්‍රව්‍ය එක් රැස්වීමට ඉඩ හැරීම;

(vi) ප්‍රාදේශීය සභාවෙන් කලින් ලබාගත් කැමැත්ත නොමැතිව තමාගේ ඉඩමේ කරනු ලබන යම් ක්‍රියාවකින් යම් මංමාවතක වූ යම් කාණුවක් හෝ බෝක්කුවක් ඔස්සේ හෝ එබඳු කාණුවකින් හෝ බෝක්කුවකින් නිදහසේ ජලය ගලා යෑමට බාධා කිරීම;

(vii) යම් මංමාවතකට අලාභ සිදුවන පරිදි, ඒ මංමාවත මත යම් ලීයක්, ගලක් හෝ වෙනත් දෙයක්, රෝද සහිත වාහනයකින් නොවන වෙනත් ක්‍රමයකින් ඇදගෙන යෑම හෝ ගෙන යෑම හෝ රෝද සහිත වාහනයක් තුළ සම්පූර්ණයෙන්ම හෝ කොටසක් වශයෙන් පටවා ගෙන යන යම් ලීයක්, ගලක් හෝ වෙනත් දෙයක් ඒ මංමාවත මත ඇදී යෑමට හෝ ඇතිල්ලෙමින් යෑමට ඉඩ හැරීම;

(viii) යම් මංමාවතක් මත හෝ ඒ හරහා යම් වේල්ලක්, අගලක්, කාණුවක් හෝ ජල මාර්ගයක් සෑදීම හෝ සෑදීමට සැලැස්වීම හෝ වෙනත් ක්‍රමයකින් යම් මහා මංමාවතක් මතුපිට කැඩීම හෝ ඊට අලාභහානි සිදු කිරීම;

(ix) ප්‍රාදේශීය සභාවේ අවසරය නොමැතිව හෝ ඒ අවසරයේ නියමයන්ට හා කොන්දේසිවලට අනුකූල නොවන ක්‍රමයකින් ස්ථිර වශයෙන් හෝ තාවකාලික වශයෙන් යම් මංමාවතක හෝ මංමාවතක් ඔස්සේ හෝ මංමාවතක් යට හෝ මංමාවතක් මත යම් කාණුවක්, කුළුණක්, ලාම්පුවක්, කම්බියක්, නලයක්, වැටක් හෝ වෙනත් පිරියතක්, ද්‍රව්‍යයක් හෝ වැඩ බිමක් ඉදි කිරීම, සිටුවීම, දැමීම හෝ ගොඩ නැගීම; හෝ

(x) යම් මංමාවතක පැති කාණුවේ පිට ගැට්ය අවුරා පාර දෙසට නෙරා යන සේ තමාගේ ගෙට අලුත් කොටසක් එකතු කිරීම හෝ යම් තාවකාලික ආධාරක මගින් හෝ වෙනත් ක්‍රමයකින් මංමාවතක යම් කොටසක් මත හෝ එහි පැති කාණුව මත යම් වර්ගයක බඩු විකිණීම පිණිස තැබීම හෝ පැති කාණුවලට කවර හෝ අන්දමකින් හානි සිදුවන ආකාරයට තමාගේ වාසස්ථාන ඉදිරිපිට කරත්තවලට බඩු පැටවීමට හෝ බඩු බෑමට සැලැස්වීම.

යම් සතකු පිට යෑම හෝ යම් සතකු දැක්කීම හෝ යම් වාහනයක් ධාවනය කිරීම තහනම් බව.

**61.** අලුත් මංමාවතක් ඉදි කරන ලද විට හෝ පවත්නා මංමාවතක අලුත්වැඩියා කිරීමක් ක්‍රියාත්මක කරන ලද විට, ඉදි කිරීමේ හෝ අලුත්වැඩියා කිරීමක් ක්‍රියාත්මක කරන ලද විට, ඉදි කිරීමේ හෝ අලුත්වැඩියා කිරීමේ කටයුතු නිම වීමෙන් පසු එක් මාසයකට නොවැඩි නිශ්චිත කාලසීමාවක් තුළ එම මංමාවතේ යම් සතකු පිට යෑම හෝ යම් සතකු දැක්කීම හෝ යම් වාහනයක් ධාවනය කිරීම, එම මංමාවතේ පාලනය දරන ප්‍රාදේශීය සභාව විසින් එම මංමාවතෙහි හෝ එම මංමාවතට පෙනෙන පරිදි ප්‍රදර්ශනය කරනු ලබන දැන්වීමක් මගින් තහනම් කිරීම නීත්‍යානුකූල වන්නේය. තව ද ඒ දැන්වීම උල්ලංඝනය වන පරිදි යම් ක්‍රියාවක් කරන සෑම තැනැත්තකුම වරදකට වරදකරු විය යුතු අතර, වරදකරු කරනු ලැබූ විට රුපියල් පන්සියයකට නොවැඩි දඩයකට යටත් වන්නේ ය.

කාණුව උඩින් තමාගේ ගෙට යෑමට පාලමක් ආදිය තැදීමට අයිතිකරු හෝ පදිංචිකරු බැඳී සිටින බව.

62. පැත්තකින් කාණුවක් තනා හාරා ඇති යම් මංමාවතකට යා වූ යම් ගෙයක හෝ ස්ථානයක අයිතිකරුට හෝ පදිංචිකරුට ඒ මංමාවතේ සිට ඒ ගෙට හෝ ස්ථානයට අවතීර්ණවීමේ මාර්ගයක් අවශ්‍ය වුවහොත් ඒ කාණුවේ දිගින් අඩි තුනකට කිසි විටක වත් අඩු නොවිය යුතු ප්‍රමාණයක් ආවරණය වන පාලමක්, වේදිකාවක් හෝ ආරුක්කුවක් ප්‍රාදේශීය සභාව යැගිමට පත්වන ආකාරයට දැමීමට ඔහු බැඳී සිටින්නේ ය; තව ද යම් තැනැත්තකුට එසේ පිහිටි යම් ගෙයකට හෝ ස්ථානයකට ඒ මංමාවතේ සිට අවතීර්ණ වීමට අයිතිය ඇති බවට ද ඒ පාලම වේදිකාව හෝ ආරුක්කුව සැපයිය යුතු බවට ප්‍රාදේශීය සභාව සෑහීමට පත්ව ඇති විට, එම පාලම, වේදිකාව හෝ ආරුක්කුව වහාම ඉදි කරන ලෙස එම ගෙයි හෝ ස්ථානයේ අයිතිකරුට හෝ පදිංචිකරුට ප්‍රාදේශීය සභාව විසින් නියම කිරීමත් සාධාරණ කාලයක් ඇතුළත එසේ එය ඉදි කිරීම ඔහු පැහැර හැරියහොත් ප්‍රාදේශීය සභාව විසින් එම වැඩය කරවීමත්, ඒ සඳහා දරන ලද වියදම් 59 වන වගන්තියේ සඳහන් වියදම අය කර ගැනීම සඳහා ඉන් විධිවිධාන සලස්වනු ලැබ ඇති ආකාරයෙන් අය කර ගැනීමත් නීත්‍යානුකූල වන්නේ ය.

මංවලට හානි පැමිණෙන අන්දමට ගස් වැවෙන්නට ඉඩ හැරීම.

**63.** තමා අයිතිකරු වන හෝ තමා පදිංචිව සිටින යම් ස්ථානයක යම් මංමාවතකට හානියක් සිදුවන අයුරින් යම් ගසක් වැවෙන්නට ඉඩ හරින යම් තැනැත්තකු ඒ හානිය නතර කිරීම සඳහා අවශ්‍ය පියවර ගන්නා ලෙස ඔහුට නියම කරමින් ප්‍රාදේශීය සභාව විසින් ඔහුට දැන්වීමක් භාර දීමෙන් පසුව ද දැන්වීමෙහි ඒ කාර්යය සඳහා නිශ්චිතව සඳහන් කරනු ලැබිය හැකි සාධාරණ කාලයක් ඉකුත් වීමෙන් පසුව ද එසේ වැවෙන්නට ඉඩ හරින්නේ නම් ඒ තැනැත්තා වරදකට වරදකරු විය යුතු අතර, වරදකරු කරනු ලැබීමෙන් පසු රුපියල් පන්සියයකට නොවැඩි දඩයකට ඔහු යටත් වන්නේ ය. තවද අවශ්‍ය පියවර ගැනීම වරදකරු විසින් පැහැර හැර ඇති විටක, ඔහු එසේ වරදකරු කරනු ලැබුවේ යම් මහේස්ත්‍රාත්වරයකු ඉදිරියේ ද ඒ මහේස්ත්‍රාත්වරයා විසින්, ඒ පියවර ප්‍රාදේශීය සභාව විසින් ගත යුතු බවටත් ඒ සඳහා දරන ලද වියදම් 59 වන වගන්තියේ සඳහන් වියදම් අයකර ගැනීම සඳහා විධිවිධාන සලස්වනු ලැබ ඇති ආකාරයෙන් අය කර ගත යුතු බවටත් විධාන කළ හැකි ය.

**64.** (1) ජලය හෝ රොන් මඩ ගලා ගෑමේ හෝ ගලා ගෑම වැඩි වීමේ හේතුව නිසා මංමාවතකට හානි සිදුවීමට ඉඩ ඇති පරිදි හෝ මංමාවතක තත්ත්වය දුබලවීමට හේතු විය හැකි පරිදි ඒ මංමාවත ආසන්නයේ පිහිටි යම් ඉඩමක් එළි කිරීම එහි වතුර බැස්සවීම හෝ කැලෑ කැපීම ආදී යම් ක්‍රියාවක් කිරීමට අදහස් කරන විට—

ආසන්න ඉඩම් එළි කිරීමෙන් වතුර බැස්ස වීමෙන් හෝ කැලෑ කැපීමෙන් මංමාවත්වලට හානි සිදු කිරීම

(අ) තමාගේ යෝජිත ක්‍රියාව ගැන ප්‍රාදේශීය සභාව වෙත ලියවිල්ලකින් දැන්වීමක් කිරීම; සහ

(ආ) ප්‍රාදේශීය සභාව විසින් ගනු ලබන පියවරවලට අතිරේකව මංමාවතකට සිදුවන හානිය හෝ ඒ මංමාවතේ තත්ත්වය දුබල වීම වැළැක්වීමට සාධාරණ ලෙස අවශ්‍ය විය හැකි සියලු පියවර තම වියදමින් ගැනීම

එහි ක්‍රියාව කිරීම අදහස් කරන සෑම තැනැත්තකුගේ ම කාර්යය වන්නේ ය.

(2) (1) වන උපවගන්තියෙන් නියම කර ඇති දැන්වීම නොදී ඒ උපවගන්තියේ සඳහන් යම් ක්‍රියාවක් කිරීමට භාර ගන්නා හෝ එහි සඳහන් නියමයන්ට අනුකූලව ක්‍රියා කිරීම අන්‍යාකාරයකින් පැහැර හරින යම් තැනැත්තකු එකී ක්‍රියා නිසා සිදු වූ යම් අලාභයක් සඳහාත් ඒ ක්‍රියාවල ප්‍රතිවිපාකයක් වශයෙන් සිදු විය හැකි යැයි බලාපොරොත්තු වූ අලාභයක් වැළැක්වීමේ හෝ ඊට පිළියම් යෙදීමේ කාර්යය සඳහා ප්‍රාදේශීය සභාව විසින් දරන ලද වියදම් කිසිවක් සඳහාත් වගකිව යුතු අතර එබඳු යම් අලාභයක හෝ වියදම්වල මුදල් 59 වන වගන්තියේ සඳහන් වියදම් අයකර ගැනීම සඳහා වූ විධිවිධාන සලස්වනු ලැබ ඇති ආකාරයෙන් අයකර ගත හැකි ය.

මංමාවත්වල කෙරෙන පීඩා ආදිය

**65.** (1) ප්‍රාදේශීය සභාවක් ඇතුළත යම් මංමාවතකට හෝ යම් මංමාවතක් තුළට හෝ මංමාවතකට නැතහොත් යම් මංමාවතක් තුළට යා හැකි වන පරිදි හෝ යම් හස්තියකු, මී ගවයකු, අශ්වයකු, බැටළුවකු, එළුවකු හෝ වෙනත් සතකු නිදැල්ලේ හරින හෝ නිදැල්ලේ හැරීමට ඉඩ හරින හෝ කවර වර්ගයක වුව සතකු, ඒ සතා අයත් වන යම් කාර්ත්තායකට හෝ, බෝට්ටුවකට බඳු පැටවීම හෝ ඉන් බඩු බෑම සඳහා අවශ්‍ය කාලය තුළ බැඳ තබා ඇත් නම් හෝ දිගේලි කර ඇත් නම් මිස, යම් මංමාවතකට හෝ මංමාවතක් තුළට ඒ සතාට යා හැකි වන පරිදි බැඳ තබන හෝ දිගේලි කරන නැතහොත් බැඳ තැබීමට හෝ දිගේලි කිරීමට ඉඩ හරින සෑම තැනැත්තකුම වරදකට වරදකරු විය යුතු අතර වරදකරු කරනු ලැබූ විට, රුපියල් පන්සියයකට නොවැඩි දඩයකට ඔහු යටත් වන්නේ ය. ඇ.රෑ

එසේ වුවද එවැනි යම් සතකු යම් මංමාවතක හෝ මංමාවතක් තුළ හමුවන නැතහොත් යම් මංමාවතක හෝ මංමාවතක් තුළට යා හැකි පරිදි බැඳ හෝ දිගේලි කර සිට හමුවන අවස්ථාවක, ඒ සතාගේ අයිතිකරු විසින් [illegible] සම්බන්ධයෙන් අධිකරණය යැයීමට පත් කළහොත් මිස, ඔහු විසින් අවස්ථෝචිත පරිදි ඒ සතා නිදැල්ලේ හරින ලද ලෙස හෝ නිදැල්ලේ හැරීමට ඉඩ හරින ලද ලෙස නැතහොත් බැඳ තබන ලද හෝ දිගේලි කරන ලද ලෙස හෝ බැඳ තැබීමට හෝ දිගේලි කිරීමට ඉඩ හරින ලද ලෙස සලකනු ලැබිය යුතු ය.

(2) ප්‍රාදේශීය සභා ප්‍රදේශයක් ඇතුළත යම් පාරක හෝ ඇතුළත බැඳ තබා ඇති හෝ අයාලේ හැසිරෙන හෝ බිම හාරමින් හෝ බිම වැතිර සිටින යම් ඌරකුගේ අයිතිකරුවකු වරදකට වරදකරු විය යුතු අතර, වරදකරු කරනු ලැබූ විට රුපියල් පනහකට නොවැඩි දඩයකට ඔහු යටත් වන්නේ ය. තවද එකී යම් පාරක හෝ ඇළක බැඳ සිටින, අයාලේ හැසිරෙන, බිම් හාරමින් හෝ බිම වැතිර සිටින යම් ඌරකු දකින යම් තැනැත්තකු විසින් එම ඌරා අල්ලා ගැනීම, ඌට වෙඩි තැබීම හෝ අන්‍යාකාරයකින් ඌ විනාශ කිරීම නීත්‍යනුකූල වන්නේ ය ; තව ද ඒ තැනැත්තා කැමති නම් ඒ වරද සිදු වූ ප්‍රදේශයේ යම් සාම නිලධරයකු හෝ පොලිස් නිලධරයකු වෙත ඒ ඌරා ගෙන යා හැකි අතර ඒ නිලධරයා විසින් නොපමාව ම ඒ ඌරා විකුණා ඒ විකිණීමෙන් ලත් මුදල ඒ තැනැත්තාට ගෙවිය යුතු ය.

(3) ප්‍රාදේශීය සභා ප්‍රදේශයක් ඇතුළත—

(අ) යම් මංමාවතක් ප්‍රයෝජනයට ගැනීමට බාධා කිරීමට තරම් වන පරිදි ඒ මංමාවතෙහි හෝ මංමාවතේ පසෙක පැදුරු, ඇඳුම් හෝ කවර ස්වභාවයක හෝ යම් ද්‍රව්‍ය කිසිවක් එල්ලා තබන හෝ අන්‍යාකාරයකින් ප්‍රදර්ශනය කර තබන ;

(ආ) යම් කරත්තයක් හෝ වෙනත් රථයක් යම් මංමාවතක් මත අගබුවකින් කැඩුණහොත් මිස, එකී කරත්තයක් හෝ රථයක් එහි වියගසෙහි ගොනුන්, අශ්වයන් හෝ වෙනත් සතුන් බැඳ නොමැතිව හෝ ඊට ඈඳා නොමැතිව යම් මංමාවතක තබන හෝ තැබීමට ඉඩ හරින සහ එවැනි අගබුවකින් කැඩුණු අවස්ථාවක් හි දී ඒ කරත්තය හෝ රථය ඉවත් කරගෙන යාමට අවශ්‍ය කාලයට වඩා වැඩි කාලයක් එය ඒ මංමාවතෙහි තබා ගෙන සිටින හෝ තබා ගෙන සිටීමට ඉඩ හරින ;

(ඇ) රථ වාහන ආඥාපනතින් හෝ මෝටර් වාහන පනතින් නියම කර ඇති පරිදි ලාම්පු සවි නොකරන ලද යම් වාහනයක් ඉර බැසීමෙන් පැය කාලකට පසුව සිට ඉර උදාවීමට පැය කාලකට පෙර දක්වා කාලසීමාව ඇතුළත යම් මංමාවතක තිබෙන්නට ඉඩ හරින ;

(ඈ) යම් දිය ඇලක් පාවිච්චි කිරීමට බාධා පැමිණෙන අන්දමින් ඒ දිය ඇලේ යම් බෝට්ටුවක් හෝ පහුරක් දමා යන;

(ඉ) යම් ගල්, ගඩොල්, පහුරු, ලී, වැලි, හුණු, සතුන්ගේ කසල, පිදුරු, කුණු හෝ යම් අගලකින් හෝ කාණුවකින් ගොඩ දමන ලද මඩ හෝ වෙනත් යම් ද්‍රව්‍යයක් හෝ දෙයක් යම් මංමාවතක, ගඟක හෝ ඇලක දමන හෝ ඊට විසි කරන සහ ඒ ද්‍රව්‍ය හෝ දෙය ඉවත් කිරීමට නියම වශයෙන් ම අවශ්‍ය විය හැකි කාල සීමාවට වැඩි කාලයක් තිබෙන්නට ඉඩ හරින;

(ඊ) ලී, ලැලි, යකඩ හෝ වෙනත් බඩු, ඒ ද්‍රව්‍යයක කොන් දෙකෙන් කවර හෝ කොනක් යම් කරත්තයක හෝ වෙනත් රථයක රෝද හෝ දෙපැත්ත ඉක්මවා පිටට නෙරා සිටින ලෙස පටවනු ලැබ, ඒ කරත්තය හෝ රථය යම් මාර්ගයක දක්කා ගෙන හෝ පදවාගෙන යන;

(උ) යම් මංමාවතක හෝ ඒ මත යම් ගොඩනැගිල්ලක්, වේදිකාවක්, බඩවැටියක්, අගලක්, හෝ වැටක් හෝ වෙනත් බාධකයක් තනා හෝ තැනීමට සලස්වා යම් මංමාවතක් ප්‍රසර්පණය කරන;

(ඌ) යම් කරත්තයක් හෝ වෙනත් රථයක් කන්දක් හෝ අනුක්‍රමයෙන් භූමියක් නගිද්දී හෝ බසිද්දී මග ඇහිරීමට හෝ එය නතර කිරීමට උපයෝගී කොට ගත් ගලක්, ලීයක් හෝ වෙනත් දෙයක් යම් මංමාවතක් මත තිබීමට සලස්වන හෝ තිබීමට ඉඩ හරින;

(එ) යම් මංමාවතක් ඔස්සේ වෙන යම් තැනැත්තකු ගමන් කිරීම හෝ ඔහුගේ ආරක්ෂාව යටතේ තිබෙන යම් රථයක්, බෝට්ටුවක්, පහුරක් හෝ වෙනත් වාහනයක් ගමන් කිරීම සිතාමතා යම් ආකාරයකින් වළක්වන

සෑම තැනැත්තකු ම වරදකට වරදකරු විය යුතු අතර, වරදකරු කරනු ලැබූ විට රුපියල් පන්සියයකට නොවැඩි දඩයකට ඔහු යටත් වන්නේ ය.

(4) ප්‍රාදේශීය සභා ප්‍රදේශයක් ඇතුළත යම් ඇලක හෝ ගංගාවක පහසුවෙන් යාත්‍රා කිරීමට අවහිර වන හෝ යම් අන්දමකින් බාධාවක් වන අයුරින් ඒ ඇලේ හෝ ගංගාවේ කොටුවක් හෝ වැටක් හෝ වෙනත් යම් බාධකයක් තබන හෝ පවත්වාගෙන යන සෑම තැනැත්තකුම වරදකට වරදකරු විය යුතු අතර වරදකරු කරනු ලැබූ විට රුපියල් පන්සියයකට නොවැඩි දඩයකට ඔහු යටත් වන්නේ ය. එසේ තබා ඇති හෝ පවත්වාගෙන යනු ලබන යම් කොටුවක්, වැටක් හෝ බාධකයක් ප්‍රාදේශීය සභාව විසින් කඩා දැමීම හෝ අන්‍යාකාරයකින් විනාශ කිරීම සහ ඒ සඳහා ගිය වියදම් 59 වන වගන්තියෙහි සඳහන් වියදම් අයකර ගැනීම සඳහා ඉන් විධිවිධාන සලස්වනු ලැබ ඇති ආකාරයෙන් අයකර ගැනීම නීත්‍යනුකූල වන්නේ ය.

අයාලේ යන ගවයන් අල්ලා ගැනීම.

66. (1) ප්‍රාදේශීය සභා ප්‍රදේශයක් ඇතුළත යම් මංමාවතක හෝ ඒ අවට බැඳ, දිගේලි කර හෝ අයාලේ යමින් සිට තමාට හමු වන යම් ගවයකු, මී ගවයකු, අශ්වයකු, බැටළුවකු, එළුවකු හෝ ඌරකු ඒ සතා යම් කරත්තයකට හෝ බෝට්ටුවකට අයත් නම් සහ බඩු පටවන හෝ බඩු බානතුරු ඒ කරත්තයේ හෝ බෝට්ටුවේ හෝ බැඳ ඇත්නම් ද මිස, ප්‍රාදේශීය සභාව විසින් ඊට කාර්යය සඳහා බලය දෙන ලද යම් තැනැත්තකු විසින් අල්ලා ගැනීම ද එසේ අල්ලා ගන්නා ලද සෑම සතකු ම ඒ සතුන් ගාල් කිරීම සඳහා සභාව විසින් පිහිටවනු ලැබ ඇති ගාලෙහි තැබීම ද නීත්‍යනුකූල වන්නේ ය.

(2) (1) වන උපවගන්තිය යටතේ අල්ලා ගනු ලැබූ කිසි ම සතකු ඒ සතා අල්ලා ගත් තැනැත්තාගේ ප්‍රයෝජනය සඳහා ප්‍රාදේශීය සභාව විසින් කලින් කල යෝජනා සම්මත මගින් නියම කරනු ලබන යම් මුදල් ප්‍රමාණයක් සහ සතා ගාල් කරගෙන සිටි එක් එක් දිනය සඳහා ප්‍රාදේශීය සභාව විසින් කලින් කල යෝජනා සම්මත මගින් නියම කරනු ලබන යම් වැඩිපුර මුදල් ප්‍රමාණයක් ද ගෙවනු ලැබුවහොත් මිස, ඒ සතාගේ අයිතිකරුට භාර නොදිය යුතු ය.

(3) යම් සතකු අල්ලා ගැනීමෙන් පසුව දවස් දහයක් ඇතුළත ගාලේ තබා ඇති ඒ සතා සම්බන්ධව යම් තැනැත්තකු විසින් හිමිකම් පානු නොලැබුවහොත් හෝ (2) වන උපවගන්තියෙන් නියම කර ඇති අයකිරීම් ගෙවනු නොලැබුවහොත් ප්‍රාදේශීය සභාව විසින් ඒ සතා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම ද ඒ විකිණීමෙන් ලත් මුදලින් ප්‍රාදේශීය සභාව විසින් කලින් කල යෝජනා සම්මත මගින් නියම කරනු ලබන යම් ප්‍රමාණයක මුදලක් එම සතා ඇල්ලූ තැනැත්තාට ගෙවීමෙන් සහ සතා ගාලෙහි ආරක්ෂා කිරීම සහ නඩත්තු කිරීම සඳහා එක් දිනකට ප්‍රාදේශීය සභාව විසින් කලින් කල යෝජනා සම්මත මගින් නියම කරනු ලබන ප්‍රමාණයක් අනුව ගණින් බලනු ලබන මුදලක් ගෙවීමෙන් පසුව ඉතිරි වන යම් ශේෂයක් තැන්පතුවක් ලෙස තබා ගැනීම ද විකිණීමේ දින සිට එක් අවුරුද්දක් වූ කාල සීමාවක් ඇතුළත ඒ ශේෂයට හිමිකම් ඇති යම් තැනැත්තකු ඒ මුදලට හිමිකම් කියනු නොලැබුවහොත් සහ ඒ ශේෂය ගෙවීම ලබා නොගතහොත් ඒ ශේෂය ප්‍රාදේශීය සභා අරමුදලට ගෙවීම ද නීත්‍යනුකූල වන්නේ ය.

(4) 1958 අංක 29 දරන සත්ව පනතේ කුමක් සඳහන්ව තිබුණද මේ පනත අදාළ වන සෑම ප්‍රාදේශීය සභා ප්‍රදේශයක ම මේ වගන්තියේ විධිවිධාන බල සහිත වන්නේ ය.

ගවයන් අල්ලන තැනැත්තන්ට බාධා කිරීම වරදක් බව

67. 66 වන වගන්තිය යටතේ හෝ 65 වන වගන්තියේ (2) වන උපවගන්තිය යටතේ යම් සතකු ඇල්ලීමට බලය ලත් තැනැත්තකුගේ නීත්‍යනුකූල භාරයෙන් එම සතා ඉවත් කර ගෙන යන හෝ ඒ තැනැත්තාගේ බලතල හෝ කාර්ය ක්‍රියාත්මක කිරීමෙහි දී හෝ ඉටු කිරීමෙහි දී ඒ තැනැත්තාට යම් අන්දමකින් හිරිහැර කරන හෝ බාධා පමුණුවන යම් තැනැත්තකු වරදකට වරදකරු විය යුතු අතර, වරදකරු කරනු ලැබූ විට රුපියල් පන්සියයකට නොවැඩි දඩයකට ඔහු යටත් වන්නේ ය.

## විශේෂ කාර්යයන් සඳහා මංමාවත් ප්‍රයෝජනයට ගැනීම

68. (ට්‍රෑම් රථ සේවයක් හෝ වෙනත් යම් වාහන ගමනා ගමන සේවයක් නොවන්නා වූ) ගෑස් ද විදුලි බලය, ජලය හෝ වෙනත් පොදු සේවයක් සැපයීමෙ හෝ යම් පෞද්ගලික ව්‍යවසායක හෝ අරමුණක කාර්යයන් සඳහා ප්‍රාදේශීය සභාවේ පාලනය යටතේ ඇති ප්‍රධාන මංමාවත් නොවන මංමාවත් ප්‍රයෝජනයට ගැනීමට ද මංමාවත් විෂය භාර අමාත්‍යවරයාගේ පූර්ව අනුමතය ඇතිව ප්‍රධාන මංමාවත් ප්‍රයෝජනයට ගැනීමට ද, එකී පොදු සේවය, අරමුණ හෝ ව්‍යවසාය සඵල අත් දමින් සංස්ථාපනය කිරීමේ හෝ පවත්වා ගෙන යෑමේ හෝ එය වෙනස් කිරීමේ හෝ සංවර්ධනය කිරීමේ කාර්යය සඳහා අවශ්‍ය යයි ප්‍රාදේශීය සභාව අදහස් කරන සියලුම වැඩ කිරීමට ද සියලු ඉදිකිරීම් හෝ යන්ත්‍ර සූත්‍ර ක්‍රියා කිරීමට ද නඩත්තු කිරීමට ද (මෙහි මින්මතු "ප්‍රවර්ධකයන්" යනුවෙන් සඳහන් කරනු ලබන) යම් තැනැත්තකුට හෝ යම් පුද්ගල මණ්ඩලයකට හෝ නීතිය මගින් සංස්ථාපනය කරන ලද යම් පළාත් පාලන ආයතනයකට බලය පැවරීම සඳහා යම් ප්‍රාදේශීය සභාවක් විසින් තනිවම හෝ වෙනත් යම් ප්‍රාදේශීය සභාවක් සමග අනුබද්ධව හෝ තත් කාර්යය වෙනුවෙන් වූ යම් විශේෂ ප්‍රඥප්තියක ඇති නියමයන්ට යටත්ව එකී ප්‍රවර්ධකයකු සමග කලින් කල ගිවිසුමකට එළඹිය හැකි ය.

විශේෂ කාර්යයන් සඳහා මංමාවත් ප්‍රයෝජනයට ගැනීමට බලය පැවරීම සඳහා ප්‍රාදේශීය සභාවල ඇති බලය.

69. (1) 68 වන වගන්තියේ සඳහන් යම් ගිවිසුමක කාර්යය සඳහා ද ගිවිසුම අදාළ වන යම් පොදු සේවයක්, පෞද්ගලික ව්‍යවසායක් හෝ අරමුණක් සම්බන්ධව මහජනයාගේ, ප්‍රාදේශීය සභාවේ සහ ප්‍රවර්ධකයන්ගේ අයිතිවාසිකම් සහ බැඳීම් ඉටුවීම සහතික කිරීමේ කාර්යය සඳහා ද ප්‍රාදේශීය සභාව විසින් පහත සඳහන් කාර්යයන් උදෙසා (ඒ වෙනුවෙන් යම් විශේෂ ප්‍රඥප්තියක් මගින් විධි විධාන සලස්වා ඇතිහොත් දුරට හැර) අතුරු ව්‍යවස්ථා සාදනු ලැබිය හැකි ය :—

පොදු ව්‍යවස්ථා.

(අ) ඒ අතුරු ව්‍යවස්ථා මගින් නියම කරනු ලැබිය හැකි කොන්දේසිවලට යටත්ව—

(i) ප්‍රාදේශීය සභාව වෙත සතු කොට ඇති යම් මංමාවතක, පස්, ගල් සහ පදික වේදිකා කඩා ලීමට;

(ii) එවැනි මංමාවතක් ඇතුළත හෝ යට කසළ කාණු, කාණු හෝ උමං විවර කිරීමට සහ කඩා ලීමට ;

(iii) එවැනි මංමාවතක්, ඒ ඔස්සේ, එකී යට හෝ ඒ මත යම් කාණුවක්, කුළුණක්, ලාම්පුවක්, කම්බියක්, නළයක්, අත්වැලක් හෝ වෙනත් යන්ත්‍රයක්, ද්‍රව්‍යයක් හෝ කර්මාන්තයක් ස්ථිර ලෙස හෝ තාවකාලික ලෙස ඉදි කිරීමට, සවි කිරීමට හෝ පිහිටුවීමට ;

(iv) එවැනි මංමාවතක හෝ ඒ අසල ඇති යම් පොදු සේවා මාර්ගයක්, කම්බියක් හෝ වෙනත් උපකරණයක් හෝ යන්ත්‍රයක් පිහිටා ඇති ආකාරය වෙනත් යම් පොදු සේවාවක කාර්යයක් සඳහා වෙනස් කිරීමට

ප්‍රවර්ධකයන්ට සහ ඔවුන්ගේ අනුයෝජිතයන්ට සේවකයන්ට හෝ වැඩකරුවන්ට හෝ ප්‍රාදේශීය සභාවේ නියෝජිතයන්ට, සේවකයන්ට හෝ වැඩ කරුවන්ට බලය පැවරීම;

(ආ) එකී අතුරු ව්‍යවස්ථා මගින් දී ඇති බලතල ක්‍රියාත්මක කිරීමේ දී සිදුවන අලාභ හැකිතාක් අඩුවෙන් සිදුවන පරිදි ක්‍රියා කරන ලෙස සහ එකී බලතල ක්‍රියාත්මක කිරීමේ දී සිදු වූ යම් අලාභයක් සඳහා වන්දි සලසන ලෙස ප්‍රවර්ධකයන්ට නියම කිරීම;

(ඇ) ඒ අතුරු ව්‍යවස්ථා යටතේ කිරීමට ප්‍රවර්ධකයන්ට බලය ලැබී ඇති යම් වැඩක් හැකිතාක් ඉක්මණින් සම්පූර්ණ කරන ලෙසත්, ඉවත් කිරීමට, වෙනස් කිරීමට හෝ බාධා කිරීමට ඒ අතුරු ව්‍යවස්ථා අනුව බලය ලැබී ඇති යම් මංමාවතක්, කසළ කාණුවක, කාණුවක්, උමගක් හෝ යම් යන්ත්‍රයක් හෝ උපකරණයක් යළි ඉදි කරන ලෙස, අලුත්වැඩියා කරන ලෙස, ප්‍රකෘතිමත් කරන ලෙස ඒ ප්‍රවර්ධකයන්ට නියම කිරීම;

(ඈ) තමන්ගේ වැඩවල ප්‍රතිඵලයක් වශයෙන් ගොඩනැගෙන සියලුම කුණු කසළ ඉවත් කරන ලෙස සහ අස් කරන ලෙස සහ ඒ සම්බන්ධයෙන් මහජන ආරක්ෂාව සඳහා නිසි පූර්වාරක්ෂක විධිවිධාන සලස්වන ලෙස ප්‍රවර්ධකයන්ට නියම කිරීම;

(ඉ) මේ වගන්තිය යටතේ වූ යම් අතුරු ව්‍යවස්ථාවක් මගින් බලය දී ඇති යම් වැඩවලට අවසර දීම හෝ ඊට බාධා කිරීම තහනම් කිරීම.

(2) ප්‍රාදේශීය සභාව වෙත සතු කොට නොමැති යම් ගොඩනැගිල්ලකට හෝ ඉඩමකට, එම ගොඩනැගිල්ලේ හෝ ඉඩමේ අයිතිකරුවන්ගේ සහ පදිංචි කරුවන්ගේ කැමැත්ත පළමුවෙන් ලබා නොගෙන, මොනයම් ඇතුල්වීමකට හෝ එහි යම් ද්‍රව්‍යයක් හෝ යන්ත්‍රයක් ඉදි කිරීමට හෝ තැන්පත් කිරීමට හෝ යම් වැඩක් කිරීමට මේ වගන්තිය යටතේ වූ කිසිම අතුරු ව්‍යවස්ථාවක් මගින් බලය නොපැවරිය යුතු ය.

අසාමාන්‍ය රථවාහන ධාවනය නිසා දරන්නට සිදුවන වියදම්.

70. (1) යම් ප්‍රාදේශීය සභාවක පාලනය යටතේ ඇති යම් මංමාවතක අධික බරක් ගෙන යෑමෙන් හෝ අසාමාන්‍ය රථවාහන පැදවීමෙන් සිදුවන හෝ සිදුවීමට ඉඩ ඇති අලාභ හේතු කොටගෙන එම මංමාවත නඩත්තු කිරීමෙහිලා ප්‍රාදේශීය සභාව විසින් අති මහත් වියදමක් දරා ඇති බව, අවට ප්‍රදේශයේ මංමාවත් නඩත්තු කිරීමේ සාමාන්‍ය වියදම සැලකිල්ලට ගැනීමේ දී එම ප්‍රාදේශීය සභාවට පෙනී ගිය අවස්ථාවක දී අධික බර හෝ අසාමාන්‍ය රථවාහන ධාවනය නිසා සිදු වූ හෝ සිදුවීමට ඉඩ තිබූ හානිය හේතු කොට ගෙන ප්‍රාදේශීය සභාව විසින් දරන ලද බවට නිසි බලය ඇති අධිකරණයක් සෑහීමට පත්වන පරිදි ඔප්පු කළ හැකි වියදම් ප්‍රමාණය ඒ බර හෝ ඒ රථවාහන ගෙන ගියේ හෝ පැදවූයේ යම් තැනැත්තකුගේ නියමයකින්ද එසේ නැතහොත් යම් තැනැත්තකුගේ නියමයක ප්‍රතිඵලයක් වශයෙන්ද ඒ තැනැත්තාගෙන් අයකර ගැනීමට ප්‍රාදේශීය සභාවට හිමිකම් ඇති අතර ඒ අධික බර හෝ අසාමාන්‍ය රථවාහන ගමනාගමනය සම්බන්ධයෙන් එක්කෙනෙකුට වැඩි තැනැත්තන් ගණනක් විසින් වගකිව යුතු අවස්ථාවක දී අදාළ අධිකරණයේ මතය අනුව එක් එක් තැනැත්තාට සාධාරණව නියම කළ හැකි පරිදි එසේ දරන ලද වියදමේ සමානුපාතික කොටසක් ප්‍රාදේශීය සභාව විසින් එක් එක් තැනැත්තාගෙන් අය කරගත හැකි ය.

(2) මේ වගන්තිය යටතේ ප්‍රාදේශීය සභාවක් විසින් වියදම් අය කර ගන්නේ හෝ අයකර ගත හැකි වන්නේ යම් තැනැත්තකුගෙන්ද ඒ තැනැත්තා විසින් එබඳු බර හෝ රථවාහන සම්බන්ධයෙන් වන්දි වශයෙන් ප්‍රාදේශීය සභාවට මුදල් ගෙවීම සඳහා එම ප්‍රාදේශීය සභාව සමඟ එකඟවීමකට එළඹිය හැකි අතර එබඳු එකඟවීම අනුව මුදල් ගෙවන ලද අවස්ථාවක දී ඒ තැනැත්තාට විරුද්ධව මේ වගන්තිය යටතේ නඩු පැවරීම හෝ නීති කෘත්‍යයක් පවත්වා ගෙන යෑම නොකළ යුතු ය.

(3) මේ වගන්තිය යටතේ යම් වියදම් අයකර ගැනීම සඳහා වූ නීති කෘත්‍ය ඒ වියදම් දරන ලද වේලාවේ සිට මාස දොළහක් ඇතුළත ආරම්භ කළ යුතු අතර, යම් වියදමක් දරන ලද්දේ දීර්ඝ කාලසීමාවක් මුළුල්ලේ පැතුරුණු යම් විශේෂ කොන්ත්‍රාත්තුවක හෝ වැඩක ප්‍රතිඵලයක් වශයෙන් වූ අවස්ථාවක දී ඒ නීති කෘත්‍යය ඒ කොන්ත්‍රාත්තුව හෝ වැඩය අවසාන වීමෙන් පසු හය මසක් ගත වීමට පෙර ආරම්භ කළ යුතු ය.

## නිලධරයන් ආදීන්ගේ බලතල, කාර්ය සහ වගකීම්

පොදු වැඩ භාරව සිටින නිලධරයන් වෙත පවරනු ලබන බලතල ක්‍රියාත්මක කළ හැක්කේ කවුරුන් විසින් ද යන වග.

71. ප්‍රාදේශීය සභාවක ප්‍රදේශ සීමා ඇතුළත පිහිටි ප්‍රධාන මංමාවත් නොවන මංමාවත් සම්බන්ධයෙන්, මේ කොටස අදාළ වන්නා වූ වැඩ භාරව සිටින නිලධරයන් වෙත මේ කොටසින් පවරනු ලබන වෙන් වෙන් බලතල සහ අධිකාර, ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා විසින් සහ ඒ වෙනුවෙන් ඔහු විසින් ලියවිල්ලකින් බලය දෙන ලද සියලු තැනැත්තන් විසින්ම හෝ ඔවුන්ගේ සේවකයන්, වැඩකරුවන් සහ නයිකරුවන් විසින් හෝ ක්‍රියාත්මක කරනු ලැබිය යුතු සහ ක්‍රියාත්මක කරනු ලැබිය හැකි ය.

සභා නිලධරයන් විසින් කරනු ලබන මැනීම තීරණාත්මක සාක්ෂිය විය යුතු බව.

72. ප්‍රාදේශීය සභාවේ විධානයෙන් හෝ සභාව අනුප්‍රාප්තිකයා වන යම් අධිකාරියක් විසින් හෝ එහි විධානයෙන් හෝ සාදන ලද යම් පිඹුරක් හෝ මැනීමක් මේ කොටස යටතේ වූ යම් නීති කෘත්‍යයක දී සාක්ෂි වශයෙන් ඉදිරිපත් කරනු ලැබුවහොත්, ප්‍රාදේශීය සභාවේ හිමිකම් පෑමට සම්බන්ධ වනතාක් ප්‍රමාණයට ඒ පිඹුර හෝ මැනීම, එම හිමිකම් පෑම ගැන විවාද කරන පාර්ශ්වය විසින් ප්‍රතිවිරුද්ධ තත්ත්වය ඔප්පු කරනු ලැබුවහොත් මිස, එහි දක්වා ඇති කරුණු පිළිබඳව තීරණාත්මක සාක්ෂිය ලෙස සැලකිය යුතුවාක් මෙන්ම එලෙසින්ම පිළිගත යුතු ය.

බලයලත් නිලධරයන් විසින් දේපළවලට කරන හානි සඳහා වන්දි.

73. මේ කොටස අදාළ වන වැඩ භාරව සිටින නිලධරයන් වෙත මේ කොටසින් පවරනු ලැබ ඇති බලතල හෝ අධිකාර කිසිවක් යම් ප්‍රාදේශීය සභාවක සභාපතිවරයා විසින් හෝ සභාපතිවරයාගේ බලය පිට හෝ ක්‍රියාත්මක කිරීමේ හේතුව නිසා යම් පාඩුවක් හෝ අලාභයක් විඳින සෑම තැනැත්තකුටම (ඒ පාඩුව හෝ අලාභය ඒ තැනැත්තාගේ ක්‍රියාවක්, පැහැර හැරීමක් හෝ නොසැලකිල්ලක් නිසා සිදු වූ අවස්ථාවක දී හැර) වන්දිය සඳහා හිමිකම් ඇති වීමෙන් පසුව මාස තුනක් ගතවීමට පෙර යම් වේලාවක ඔහු විසින් වන්දි සඳහා ප්‍රාදේශීය සභාවට ඉල්ලීමක් ඉදිරිපත් කළහොත් එකී පාඩුව හෝ අලාභය සඳහා වන්දි ලැබීමට ඔහුට හිමිකම් ලැබිය යුතු ය. ඉහත කී කාලසීමාව ඇතුළත එබඳු ඉල්ලීමක් ඉදිරිපත් කිරීම එකී යම් තැනැත්තකු විසින් පැහැර හරිනු ලැබූ අවස්ථාවක සිදුවී ඇතැයි කියන පාඩුව හෝ අලාභය වෙනුවෙන් වන්දි සඳහා වන ඔහුගේ හිමිකම් පෑමට ඉඩ නොදිය යුතු අතර ඔහු වන්දි ලබා ගැනීමෙන් වළක්වාලිය යුතු ය.

බේරුම් කිරීම.

74. යම් හේතුවක් නිසා 73 වන වගන්තිය යටතේ ගෙවිය යුතු යම් වන්දි මුදලක් ගැන ප්‍රාදේශීය සභාව හිමිකම්පාන්නා අතර එකඟත්වයක් ඇති නොවූ අවස්ථාවක ප්‍රාදේශීය සභාව විසින් නම් කළ යුතු එක් තැනැත්තකු ද හිමිකම්පාන්නා විසින් නම් කළ යුතු තවත් තැනැත්තකු ද වශයෙන් වූ බේරුම්කරුවන් දෙදෙනකු විසින් එකී වන්දි ප්‍රමාණය තීරණය කළ යුතු ය. බේරුම්කරුවන් දෙදෙනාට එකඟත්වයකට එළඹිය නොහැකි වුවහොත් ඔවුන් විසින් තීරකයකු පත් කළ යුතු අතර, සභාව සහ හිමිකම්පාන්නා විසින් එකඟ වන ලද නියමයක් අනුව, අවස්ථෝචිත පරිදි, බේරුම්කරුවන් හෝ තීරක විසින් දෙන ලද තීරණය අවසානාත්මක විය යුතු ය.

රාත්‍රී කාලයේ දී මහා මාර්ග මත ගල් ආදිය දමා යන නිලධරයන් හා කොන්ත්‍රාත් කරුවෝ.

75. යම් මංමාවතක යම් වැඩක් භාරව සිටින ප්‍රාදේශීය සභාවක යම් නිලධරයකු විසින් හෝ එකී යම් ප්‍රාදේශීය සභාවක් සමග වූ යම් කොන්ත්‍රාත්තුවක් ප්‍රකාර යම් මංමාවතක කටයුතුවල යෙදී සිටින යම් තැනැත්තකු විසින් එම මංමාවත මත යම් ගල් ගොඩක්, බොරලු ගොඩක්, කුණු ගොඩක් හෝ කවර හෝ වෙනත් ද්‍රව්‍ය ගොඩක් දැමුවහොත් හෝ දැමීමට සැලැස්වුවහොත් සහ එම මංමා

වන ඔස්සේ ගමන් කරන යම් තැනැත්තකුට අනතුරක් හෝ පෞද්ගලික අලාභ හානියක් වන පරිදි ඒ ගොඩ (එබඳු අනතුරක් හෝ අලාභ හානියක් සිදුවීම වැළැක්වීම පිණිස ඔහු විසින් සියලු කිසි සහ සැහෙන පූර්වාරක්ෂක විධිවිධාන සලස්වා නොමැතිව) රාත්‍රි කාලයේ දී එසේ තිබීමට ඉඩ හැරියොත් එකී නිලධරයා හෝ තැනැත්තා වරදක් කරන අතර වරදකරු කරනු ලැබූ විට රුපියල් පන්සියයකට නොවැඩි දඩයකට ඔහු යටත් වන්නේ ය.

**76.** 75 වන සහ 218 වන වගන්තිවල විධිවිධාන සලස්වා ඇති ප්‍රකාර හැර යම් මහාමාර්ගයක යම් වැඩක් භාරව සිටින ප්‍රාදේශීය සභාවේ යම් නිලධරයකු හෝ ප්‍රාදේශීය සභාව යටතේ වූ යම් කොන්ත්‍රාත්කරුවකු, ඒ නිලධරයාගේ තනතුරේ කාර්ය ඉටු කිරීමෙහිලා ඒ නිලධරයා විසින් කරන ලද හෝ ඒ කොන්ත්‍රාත්කරුගේ ගිවිසුම ක්‍රියාත්මක කිරීමේ දී හෝ ඉටු කිරීමේ දී ඒ කොන්ත්‍රාත්කරු විසින් කරන ලද යම් ක්‍රියාවක් සම්බන්ධව යම් නඩු පැවරීමකට හෝ යම් දඬුවමකට මේ කොටසේ සඳහන් කිසිවක් නිසා යටත් නොවිය යුතු ය.

*ඇතැම් අවස්ථාවල දී හැර මාර්ග නිලධරයකු හෝ මාර්ග කොන්ත්‍රාත් කරුවකු දඬුවමට යටත් නොවන බව.*

**77.** තමන් පත් කරනු ලැබ සිටින්නේ යම් කොට්ඨාසයක් හෝ ප්‍රදේශයක් වෙනුවෙන් ද, ඒ කොට්ඨාසයේ හෝ ප්‍රදේශය ඇතුළත යම් කොටසට පටහැනිව කෙරෙන සියලු වැරදි වැළැක්වීමෙහිලා ආධාර සහ උපකාර කිරීම සාමාන්‍යයෙන් පොලිස් හමුදාවේ සියලු නිලධරයන්ගේ ද ග්‍රාම සේවා නිලධරයන්ගේ ද කාර්යය විය යුතු ය.

*පොලිස් නිලධරයන් සහ ග්‍රාම සේවා නිලධරයන් මේ කොටසේ විධිවිධාන බලාත්මක කළ යුතු බව.*

## IV වන කොටස

### මහජන සෞඛ්‍ය පිළිබඳ බලතල සහ කාර්යය

#### මහජන සෞඛ්‍යය

**78.** (1) වෙනත් යම් අධිකාරියකට නීතියෙන් පවරන ලද බලතල සහ වගකීම් වලට යටත්ව, එක් එක් ප්‍රාදේශීය සභා ප්‍රදේශය ඇතුළත මහජන සෞඛ්‍ය ප්‍රවර්ධනය කිරීමේ සහ ආරක්ෂා කිරීමේ කාර්යයන් සඳහා වූ පොදු පරිපාලන අධිකාරිය විය යුතු අතර, මේ පනතින්, පීඩා පිළිබඳ ආඥාපනතින්, නිවාස සහ නාගර සංවර්ධන ආඥාපනතින් සහ ඒ සඳහා තත්කාලයේ බලපවත්නා යම් ලිඛිත නීතියකින් ඊට පවරා ඇති පොදු බලතල ඒ කාර්ය සඳහා ක්‍රියාත්මක කිරීමේ යිම්කම ඒ සභාවට තිබිය යුතු ය.

*ප්‍රාදේශීය සභාව පොදු මහජන සෞඛ්‍ය අධිකාරිය විය යුතු බව.*

(2) මේ පනතින් හෝ ඒ යටතේ ප්‍රාදේශීය සභාව වෙත සතු කරන ලද, පවරන ලද හෝ නියම කරන ලද මහජන සෞඛ්‍යයට අදාළ කරුණු සම්බන්ධයෙන් වූ බලතල, කාර්ය සහ කර්තව්‍ය ඉටු කිරීමේ දී ඒ ප්‍රාදේශීය සභාව, එහි සීමා ඇතුළත වූ සෞඛ්‍ය වෛද්‍ය නිලධරයා විමසා ක්‍රියා කළ යුතු ය. එවැනි සියලු කරුණු සම්බන්ධයෙන් ප්‍රාදේශීය සභාවට උපදෙස් දීම ද මහජන සෞඛ්‍යයට අදාළ කටයුතු ඒ ප්‍රදේශය තුළ කරගෙන යාම විධාන කිරීම හා අධීක්ෂණය ද ඒ සෞඛ්‍ය වෛද්‍ය නිලධරයාගේ වගකීම විය යුතු ය.

## ජලාපවහනය

ප්‍රාදේශීය සභාව පොදු කාණු ඉදි කළ යුතු බව.

**79.** ප්‍රාදේශීය සභාව විසින්, ඒ ප්‍රාදේශීය සභා ප්‍රදේශය තුළ සාර්ථකව ජලාපවහනය සඳහා අවශ්‍ය යැයි පෙනී යන පොදු ප්‍රධාන නල හෝ වෙනත් කාණු, කසල කාණු සහ ජල මාර්ග, කලින් කල සෑදීම, වෙනස් කිරීම, හෝ දීර්ඝ කිරීම කළ හැකි අතර, අවශ්‍ය වුවහොත් යම් වීදියක් හෝ වීදියක් ලෙස සැලසුම් කර ඇති නැත හොත් වීදියක් සඳහා අදහස් කර ඇති යම් ස්ථානයක් හෝ වීදියක් යටින් ඇති යම් උමං ගබඩාවක් හෝ සුරක්ෂිතාගාරයක් හෝ මැදින්, හරහා හෝ යටින් සහ සිදුවන අලාභ හැකිතාක් අඩුවන ලෙස ද යම් අලාභයක් සිදුවුවහොත් ඒ වෙනුවෙන් සම්පූර්ණ වන්දි සලසමින් ද (ඒ සම්බන්ධයෙන් ලියවිල්ලකින් යුක්ති සහගත දැන්වීමක් කිරීමකින් පසුව) යම් කොටු කර ඇති ඉඩම් හෝ වෙනත් කවර අන්දමක හෝ ඉඩම් තුළට, ඒ මැදින් හෝ යටින් ද ඒවා ඇමිය හැකි ය.

කාණු අලුත්වැඩියා කිරීම, වෙනස් කිරීම සහ වසා දැමීම ප්‍රාදේශීය සභාව සතු කාර්යයක් බව.

**80.** (1) ප්‍රාදේශීය සභාවක් විසින් පොදු කාණු බෝක්කු, පීලි සහ ජල මාර්ග සියල්ල හෝ ඉන් කිසිවක් නඩත්තු කිරීම ද කලින් කල අලුත්වැඩියා කිරීම ද සුදුසු යැයි ප්‍රාදේශීය සභාවට පෙනෙන ආකාරයට ඒවා විශාල කිරීම, වෙනස් කිරීම, උඩින් ආරුක්කු දැමීම හෝ වෙනත් ආකාරවලින් වැඩි දියුණු කිරීම ද කළ යුතු අතර ඒවායින් යමක් නිෂ්ප්‍රයෝජන හෝ අනවශ්‍ය බව ප්‍රාදේශීය සභාව විසින් අදහස් කරන විටක, එය වසා දැමීම, පිරවීම හෝ විනාශ කිරීම ඒ ක්‍රියාව නිසා කිසි කරදරයක් නොවන පරිදි කළ හැකි ය.

(2) යම් කාණුවක්, බෝක්කුවක්, පීල්ලක් හෝ ජල මාර්ගයක් වසා දැමීමේ, පිරවීමේ, විනාශ කිරීමේ හෝ වෙනස් කිරීමේ හේතුව නිසා, යම් තැනැත්තකුට එහි නීත්‍යානුකූල පාවිච්චියට ඇති අයිතිය නැති වූ අවස්ථාවක දී ප්‍රාදේශීය සභාව විසින් ඒ වෙනුවට වෙනත් සාර්ථක ආදේශක වැඩ පිළිවෙලක් අනලස්ව සැපයිය යුතු ය.

වර්ෂා ජලය සහ අපවහන ජලය පිට කිරීමට බාධා කිරීම.

**81.** වර්ෂා ජලය හෝ අපවහන ජලය ගලා බසින යම් ස්වභාවික දිය පාරක්, ඇළක්, වැවක්, වගුරක් හෝ ඉන් යම් කොටසක් ඒ වර්ෂා ජලය හෝ අපවහනය ඇතුළුවීම සඳහා විවෘතව තිබිය යුතු යැයි ප්‍රාදේශීය සභාවක් විසින් යෝජනා සම්මතයක් මගින් නිරණය කර ඇති කවර අවස්ථාවක දී වුව ද ඒ යෝජනා සම්මතය පිළිබඳ ලිඛිත දැන්වීමක් ප්‍රාදේශීය සභාවෙන් ලැබීමෙන් පසු වර්ෂා ජලය හෝ අපවහන ජලය නිර්බාධිතව ගලා ගෙන යෑමට බාධා වන හෝ අවහිර වන අන්දමින් දිය පාරක්, ඇළක්, වැවක් හෝ වගුරක් පුරවන සේ පුරවා තිබීමට ඉඩ හරින යම් තැනැත්තකු වරදක් කරන අතර වරදකරු කරනු ලැබූ විට රුපියල් පන්සියයකට නොවැඩි දඩයකට ද ඔහු යටත් විය යුතු ය.

එසේ වුවද—

(අ) වර්ෂා ජලය හෝ අපවහන ජලය ඇතුළු වී ගසා ගෙන යෑමට සභාපතිවරයාගේ මතය අනුව ප්‍රමාණවත් සහ සුදුසු වෙනත් ඇළක් හෝ කාණුවක් එකී දියපාරක්, ඇළක්,

වැවක් හෝ වගුරක් අයිතිකරු විසින් කලින් සාදාදෙනු ලැබුවහොත් එකී ස්වාභාවික දිය පාර, ඇළ, වැව හෝ වගුර එහි අයිතිකරු විසින් පිරවිය හැකි ය; තව ද,

(ආ) එබඳු වෙනත් ඇළක් හෝ කාණුවක් සෑදීමේ වියදම් සම්පූර්ණයෙන් ම හෝ ඉන් කොටසක් ප්‍රාදේශීය සභාව විසින් ප්‍රදානය කළ හැකි ය.

82. (1) යම් ප්‍රාදේශීය සභා ප්‍රදේශයක ඇති සෑම පෞද්ගලික කාණුවක් ම එම ප්‍රදේශයේ ප්‍රාදේශීය සභාවේ සෝදිසිය සහ පාලනය යටතේ තිබිය යුතු අතර, ඒ කාණුව අයත් ඉඩමේ හෝ ගොඩනැගිල්ලේ නැතහොත් ඒ කාණුව ඉදිකරනු ලැබුවේ යම් ඉඩමක හෝ ගොඩනැගිල්ලක ප්‍රයෝජනය සඳහා ද ඒ ඉඩමේ හෝ ගොඩනැගිල්ලේ අයිතිකරුවන්ගේ වියදමින්, ප්‍රාදේශීය සභාව විසින් නියම කරනු ලබන පරිදි ඒ කාණුව තැනීම, වෙනස් කිරීම, අලුත්වැඩියා කිරීම හෝ නිසි අයුරින් තබා ගැනීම කළ යුතු ය. කාණු සම්බන්ධ කාර්ය පාලනය.

(2) තත් කාර්ය සඳහා ප්‍රාදේශීය සභාව විසින් ලිඛිත දැන්වීමක් භාර දීමෙන් පසුව, දින අටක් ඇතුළත එම දැන්වීමේ නිශ්චිත ලෙස සඳහන්ව තිබිය හැකි පරිදි එබඳු යම් කාණුවක් වෙනස් කිරීම, අලුත්වැඩියා කිරීම හෝ නිසි තත්වයට පත් කිරීම ඒ කාණුව අයත් ඉඩමේ හෝ ගොඩනැගිල්ලේ අයිතිකරු විසින් නොසලකා හරිනු ලැබුවහොත් ප්‍රාදේශීය සභාව විසින් දැන්වීමෙහි සඳහන් ආකාරයට එකී කාණුව වෙනස් කිරීමට, අලුත්වැඩියා කිරීමට හෝ නිසි අයුරින් තබා ගැනීමට සලස්වනු ලැබිය හැකි අතර, ප්‍රාදේශීය සභාව විසින් ඒ වෙනුවෙන් දරන ලද වියදම්, අයිතිකරු විසින් ගෙවිය යුතුවාක් මෙන්ම මෙහි මින් මතු විධිවිධාන සලස්වනු ලැබ ඇති ආකාරයෙන් එය අයකර ගනු ලැබිය යුතු ය.

83. ප්‍රථමයෙන් ප්‍රාදේශීය සභාවේ ලිඛිත කැමැත්ත ලබා නොගෙන යම් ප්‍රාදේශීය සභා ප්‍රදේශයක් ඇතුළත පොදු කසළ කාණුවකට සම්බන්ධ වන අන්දමින් යම් කාණුවක් සාදන හෝ කාණුවක් හෝ කාණුවකට සම්බන්ධ වන අන්දමින් යම් කාණුවක් සාදන හෝ සෑදීමට සලස්වන කවර වුව ද තැනැත්තෙක් රුපියල් පන්සියයකට නොවැඩි දඩයකින් දඬුවම් ලැබිය යුතු වරදක් කරන අතර, එසේ සාදන ලද කාණුව ප්‍රාදේශීය සභාව විසින් කඩා බිඳ දැමීමට, වෙනස් කිරීමට, නැවත සෑදීමට හෝ ප්‍රාදේශීය සභාව සුදුසු යයි සිතන අයුරින් ඒ සම්බන්ධයෙන් අන්‍යාකාරයෙන් ක්‍රියා කිරීමට සැලැස්විය හැකි ය. තව ද, ප්‍රාදේශීය සභාව විසින් ඒ වෙනුවෙන් දරන ලද සියලු වියදම්, වරදට වරදකරු කරනු ලැබූ තැනැත්තා විසින් ගෙවිය යුතු අතර, මෙහි මින් මතු විධිවිධාන සලස්වනු ලැබ ඇති ආකාරයෙන් එය අය කර ගනු ලැබිය යුතු ය. පොදු කාණුවලට සම්බන්ධ වන අන්දමින් බලය රහිතව කාණු සෑදීම පිළිබඳ දණ්ඩනය.

ප්‍රාදේශීය සභාවේ අවසරයක් නොමැතිව කාණු උඩින් ගොඩනැගිලි ආදිය ඉදි නොකළ යුතු බව.

84. යම් ප්‍රාදේශීය සභාවක ලිඛිත කැමැත්ත නොමැතිව, ප්‍රාදේශීය සභාවේ සීමාව ඇතුළත ඇති යම් පොදු කාණුවක්, කසළ කාණුවක්, බෝක්කුවක්, පීල්ලක් හෝ දිය පාරක් උඩින් කිසිම අලුත් ගොඩනැගිල්ලක් ඉදි නොකළ යුතු ය. තවද, කිසියම් ගොඩනැගිල්ලක් එසේ ඉදිකරන ලද අවස්ථාවක ප්‍රාදේශීය සභාව විසින් එය කඩා බිඳ දමනු ලැබීමට හෝ ප්‍රාදේශීය සභාව සුදුසු යයි සිතන අන්දමෙන් එය සම්බන්ධයෙන් ක්‍රියා කිරීමට සැලැස්විය හැකි ය. තව ද ප්‍රාදේශීය සභාව විසින්, ඒ වෙනුවෙන් දරන ලද වියදම් වරදකට වරදකරු කරනු ලැබූ තැනැත්තා විසින් ගෙවිය යුතු අතර, මෙහි මින් මතු විධිවිධාන සලස්වනු ලැබ ඇති ආකාරයෙන් එය අයකර ගනු ලැබිය යුතු ය.

## වැසිකිළි

වැසිකිළි පහසුකම් පිළිබඳව ප්‍රාදේශීය සභාවේ කාර්යය.

85. (අ) එක් එක් ප්‍රාදේශීය සභා ප්‍රදේශයක් ඇතුළත වූ සියලු නිවාස, ගොඩනැගිලි සහ ඉඩම් සඳහා ප්‍රමාණවත් සහ නිසි වැසිකිළි ඉඩපහසුකම් සපයනු ලැබීම සහතික කිරීමට ඵලදායී පියවර ගැනීම ;

(ආ) එක් එක් ප්‍රාදේශීය සභා සීමාව ඇතුළත මහජනයා ගැවසෙන සියලු ස්ථාන වල අවශ්‍ය පරිදි පොදු වැසිකිළි ඉඩ පහසුකම් සැපයීම ; සහ

(ඇ) එක් එක් ප්‍රාදේශීය සභා සීමාව ඇතුළත සියලු පොදු සහ පෞද්ගලික වැසිකිළි නිසි අයුරින් සහ නිසි තත්ත්වයෙන් පවත්වාගෙන යන බවට වග බලා ගැනීම

ඒ ඒ ප්‍රාදේශීය සභාවේ කාර්යය විය යුතු ය.

අතිරේක වැසිකිළි ඉදිකිරීම.

86. (1) යම් වැසිකිළියක්, දිය වැසිකිළියක් හෝ නාන කාමරයක් නැතහොත් අතිරේක වැසිකිළියක්, දිය වැසිකිළියක් හෝ නාන කාමරයක් යම් නිවසකට හෝ ගොඩනැගිල්ලකට හෝ ඉඩමකට අනුයුක්ත කළ යුතු බව හෝ සැලසිය යුතු බව ප්‍රාදේශීය සභාවේ මතය වන යම් අවස්ථාවක, ප්‍රාදේශීය සභාව විසින්, ඒ නිවසේ හෝ ගොඩනැගිල්ලේ හෝ ඉඩමේ අයිතිකරු වෙත ලියවිල්ලකින් කරනු ලැබූ දැන්වීමක් මගින්, ඒ දැන්වීම භාරදීමේ දින සිට දින තිහක් ඇතුළත, ඒ දැන්වීමේ ඇතුළත් නියමයන්ට අනුකූලව, ඒ වැසිකිළිය, දිය වැසිකිළිය, හෝ නාන කාමරය සෑදීමට ඒ අයිතිකරුට නියම කරනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ තමා වෙත භාර දෙන ලද යම් දැන්වීමක නියමයක් අනුව එකී දින තිහක කාලය ඇතුළත කටයුතු කිරීම පැහැර හරින හෝ නොසලකා හරින සෑම අයිතිකරුවකු ම වරදක් කරන අතර, වරදකරු කරනු ලැබූ විට රුපියල් දෙසිය පණහක් නොඉක්මවන දඩයකට යටත් විය යුතු ය.

87. (1) වැඩකරුවන් හෝ කම්කරුවන් විශාල සංඛ්‍යාවක් සේව යෙහි නියුක්ත කරන යම් තැනැත්තකු වෙත භාර දෙනු ලබන ලිඛිත දැන්වීමක් මගින්, ප්‍රාදේශීය සභාවක් විසින්— කම්කරුවන් සේවයෙහි නියුක්ත කරන සේවා යෝජක යන් විසින් වැසිකිළි සැලසීම ඔවුන්ගේ කාර්යයක් බව.

(අ) ඒ තැනැත්තන් විසින් සේවයෙහි නියුක්ත කරගනු ලබන වැඩකරුවන් හෝ කම්කරුවන් සංඛ්‍යාව සැලකිල්ලට ගෙන අවශ්‍ය යයි ප්‍රාදේශීය සභාවට පෙනී යන යම් වැසිකිළි, දිය වැසිකිළි සහ කැසිකිළි සංඛ්‍යාවක් දැන්වීමෙහි නියම කරනු ලබන කාලය ඇතුළත සලසන ලෙසත් ; සහ ස්ත්‍රී පුරුෂ දෙපාර්ශ්වයේම තැනැත්තන් සේවයෙහි නියුක්ත කරනු ලබන අවස්ථාවක හෝ සේවයෙහි නියුක්ත කිරීමට අදහස් කරනු ලබන අවස්ථාවක හෝ පැමිණ සිටින අවස්ථාවක ස්ත්‍රී පුරුෂ එක් එක් වර්ගයේ තැනැත්තන් සඳහා වෙන වෙනම නිසි ඉඩකඩ සලසන ලෙස ; සහ

(ආ) එම වැසිකිළි සනීපාරක්ෂක තත්ත්වයකින් සහ නිසි පිළිවෙලට පවත්වාගෙන යන ලෙස

ඒ තැනැත්තාට නියම කරනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ දැන්වීමක් භාරදෙනු ලැබූ යම් තැනැත්තකු විසින්, ඒ වැසිකිළි, දිය වැසිකිළි හෝ කැසිකිළි සනීපාරක්ෂක තත්ත්වයකින් සහ නිසි පිළිවෙලට පවත්වා ගෙන යාම පැහැර හරින හෝ නොසලකා හරින අවස්ථාවක ප්‍රාදේශීය සභාව විසින්, ඒ වැසිකිළි, දිය වැසිකිළි හෝ කැසිකිළි ඉදිකිරීමට හෝ සනීපාරක්ෂක තත්ත්වයකින් හෝ නිසි පිළිවෙලට පවත්වා ගෙන යාමට සලස්වනු ලැබිය හැකි අතර, ඒ සම්බන්ධයෙන් ප්‍රාදේශීය සභාව විසින් දරන ලද වියදම් ඉහත කී තැනැත්තා විසින් ගෙවනු ලැබිය යුතු අතර, එලෙස ගෙවීමට පැහැර හරිනු ලැබුවහොත් මෙහි මින් මතු විධිවිධාන සලස්වා ඇති පරිදි එය අය කරගනු ලැබිය යුතු ය.

(3) (1) වන උපවගන්තිය යටතේ තමා වෙත භාරදෙනු ලබන යම් දැන්වීමේ නියමිත කාලය ඇතුළත, ඒ දැන්වීමෙහි නියමයක් අනුව කටයුතු කිරීම පැහැර හරින හෝ නොසලකා හරින හැම තැනැත්තකුම, වරදකට වරදකරු විය යුතු අතර, වරදකරු කරනු ලැබූ විට, රුපියල් දෙසිය පනහක් නොඉක්මවන දඩයකට යටත් විය යුතු ය.

88. (1) වැසිකිළියක් පිහිටි යම් නිවසක හෝ ගොඩනැගිල්ලක හෝ ඉඩමක අයිතිකරු විසින් හෝ පදිංචිකරු විසින්, අවට ප්‍රදේශ යේ පදිංචිව සිටින හෝ ඒ අසලින් එහා මෙහා ගමන් කරන තැනැත්තන්ට ඒ වැසිකිළිය නොපෙනෙන ලෙස සෑහෙන වහල කින් සහ බිත්තියකින් හෝ වැටකින් එය ආවරණය කර තැබිය යුතු අතර, එබඳු යම් අයිතිකරුවකු විසින් හෝ පදිංචිකරුවකු විසින් විවෘත වැසිකිළියක් හෝ යම් වීදියක් දෙසට විවෘත වූ දොරක් හෝ කිම් දොරක් සහිත වැසිකිළියක් තබාගනු ලැබීම නීත්‍යානුකූල නො විය යුතු ය. පෞද්ගලික වැසිකිළි පොදු කිරීම නොසලකා හැරීම.

(2) (1) වන උපවගන්තියේ විධිවිධානවලින් කිසිවක් පිළිපැදීමට පැහැර හරින හෝ කඩකරන යම් නිවසක හෝ ගොඩනැගිල්ලක හෝ ඉඩමක අයිතිකරුවකු හෝ පදිංචිකරුවකු, වරදකට වරදකරු විය යුතු අතර, ඒ කඩකිරීම නොකඩවා කරනු ලබන එක් එක් දිනය සඳහා රුපියල් පනහක් බැගින් වූ දඩයකට යටත් විය යුතු ය :

එසේ වුව ද, යම් විවෘත වැසිකිළියක් හෝ යම් වීදියක් දෙසට විවෘත වූ දොරක් හෝ බිම් දොරක් සහිත යම් වැසිකිළියක්, එවක එන් පවතින්නා වූ ද ඉන් පීඩාවක් නොවන්නා වූ ද අවස්ථාවක දී, ප්‍රාදේශීය සභාව විසින් සුදුසු යයි ප්‍රාදේශීය සභාව අදහස් කරන කාලයක් සඳහා තවදුරටත් ඒ වැසිකිළිය තබා ගැනීමට එකී අයිතිකරුට අවසර දිය හැකි ය.

වැසිකිළි සම්බන්ධයෙන් සාමාන්‍ය පාලනය.

89. (1) යම් ප්‍රාදේශීය සභා ප්‍රදේශයක් ඇතුළත වූ සියලුම වැසිකිළි සහ වැසිකිළි වලවල්, එම ප්‍රාදේශීය සභාවේ සමීක්ෂණයට සහ පාලනයට යටත් විය යුතු අතර වැසිකිළි අයිති වන නිවාසවල, ගොඩනැගිලිවල හෝ ඉඩම්වල සහ වැසිකිළි ඉදිකරන ලද්දේ යම් නිවාසවල, ගොඩනැගිලිවල හෝ ඉඩම්වල ප්‍රයෝජනය සඳහා ද, ඒ නිවාසවල, ගොඩනැගිලිවල හෝ ඉඩම්වල ඒ ඒ අයිතිකරුවන්ගේ වියදමින්, ප්‍රාදේශීය සභාව විසින් නියම කරනු ලබන පරිදි ඒ වැසිකිළි සහ වැසිකිළි වලවල් වෙනස් කිරීම, අලුත්වැඩියා කිරීම හෝ නිසි තත්ත්වයෙන් තබා ගැනීම කළ යුතු අතර යම් වැසිකිළියක් ජල මුද්‍රා වැසිකිළියක් බවට පරිවර්තනය කළ හැකි ය.

(2) ප්‍රාදේශීය සභාව විසින් නියම කරනු ලබන ආකාරයට වැසිකිළිය හෝ වැසිකිළි වල වෙනස් කරන ලෙස හෝ අලුත්වැඩියා කරන ලෙස හෝ නිසි තත්ත්වයෙන් තබා ගන්නා ලෙස හෝ දන්වමින් ලිඛිත දැන්වීමක් භාරදීමෙන් පසුවත් මාසයක් ඇතුළත හෝ දැන්වීමේ නිශ්චය කරනු ලැබ තිබිය හැකි වෙනත් යම් කාල සීමාවක් ඇතුළත, එසේ කිරීම හෝ එම වැසිකිළිය ජල මුද්‍රා වැසිකිළියක් බවට පරිවර්තනය කිරීම යම් වැසිකිළියක් හෝ වැසිකිළි වලක් අයිතිවන යම් නිවසක ගොඩනැගිල්ලක හෝ ඉඩමක අයිතිකරු හෝ පදිංචිකරු පැහැර හැරියොත් නියමිත ආකාරයට ඒ වැසිකිළිය හෝ වැසිකිළි වල වෙනස් කිරීමට හෝ අලුත්වැඩියා කිරීමට හෝ නිසි තත්ත්වයෙන් තබා ගැනීමට හෝ එය ජල මුද්‍රා වැසිකිළියක් බවට පත් කිරීමට සභාව විසින් සලස්වනු ලැබිය හැකි ය ; තව ද ඒ සඳහා ප්‍රාදේශීය සභාව විසින් දරන ලද වියදම්, අයිතිකරු විසින් ගෙවිය යුතු අතර මෙහි මින් මතු විධිවිධාන සලස්වනු ලැබ ඇති ප්‍රකාර අයකර ගනු ලැබිය යුතු ය.

**90.** යම් තැනැත්තකු විසින්, යම් ප්‍රාදේශීය සභා ප්‍රදේශයක් ඇතුළත— ප්‍රාදේශීය සභාවේ විධානවලට හෝ අතුරු ව්‍යවස්ථාවලට පටහැනි වන අන්දමින් වැසිකිළි ආදිය සාදන හෝ වෙනස් කරන තැනැත්තන් සඳහා දණ්ඩ නියම.

(අ) ප්‍රාදේශීය සභාවේ විධානයන්ට පටහැනි හෝ මේ පනතේ හෝ ඒ යටතේ සම්පාදනය කරන ලද යම් අතුරු ව්‍යවස්ථාවක විධිවිධානවලට පටහැනිව යම් වැසිකිළියක් හෝ වැසිකිළි වලක් ඉදි කරනු ලැබුවහොත් ; හෝ

(ආ) කඩා ඉවත් කරන ලෙස හෝ වසා දමන ලෙස ප්‍රාදේශීය සභාව විසින් නියමයක් කරනු ලබන වැසිකිළියක් හෝ වැසිකිළි වලක් පාවිච්චි කිරීම නොකඩවා කරනු ලැබුවහොත් ; හෝ

ඒ තැනැත්තා රුපියල් පන්සියයකට නොවැඩි දඩයකින් දඬුවම් කරනු ලැබිය යුතු වරදකට වරදකරු විය යුතු ය.

**91.** (1) ප්‍රාදේශීය සභාව විසින් හෝ ඒ කාර්යය සඳහා ප්‍රාදේශීය සභාව විසින් බලය පවරන ලද යම් නිලධරයකු විසින් මේ පනතේ ප්‍රතිපාදනවලට යටත්ව, ස්වකීය ප්‍රදේශය ඇතුළත යම් වැසිකිළියක් හෝ වැසිකිළි වලක් පරීක්ෂා කරනු ලැබිය හැකි අතර ඒ කාර්යය සඳහා අවශ්‍ය විය හැකි සහායකයින් සහ කම්කරුවන් සමග යම් නිවසකට, ගොඩනැගිල්ලකට හෝ ඉඩමකට ඇතුල් වීමත් ඒ ප්‍රාදේශීය සභාව හෝ නිලධරයා සුදුසු යයි සිතන අවස්ථාවක දී, හැකි තරම් අඩුවෙන් අලාභ සිදු කරමින් පොළොව කැණීමත් ඒ සභාව හෝ නිලධරයා විසින් කළ හැකි ය. වැසිකිළි ආදිය පරීක්ෂා කිරීම.

(2) (1) වන උපවගන්තිය යටතේ යම් පරීක්ෂණයක දී, යම් වැසිකිළියක් හෝ වැසිකිළි වලක් නිසි අයුරින් හෝ නිසි තත්ත්වයෙන් නොපවතී යයි හෝ එය, ප්‍රාදේශීය සභාව සංස්ථාපනය කරන ලද දින සිට පසු මේ පනතේ හෝ ඒ යටතේ සාදන ලද අතුරු ව්‍යවස්ථාවල විධිවිධාන උල්ලංඝනය වන යම් අන්දමකින් හෝ ප්‍රාදේශීය සභාවේ විධානවලට පටහැනිව යම් අන්දමකින් ඉදිකර තිබේ යයි හෝ පෙනී ගියහොත්, ඒ පරීක්ෂණය පිළිබඳ වියදම්, ඒ වැසිකිළිය හෝ වැසිකිළි වල අයිතිව තිබිය හැකි තැනැත්තකු විසින් ගෙවිය යුතු අතර ඒවා මෙහි මින් මතු විධිවිධාන සලස්වා ඇති පරිදි අයකර ගත යුතු ය.

(3) යම් වැසිකිළියක් හෝ වැසිකිළි වලක්, නිසි අයුරින් හෝ නිසි තත්ත්වයෙන් පවතින බව සහ මේ පනතේ හෝ ඒ යටතේ සාදන ලද අතුරු ව්‍යවස්ථාවල විධිවිධාන හෝ ප්‍රාදේශීය සභාවේ විධාන උල්ලංඝනය කරමින් ඉදිකර නොමැති බව පෙනී ගියහොත් ප්‍රාදේශීය සභාව විසින් හෝ ප්‍රාදේශීය සභාවේ බලයලත් නිලධරයා විසින් හැකි ඉක්මණින් පොළොව වසා දැමීමට සලස්වා යථා තත්ත්වයට පත් කරවිය යුතු අතර එවැනි අවස්ථාවක දී ඊට ගිය වියදම් ප්‍රාදේශීය සභාව විසින් ගෙවිය යුතු ය.

වැසිකිළි කඩා ඉවත් කරන ලෙස හෝ වැසිකිළි වලවල් වසා දමන ලෙස හෝ නියම කිරීමට ප්‍රාදේශීය සභාවට ඇති බලය

92. (1) ප්‍රාදේශීය සභා ප්‍රදේශයක් ඇතුළත පිහිටි යම් නිවාසයක, හෝ ගොඩනැගිල්ලක හෝ ඉඩමක ඇති වැසිකිළියක් හෝ වැසිකිළි වලක ඒ ප්‍රාදේශීය සභාවේ හෝ නත් කාර්යය සඳහා ප්‍රාදේශීය සභාව විසින් බලය පවරන ලද යම් නිලධරයකුගේ මතය අනුව නිර්මාණ දෝෂයකින් යුක්ත වන හෝ එය අදහස් කරන ලද කාර්යය සඳහා අයෝග්‍ය වන හෝ පීඩාවක් ඇති කිරීමට තුඩුදිය හැකි වන අවස්ථාවක දී, ඒ වැසිකිළිය හෝ වැසිකිළි වල අලුත්වැඩියා කිරීමට වෙනස් කිරීමට, යළි ඉදි කිරීමට හෝ ඉවත් කිරීමට හෝ ඒ වෙනුවට වල වැසිකිළියක් තැනීමට ඒ නිවාසයේ, ගොඩනැගිල්ලේ හෝ ඉඩමේ අයිතිකරුට හෝ පදිංචිකරුට ඒ ප්‍රාදේශීය සභාව විසින් හෝ එසේ බලයලත් නිලධරයා විසින් ලිඛිත දැන්වීමක් මගින් නියම කරනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ ඒ වෙනුවෙන් දැන්වීමක් භාර දීමෙන් පසු එක් මාසයක් වූ කාල සීමාවක් ඇතුළත හෝ දැන්වීමේ නිශ්චිතව සඳහන්ව තිබිය හැකි වෙන යම් කාල සීමාවක් ඇතුළත දැන්වීම් අදාළ වන වැසිකිළිය හෝ වැසිකිළි වල අලුත්වැඩියා කිරීමට වෙනස් කිරීමට, යළි ඉදි කිරීමට හෝ කඩා ඉවත් කිරීමට හෝ ඒ වෙනුවට වල වැසිකිළියක් සැපයීමට යම් අයිතිකරුවකු විසින් හෝ පදිංචිකරුවකු විසින් පැහැර හරිනු ලැබුවහොත් ඔහු රුපියල් පන් සියයකට නොවැඩි දඩයකින් දඬුවම් ලැබිය යුතු වරදකට වරදකරු විය යුතු ය.

(3) (2) වන උපවගන්තියේ සඳහන් වැසිකිළිය හෝ වැසිකිළි වල අලුත්වැඩියා කිරීමට, වෙනස් කිරීමට, යළි ඉදි කිරීමට හෝ කඩා ඉවත් කිරීමට සහ ඒ වෙනුවට වල වැසිකිළියක් සැපයීමට ප්‍රාදේශීය සභාව විසින් හෝ බලය ලත් නිලධරයා විසින් සලස්වනු ලැබිය හැකි අතර, ඒ සම්බන්ධයෙන් ප්‍රාදේශීය සභාව විසින් දරන ලද වියදම් අයිතිකරු විසින් ගෙවිය යුතු අතර මෙහි මින් මතු විධිවිධාන සලස්වනු ලැබ ඇති පරිදි ඒවා අයකර ගත යුතු ය.

## මලාපවහනය සහ කසළ ශෝධනය

මලාපවහනය සහ කසළ ශෝධනය සම්බන්ධයෙන් ප්‍රාදේශීය සභාවේ කාර්යය

93. (අ) අඩි පාරවල් ද ඇතුළුව, වීදි නිසි පරිදි අතුගා පවිත්‍ර කිරීම සඳහා සහ, වීදිවල තිබෙන කසළ එකතු කර ඉවත් කිරීම සඳහා ;

(ආ) සියලුම නිවාසවල තිබෙන කසළ නිසි කාල සීමාවන්වල දී විධිමත් ලෙස ඉවත් කිරීම සහ සියලු වැසිකිළි සහ වැසිකිළි වලවල් නිසි කාල සීමාව තුළ දී විධිමත් ලෙස පවිත්‍ර කිරීම සහ හිස් කිරීම සඳහා ; සහ

(ඇ) වීදිවල තිබෙන සියලුම කසළ, නිවාසවල තිබෙන කසළ සහ මල බැහැර කිරීම සඳහා

ස්වකීය ප්‍රදේශය ඇතුළත හැකිතාක් දුරට අවශ්‍ය සියලු පියවර ගැනීම ප්‍රාදේශීය සභාවේ කාර්යය විය යුතු ය.

එකතු කරනු ලබන සියලුම කසළ ප්‍රාදේශීය සභාවේ දේපළ විය යුතු බව.

94. මේ කොටසේ විධිවිධාන යටතේ යම් ප්‍රාදේශීය සභාවක් විසින් එකතු කරනු ලබන විදිවල තිබෙන සියලුම කසළ, නිවාසවල තිබෙන කසළ, මල හෝ ඊට සමාන වෙනත් ද්‍රව්‍ය ප්‍රාදේශීය සභාවේ දේපළ විය යුතු අතර, ඒ සියලු ද්‍රව්‍ය විකිණීම සඳහා හෝ බැහැර කිරීම සඳහා ප්‍රාදේශීය සභාවට සම්පූර්ණ බලය තිබිය යුතු ය.

කසළ බැහැර කිරීම සඳහා සහ උපකරණ තැබීම සඳහා ස්ථාන.

95. මේ කොටසේ විධිවිධාන අනුව ඉවත් කරනු ලැබ, විදිවල එකතු වන කසළ, නිවාසවල එකතු වන කසළ, මල සහ එවැනි ද්‍රව්‍ය නිසි පරිදි බැහැර කිරීමට සහ එම කාර්යය සඳහා සහ මේ පනතේ වෙනත් යම් කාර්යයන් අතුරින් කිසිවක් සඳහා අවශ්‍ය කරන්නා වූ සියලුම වාහන සතුන්, උපකරණ සහ වෙනත් දේ තැබීමට පහසු ස්ථාන කලින් කලට සෑම ප්‍රාදේශීය සභාවක් විසින්ම සැපයිය යුතු අතර මේ කොටසේ විධිවිධාන අනුව ඉවත් කරනු ලබන එකී කසළ, මල හෝ එවැනි ද්‍රව්‍ය, පීඩාවක් සිදුවන අන්දමින් බැහැර නොකෙරෙන බවට වග බලා ගැනීමට අවශ්‍ය විය හැකි සියලුම වැඩ පිළිවෙළවල් සහ පූර්වාරක්ෂක විධිවිධාන සැලැස්විය යුතු ය.

### සෞඛ්‍යයට අහිතකර ගොඩනැගිලි

සෞඛ්‍යයට අහිතකර ගොඩනැගිලි සම්බන්ධයෙන් ප්‍රාදේශීය සභාවේ කාර්යය.

96. ප්‍රාදේශීය සභා ප්‍රදේශය තුළ ඇති නිවාස සහ ගොඩනැගිලි, මේ නීතිය යටතේ හෝ වෙන යම් ප්‍රඥප්තියක විධිවිධානවලින් නියම කෙරෙන අන්දමේ සෞඛ්‍යය තත්ත්වයෙන් පවතින බවට නිශ්චය කර ගැනීමේ අභිප්‍රායෙන් ඒ ප්‍රාදේශීය සභා ප්‍රදේශයේ සෑම කොටසක්ම කාලයෙන් කාලයට පරීක්ෂා කරනු ලැබීමට සැලැස්වීමත්, ප්‍රදේශය ඇතුළත එකී විධිවිධාන ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය සියලු කටයුතු කිරීමත් ඒ ප්‍රදේශයේ ප්‍රාදේශීය සභාවේ කාර්යය විය යුතු ය.

පවතින ගොඩනැගිලි සම්බන්ධයෙන් සභාවේ කාර්යය.

97. (1) යම් ගොඩනැගිල්ලක හෝ ගොඩනැගිලි සමූහයක, වසංගතයක් පැතිරීම නිසා හෝ ඒ ගොඩනැගිලි පාදාසන්න ලෙසින් තද බදව පිහිටා තිබීමෙන්, ආකාරය නිසා, ජලාපවහන ක්‍රමයක් නොමැතිකම නිසා කසළ ශෝධනයේ අපහසුතාවය නිසා හෝ ඒ නිවාසවල හෝ එහි අවට පදිංචිකරුවන්ගේ සෞඛ්‍යයට හානි කර යයි ප්‍රාදේශීය සභාව හැඟීමට පත්වන කවර විටක වුවද, ඒ හානිදායක තත්ත්වය වැළැක්වීම සඳහා අවශ්‍ය ලෙස ප්‍රාදේශීය සභාව විසින් සලකනු ලැබිය හැකි ඒ ගොඩනැගිලි වෙනස් කිරීම් ද ඇතුළු කටයුතු, දැන්වීමේ නියම කරනු ලැබිය හැකි කාලයක් ඇතුළත කරන ලෙස දන්වන දැන්වීමක් ඒ ගොඩනැගිලිවල අයිතිකරුවන් වෙත හෝ ප්‍රාදේශීය සභාවේ මනාපය පරිදි, ඒ ගොඩනැගිලි ඉදිකර තිබෙන ඉඩමේ අයිතිකරු වෙත ප්‍රාදේශීය සභාව විසින් භාර දෙනු ලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ වූ දැන්වීමක් භාර දෙනු ලැබූ අයිතිකරුවකු හෝ පදිංචිකරුවකු දැන්වීමේ සඳහන් කාලය ඇතුළත එකී කටයුතු කිරීමට ප්‍රතික්ෂේප කරන ලද හෝ අතපසු කරන ලද යම් අවස්ථාවක දී, එම ගොඩනැගිලි කඩාදැමීමට හෝ එකී හානිදායක තත්ත්වය වැළැක්වීමට අවශ්‍ය යයි ප්‍රාදේශීය සභාව විසින් සලකන අන්දමට ඒ ගොඩනැගිලි කටයුතු සම්බන්ධයෙන් ක්‍රියා කිරීමට සැලැස්වීම ප්‍රාදේශීය සභාව විසින් තත් කාර්ය සඳහා බලය දෙන ලද යම් නිලධරයකු විසින්, කළ හැකි ය.

7—ඒ 094615 (86/12)

(3) (2) වන උපවගන්තිය යටතේ යම් ගොඩනැගිලි කඩා දමන ලද අවස්ථාවක දී, ප්‍රාදේශීය සභාව විසින් හෝ බලය ලත් නිලධරයා විසින් එක් එක් ගොඩනැගිල්ලක ද්‍රව්‍ය විකිණිය හැකි නම් ඒවා වෙන වෙනම විකිණීමට සැලැස්විය යුතු අතර, ඉන් ලැබෙන මුදල් ගොඩනැගිල්ල අයිතිකරුට ගෙවිය යුතු ය. නැතහොත් අයිතිකරු නොදනී නම් හෝ අයිතිය පිළිබඳ ආරාවුලක් තිබේ නම්, ඒ මුදල් සඳහා අයිතිවාසිකම් ඇති තැනැත්තා විසින් ඒ මුදල් ලබා ගැනීම සඳහා නිසි බලය ඇති අධිකරණයකින් ආඥාවක් ලබා ගන්නා තුරු, ඒ මුදල් ප්‍රාදේශීය සභාවේ තැන්පත් කර තැබිය යුතු ය.

නිවාස තුළ ජනාකීර්ණ වීම.

98. යම් නිවාසයක්, ඒ නිවසේ හෝ ඒ අවට පදිංචිකරුවන්ගේ සෞඛ්‍යයට අන්තරාදායක හෝ අනර්ථදායක ලෙසින් ජනාකීර්ණ වී ඇති බව සහ ඒ පදිංචිකරුවන් එක් පවුලකට වැඩි සංඛ්‍යාවකින් සමන්විත වන බව ප්‍රාදේශීය සභාවට පෙනී ගිය කවර විටක වුවද ප්‍රාදේශීය සභාව විසින් එම ජනාකීර්ණ භාවය නැති කිරීමට පියවර ගැනීමට මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියේ නඩු කටයුතු ආරම්භ කළ යුතු අතර මහෙස්ත්‍රාත්වරයා විසින් ඊට සුදුසු යයි සිතිය හැකි ආඥාවක් කළ යුතුය ; තවද එබඳු ජනාකීර්ණවීම්වලට අවසර දෙන එක් එක් තැනැත්තා වරදකට වරදකරු වන අතර වරදකරු කරනු ලැබූ විට ඒ ආඥාවේ දිනයෙන් පසු ඒ ජනාකීර්ණවීම දිගටම පවතින එක් එක් දිනය සඳහා රුපියල් එක් සියයකට නොවැඩි දඩයකට යටත් විය යුතු ය.

නිවාස පරීක්ෂා කිරීමට සහ ඒවායේ හුණු ගෑමට ප්‍රාදේශීය සභාවට ඇති බලය.

99. ප්‍රාදේශීය සභාවක් විසින් තත් කාර්ය සඳහා බලය දෙනු ලැබූ නිලධරයකු යම් නිවසකට හෝ ගොඩනැගිල්ලකට ඉර උදාව සහ ඉර බැසීම් අතරතුර ඕනෑම වේලාවක දී ඇතුල්වී පරීක්ෂා කිරීම සහ, එහි හෝ එහි යම් කොටසක ඇතුල් පැත්තේ හෝ පිට පැත්තේ හුණු ගාන ලෙස හෝ වෙනත් අ කාරයකින් පවිත්‍ර කරන ලෙස ලියවිල්ලකින් වූ නියමයක් මගින් විධාන කිරීම නීත්‍යනුකූල විය යුතු ය ; තවද එකී නිවසේ හෝ ගොඩනැගිල්ලේ අයිතිකරු හෝ පදිංචිකරු වෙත ඒ නියමය භාර දෙනු ලැබූ වේලාවේ සිට දින හතක් ඇතුළත ඒ විධානය පිළිපැදීම ඔහු පැහැර හැරියොත්, ප්‍රාදේශීය සභාව විසින් ඒ වැඩය කරවීමට සලස්වනු ලැබිය හැකි ය. තවද ඒ වෙනුවෙන් දරන ලද වියදම්, අයිතිකරු විසින් ගෙවිය යුතු අතර පැහැර හැරීමක දී මෙහි මින් මතු විධිවිධාන සලස්වනු ලබන පරිදි එම වියදම් අයකර ගත යුතු ය.

## පීඩා

පීඩා පරීක්ෂා කිරීම.

100. මේ පනතින් හෝ වෙනත් යම් ප්‍රඥප්තියකින් පවරන ලද බලය යටතේ නතර කිරීමට උචිත පීඩා කවරේදැයි නිශ්චිත වශයෙන් දැන ගැනීමේ සහ ඒ පීඩා නතර කිරීම පිණිස මේ පනතේ හෝ එබඳු වෙනත් ප්‍රඥප්තියක විධිවිධාන ක්‍රියාත්මක කිරීමේ අභිප්‍රායෙන් කලින් කල ස්වකීය ප්‍රදේශය පරීක්ෂා කිරීම ප්‍රාදේශීය සභාවේ කාර්යය විය යුතු ය.

**පෞද්ගලික ස්ථානවල තිබෙන සෞඛ්‍යාරක්ෂක බාධක ජලාශ පුරවා දැමීමේ බලය.**

**101.** (1) යම් ප්‍රාදේශීය සභා ප්‍රදේශයක් තුළ යම් පෞද්ගලික ඉඩමක පිහිටා තිබෙන යම් පෞද්ගලික ජලාශයක් හෝ පහත් වගුරු බිමක්, හෝ යම් අපවිත්‍ර හෝ එක තැන රැඳී තිබෙන ජලයක්, සෞඛ්‍යයට අහිතකර යයි හෝ අසල්වාසීන්ට අප්‍රසන්න යයි හෝ ප්‍රාදේශීය සභාවට පෙනී ගිය අවස්ථාවක දී එම ජලාශය හෝ වගුරු බිම ශුද්ධ පවිත්‍ර කරන ලෙස හෝ පුරවන ලෙස හෝ එම අපවිත්‍ර හෝ එකතැන රැඳී තිබෙන ජලය ගලා යාමට සලස්වන ලෙස හෝ ඉවත් කරන ලෙස හෝ ප්‍රාදේශීය සභාව විසින් එම ඉඩමේ අයිතිකරුට ලියවිල්ලකින් වූ දැන්වීමක් මගින් නියම කළ යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ දැන්වීමක් භාර දෙන ලද යම් අයිතිකරුවකු, එම දැන්වීමේ සඳහන්ව තිබිය හැකි කාලසීමාව ඇතුළත එම දැන්වීමේ සඳහන් නියමය පිළිපැදීම ප්‍රතික්ෂේප කළහොත් හෝ පැහැර හැරියොත්, ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා විසින් හෝ එහි නිලධරයන් සහ වැඩකරුවන් විසින් එම ඉඩමට ඇතුල්වී, (1) වන උපවගන්තියේ සඳහන් කාර්යයන් සියල්ල සඳහා හෝ ඉන් කිසිවක් සඳහා අවශ්‍ය සියලු ක්‍රියා කරනු ලැබිය හැකි ය. තව ද ඒ සඳහා වැය වන වියදම්, ඉඩමේ අයිතිකරු විසින් ගෙවිය යුතු අතර පැහැර හැරීමක දී ඒවා මෙහි මින්මතු විධිවිධාන සලස්වනු ලැබ ඇති ප්‍රකාර අය කරගත යුතු ය.

(3) (2) වන උපවගන්තියේ සඳහන් වන ඉඩම එක් තැනැත්තකුට වඩා වැඩි දෙනකුට අයිතිවන අවස්ථාවක දී, ඒ උපවගන්තියේ සඳහන් වන වියදම්, ප්‍රාදේශීය සභාව විසින් නිර්ණය කරනු ලැබිය හැකි සමානුපාතික කොටස් වශයෙන් වෙන වෙනම වූ අයිතිකරුවන්ගෙන් ඒ ඒ අයට එම ඉඩමට ඇති සම්බන්ධතාවය සැලකිල්ලට ගෙන අයකර ගත යුතු ය.

**ගෝඝාතක ස්ථාන සඳහා බලපත්‍ර දීම.**

**102.** (1) යම් ප්‍රදේශයක ප්‍රාදේශීය සභාව විසින් සපයන ලද ස්ථානයක් නොවන, ඒ ප්‍රදේශය තුළ වූ යම් ස්ථානයක් ගෝඝාතක ස්ථානයක් ලෙස පාවිච්චි කිරීම සඳහා බලපත්‍රයක් දීමට සහ අවශ්‍ය යයි ඔහු අදහස් කරන පරිදි යම් බලපත්‍රයක් අත්හිටුවීමට හෝ අවලංගු කිරීමට මෙයින් බලය පවරනු ලැබ ඇති ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයාගෙන් එබඳු බලපත්‍රයක් ලබාගත හොත් මිස, එබඳු කිසිම ස්ථානයක් ගෝඝාතක ස්ථානයක් ලෙස පාවිච්චි කරනු නොලැබිය යුතු ය.

(2) ප්‍රාදේශීය සභාව විසින් සපයනු ලබන ස්ථානයක් නොවන සහ (1) වන උපවගන්තිය යටතේ බලපත්‍රයක් දෙනු නොලැබූ යම් ස්ථානයක් වන හෝ දෙනු ලැබූ යම් බලපත්‍රයක් අත්හිටුවනු ලැබූයේ හෝ අවලංගු කරනු ලැබූ යම් ස්ථානයක් ගෝඝාතක ස්ථානයක් වශයෙන් පාවිච්චි කරන සෑම තැනැත්තකු රුපියල් හය සියයකට නොවැඩි දඩයකින් දඬුවම් කරනු ලැබිය යුතු වරදකට වරදකරු වන අතර එකී ගෝඝාතක ස්ථානය පාවිච්චි කිරීම නතර කරන ලෙස ඒ තැනැත්තාට නියම කරමින් සභාපතිවරයා විසින් ඔහු වෙත දැන්වීමක් භාර දෙනු ලැබීමෙන් පසුව ඒ වරද තවදුරටත් කරගෙන යන සෑම දිනයක් සඳහා ම රුපියල් පන්සියයකට නොවැඩි තවදුරටත් වූ දඩයකින් දඬුවම් ලැබිය යුතු වරදකට වරදකරු වන්නේ ය.

ළමයින්ගෙන් සිදුවන පීඩා.

**103.** වයස අවුරුදු දොළහකට අඩු යම් ළමයකු යම් විටෙක හෝ යම් විටියක් අයිනේ පීඩාවක් කිරීමෙන් වැළැක්වීම නොකර හරින්නා වූ ද ඒ ළමයාගේ භාරය හෝ රැකවරණය භාරව සිටින්නා වූ ද සෑම තැනැත්තකුම වරදක් කරන අතර, ඊට වරදකරු කරනු ලැබූ විට, රුපියල් සියයක් නොඉක්මවන දඩයකට ඔහු යටත් විය යුතු ය.

පොදු නාන ස්ථාන.

**104.** (1) නත් කාර්යය සඳහා වෙන් නොකරන ලද යම් පොදු ස්ථානයක හෝ දැන්වීමේ සඳහන් වේලාවන් හැර වෙනත් වේලාවල දී හෝ දැන්වීමේ සඳහන් තැනැත්තන් හැර වෙනත් තැනැත්තන් විසින් හෝ, නෑම හෝ සතුන් නැවීම හෝ රෙදි සේදීම ද පොදු ස්ථානවල ජලය ප්‍රයෝජනයට නුසුදුසු තත්ත්වයකට පත කරන හෝ, නාන හෝ සෝදන ස්ථාන භාවිත කරන තැනැත්තන්ට අපහසු හෝ හිරිහැර තත්ත්වයක් ඇති කරන වෙනත් සියලු ක්‍රියා ද ප්‍රාදේශීය සභාව විසින් ප්‍රසිද්ධ දැන්වීමක් මගින් තහනම් කළ හැකි ය. ඒ දැන්වීම සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂාවලින් ගැසට් පත්‍රයේ ද, යටත් පිරිසෙයින් එක් සිංහල, එක් දෙමළ හා එක් ඉංග්‍රීසි පුවත් පත්‍රයක ද පළ කරනු ලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තියට පටහැනිව නෑම, සේදීම හෝ වෙනත් යම් ක්‍රියාවක් කරන සෑම තැනැත්තකුම වරදක් කරන අතර, ඊට වරදකරු කරනු ලැබූ විට, රුපියල් පන්සියයක් නොඉක්මවන දඩයකට ඔහු යටත් විය යුතු ය.

ජලාශවලට හෝ ජල කර්මාන්ත වලට ගලන ජලය අපිරිසිදු කිරීම.

**105.** යම් ප්‍රාදේශීය සභාවකට අයත් ජල කර්මාන්තයක කාර්යය සඳහා භාවිතා කරනු ලබන යම් ජලාශයක හෝ එම ජලාශයට ගලන හෝ ජලය සපයන යම් දිය පහරක හෝ ජල මාර්ගයක නෑම, රෙදි හෝ වෙනත් ද්‍රව්‍ය සේදීම හෝ යම් කුණු, අප ද්‍රව්‍ය හෝ වෙනත් අපවිත්‍ර ද්‍රව්‍ය ඊට ගලායෑමට සැලැස්වීම හෝ ඉඩ හැරීම හෝ වෙනත් ආකාරයකින් එය අපවිත්‍ර කිරීම හෝ එසේ කිරීමට ඉඩ දීම කරන සෑම තැනැත්තකුම වරදක් කරන අතර, ඊට වරදකරු කරනු ලැබූ විට, රුපියල් පන්සියයක් නොඉක්මවන දඩයකට ඔහු යටත් විය යුතු ය. තවද එම වරද කරගෙන යන අවස්ථාවක නම්, ඒ වරදට වරදකරු කරනු ලැබීමෙන් පසු හෝ වරදට අවධානය යොමු කරවමින් සභාව විසින් ලිඛිත දැන්වීමක් භාරදෙනු ලැබීමෙන් පසු ඒ වරද කරගෙන ගිය එක් එක් දවසට රුපියල් සියයක් නොඉක්මවන අතිරේක දඩයකට ඔහු යටත් විය යුතු ය.

කර්මාන්ත ශාලාවලින් සිදුවන පරිසර දූෂණය.

**106.** (1) යම් තැනැත්තකු විසින්, ප්‍රාදේශීය සභා ප්‍රදේශය තුළ පිහිටි යම් කර්මාන්තශාලාවක්, එහි අවට පරිසරයේ සෞඛ්‍ය තත්ත්වයට අන්තරායක් නැතහොත් හානියක් සිදුවන පරිද්දෙන් පවත්වාගෙන යනු ලැබුවහොත්, හෝ එසේ පවත්වාගෙන යාමට සැලැස්සුවහොත්, ඒ තැනැත්තා වරදක් සිදුකිරීම සම්බන්ධයෙන් වරදකරු වන්නේ ය.

(2) ලඝු නඩු විභාගයකින් පසු මහේස්ත්‍රාත්වරයකු විසින් (1) වන උපවගන්තිය යටතේ යම් තැනැත්තකු වරදකරු කරනු ලැබූ ප්‍රමාණය අනුව,—

(අ) මේ පනතේ විධිවිධාන නැතහොත් මේ පනත යටතේ සාදන ලද අතුරු ව්‍යවස්ථාවල විධිවිධාන යටතේ ඒ කර්මාන්ත ශාලාව පිහිටි ස්ථානය වෙනුවෙන් නිකුත් කරන ලද බලපත්‍රය සඳහා ගෙවිය යුතු ගාස්තුව මෙන් දෙගුණයක දඩයක් ගෙවන ලෙස ඒ මහේස්ත්‍රාත්වරයා විසින් ඒ තැනැත්තාට ආඥා කළ යුතු අතර, මහේස්ත්‍රාත්වරයකු විසින් තම සාමාන්‍ය අධිකරණ බලය ක්‍රියාත්මක කිරීමේ දී නියම කරනු ලැබිය හැකි දඩයක ප්‍රමාණයට වඩා යටකී දඩය වැඩි වුව ද ඒ නොතකා එකී දඩය නියම කළ යුතු ය. තව ද එසේ අය කරනු ලබන දඩ මුදල් ප්‍රාදේශීය සභාවේ අරමුදලට ගෙවිය යුතු ය ; නැතහොත්

(ආ) ඒ කර්මාන්ත ශාලාව පවත්වාගෙන යාම නතර කරන ලෙස ඒ මහේස්ත්‍රාත්වරයා විසින් ආඥා කරනු ලැබිය යුතු ය.

107. (1) යම් ප්‍රාදේශීය සභා ප්‍රදේශයක් තුළ වූ යම් ගසකින් හෝ ගසක යම් අත්තකින්, කඳකින්, ගෙඩියකින් හෝ වෙනත් කිසිවකින් යම් ගොඩනැගිල්ලකට අලාභ හානියක් සිදුවන හෝ අලාභ හානි සිදුවීමට ඉඩ ඇති හෝ අවස්ථාවක නැතහොත් එය, යම් ගොඩනැගිල්ලක පදිංචිකරුවන්ට හෝ යම් ප්‍රසිද්ධ මහා මාර්ගයක ගමන් කරන්නන්ගේ ආරක්ෂාවට අනතුරුදායක තත්ත්වයක පවතින අවස්ථාවක, ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා විසින් ඒ ගස පිහිටියා වූ ඉඩමේ අයිතිකරු වෙත හෝ පදිංචිකරු වෙත ලියවිල්ලකින් වූ දැන්වීමක් භාරදීමෙන්, ඒ දැන්වීමේ නිශ්චිතව සඳහන් කරනු ලබන කාලයක් ඇතුළත ඒ ගස බැඳ තැබීමට සහ ආරක්ෂාවට අනතුරුදායක නොවන ලෙස තැබීමට හෝ ඒ ගස හෝ ගසේ අත්ත, කඳ, ගෙඩි හෝ වෙනත් යම් කොටසක් කපා ඉවත් කිරීමට ඒ අයිතිකරුට හෝ පදිංචිකරුට නියම කරනු ලැබිය හැකි ය.

තැනැත්තන්ගේ හෝ දේපළක ආරක්ෂාවට තර්ජනයක් වන ගස් හෝ ගස්වල අතු හෝ කඳන් හෝ ගෙඩි සම්බන්ධයෙන් ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයාගේ බලතල.

(2) (1) වන උපවගන්තිය යටතේ දැන්වීමක් භාරදෙනු ලැබූ සෑම තැනැත්තකුම, ඒ දැන්වීමේ නිශ්චිතව සඳහන් කරන ලද කාලය ඇතුළත ඒ දැන්වීමේ කර ඇති නියමයන් ඉටු කළ යුතු ය; ඒ කාලය ඇතුළත, ඒ තැනැත්තන් විසින් ඒ නියමයන් ඉටු කිරීම ප්‍රතික්ෂේප කර ඇති හෝ අතපසු කර ඇති විට, සභාපතිවරයා හෝ සභාපතිවරයා විසින් ලියවිල්ලකින් තත් කාර්යය සඳහා බලය

පවරන ලද යම් නිලධරයෙක් හෝ කම්කරුවෙක් ඒ දැන්වීමේ සඳහන් ඉඩමට ඇතුල් වී, ඒ දැන්වීමෙන් ඒ තැනැත්තාට ඉටු කිරීමට නියම කරන ලද කටයුත්ත කරනු ලැබිය හැකි අතර, ඒ කටයුත්ත වෙනුවෙන් දරන ලද වියදම් සභාවට අයවිය යුතු ණයක් ලෙස ඒ තැනැත්තාගෙන් අය කර ගනු ලැබිය හැකි ය.

104 වන වගන්තියේ, 105 වන වගන්තියේ සහ 106 වන වගන්තියේ කාර්ය සඳහා, "පරිසර දූෂණය" යන්නෙන් පරිසරයෙන් ලැබෙන ප්‍රයෝජන කිසිවක් කෙරෙහි අහිතකර ලෙස බලපාන අන්දමට නැතහොත්, මහජනයාගේ සෞඛ්‍යයට, ආරක්ෂාවට හෝ ශුභ සිද්ධියට හෝ සෑම වර්ගයේම සතුන්ට, පක්ෂීන්ට, වන සතුන්ට, මත්ස්‍යයන්ට, ජලජ ජීවීන්ට හෝ ශාකවලට උපද්‍රව සහිත තත්ත්වයක් නැතහොත් උපද්‍රවකාරී වියහැකි තත්ත්වයක් ඇතිවන අන්දමට, අපද්‍රව්‍ය පිට කිරීමෙන්, විමෝචනය කිරීමෙන් නැතහොත් තැන්පත් කිරීමෙන්, පරිසරයේ කවර වූ හෝ කොටසක පවත්නා භෞතික. තාප, රසායනික, ජෛව හෝ විකිරණශීලි ගුණ කිසිවක් කෙලින්ම නැතහොත් අන්‍යාකාරයකින් වෙනස් කිරීම අදහස් වේ.

## පොදු උපයෝගිතා සේවා

පොදු උපයෝගිතා සේවා පිහිටුවා පවත්වා ගෙන යාමට ප්‍රාදේශීය සභාවට ඇති බලය.

108. ප්‍රාදේශීය සභාවක් විසින් ස්වාධීනව හෝ වෙන යම් පළාත් පාලන ආයතනයක් හෝ යම් තැනැත්තකු සමග සම්බන්ධව එම ප්‍රදේශයේ වාසය කරන හෝ එහි පදිංචියට යන තැනැත්තන්ගේ යහපත සඳහා පහත සඳහන් පොදු උපයෝගිතා සේවාවන් අතුරින් යම් සේවාවක් පිහිටුවා පවත්වා ගෙන යනු ලැබිය හැකි ය:—

(අ) ජල සම්පාදනය;

(ආ) වීදි, පොදු ස්ථාන සහ පොදු ගොඩනැගිලි විදුලි ආලෝක කිරීම;

(ඇ) විදුලි බලය හෝ බලය සැපයීම;

(ඈ) වෙළෙඳ පොළවල්;

(ඉ) නානාගම්;

(ඊ) පොදු නාන ස්ථාන සහ නාන ස්ථාන;

(උ) වැසිකිළි සඳහා වැසිකිළි ලැලි නිෂ්පාදනය කොට පිරිවැය මිළට සැපයීම;

(ඍ) දුප්පත් පංතිය සඳහා නිවාස පහසුකම් සැපයීම ;

(එ) පිහිටුවීමට, පවත්වාගෙන යෑමට හෝ සැලසීමට මේ පනතේ වෙනත් යම් විධිවිධානයකින් හෝ වෙනත් යම් ලිඛිත නීතියක් යටතේ බලය ලැබී ඇති වෙනත් යම් ආකාරයක පොදු සේවාවක්.

**109.** පිහිටුවීමට හෝ පවත්වා ගෙන යාමට 108 වන වගන්ති යෙන් හෝ ඒ යටතේ ප්‍රාදේශිය සභාවකට බලය දෙනු ලැබ ඇති යම් පොදු උපයෝගිතා සේවාවක් පිහිටුවීමේ හෝ පවත්වාගෙන යාමේ කාර්යය සඳහා ප්‍රාදේශිය සභාව විසින්— පොදු උපයෝගිතා සේවා සඳහා වූ වියදම් ගෙවීමේ ආකාරය

(අ) ප්‍රාදේශිය සභාවේ ආදායමෙන් වැයවන යම් වියදමක් සඳහා මුදල් සැපයීම ; හෝ

(ආ) අතුරු ව්‍යවස්ථා මගින් නියම කළ හැකි සීමාවන්ට සහ නිදහස් කිරීම් වලට යටත්ව, එකී සේවාවෙන් ප්‍රයෝජනය ලබන ප්‍රදේශ සඳහා විශේෂ වරිපනම් බදු ප්‍රමාණයක් අය කිරීම ; හෝ

(ඇ) එම සේවය සැලැස්වීම සඳහා ස්ථානවල අයිතිකරුවන් හෝ පදිංචිකරුවන් සමග, ගිවිසුමකට එළඹීම සහ එකී සේවාව සම්බන්ධයෙන් අතුරු ව්‍යවස්ථා මගින් නියම කළ හැකි වරිපනම් බදු ප්‍රමාණ අය කිරීම හෝ බලාත්මක කිරීම ; හෝ

(ඈ) එකී සේවයෙන් ප්‍රයෝජනය ලබන තැනැත්තන්ගෙන් සාධාරණ යයි සැලකිය හැකි අන්දමේ ගාස්තු අය කිරීම ; හෝ

(ඉ) ප්‍රාදේශිය සභාව සමග ඇතුල් වූ යම් ගිවිසුමක් අනුව හෝ ප්‍රාදේශිය සභාව විසින් නිකුත් කරන ලද යම් බලපත්‍රයක් යටතේ යම් අනුග්‍රාහකයකු හෝ අනුග්‍රාහක මණ්ඩලයක් මගින් එබඳු යම් පොදු සේවාවක් පිහිටුවන ලද සහ පවත් වාගෙන යන අවස්ථාවක දී එම සේවාවෙන් ප්‍රයෝජනය ලබන තැනැත්තන්ගෙන් ප්‍රාදේශීය සභාව විසින් අනුමත කරනු ලැබිය හැකි ගාස්තු අය කිරීම

කළ හැකි ය.

ජල හෝ මලාපවහන සේවාවන් සඳහා උපයිම විශේෂ වරිපනම් බද්ද.

**110.** ප්‍රාදේශීය සභාව විසින් ඇති කර පවත්වාගෙන යනු ලබන ජල සේවාවකින් හෝ මලාපවහන සේවාවකින් ප්‍රයෝජන ලබන ප්‍රදේශයක් මත ප්‍රාදේශීය සභාව විසින් පැනවිය හැකි විශේෂ වරිපනම් බද්ද එම ප්‍රදේශයේ පිහිටි සියලුම ගොඩනැගිලි සහ ඉඩම්වල වාර්ෂික වටිනාකම්වල සියයට තුනක් නොඉක්මවිය යුතු ය.

රජයේ දේපළ විශේෂ වරිපනම් බදුවලින් නිදහස් වීම.

**111.** (1) ප්‍රාදේශීය සභා ප්‍රදේශයක් ඇතුළත පිහිටියා වූ ද රජයේ දේපළක් වන්නා වූ ද යම් ඉඩමක හෝ ගොඩනැගිල්ලක, රජය විසින් ප්‍රදානය කරන ලද යම් බද්දක් හෝ අවසරපත්‍රයක් යටතේ යම් තැනැත්තකු පදිංචි වී හෝ ඒ තැනැත්තා විසින් එය දරමින් සිටින අවස්ථාවක, ඒ ඉඩම හෝ ගොඩනැගිල්ල 109 වන වගන්තිය යටතේ නියම කරන ලද යම් විශේෂ වරිපනම් බද්දක් සම්බන්ධයෙන් තක්සේරු කරනු ලැබීමට යටත් වන අතර ඒ ඉඩම හෝ ගොඩනැගිල්ල වෙනුවෙන් අය කළ හැකි විශේෂ වරිපනම් බද්ද ගෙවීමට ඒ තැනැත්තා යටත් විය යුතු ය. එය ඔහු විසින් ගෙවිය යුතු ද වන්නේ ය.

(2) රජය සමග ඇති කර ගත් හෝ රජය විසින් දෙන ලද ප්‍රකාශිත වූ හෝ ව්‍යාංගිත වූ හෝ, එකඟවීමක්, ගිවිසුමක් හෝ අවසරපත්‍රයක් යටතේ රජයේ නිශ්චල හෝ චංචල දේපළක පදිංචි හෝ රජයේ දේපළක් දරන යම් තැනැත්තකුගෙන් අය විය යුතු යම් විශේෂ වරිපනම් බද්දක් අය කර ගැනීම සඳහා, එම රජයේ දේපළ තහනමට ගැනීමට හෝ විකිණීමට යටත් නොවිය යුතු ය.

විශේෂ වරිපනම් බදු තක්සේරු කිරීම සහ අය කිරීම.

**112.** 109 වන වගන්තිය යටතේ වූ සෑම විශේෂ වරිපනම් බද්දක් ම තක්සේරු කිරීම සහ අය කිරීම ද පැහැර හැරීමක දී ලඝු වශයෙන් අය කර ගැනීම ද 159 වන වගන්තියෙන් නියම කර ඇති ආකාරයට කළ යුතු ය.

යෝජනා සම්මතයක් මගින් විශේෂ වරිපනම් බදු වලින් නිදහස් කිරීම.

**113.** 109 වන වගන්තිය යටතේ පනවන ලද යම් විශේෂ වරිපනම් බද්දකින්, යම් දේපළක්, එහි අයිතිකරුගේ දරිද්‍රතාවයේ හේතුව මත නිදහස් කිරීම ප්‍රාදේශීය සභාවක් විසින් විශේෂ යෝජනා සම්මතයක් මගින් කළ හැකි ය.

### ජල සම්පාදනය

යාබද ප්‍රදේශවල ස්ථානවලට සැපයීම.

**114.** ප්‍රාදේශීය සභා ප්‍රදේශයකට යාබද යම් ප්‍රදේශයක් තුළ පිහිටි යම් ස්ථානයකට යම් පොදු උපයෝගිතා සේවාවක් සැපයීම සඳහා ඒ ප්‍රාදේශීය සභාව විසින් අමාත්‍යවරයාගේ අනුමතිය ඇතිව සහ එකී යාබද ප්‍රදේශයේ පළාත් පාලන ආයතනයේ කැමැත්තට යටත්ව එවැනි යම් යාබද ප්‍රදේශයක පිහිටි ස්ථානවලට යම් පොදු උපයෝගිතා සේවාවක් සැපයීම සඳහා ඒ ස්ථානවල අයිතිකරුවන් හෝ පදිංචිකරුවන් සමග ගිවිසුමකට ඇතුල් විය හැකි අතර එම සැපයීම සම්බන්ධයෙන් වරිපනම් බදු ප්‍රමාණය අය නොකර බලාගත [illegible] කළ හැකි ය.

**115.** පිහිටුවීමට හෝ පවත්වාගෙන යාමට මේ පනතින් හෝ යම් ප්‍රාදේශීය සභාවකට බලය දී තිබෙන යම් පොදු උපයෝගිතා සේවාවක් පිහිටුවීමේ සහ පවත්වාගෙන යාමේ කාර්යයන් සඳහා ඒ ප්‍රාදේශීය සභාව විසින් යම් ගිවිසුමකට ඇතුල් විය හැකි අතර මේ පනතේ විධිවිධානවලට යටත්ව, ඒ කාර්යයන් සඳහා අවශ්‍ය සියලුම ස්ථාන යන්ත්‍රෝපකරණ සහ උපකරණ මිල දී ගැනීම, බද්දට ගැනීම, කුලියට ගැනීම, ඉදිකිරීම හෝ නඩත්තු කිරීම සහ ඒ වෙනුවෙන් අවශ්‍ය විය හැකි සියලුම වැඩ, කාරණා සහ දේවල් කිරීම සහ ඉටු කිරීම ද කරනු ලැබිය හැකි ය.

ප්‍රාදේශීය සභාවල සාමාන්‍ය බලතල.

**116.** ප්‍රාදේශීය සභා ප්‍රදේශයේ හෝ එහි යම් කොටසක පදිංචිකරුවන්ගේ යහපත සඳහා ඒ ප්‍රාදේශීය සභාව විසින් පොදු ජල සම්පාදනයක් ඇති කරනු ලබන හා පවත්වාගෙන යනු ලබන අවස්ථාවක දී ද, විශේෂ ජල ගාස්තුවක් ප්‍රාදේශීය සභාව විසින් අයකරනු ලබන්නේ යම් ප්‍රදේශයක් හෝ කොටසක් සම්බන්ධයෙන් ද අවස්ථාවෝචිත පරිදි, ඒ ප්‍රදේශයේ හෝ කොටසේ යම් ස්ථානයක අයිතිකරු හෝ පදිංචිකරුට ඔහුගේම සහ ඔහුගේ ගෘහයේ සාමාජිකයන්ගේ හෝ ඔහුගේ කුලී නිවැසියන්ගේ හෝ ඔහුගේ ස්ථානයේ පදිංචිව සිටින වෙනත් තැනැත්තන්ගේ ගෘහ කාර්යයන් සඳහා භාවිත ගාස්තුවක් නොගෙවා පොදු ජල කණුවලින් ජල සම්පාදනයක් ලබා ගැනීම සඳහා අයිතිවාසිකම් තිබිය යුතු ය.

ගෘහ කාර්යයන් සඳහා පොදු ජල කණු වලින් නොමිලේ ලැබෙන ජල සම්පාදනයට බිඳු ගෙවන්නන්ට අයිතිවාසිකම් ඇති බව.

**117.** යම් අශ්වයන්, ගවයන් හෝ රථවාහන, විකිණීම, කුලියට දීම පිණිස තබා ඇති අවස්ථාවක දී ඒ අශ්වයන් හෝ ගවයන් හෝ රථවාහන සේදීම සඳහා ජල සම්පාදනයක් හෝ යම් වෙළෙඳාමක්, නිෂ්පාදනයක් හෝ ව්‍යාපාරයක් සඳහා හෝ වතුරමල්, පිහිණුම් පොකුණු සඳහා හෝ යම් විසිතුරු හෝ යාන්ත්‍රික කාර්යයක් සඳහා වූ හෝ වාරිමාර්ග කාර්යයන් සඳහා වූ ජල සම්පාදනයක් ගෘහ කාර්යයක් සඳහා වූ ජල සම්පාදනයකට ඇතුළත් නොවිය යුතු ය.

"ගෘහ කාර්යයන්" යන්නෙහි අර්ථය.

**118.** ප්‍රාදේශීය සභාවක් විසින් ගෘහ කාර්යය සඳහා නොවන ජල සම්පාදනයක් සැලසීම හෝ ගෘහ කාර්යයන් සඳහා යම් ස්ථානයකට පෞද්ගලික ජල සම්පාදනයක්, ප්‍රාදේශීය සභාව සහ එසේ ජලය ලබා ගැනීමට කැමති තැනැත්තන් අතර එකඟත්වයට පත් කර ගන්නා ලද හෝ මේ වෙනුවෙන් වූ අතුරු ව්‍යවස්ථා මගින් නියම කළ හැකි ප්‍රමාණ අනුව සහ නියමයන් සහ කොන්දේසි අනුව දෙනු ලැබිය හැකි ය.

පෞද්ගලික සේවය සඳහා ගිවිසුම්.

## වෙළෙඳ පොළවල්

**119.** ප්‍රාදේශීය සභාවක් විසින්, පදිංචිකරුවන්ගේ සේවය සඳහා අවශ්‍ය විය හැකි පොදු වෙළෙඳ පොළවල් සහ ගම්බද පොළවල් පිහිටුවීම සහ පවත්වා ගෙන යාම සහ එකී සියලුම වෙළෙඳ පොළවල් නිසි ලෙස විධිමත් කිරීම, අධීක්ෂණය කිරීම සහ පාලනය කිරීම නීත්‍යනුකූල විය යුතු ය.

ගම්බද පොළවල් සම්බන්ධයෙන් සභාව සතු බලය.

පෞද්ගලික වෙළෙඳ පොළක් සඳහා බලපත්‍රයක් අවශ්‍යවන අවස්ථාවක අදාළ වන විධිවිධාන.

**120.** පෞද්ගලික වෙළෙඳ පොළක් පිහිටුවීම සහ පවත්වාගෙන යාම, සඳහා ප්‍රාදේශීය සභාවක් විසින් නිකුත් කරනු ලබන සෑම බල පත්‍රයක් ම පහත සඳහන් කොන්දේසි වලට යටත් විය යුතු ය :—

(අ) ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් අමාත්‍ය වරයා විසින් නියම කරනු ලබන දිනයක හෝ ඊට පසු පෞද්ගලික වෙළෙඳ පොළක් සඳහා ප්‍රදානය කරන ලද සෑම බලපත්‍රයක් ම, ඒ පෞද්ගලික වෙළෙඳ පොළ වෙනුවට ගම්බද වෙළෙඳ පොළක් පිහිටුවීම මහජන යහපත සඳහා වේ යැයි ප්‍රාදේශීය සභාව විසින් යම් අවස්ථාවක තීරණය කළහොත්, ඒ පෞද්ගලික වෙළෙඳ පොළ සඳහා වූ බලපත්‍රය අලුත් කිරීම, ඒ සඳහා බලයලත් බලධරයා විසින් ප්‍රතික්ෂේප කළ හැකි බවට සහ ඒ ප්‍රතික්ෂේප කිරීම සම්බන්ධයෙන් ඒ පෞද්ගලික වෙළෙඳ පොළ අයිතිකරුට යම් වන්දියකට හිමිකම් නොලැබෙන බවට වූ කොන්දේසිය මත ප්‍රදානය කරනු ලැබිය යුතු ය.

(ආ) එවකටත් පවතින හෝ පිහිටුවීමට අදහස් කරනු ලබන ගම්බද සහ පෞද්ගලික වෙළෙඳ පොළවල් මගින් ප්‍රදේශයේ අවශ්‍යතාවන් සැපයෙන බවට ඒ සඳහා බලයලත් බල ධරයා සෑහීමට පත්වන්නේ නම් මේ වගන්තියේ (අ) ඡේදය යටතේ නියම කරන ලද දිනයේ හෝ ඉන්පසු පෞද්ගලික වෙළෙඳ පොළක් සඳහා වූ බලපත්‍රයක් නිකුත් කිරීම හෝ අලුත් කිරීම ඒ බලධරයා විසින් ප්‍රතික්ෂේප කළ හැකි ය.

පෞද්ගලික වෙළෙඳ පොළක් වසා දැමීම සඳහා වන්දි.

**121.** (1) යම් පෞද්ගලික වෙළෙඳ පොළක්—

(අ) වසා දැමීම, හෝ

(ආ) ප්‍රාදේශීය සභාව විසින් පවරාගෙන පොදු වෙළෙඳ පොළක් වශයෙන් පවත්වා ගෙන යාම

මහජන යහපත සඳහා වේ යැයි ප්‍රාදේශීය සභාව සෑහීමට පත් වූ අවස්ථාවක දී ප්‍රාදේශීය සභාව විසින් ඒ වෙළෙඳ පොළ වසා දැමීමට විධාන කළ හැකි ය. එසේ නැතහොත් එය පවරාගෙන පොදු වෙළෙඳ පොළක් වශයෙන් පවත්වා ගෙන යා හැකි ය. එහෙත් මේ අවස්ථා දෙකෙහි දී ම මේ වගන්තියේ විධිවිධානවලට අනුකූලව වන්දි ගෙවීමට යටත් විය යුතු ය.

(2) යම් පෞද්ගලික වෙළෙඳ පොළක් වසා දමන ලෙස ප්‍රාදේශීය සභාවක් විසින් විධාන කරනු ලැබූ අවස්ථාවක දී ගෙවිය යුතු වන්දිය වූ කලී, ගිවිසුමක් මගින් අන්‍යාකාරයකින් සමථයකට පත් වුවහොත් හැර, මේ පනත යටතේ වෙළෙඳ පොළක් වශයෙන් ස්ථානය පාවිච්චි කරනු ලැබුවහොත් ඒ ස්ථානයේ වටිනාකම සහ ඒ ස්ථානය වෙළෙඳ පොළක් වශයෙන් නොව ඒ ප්‍රදේශය තුළම උපරිම වාසිය ලබාගැනීම සඳහා ඒ අන්දමේ ස්ථානයක් යොදා ගනු ලැබ ඇති හෝ යොදා ගනු ලැබීමට ඉඩ ඇති වෙන යම් කාර්යයන් සඳහා පාවිච්චි කරනු ලැබුවහොත්, ඒ ස්ථානයේ වටිනාකම යන වටිනාකම් දෙක අතර වෙනසෙහි සහ වෙළෙඳ පොළ සඳහා භාවිතා කළ ගොඩනැගිලි එබඳු යම් කාර්යයක් සඳහා සකස් කර ගැනීමේ පිරිවැය සම්බන්ධ දීමනාව යන දෙකේ එකතුව විය යුතු ය.

(3) යම් පෞද්ගලික වෙළෙඳ පොළක් පොදු වෙළෙඳ පොළක් වශයෙන් පවත්වාගෙන යාම සඳහා ප්‍රාදේශීය සභාව විසින් පවරා ගනු ලැබූ අවස්ථාවක දී, ගෙවිය යුතු වන්දිය විය යුත්තේ, මේ පනත යටතේ පෞද්ගලික වෙළෙඳ පොළක් ලෙස පාවිච්චි කරනු ලබන විට ඒ ස්ථානයේ වටිනාකම ය.

(4) මේ පනත යටතේ වෙළෙඳ පොළක් ලෙස පාවිච්චි කරනු ලබන ස්ථානයේ වටිනාකම ඇස්තමේන්තු කිරීමේදී ඒ අවට ප්‍රදේශයේ පොදු වෙළෙඳ පොළක් හෝ අලුත් පෞද්ගලික වෙළෙඳ පොළක් පිහිටුවනු ලැබුවහොත් එකී වෙළෙඳ පොළේ ස්ථානය පිළිබඳ වටිනාකමේ ඇතිවීමට ඉඩ ඇති අගය ක්ෂයවීම ගැන ද සැලකිල්ල දැක්විය යුතු ය.

අතුරු ව්‍යවස්ථා සෑදීමේ බලය.

122. (1) මේ පනතින් බලය දෙනු ලැබිය හැකි හෝ නියම කරනු ලැබිය හැකි අන්දමේ නොහොත් මේ පනත යටතේ ප්‍රාදේශීය සභාවේ බලතල පාවිච්චි කිරීමේ, සහ යුතුකම් ඉටුකිරීමේ කාර්යයන් සඳහා අවශ්‍ය යයි ප්‍රාදේශීය සභාවට පෙනී යා හැකි අන්දමේ වූ ද, මේ පනතේ විධිවිධානවලට අනනුකූල නොවන්නා වූ ද අතුරු ව්‍යවස්ථා කාලයෙන් කාලයට සෑදීමටත්, එසේ සාදනු ලබන යම් අතුරු ව්‍යවස්ථාවක් සංශෝධනය කිරීමට, වෙනස් කිරීමට හෝ පරිච්ඡින්න කිරීමටත් සෑම ප්‍රාදේශීය සභාවකටම බලය තිබිය යුතු ය.

(2) යම් ප්‍රාදේශීය සභාවක් විසින් සාදන ලද අතුරු ව්‍යවස්ථාවක් මගින්, එම අතුරු ව්‍යවස්ථාව උල්ලංඝනය කිරීම පිළිබඳව, ඒ උල්ලංඝනය සංස්ථාපිත වන යම් එක් ක්‍රියාවක් හෝ නොකර හැරීමක් සඳහා රුපියල් හත්සිය පනහකට නොවැඩි දඩයකින් සහ එම උල්ලංඝනය නොකඩවා තවදුරටත් කරගෙන යන විටක නිසි බලය ඇති අධිකරණයක් විසින් ඒ ඒ පිළිබඳව වරදකරු කිරීමෙන් පසුව හෝ එම උල්ලංඝනය ගැන අවධානය යොමු කරමින් සභාපතිවරයා විසින් හෝ බලය ලත් වෙනත් නිලධරයකු විසින් ලිඛිත දැන්වීමක් භාර දෙනු ලැබීමෙන් පසුව උල්ලංඝනය තවදුරටත් නොකඩවා කර ගෙන යන සෑම එක් දිනයක් සඳහාම රුපියල් දෙසිය පණහකට නොවැඩි අතිරේක දඩයකින් යුත් දඬුවමක් සඳහා විධිවිධාන සැලැස්විය හැකි ය.

(3) (අ) 126 වන වගන්තියේ (ix) වන ඡේදය යටතේ සාදන ලද යම් අතුරු ව්‍යවස්ථා යම් තැනැත්තකු විසින් කඩ කරනු ලැබුවා වූ ද ඒ තැනැත්තා ඊට පෙර මේ වගන්තිය යටතේ වරදකරුවකු කර නැත්තා වූ ද අවස්ථාවක, වරදකරුගෙන් ඉල්ලීමක් ඇත හොත්, මේ වගන්තිය යටතේ එම වරද සඳහා නියම කළ හැකි උපරිම දඩ මුදලෙන් හතරෙන් එක් පංගුවකට නොවැඩි මුදලකට සභාපතිවරයා විසින් එම වරද සමථයකට පත් කළ යුතු ය. ඒ වරදකරුට විරුද්ධව අපරාධ නඩු පැවරීමක් සටහන් කර ඇති අවස්ථාවක නම් සභාපතිවරයා විසින් නඩු තීන්දුවට පෙර කවර හෝ වේලාවක අධිකරණයේ කැමැත්ත ඇතිව එම වරද සමථයකට පත් කළ යුතු ය.

(ආ) (1) වන උපවගන්තිය යටතේ සභාපතිවරයා විසින් භාර ගත් යම් මුදලක් ප්‍රාදේශීය සභා අරමුදලට බැර කළ යුතු ය.

අතුරු ව්‍යවස්ථා අනුමත කිරීම හා ප්‍රසිද්ධ කිරීම.

123. (1) මේ පනත යටතේ කිසිම අතුරු ව්‍යවස්ථාවක් හෝ යම් අතුරු ව්‍යවස්ථාවක සංශෝධනය කිරීමක්, වෙනස් කිරීමක් හෝ පරිච්ඡින්න කිරීමක්, එය අමාත්‍යවරයා විසින් අනුමත කරනු ලබන තුරු සහ එකී අනුමැතිය පිළිබඳ නිවේදනය ගැසට් පත්‍රයේ පළ කරනු ලබන තුරු බල නොපැවැත්විය යුතු ය.

(2) මේ පනත යටතේ සාදන ලද සෑම අතුරු ව්‍යවස්ථාවක් ම, මේ වගන්තියේ (1) වන උපවගන්තිය මගින් නියම කර ඇති නිවේදනයත් සමග ගැසට් පත්‍රයේ පළ කළ යුතු ය.

අතුරු ව්‍යවස්ථාවල පිටපත් සැපයීම.

124. මේ පනත යටතේ, සාදන ලද සියලුම අතුරු ව්‍යවස්ථාවල පිටපත්, ඒ අතුරු ව්‍යවස්ථා අදාළ වන්නා වූ ප්‍රාදේශීය සභා කාර්යාලයේත් කොමසාරිස්වරයාගේ කාර්යාලයේත් තබා ගත යුතු අතර ඒවා පරීක්ෂාවට විවෘතව තැබිය යුතුවාක් මෙන් ම මහජනයාට විකිණීම සඳහා ඉඩ සලසා තිබිය යුතු ය.

අවසර නොදීම්වලට හෝ සංශෝධනවලට අතුරු ව්‍යවස්ථා යටත් විය යුතු බව.

125. මේ පනත යටතේ සාදනු ලබන සෑම අතුරු ව්‍යවස්ථාවක් ම, 123 වන වගන්තිය යටතේ එය පළ කිරීමෙන් පසුව හැකිතාක් ඉක්මනින්, එකී අතුරු ව්‍යවස්ථාවට අවසර නොදීම නොකරන ලෙසට වූ යෝජනාවක් මගින් පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු අතර එය පාර්ලිමේන්තුවේ යෝජනා සම්මතයක් මගින් පරිච්ඡින්න හෝ සංශෝධනය කළ හැකි ය. පාර්ලිමේන්තුව මගින් පරිච්ඡින්න කිරීමේ හෝ සංශෝධනය කිරීමේ නිවේදනයක් නොපමාව ම ගැසට් පත්‍රයේ පළ කළ යුතුය ; තව ද එකී පරිච්ඡින්න කිරීම හෝ සංශෝධනය කිරීම එසේ පළ කිරීමේ දින සිට, එහෙත් ඒ දිනයට පෙරාතුව එම අතුරු ව්‍යවස්ථාව යටතේ කරනු ලැබ තිබිය හැකි යම් දෙයකට හෝ ආරම්භ කර තිබිය හැකි යම් නීති කෘත්‍යයකට හානියක් නොමැතිව, බලපෑ යුතු ය.

අතුරු ව්‍යවස්ථාවලට විෂය වන කරුණු

126. මේ කොටස යටතේ ප්‍රාදේශීය සභාවකට පැවරී ඇති බලතලවල ව්‍යාප්තියට හානියක් නොමැතිව, මේ කොටස යටතේ අතුරු ව්‍යවස්ථා සෑදීමට ප්‍රාදේශීය සභාවකට ඇති බලයට පහත දැක්වෙන කාර්ය සියල්ලම හෝ ඉන් යමක් උදෙසා වෙන් අතුරු ව්‍යවස්ථා සෑදීමේ බලය ඇතුළත් විය යුතු ය :—

(i) රැස්වීම් සහ කාර්ය පටිපාටිය: ඊට පහත සඳහන් දේ ද ඇතුළත් වේ :—

(අ) සාමාන්‍ය රැස්වීම් කැඳවීමේ කාලසීමා ;

(ආ) විශේෂ රැස්වීම් ;

(ඇ) රැස්වීමක් කැඳවීමේ ක්‍රමය ;

(ඈ) රැස්වීමක් පැවැත්වීම.

(ii) නිලධරයන් සහ සේවකයන් : ඊට පහත සඳහන් දේ ද ඇතුළත් වේ:—

(අ) තනතුරු හෝ ධුර ඇති කිරීම ;

(ආ) ජාතික රාජ්‍ය සභාවේ 1974 අංක 16 දරන පළාත් පාලන සේවා පනතේ අර්ථානුකූලව පළාත් පාලන සේවයේ තනතුරු නොවන ප්‍රාදේශීය සභා සේවයේ තනතුරු හෝ ධුරවලට පත්වීම් කිරීම ;

(ඇ) (ආ) අනුච්ඡේදයේ සඳහන් තනතුරු හෝ ධුරවලට පත්වීම් සඳහා අවශ්‍ය සුදුසුකම් ;

(ඈ) පළාත් පාලන සේවයේ සාමාජිකයන් නොවන, ප්‍රාදේශීය සභාවල නිලධරයන්ට හා සේවකයන්ට වැටුප්, දීමනා සහ පාරිශ්‍රමික ගෙවීම ;

(ඉ) මියගිය නිලධරයන්ගේ හෝ සේවකයන්ගේ වැන්දඹුවන්ට, ළමයින්ට, ළඟම ඥාතීන්ට හෝ යැපෙන්නන්ට විශ්‍රාම වැටුප් හෝ පාරිතෝෂික සපයා දීම ;

(ඊ) (ඈ) අනුච්ඡේදයේ සඳහන් නිලධරයන් හා සේවකයන්ගේ යහපත සඳහා අර්ථසාධක අරමුදලක් පිහිටුවීම සහ පවත්වාගෙන යාම ;

(උ) (ඈ) අනුච්ඡේදයේ සඳහන් නිලධරයන්ට සහ සේවකයන්ට සේවයට නොපැමිණ සිටීමේ නිවාඩු දීම.

(iii) වෙන කිසිම ප්‍රකාශිත විධිවිධානයක් සලසා නොමැත්තා වූ ද, මේ පනත යටතේ ගෙවිය යුතු වූ ද යම් බදු අයකර ගැනීම සහ එබඳු යම් බදුවල කාර්යයන් සඳහා අවශ්‍ය විය හැකි සියලුම වාර වාරිකා සහ තොරතුරු සැපයීම ද ඇතුළුව බදු අයකර ගැනීම.

(iv) ණය : ඊට පහත සඳහන් දේ ද ඇතුළත් වේ:—

(අ) ඇප තැබීමේ විධිය සහ ආකාරය ;

(ආ) ඇවර කිරීමේ වැඩ පිළිවෙළ ;

(ඇ) ඇප ආපසු ගෙවීමේ ක්‍රමය සහ පිළිවෙළ ;

(ඈ) යම් ණයක් පිළිබඳ කොන්දේසි සහ ණයට දුන් මුදල් යොදා ගැනීම.

(v) වරිපනම් බදු සහ ගාස්තු පැනවීම, අයකර ගැනීම සහ ලබා ගැනීම :

ඊට පහත සඳහන් දේ ද ඇතුළත් වේ:—

(අ) ගොඩනැගිලි, ඉඩම් සහ ගෙපත් තක්සේරු කිරීම ;

(ආ) එකී තක්සේරු කිරීමේ කාර්යය සඳහා අවශ්‍ය වාර වාර්තා සහ තොරතුරු සැපයීම ;

(ඇ) විරෝධතා ශ්‍රවණය කොට නිර්ණය කිරීම ;

(ඈ) ප්‍රාදේශීය සභාවේ පරිපාලන සීමාවන් ඇතුළත පිහිටි නිශ්චල දේපළ පිළිබඳ වූ උකස් සහ උකස් හිමියන්ගේ ලිපිනයන් ප්‍රාදේශීය සභාවේ කාර්යාලයේ ලියාපදිංචි කිරීම සහ එකී ලියාපදිංචි කිරීම් සඳහා ගාස්තු පැනවීම සහ ලබාගැනීම ;

(ඉ) වරිපනම් බදු, බදු හෝ ගාස්තු ලබා ගැනීම සඳහා තහනමට ගන්නා ලද නිශ්චල දේපළ විකිණීම පිළිබඳව ලියවිල්ලකින් වූ දැන්වීම එකී ලියාපදිංචි කරන ලද උකස් හිමියනට තැපැල් කිරීම.

(vi) ඉඩම් සහ දේපළ : ඊට පහත සඳහන් දේ ද ඇතුළත් ය :—

(අ) අම්බලම් සහ මඩම් එළිමහන් ස්ථාන සහ පොදු විනෝදය සඳහා වූ ස්ථාන සැපයීම, පාලනය කිරීම සහ ඒවායේ කළමනාකරණය ;

(ආ) මුඩු බිම් හෝ පොදු ඉඩම් බලා ගැනීම ;

(ඇ) ප්‍රාදේශීය සභාව වෙත හෝ ප්‍රාදේශීය සභාවේ පාලනය යටතට පවරනු ලැබ ඇති නිශ්චල දේපළවල නඩත්තුව සහ කළමනාකරණය ;

(ඈ) පොදු තණබිම් සැපයීම, ආරක්ෂාව සහ පාලනය, සහ ඒවා පාවිච්චි කිරීම සඳහා ගාස්තු අය කිරීම ;

(ඉ) පෞද්ගලික හෝ පොදු ඉඩම්වල මායිම් පිහිටුවා ආරක්ෂා කිරීම ;

(ඊ) යම් පොදු කාර්යයක් සඳහා නඩත්තු කරනු ලබන යම් කම්බි සවිකර ඇති දේවල් හෝ උපකරණ හෝ ඒවාට දී ඇති රුකුල්වලට කරනු ලබන අලාභයක් වැළැක්වීමේ හෝ ඒවායේ ඇති දෝෂයක් අලුත් වැඩියා කිරීමේ හෝ ඊට ප්‍රතිකර්ම කිරීමේ කාර්යය සඳහා පෞද්ගලික ඉඩම්වලට ඇතුල්වීමට බලය පැවරීම.

(vii) පාරවල් සහ මංමාවත් : ඊට පහත සඳහන් දේ ද ඇතුළත් වේ :—

(අ) ප්‍රදේශයේ පාරවල් සහ අඩිපාරවල් සංවර්ධනය කිරීම, එකෝලි කිරීම, ඔව්වම් කිරීම, පළල් කිරීම අලුත් පාරවල් සහ අඩි පාරවල් තැනීම ;

(ආ) පාරවල් සහ මංමාවත් ශුද්ධ පවිත්‍ර කිරීම සහ ඊට ජලය සැපයීම සහ ඒවාට ආලෝකය සැපයීම ;

(ඈ) වාහනවල බර සහ වේගය සීමා කිරීම, යම් පාලමක් පාරක් හෝ අඩි පාරක් මත හෝ යම් ස්ථානයක වාහන පාවිච්චි කිරීමෙන් මහජනයාට අනතුරක් සිදුවිය හැකි හෝ එකී පාලමට, පාරට හෝ මංමාව තට අලාභ සිදුවීමට ඉඩ ඇති විය හැකි හෝ එකී අවස්ථාවක දී, එකී පාවිච්චිය වැළැක්වීම හෝ සීමා කිරීම ඇතුළුව පාරවල්වල සහ අඩිපාරවල්වල වාහන පාවිච්චි කිරීම හා ගමනා ගමනය පාලනය කිරීම ;

(ඇ) පාරවල්වල හෝ මංමාවත්වල පෙරහැරවල් සහ ජන සන්නිපාතයන් සහ සංගීත දර්ශන පැවැත්වීම හැසිරවීම ;

(ඉ) පාරවල්වල සහ මංමාවත්වල ඇතිවන බාධක, පාර වල් සහ මංමාවත් අයුතු ලෙස අල්ලා ගැනීම, ප්‍රක් ෂේපණයන්, සහ වෙනත් අවහිර කිරීම් වැළැක් වීම, නැති කිරීම, අධීක්ෂණය සහ විධිමත් කිරීම ;

(ඊ) විශාල දැන්වීම් පුවරු සහ වෙනත් තාවකාලික නිර් මාණ ඉදි කිරීම හෝ යම් විධියක හෝ ඊට යාබදව යම් වර්ගයක සැරසිලි කිරීම සහ ඒ සම්බන් ධයෙන් නිකුත් කරන ලද යම් අවසර පත්‍ර සඳහා ගාස්තු අය කිරීම සහ ප්‍රාදේශීය සභාව විසින් ඉදි කරන ලද විශාල දැන්වීම් පුවරු භාවිතා කිරීම සඳහා ගාස්තු අය කිරීම ;

(උ) පාරවල් සහ මංමාවත්වල හෝ ඒ අසල ඇති ගොඩ නැගිලි නැගීමේ සහ වෙනත් ක්‍රියාවල ප්‍රතිඵලයක් වශයෙන් සිදුවිය හැකි අලාභවලින් මහජනයා ආර ක්ෂාකර ගැනීම ;

(ඌ) ප්‍රාදේශීය සභා ප්‍රදේශය ඇතුළත රථ නවතා තැබීම සඳහා ස්ථාන ඇති කිරීමෙන් හා ඒ ස්ථානවල රථ නවතා තැබීම වෙනුවෙන් නියම කරනු ලබන ගාස්තු එකතු කිරීමෙන් මෝටර් රථ නවතා තැබීම පාලනය කිරීම :

එසේ වුවද, මේ ඡේදයේ විධිවිධාන ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ මෝටර් රථ සම්බන්ධ යෙන් අදාළ නොවිය යුතු ය.

(viii) ගොඩනැගිලි, ගොඩනැගිලි තැනීම සහ වැඩ කටයුතු: ඊට පහත සඳහන් දේ ද ඇතුළත් වේ:—

(අ) මේ ශීර්ෂය යටතේ වූ අතුරු ව්‍යවස්ථා අදාළ වන ප්‍රදේශ නිර්ණය කිරීම;

(ආ) ස්ථාවරත්වය ඇති කිරීමේ, ගිනිගැනීම් වැළැක්වීමේ සහ සෞඛ්‍යය ආරක්ෂා කිරීමේ බලාපොරොත්තුව ඇතිව එකී ගොඩනැගිලි සාදන ද්‍රව්‍ය පාලනය කිරීම;

(ඇ) බාධා රහිතව වාතය සංසරණය වීමට සහ කසළ ශෝධනය සඳහා ඉඩ ලැබෙන පරිදි යම් ගොඩනැගිල්ලක් හෝ ගොඩනැගිලි සමූහයක් අසල ඉඩ අවකාශය තැබීම;

(ඈ) දොර ජනෙල්වල දිග පළල, පොළොවේ මට්ටම වහලේ උස, සාමාන්‍ය වාතාශ්‍රය සහ ජලාපවහන ක්‍රමය;

(ඉ) අලුත් ගොඩනැගිලි සඳහා හෝ පවතින ගොඩනැගිලි වෙනස් කිරීම සඳහා වූ සැලසුම් පරීක්ෂා කිරීම සහ සලකා බැලීම සඳහා ගාස්තු අය කිරීම;

(ඊ) වැසිකිළිවල සංඛ්‍යාව සහ ස්වභාවය;

(උ) නිර්මාණයේ අත්තිවාරම් සහ ස්ථාවර භාවය;

(ඌ) ගොඩනැගිලි අභිමුඛයේ රේඛා.

(ix) මහජන සෞඛ්‍ය සහ සැප විසර්ජන ක්‍රම: ඊට පහත සඳහන් දේ ද ඇතුළත් වේ:—

(අ) ජලාපවහනය;

(ආ) මලාපවහනය සහ කසළ ශෝධනය හා ඒ සඳහා ගාස්තු අය කිරීම;

(ඇ) කාණු, කැසිකිළි, කසළ වලවල්, අළු වලවල් සහ සෞඛ්‍යාරක්ෂක පහසුකම් සහ උපකරණ පරීක්ෂා කිරීම, පාලනය කිරීම සහ නඩත්තු කිරීම;

(ඈ) පොදු සෞඛ්‍යාරක්ෂක පහසුකම්වල පාලනය සහ කළමනාකරණය;

(ඉ) නවාතැන් ගෙවල් සහ ගෙපත් ගොඩනැගිලි විධිමත් කිරීම, අධීක්ෂණය කිරීම, පරීක්ෂා කිරීම, සහ පාලනය කිරීම;

(ඊ) ග්‍රැමෆෝන්, ලවුඩ්ස්පීකර්, ඈම්ප්ලිෆයර් සහ ස්වයංක්‍රීය හෝ යාන්ත්‍රිකව ශබ්දය නිපදවීම හෝ නැවත නිපදවන වෙනත් භාණ්ඩ ක්‍රියාකාර වීම විධිමත් කිරීම හා පාලනය කිරීම ඇතුළු පීඩා නතර කිරීම;

(උ) සෞඛ්‍යයට අහිතකර කෑමට හෝ බීමට ගන්නා දේවල් තනනමට තැනීම, අරිම් කිරීම, ඉවත් කිරීම හා විනාශ කිරීම සහ ඒවා විකිණීම හෝ විකිණීම සඳහා තැබීම වැළැක්වීම;

(ඌ) බේකරි, භෝජන ශාලා, හෝටල්, ආපනශාලා සහ තේ සහ කෝපි කඩ, විධිමත් කිරීම, අධීක්ෂණය කිරීම, පරීක්ෂා කිරීම සහ පාලනය කිරීම;

(එ) කිරි පට්ටි සහ කිරි විකිණීම විධිමත් කිරීම, අධීක්ෂණය කිරීම, පරීක්ෂා කිරීම සහ පාලනය කිරීම;

(ඒ) මස්, කුකුල් මස්, මාළු, පලතුරු, එළවළු හෝ මනුෂ්‍ය ආහාරය සඳහා වූ වෙනත් නරක් වන දළ භාණ්ඩ විකිණීම සඳහා භාවිතා කෙරෙන (වෙළෙඳ පොළවල් හැර) සාප්පු සහ වෙනත් ස්ථාන පරීක්ෂා කිරීම, විධිමත් කිරීම සහ පාලනය කිරීම ඇතුළුව ආහාර ද්‍රව්‍ය විකිණීම ද අළුත් මස්, අළුත් මාළු සහ පණ පිටින් සතුන් විකිණීම සඳහා භාවිතා කෙරෙන සාප්පුවලට සහ ස්ථාන වලට බලපත්‍ර නිකුත් කිරීම;

(ඔ) පීඩාකාරී හෝ අන්තරාදායක යයි ප්‍රාදේශීය සභාව විසින් සලකනු ලබන වෙළෙඳාම් විධිමත් කිරීම, අධීක්ෂණය කිරීම, පරීක්ෂා කිරීම සහ පාලනය කිරීම;

(ඕ) පොල්ලෙලි පෙඟවීම සඳහා පොදු ඇළවල, ගංගා වල, කලපුවල සහ මෝය කටවල්වල ලෙලිවලවල් පාවිච්චි කිරීම විධිමත් කිරීම හා ඒවායේ දිග පළල විධිමත් කිරීම සහ එවැනි ලෙලිවලවල් පාවිච්චි කිරීම සඳහා ගාස්තු අය කිරීම;

(ක) මද්‍යාගාර සහ සිසිල් බීම කර්මාන්ත ශාලා විධිමත් කිරීම, අධීක්ෂණය කිරීම, පරීක්ෂා කිරීම සහ පාලනය කිරීම;

(ග) තමතමන්ගේ ඉඩම් කටුපඳුරුවලින් සහ කුණු කසළ වලින් නිදහස් කර තබා ගන්නා ලෙසත් තම තමන්ගේ වාසස්ථානවල මිදුල් පිරිසිදු සහ සෞඛ්‍යාරක්ෂක තත්ත්වයෙන් තබා ගන්නා ලෙසත්, ප්‍රාදේශීය සභා ප්‍රදේශ ඇල අයිතිකරුවන්ට සහ පදිංචිකරුවන්ට බල කිරීම;

8—ඒ 094615 (86/12)

(ච) මැලේරියාව මර්ධනය කිරීම, මදුරුවන් සහ රෝග හාරක කෘමීන් විනාශ කිරීම;

(ජ) පොකුණුවල, දිය කඩිතිවල, විවෘත අගල්වල, කසළ කාණුවල, කාණුවල සහ අප්‍රසන්න ස්වභාවය කින් යුක්ත හෝ සෞඛ්‍යයට හානිකර වීමට ඉඩ ඇති යම් අපවිත්‍ර දේවල, කැලිකසළ, වතුර, ද්‍රව්‍ය හෝ දෙයක් අඩංගු වන හෝ එකතු කිරීම සඳහා භාවිතා කරන ස්ථානවල විතුර ඉවත් කිරීම සහ ඒවා ශුද්ධ කිරීම, ආවරණය කිරීම හෝ පිරවීම;

(ට) නිවාස, වාසස්ථාන සහ මහජනයා රැස්වන හෝ පූජනීය ස්ථාන අයිතිකරුවන් විසින් හා ඒවා භාරව සිටින හෝ පාලනය කරන තැනැත්තන් විසින් ශුද්ධ කිරීම, පවිත්‍ර කිරීම, ඒවාට වාතාශ්‍රය ලැබීමට සැලැස්වීම සහ ඒවායේ විෂබීජ නාශනය කිරීම;

(ඩ) වසංගත රෝග, ප්‍රාදේශික රෝග, හෝ ස්පර්ශ යෙන් බෝවන රෝග වැළැක්වීම, හෝ ප්‍රතීන කිරීම සහ ඒ රෝග පවතින අතරතුර මියයන තැනැත්තන් ඉක්මනින් භූමදාන කිරීම;

(ණ) පොදු නාන ස්ථාන සහ සතුන් සහ රෙදි සෝදන ස්ථාන පිහිටුවීම, නඩත්තු කිරීම සහ විධිමත් කිරීම ද ඇතුළුව සේදීම සහ නෑම;

(ත) කාර්මික අපද්‍රව්‍ය විධිමත් කිරීම සහ පාලනය කිරීම;

(ද) මහජන සෞඛ්‍යය ආරක්ෂා කිරීම සහ ඊඩා මැඩ පැවැත්වීම.

(x) සංචාරක වෙළෙන්දන් : ඊට පහත සඳහන් දේ ද ඇතුළත් විය යුතු ය:—

(අ) සංචාරක වෙළෙන්දන් අධීක්ෂණය කිරීම හෝ පාලනය කිරීම;

(ආ) ඒ අධීක්ෂණය හෝ පාලනය කිරීමේ කාර්ය සඳහා බලපත්‍ර නිකුත් කිරීම සහ ඒ බලපත්‍රවලට අනු යුක්ත කළ යුතු කොන්දේසි;

(ඇ) නියමිත අවස්ථාගත කරුණුවල දී බලපත්‍ර ප්‍රතික්ෂේප කිරීම;

(ඇ) යම් නියමිත භාණ්ඩයක් විකිණීම හෝ යම් නියමිත ස්ථානයක හෝ ප්‍රදේශයක භාණ්ඩ විකිණීම විධිමත් කිරීම හෝ තහනම් කිරීම.

(xi) සතුන් : ඊට පහත සඳහන් දේ ද ඇතුළත් වේ:—

(අ) ගවයන්, අශ්වයන්, බැටළුවන්, එළුවන් සහ ඌරන් තබා ගැනීම හා කොටු කිරීම ;

(ආ) ගාල් පාවිච්චි කිරීම සඳහා වූ ගාස්තු සහ සතුන් ගාල් කර තබා ගැනීමට දරන ලද වැය ද නියම කිරීම, පැනවීම සහ අයකර ගැනීම ඇතුළුව දඩාවතේ යන ගවයන්, එළුවන් සහ ඌරන් ;

(ඇ) සතුන් අතර වසංගත රෝග බෝවීම මැඩ පැවැත්වීම, සතුන් සඳහා නිරෝධායන ස්ථාන තබත්තු කිරීම සහ විධිමත් කිරීම ද, ඒ ස්ථාන පාවිච්චි කිරීම සඳහා ගාස්තු අය කිරීම; ඇති කරන සතුන් සහ බල්ලන් එන්නත් කිරීම හා ප්‍රතිශක්තිකරණය සඳහා පහසුකම් සැලසීම ;

(ඈ) හරකුන්ගේ, අශ්වයන්ගේ, බැටළුවන්ගේ සහ එළුවන්ගේ වසුරු එකතු කිරීම හා විකිණීම සහ ඒවා යම් ප්‍රාදේශීය සභාවක සීමාව ඇතුළත යම් තැනක සිට ඒ සීමාවෙන් පිට යම් ස්ථානයකට ඉවත් කිරීම විධිමත් කිරීම සහ පාලනය කිරීම;

(ඉ) වනසතුන් සහ සැලා කුරුල්ලන් රැක බලා ගැනීම සහ ආරක්ෂා කිරීම ;

(ඊ) දඩාවතේ යන බල්ලන් විනාශ කිරීම ;

(උ) (ප්‍රාදේශීය සභාවේ මතය අනුව අනවශ්‍ය වේදනාවක් හෝ පීඩාවක් සිදුවීමට ඉඩ ඇති පරිදි අත්දමකින් පණ ඇති සතුන් විකිණීම සඳහා තැබීම සීමා කිරීම ද ඇතුළුව) සතුන්ට වධහිංසා කිරීම වැළැක්වීම ;

(ඌ) ගවමඩු, ගාල්, රාත්‍රියට ගවයන් බඳින කොටු සහ නතර කරන ස්ථාන විධිමත් කිරීම සහ අධීක්ෂණය කිරීම සහ ඒවා පිහිටුවන ස්ථාන පාලනය කිරීම ;

(එ) ගෝඝාතක ස්ථාන විධිමත් කිරීම, අධීක්ෂණය කිරීම, පරීක්ෂා කිරීම සහ පාලනය කිරීම හා ඒවා පාවිච්චි කිරීමේ ගාස්තු නියම කර අය කර ගැනීම ;

(ඒ) සතුන්ගේ මළකුණු බැහැර කිරීම ;

(ඔ) සතුන් හණ ගැසීම.

(xii) පොදු හෝ පෞද්ගලික වෙළඳපොලවල් සහ පොළවල් : ඊට පහත සඳහන් දේ ද ඇතුළත් වේ:—

(අ) ඒවා පිහිටුවීම, නඩත්තු කිරීම සහ වැඩි දියුණු කිරීම ;

(ආ) ඒවා තුළ විකුණනු ලබන භාණ්ඩවල මිල පාලනය ද ඇතුළුව, ඒවා විධිමත් කිරීම, අධීක්ෂණය කිරීම, පරීක්ෂා කිරීම සහ පාලනය කිරීම ;

(ඇ) ඒවා තුළ මලාපවහනය සහ කසළ ශෝධනය, ඒ සම්බන්ධයෙන් සිදු වන පීඩා වැළැක්වීම ;

(ඈ) ඒවා ඇතුළත හා තදාසන්න ප්‍රදේශයෙහි වාහන ගමනාගමනය පාලනය සහ ඒවා ඇතුළත නීති පාලනය රැක ගැනීම ;

(ඉ) වෙළෙඳපොළ භූමි තුළ වැසිකිලි හෝ ශෝචාගාර ස්ථාන ජල සම්පාදනය සහ ආලෝකය සැපයීම, ඒවා පරීක්ෂා කිරීම සහ පාලනය කිරීම ;

(ඊ) කඩ පිල්, වෙළෙඳ මැසි, ආසන හෝ ඉඩකඩ වෙන් කර දීම ;

(උ) ආහාර පරීක්ෂා කිරීම සහ සෞඛ්‍යාරක්ෂාවට හානිකර ආහාර ද්‍රව්‍ය තහනමට ගැනීම ;

(ඌ) යම් ආහාර ද්‍රව්‍යයක් හෝ ද්‍රව්‍ය ප්‍රථම වරට ඉදිරිපත් කිරීම හෝ විකිණීම තහනම් කිරීමට සෑහෙන හේතු ඇති අවස්ථාවක, ඒවා තහනම් කිරීම ;

(එ) යම් ද්‍රව්‍ය විකිණීම සම්පූර්ණයෙන් ම තහනම් කිරීම හෝ විශේෂ බලපත්‍රයක් මගින් සීමා කිරීම සහ එවැනි විශේෂ බලපත්‍ර සඳහා ගාස්තු අය කිරීම ;

(ඒ) ගිනිගැනීම්වලින් ආරක්ෂාව සැලසීම ;

(ඔ) යම් වෙළෙඳපොළක් හෝ පොළක් තාවකාලික ලෙස වැසීම ;

(ඕ) වෙළෙඳපොළ භාරකරුවන් විසින් සහ වෙනත් සේවා නියුක්තයන් විසින් ඔවුන්ගේ කාර්ය නිසිලෙස ඉටු කිරීම ;

(ක) පොදු වෙළෙඳ පොළක පරිශ්‍රය හෝ ඉන් යම් කොටසක් හෝ එහි ගෙබඩාගිල් පාවිච්චි කිරීම සඳහා ගාස්තු හෝ කුලී නියම කිරීම සහ අයකර ගැනීම සහ එවැනි යම් ගාස්තු හෝ කුලී එකතු කිරීමට ඇති අයිතිය බදු දීම සඳහා ගාස්තු හෝ කුලී නියම කිරීම සහ අයකර ගැනීම ;

(ග) එක් එක් පොදු වෙළඳපොළක් සඳහා වෙළඳපොළ ප්‍රදේශයක් ප්‍රකාශයට පත් කිරීම සහ පෞද්ගලික වෙළඳපොළවල් සඳහා බලපත්‍රදීම, ඒවා සීමා කිරීම හෝ තහනම් කිරීම නැතහොත් පොදු වෙළඳපොළ ප්‍රදේශය ඇතුළත හැර ඒ ප්‍රදේශයේ වෙනත් යම් ස්ථානයක වෙළඳපොළක භාණ්ඩ විකිණීම සඳහා බලපත්‍ර දීම, ඒවා සීමා කිරීම හෝ තහනම් කිරීම ;

(ච) පෞද්ගලික වෙළඳපොළවල් හෝ පොළවල් සඳහා බලපත්‍රදීම, බලපත්‍රයේ කොන්දේසි සහ ඒ බලපත්‍ර සඳහා ගෙවිය යුතු ගාස්තු ;

(ජ) පෞද්ගලික වෙළඳපොළවල හෝ පොළවල්වල ඉඩකඩ, කාණු ක්‍රමය, පාරවල්, වාතාශ්‍රය, උපකරණ සහ සනීපාරක්ෂක අවශ්‍යතා සම්බන්ධයෙන් පිළිපැදිය යුතු ප්‍රමිති ;

(ට) ප්‍රාදේශීය සභාවට දන්වීමෙන් පසුව සහ ප්‍රාදේශීය සභාව විසින් අනුමත කරන ලද සැලසුම් ප්‍රකාර, පෞද්ගලික වෙළඳපොළවල් හෝ පොළවල පරිශ්‍රය තුළ හෝ ඒ අවට පවත්නා ගොඩනැගිලි අළුත් කිරීම, වෙනස් කිරීම, විශාල කිරීම සහ වැඩිදියුණු කිරීම සහ අලුත් ගොඩනැගිලි ඉදි කිරීම ;

(xiii) ජල සම්පාදනය සහ ජල කර්මාන්ත : ඊට පහත සඳහන් දේ ඇතුළත් වේ :—

(අ) ගෘහ කාර්ය සඳහා ජලය සැපයීම පිණිස මහජන ළිං, ජලමං, ජල උල්පත් හෝ වෙනත් ජල ස්ථාන සැලසීම, විධිමත් කිරීම, ආරක්ෂා කිරීම සහ නඩත්තු කිරීම ;

(ආ) නෑම සඳහා හෝ සතුන්, රෙදි සහ වෙනත් ද්‍රව්‍ය සේදීම සඳහා ප්‍රාදේශීය සභාව විසින් වෙන් කරනු ලැබ ඇති කවර වර්ගයක හෝ ජලස්ථාන විධිමත් කිරීම සහ නඩත්තු කිරීම ;

(ඇ) මහජන සෞඛ්‍යය සහ ආරක්ෂාව සුරැකීම පිණිස අවශ්‍ය වන ආකාරයට පෞද්ගලික ළිං ඉදි කිරීම සහ නඩත්තු කිරීම විධිමත් කිරීම ;

(ඈ) ප්‍රාදේශීය සභාව විසින් පිහිටුවන ලද හෝ නඩත්තු කරනු ලබන යම් ජලකර්මාන්තයකින් ජලය සැපයීම විධිමත් කිරීම, පාලනය කිරීම, ආරක්ෂා කිරීම සහ නඩත්තු කිරීම ;

(ඉ) පොදු හෝ පෞද්ගලික පාවිච්චිය සඳහා සපයනු ලබන ජලය අපතේ යෑම, වැරදි ලෙස පාවිච්චි කිරීම, අනිසි ලෙස පරිභෝජනය හෝ අපවිත්‍ර වීම වැළැක්වීම ;

(ඊ) නල, වැල්ව, කරාම, ජලභාජන, කසල භාජන, ජල වැසිකිළි සහ වෙනත් උපකරණ සහ භාජන හෝ ඒවායින් යම් කඳයක්, පිළිවෙලින්, ජලය ගෙන යාම, බෙදාහැරීම, [illegible] කිරීම සහ ගබඩා කිරීම සඳහා භාවිත කිරීම පිළිබඳව උපදෙස් දීම සහ ඒවායේ ප්‍රමාණය, ස්වභාවය, ශක්තිය සහ ද්‍රව්‍ය නියම කිරීම සහ ඒවායේ පිළිවෙල, තත්ත්වය, ඒවා වෙනස් කිරීම, ඉවත් කිරීම, අලුත් කිරීම සහ අලුත්වැඩියා කිරීමට නියම කිරීම ;

(උ) ජලකණු මගින් පොදු ජල සැපයුම විධිමත් කිරීම සහ එහි භාවිතය විධිමත් කිරීම ;

(ඌ) පෞද්ගලික ජල සේවාවන් මගින් ජල සැපයුම සහ භාවිත කළ යුතු ද්‍රව්‍ය සහ සවිකිරීම් විධිමත් කිරීම ;

(එ) මැනීමෙන් ජල සැපයුම විධිමත් කිරීම සහ ඒ කාර්ය සඳහා හෝ ඒ සම්බන්ධයෙන් භාවිත කළ යුතු ද්‍රව්‍ය, මීටර්, උවාරණ සහ සවි කිරීම් විධිමත් කිරීම ;

(ඒ) ගෘහ කාර්ය සඳහා හෝ ගෘහ කාර්ය නොවන කාර්ය සඳහා ජලය සැපයීම කළ යුත්තේ යම් නියම හා කොන්දේසි යටතේ ද ඒ නියම හා කොන්දේසි ද එසේ සපයනු ලබන ජලය සඳහා ගෙවිය යුතු මිල ද විධිමත් කිරීම ;

(ඔ) ජලය සැපයීම සඳහා ගෙවිය යුතු මුදල් අයකර ගැනීම සඳහා ක්‍රියා පරිපාටිය නියම කිරීම ;

(ඕ) ජල කර්මාන්තයෙන් සපයනු ලබන ජලය සැපයීමට හෝ පාලනයට අදාළව, අවශ්‍ය යයි ප්‍රාදේශීය සභාවට පෙනී යන වෙනත් සෑම කාර්යයක්.

(xiv) පොදු සේවාවන් පිහිටුවීම, නඩත්තු කිරීම, ක්‍රියා කරවීම සහ සම්පාදනය සඳහා අවශ්‍ය සියලු කාර්යයන් ඇතුළුව පොදු සේවාවන්, ඒ සේවාවන් හා සම්බන්ධ ගාස්තු පැනවීම සහ අය කර ගැනීම, ඒවාට හානි සිදුවීමට සහ තරහයක් ඇතිවීමට එරෙහිව ඒවායේ සුරක්ෂිතභාවය සඳහා ;

(xv) පාත්වල ටිම් හෝ දිග පළල සහ ඒවා සෑදීම සහ ඒවායේ තත්ත්වය පාලනය කිරීම ;

(xvi) පඩි සහ මිම්ම විධිමත් කිරීම ;

(xvii) රා මැදීම සම්බන්ධ හදිසි අනතුරු වළක්වාලීම සහ කඹ සහ ඒ කාර්යය සඳහා භාවිත කෙරෙන වෙනත් ආම්පන්න කලින් කල පරීක්ෂා කිරීම ;

(xviii) දුනු තුවක්කු සහ මරුවැල් නිසා ඇති වන හදිසි අනතුරු වළක්වාලීම;

(xix) ළිං සහ වළවල් වටා වැටවල් බැඳීම;

(xx) සුදු සෙල්ලම් කිරීම සහ නාකුළන් පෙරා කෙටවීම සහ පොදු පටුපාරවල්වල සහ පාරවල්වල කරත්ත තරඟයට දිවීම වළක්වාලීම;

(xxi) පොදු මංමාවත්වල හෝ පාරවල්වල හෝ ප්‍රසිද්ධ ස්ථානවල අවිනීත ලෙස හැසිරීම, නිකරුණේ ගැවසීම සහ අසභ්‍ය වචන භාවිත කිරීම වළක්වාලීම;

(xxii) කවර ආකාරයක හෝ ස්ප්‍රීතු හෝ වෙනත් මත්වන සුළු මිත්පැන් හෝ යම් නාල ද්‍රව්‍යයක් වෛද්‍ය නියමයකින් ලබාගන්නා ලද ඒවා හෝ මත් බව්වා හැර වූ ළඟ දඩු යුණ වයස අවුරුදු දහසයකට අඩු පිරිමි ළමයින්ට හෝ ස්ත්‍රීන්ට විකිණීම වළක්වාලීම;

(xxiii) කොණ්ඩා කපන ස්ථාන සහ බාබර් සාප්පු විධිමත් කිරීම, අධීක්ෂණය කිරීම, පරීක්ෂා කිරීම සහ පාලනය කිරීම;

(xxiv) බිලියඩ් ක්‍රීඩාගාර විධිමත් කිරීම, අධීක්ෂණය කිරීම, පරීක්ෂා කිරීම සහ පාලනය කිරීම;

(xxv) කම්මල් විධිමත් කිරීම, අධීක්ෂණය කිරීම, පරීක්ෂා කිරීම සහ පාලනය කිරීම;

(xxvi) වෙරළබඩ මසුන් මැරීමට ඇති බාධා ඉවත් කිරීම;

(xxvii) ධීවර කාර්මිකයන් සඳහා ශුභසාධක පහසුකම්;

(xxviii) තැනැත්තන්ට බ්‍රෝකර්වරුන් වශයෙන් බලපත්‍රදීම;

(xxix) මුදල් ණයට දීමේ ව්‍යාපාරය කරන තැනැත්තන්ට බලපත්‍ර දීම;

(xxx) යම් මංමාවතක සිට පෙනෙන පරිදි විදහාපා ඇති හෝ ප්‍රදර්ශනය කර ඇති ප්‍රචාරක දැන්වීම් විධිමත් කිරීම හා පාලනය කිරීම සහ එසේ විදහාපාන හෝ ප්‍රදර්ශනය කරන ප්‍රචාරක දැන්වීම් සම්බන්ධයෙන් ගාස්තු අය කිරීම.

සුසාන භූමි සහ මිනීවළ ආඥාපනත යටතේ නිසි බලධරයා ප්‍රාදේශීය සභාව විය යුතු බව.

127. සුසානභූමි සහ මිනීවළ ආඥාපනතේ 3 වන වගන්තියේ කාර්යය සඳහා සෑම ප්‍රාදේශීය සභාවක්ම, ඒ ප්‍රාදේශීය සභාවේ සීමා ඇතුළත එම ආඥාපනත යටතේ නිසි බලධරයා විය යුතු ය.

ඉඩම් සහ ගොඩනැගිලි අනිවාර්යයෙන් අත්පත් කර ගැනීම.

128. ප්‍රාදේශීය සභාවක කාර්ය සඳහා අවශ්‍ය යම් ඉඩමක් හෝ ගොඩනැගිල්ලක් පොදු කාර්යයක් සඳහා අවශ්‍ය වූවක් ලෙස සැලකිය යුතු අතර එය ඒ ප්‍රාදේශීය සභාව සඳහා ආණ්ඩුව විසින් ඉඩම් අත්පත් කර ගැනීමේ පනත යටතේ අත්පත් කර ගනු ලැබිය හැක්කේ ය.

## V වන කොටස

## මුදල්

ප්‍රාදේශීය සභා අරමුදල

129. (1) සෑම ප්‍රාදේශීය සභාවක් විසින් ම එහි සාමාන්‍ය මුදල් කාර්යයන් සඳහා ප්‍රාදේශීය සභා අරමුදලක් පිහිටුවිය යුතු ය.

(2) ප්‍රාදේශීය සභා අරමුදලට—

(අ) පළමුවන උපලේඛනයේ සඳහන් කරන ලද දඩ මුදල් සහ දණ්ඩන මුදල්;

(ආ) දෙවන උපලේඛනයේ සඳහන් කරන ලද සියලුම මුද්දර ගාස්තුවල මුදල් ප්‍රමාණය;

(ඇ) අමාත්‍යවරයා විසින් කරනු ලබන යම් විශේෂ විසර්ජනය කට යටත්ව, අමාත්‍යවරයා විසින් ප්‍රාදේශීය සභාවට වෙන් කර ඇති සියලු සාමාන්‍ය හෝ විශේෂ ප්‍රදාන;

(ඈ) සභාවට ඇති ආදායම සභාවේ යෝජිත වියදමට සමාන වන බවට වගබලා ගැනීම සඳහා අමාත්‍යවරයා විසින් ප්‍රාදේශීය සභාවට වෙන් කර දෙන ලද යම් විශේෂ ප්‍රදානයක්;

(ඉ) මේ පනතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක අධිකාරය යටතේ පනවන සියලු වරිපනම් බදු, කිරු බදු ගාස්තු සහ වෙනත් අය කිරීම්;

(ඊ) විකිණීම්වලින්, බදුදීම්වලින් හෝ ප්‍රාදේශීය සභාවේ වෙනත් ගනුදෙනුවලින් ලැබෙන සියලු මුදල්;

(උ) ප්‍රාදේශීය සභාව වෙත සතුකර ඇති යම් දේපළකින් හෝ යම් පොදු සේවාවක් සැලසීමෙන් ප්‍රාදේශීය සභාව වෙත ලැබෙන සියලු මුදල්;

(ඌ) ප්‍රාදේශීය සභාව අනුප්‍රාප්තික වන්නේ යම් පළාත් පාලන ආයතනයකට ද ඒ පළාත් පාලන ආයතනයට යම් ඉවත් කරන ලද ප්‍රඥප්තියක් ප්‍රකාරව හෝ එය ප්‍රකාර යයි අදහස් කරන ලදුව ලබා දී ඇති යම් ආදායම් මාර්ගයකින් ලැබුණ සියලු මුදල්;

(එ) යෝජනා සම්මතයකින් හෝ වෙනත් යම් ආකාරයකින් කලින් කල පාර්ලිමේන්තුව විසින් ප්‍රාදේශීය සභාවට විසර්ජනය කරනු ලබන හෝ ලබා දෙන සියලු මුදල් හා සියලු ආදායම් මාර්ග;

(ඒ) මේ පනත යටතේ ස්වකීය බලතල ක්‍රියාත්මක කිරීමේ දී ප්‍රාදේශීය සභාව විසින් ණයට ගන්නා ලද සියලුම මුදල්;

(ඔ) සිය බලතල හා කාර්යයන් ක්‍රියාත්මක කිරීමේ දී ප්‍රාදේශීය සභාවට අන්‍යාකාරයෙන් උපචිත වන සියලු මුදල්

ගෙවනු ලැබිය යුතු ය.

*ප්‍රාදේශීය සභාවට ලැබුණු මුදල් බැංකුවක තැන්පත් කළ යුතු බව.*

**130.** ප්‍රාදේශීය සභාවකට ලැබී ප්‍රාදේශීය සභා අරමුදලට ගෙවනු ලැබිය යුතු සියලු මුදල් අනුමත කළ බැංකුවක තැන්පත් කරනු ලැබිය යුතු අතර, "ප්‍රාදේශීය සභා අරමුදල" යන අභිධානයෙන් යුත් ගිණුමකට බැර කරනු ලැබිය යුතු ය.

මේ වගන්තියේ "අනුමත කළ බැංකුව" යන්නෙන්, යම් ප්‍රාදේශීය සභාවක මුදල් තැන්පත් කළ යුතු බැංකුවක් වශයෙන්, අමාත්‍යවරයා විසින් ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් නිශ්චිතව සඳහන් කරනු ලබන බැංකුවක් අදහස් වේ.

*ප්‍රාදේශීය සභා අරමුදලින් යම් කොටසක් ආයෝජනය කිරීමට ඇති බලය.*

**131.** භාර ආඥාපනතේ 20 වන වගන්තියේ නිශ්චිතව සඳහන් කර ඇති සුරැකුම්පත් අතුරින් යම් සුරැකුම්පත්වල, ප්‍රාදේශීය සභා අරමුදල්වලින් යම් කොටසක් ප්‍රාදේශීය සභාවක් විසින් ආයෝජනය කරනු ලැබිය හැකි ය.

*ප්‍රාදේශීය සභා අරමුදල යෙදවීම.*

**132.** එක් එක් ප්‍රාදේශීය සභාව විසින් පවත්වනු ලබන ප්‍රාදේශීය සභා අරමුදලින්—

(අ) මේ පනත හෝ වෙනත් යම් ලිඛිත නීතියක් යටතේ හෝ ඒ යටතේ සාදන ලද යම් අතුරු ව්‍යවස්ථාවක් හෝ රීතියක් යටතේ ශිය බලතල ක්‍රියාත්මක කිරීමේ දී සහ ඊයි කාර්යයන් සහ කර්තව්‍ය ඉටු කිරීමේ දී ප්‍රාදේශීය සභාවලට දැරීමට සිදු වූ සියලු වියදම්;

(ආ) කම්කරු වන්දි ආඥාපනත යටතේ වූ යම් බැඳීමක් සම්බන්ධයෙන් ප්‍රාදේශීය සභාව විසින් ගෙවිය යුතු සියලු මුදල්;

(ඇ) ප්‍රාදේශීය සභාවට අයත් හෝ ඒ වෙත සතු කරන ලද යම් දේපලක් රක්ෂණය කිරීම සඳහා වාරික වශයෙන් හෝ කම්කරු වන්දි ආඥාපනත යටතේ ඒ ප්‍රාදේශීය සභාව විසින් දැරීමට සිදුවිය හැකි යම් බැඳීමකට එරෙහිව රක්ෂණය කිරීම සඳහා වාරික වශයෙන් ප්‍රාදේශීය සභාව විසින් ගෙවිය යුතු සියලු මුදල්;

(ඈ) හදිසි අනතුරක් හෝ ප්‍රාදේශීය සභාව විසින් භාවිතා කෙරෙන යන්ත්‍රයක, යන්ත්‍රාගාරයක හෝ උපකරණයක දෝෂයක් හෝ තුන්වන පාර්ශ්වයකගේ බලය නොලත් හෝ නීත්‍යනුකූල නොවන මැදිහත්වීම හේතුකොටගෙන, මේ පනත හෝ වෙනත් යම් ලිඛිත නීතියක් මගින් හෝ යටතේ ප්‍රාදේශීය සභාව වෙත හෝ එහි යම් නිලධරයකු හෝ සේවකයකු වෙත සතුකරනු ලැබ ඇති යම් බලතල අතුරින් කිසිවක් ක්‍රියාත්මක කිරීමෙන් අනියමින් පමණක් ආරෝපණය කළ හැකි අවස්ථාගත කරුණු මත තුවාල සිදු වන්නා වූ හෝ වෙනත් යම් හානියක් සිදු වන්නා වූ නැතහොත් මරණයට පත් වන්නා වූ (ප්‍රාදේශීය සභාවේ සේවකයන් හැර) යම් තැනැත්තකුට හෝ යම් තැනැත්තන්ගේ යැපෙන්නන්ට කරුණා සහගත දීමනාව ලෙස ප්‍රදානය කිරීමට ප්‍රාදේශීය සභාව තීරණය කරනු ලැබිය හැකි සියලු මුදල්;

(ඉ) ප්‍රාදේශීය සභාව වෙත ලැබුණා වූ ද මුදල් යෙවනු ලැබුවේ යම් තැනැත්තන් විසින් ද ඒ තැනැත්තන්ට ආපසු ගෙවීමට ප්‍රාදේශීය සභාවට යම් ලිඛිත නීතියකින් බලය ලැබී ඇති හෝ නියම කරනු ලැබ ඇත්තා වූ ද සියලු මුදල් ;

(ඊ) අමාත්‍යවරයා විසින් අනුමත කරනු ලබන පුණ්‍ය කටයුතු සඳහා හෝ වර්ෂාව, ගංවතුර, ගිනි, කුණාටු, භූමිකම්පා, සාගත හෝ වසංගත හේතුකොටගෙන ඇතිවිය හැකි ආපදාවලට සහනය සැලසීම පිණිස ගන්නා ක්‍රියා මාර්ග සඳහා ප්‍රාදේශීය සභාව විසින් දරන ලද සියලු වියදම් ;

(උ) ගිනි නිවන හමුදාවක් පවත්වාගෙන යෑමෙහි ලා සහ ජීවිත හා දේපළ ගින්නෙන් ආරක්ෂා කිරීමෙහි ලා ප්‍රාදේශීය සභාව විසින් දරනු ලබන සියලු වියදම් ;

(ඌ) මේ පනත හෝ වෙනත් යම් ලිඛිත නීතියක් මගින් හෝ යටතේ ප්‍රාදේශීය සභාව විසින් පිහිටුවීමට, පවත්වාගෙන යෑමට හෝ සැලැස්වීමට බලය ලැබී ඇති යම් ආධාරයක් පොදු සේවාවක් පිහිටුවීමට සහ පවත්වාගෙන යාමට ප්‍රාදේශීය සභාව විසින් දරන ලද සියලු වියදම් ;

(එ) ප්‍රාදේශීය සභාවේ සේවකයන්ගේ ශුභසාධනය සඳහා හෝ, ප්‍රාදේශීය සභාවේ නිලධරයන් හෝ සේවකයන් රෝගාතුර වූ විට, ණයගැති වූ විට හෝ ආපදාවලට මුහුණපෑ විට ඔවුන්ට සහන සැලැස්වීම හෝ සහායවීම පිණිස සංස්ථාපනය කරන ලද හෝ පිහිටුවන ලද යම් අරමුදලක් හෝ යෝජනා ක්‍රමයක් සඳහා නියම කරනු ලබන සීමාවන්වලට යටත්ව, ප්‍රාදේශීය සභාව විසින් සම්මත කරනු ලබන සියලු ආධාර මුදල් ;

(ඒ) ප්‍රජා පිළිගැනීම සම්බන්ධයෙන් හෝ පොදු වැදගත්කමකින් යුත් යම් සිද්ධි හෝ අවස්ථා ජශ්‍රීබද උත්සව හෝ පැවැත්වීමක් හෝ පිළිසැඳීමක් සම්බන්ධයෙන් හෝ යම් ආගමික, පුණ්‍ය, සංස්කෘතික, සෞඛ්‍ය, විනෝදාත්මක හෝ අධ්‍යාපනික කාර්යයක් සම්බන්ධයෙන් එක් වර්ෂයකට මුළු එකතුව රුපියල් එක් දහසක් නොඉක්මවන ප්‍රාදේශීය සභාව විසින් දරන ලද වියදමක් සහ අමාත්‍යවරයාගේ ලියවිල්ලකින් පූර්ව අනුමැතිය ඇතිව ප්‍රාදේශීය සභාව විසින් ඒ කාර්යයන් සඳහා දරනු ලබන වෙනත් වියදම් ;

(ඔ) මහජන විනෝද කටයුතු හෝ විනෝදාංශ වෙනුවෙන් හෝ යම් පුස්තකාල හෝ යම් අධ්‍යාපනික, විද්‍යාත්මක, පුණ්‍ය හෝ ශුභසාධක ආයතනවලට ආධාර වශයෙන් හෝ එක් වර්ෂයකට මුළු එකතුව රුපියල් එක් දහසක් නොඉක්මවන ප්‍රාදේශීය සභාව විසින් සම්මත කරන ලද ආධාර මුදලක් සහ අමාත්‍යවරයාගේ ලියවිල්ලකින් වූ පූර්ව අනුඥාව ඇතිව ප්‍රාදේශීය සභාව විසින් ඒ කාර්යයන් සඳහා සම්මත කරනු ලබන වෙනත් ආධාර මුදල් ;

(ඕ) ස්වකීය කාර්යයන් ඉටු කිරීමේ දී තමන් විසින් දරන ලද වියදම් ප්‍රතිපූරණය කිරීම් වශයෙන්, ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයාට, උපසභාපතිවරයාට, සභිකයන්ට, නිලධරයන්ට සහ සේවකයන්ට යැපීම් සහ ගමන් වියදම් දීමනා වෙනුවෙන් ප්‍රාදේශීය සභාව විසින් ගෙවිය යුතු සියලු මුදල් ;

(ක) පළාත් පාලනයේ ප්‍රවර්ධනය, සංවිධානය හෝ පිහිටුවීම සඳහා වූ පළාත් පාලන ආයතනවල යම් සංගමයක වියදම් උදෙසා අමාත්‍යවරයා විසින් අනුමත කරනු ලබන සියලු ආධාර මුදල් ;

(ග) පළාත් පාලනයට අදාළ කරුණු ගැන සලකා බැලීම සඳහා වූ පළාත් පාලන ආයතනවල සභිකයන්ගේ හෝ නිලධරයන්ගේ යම් රැස්වීමකට හෝ සම්මේලනයකට සහභාගි වන සභාවේ සභිකයන්ගේ හෝ නිලධරයන්ගේ ගමන් වියදම් පියවීම පිණිස ප්‍රාදේශීය සභාව විසින් සම්මත කරනු ලබන සියලු මුදල් ;

(ච) මේ පනතින් හෝ වෙනත් යම් ලිඛිත නීතියකින් තමා වෙත පැවරී ඇති බලතල ක්‍රියාත්මක කිරීමේ දී සහ කාර්යයන් ඉටු කිරීමේ දී ප්‍රාදේශීය සභාවේ ලේකම්වරයා විසින් හෝ ඔහු වෙනුවෙන් දරන ලද සියලු වියදම් ;

(ජ) මේ පනත යටතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක් යටතේ හෝ ඒ යටතේ සාදන ලද යම් අතුරු ව්‍යවස්ථාවක්, රීතියක් හෝ නියෝගයක් යටතේ ස්වකීය බලතල ක්‍රියාත්මක කිරීමේ දී හා කාර්යයන් සහ කර්තව්‍ය ඉටු කිරීමේ දී ප්‍රාදේශීය සභාව වෙනුවෙන් ප්‍රාදේශීය සභාව විසින් හෝ සභාපතිවරයා හෝ ලේකම්වරයා හෝ ප්‍රාදේශීය සභාවේ වෙනත් යම් නිලධරයකු විසින් දරන ලද සියලු වියදම් ; සහ

(ට) මේ පනතින් හෝ වෙනත් යම් ලිඛිත නීතියකින් හෝ ඒ යටතේ හෝ ප්‍රාදේශීය සභා අරමුදලින් ගෙවීමට නියමිත හෝ බලය ලැබී ඇති සියලු මුදල්

ගෙවනු ලැබිය යුතු ය.

ප්‍රාදේශීය සභා අරමුදලින් ගෙවීම චෙක් පත් අණකර ආදිය

133. ප්‍රාදේශීය සභා අරමුදලින් කරනු ලබන සියලු ගෙවීම් සඳහා වූ චෙක්පත් හෝ අණකර, සහකාර කොමසාරිස්වරයාගේ අනුමතියට යටත්ව, ඒ කාර්ය සඳහා ප්‍රාදේශීය සභාව විසින් විශේෂයෙන් බලය පවරන ලද නිලධරයන් දෙදෙනකු විසින් අත්සන් කරනු ලැබිය යුතු ය. අරමුදල පිහිටුවා ඇති බැංකුව විසින්, එසේ අත්සන් කරන ලද සියලු අණකර හෝ චෙක්පත් වෙනුවෙන් අරමුදලින් ගෙවීම් කරනු ලැබිය හැකි ය.

## වරිපනම් සහ බදු

වරිපනම් සහ අක්කර බදු.

134. (1) සහකාර කොමසාරිස්වරයාගේ අනුමතිය ඇතිව, දියුණු කළ ප්‍රදේශ වශයෙන් ප්‍රාදේශීය සභාව විසින් ප්‍රකාශයට පත් කරන ලද ප්‍රදේශ ඇතුළත පිහිටියා වූ යම් නිවෙස්වල දේපළක හෝ නිවෙස්වල දේපළ වර්ගයක වාර්ෂික වටිනාකම මත වරිපනම් බද්දක් අමාත්‍යවරයාගේ අනුමතියට යටත්ව, සෑම ප්‍රාදේශීය සභාවක් විසින් ම නියම කිරීම සහ අය කිරීම කරනු ලැබිය හැකි ය.

(2) ප්‍රාදේශීය සභාව විසින්, දියුණු කළ වෙනස් ප්‍රදේශයන් සඳහා හෝ එහි කොටස් සඳහා වෙනස් වන වරිපනම් බදු එම ප්‍රදේශවල හෝ කොටස්වල සංවර්ධන මට්ටම සැලකිල්ලට ගෙන නියම කරනු ලැබිය හැකි ය.

(3) ප්‍රාදේශීය සභාව විසින්, යම් ප්‍රාදේශීය සභාවක සීමා ඇතුළත පිහිටියා වූ ද ස්ථිර හෝ නිතිපතා ගොවිතැනක් යටතේ වූ ද එක් එක් ඉඩම් හෙක්ටයාරය මත පහත දක්වා ඇති අනුප්‍රමාණ නොඉක්මවන අක්කර බද්දක්, අමාත්‍යවරයාගේ අනුමතයට යටත්ව, නියම කිරීම සහ අයකිරීම් කළ හැකි ය :

| ඉඩම් ප්‍රමාණය | බදු අනු ප්‍රමාණය වාර්ෂිකව |
|---|---|
| | රු. |
| ඒ ඉඩම් ප්‍රමාණය හෙක්ටයාර් පහකට අඩු නමුත් හෙක්ටයාර් එකකට නොඅඩු වන අවස්ථාවක ... | 50 |
| ඉඩම් ප්‍රමාණය හෙක්ටයාර් පහක් හෝ ඊට වැඩි වන අවස්ථාවක ... | 10 : |

එසේ වුවද ප්‍රමාණයෙන් හෙක්ටයාර් පහකට අඩු වූ ද නිසි ලෙස මවත් කර දක්වා ඇත්තා වූ එක් දේපළක් සංයුක්ත වූ ද යම් බෙදූ ඉඩම් කොටසක් අක්කර බද්ද නියම කිරීම හා අය කිරීමේ කාර්යය සඳහා විශේෂ ප්‍රදේශයක් ලෙස ගැසට් පත්‍රයෙහි පළකරනු ලබන නියමයක් මගින් අමාත්‍යවරයා විසින් ප්‍රකාශයට පත් කරන ලද ප්‍රදේශයක පිහිටා ඇත්නම් මිස, එවැනි ඉඩම් කොටසක් සම්බන්ධයෙන් ප්‍රාදේශීය සභාව විසින් ඒ බද්ද නියම නොකළ යුතු ය :

එසේම තවදුරටත් වරිපනම් බද්දක් නියම කිරීම සඳහා දියුණු වූ ප්‍රදේශ යනුවෙන් ප්‍රකාශිත ප්‍රදේශවල පිහිටියා වූ යම් ඉඩමක් සම්බන්ධයෙන් ප්‍රාදේශීය සභාව විසින් අක්කර බද්දක් නියම නොකළ යුතු ය.

(4) යම් ගොඩනැගිල්ලක්, ඒ ගොඩනැගිල්ල පිහිටි ඉඩම වගා කිරීමට සම්බන්ධ හෝ ආනුෂංගික කාර්යය සඳහා හෝ එම ඉඩම් වගාකිරීමේ යෙදී සිටින යම් තැනැත්තකුගේ හෝ තැනැත්තන්ගේ පදිංචිය සඳහා සම්පූර්ණයෙන්ම හෝ ප්‍රධාන වශයෙන් භාවිත කෙරෙන්නා වූ ද එම ඉඩම සම්බන්ධයෙන් අක්කර බද්දක් අය කරනු ලැබ ගෙවනු ලබන්නා වූ ද අවස්ථාවක, එම ගොඩනැගිල්ල දියුණු ප්‍රදේශයක පිහිටියේ වුවද එම ගොඩනැගිල්ල සම්බන්ධයෙන් වරිපනම් බද්දක් අය කර නොගත යුතු ය.

(5) ප්‍රාදේශීය සභාව විසින් යම් වර්ෂයක් සඳහා (1) වන උපවගන්තිය යටතේ යම් වරිපනම් බද්දක් හෝ (2) වන උපවගන්තිය යටතේ අක්කර බද්දක් යම් වර්ෂයක් සඳහා නියම කිරීමේ දී කලින් වර්ෂයේ බලපැවැත්වූ අනුප්‍රමාණයම වෙනස් නොකර යොදාගැනීමට අදහස් කරන අවස්ථාවක දී ඒ වරිපනම් බද්ද හෝ අක්කර බද්ද නියමකිරීම හෝ අයකිරීම සම්බන්ධයෙන් අමාත්‍යවරයාගේ අනුමතිය අවශ්‍ය නොවිය යුතු ය.

(6) මේ වගන්තිය යටතේ වූ ඒ වරිපනම් බද්ද හෝ අක්කර බද්ද ප්‍රාදේශීය සභාව විසින් විධාන කරනු ලබන ආකාරයේ වාරිකවලින් එසේ විධාන කරනු ලබන කාලවල දී ගෙවිය යුතු ය.

(7) යම් වාර්ෂික වරිපනම් බද්දක් හෝ අක්කර බද්දක් එම වර්ෂයේ ජනවාරි මාසයේ තිස් එක් වන දින හෝ ඊට පෙර ගෙවුව හොත් එම වාර්ෂික වරිපනම් බද්දේ හෝ බද්දේ ප්‍රමාණයෙන් සියයට දහයක වට්ටමක් ද ඒ වරිපනම් බද්ද හෝ බද්ද වාරිකවලින් ගෙවන අවස්ථාවක නම් ඒ වරිපනම් බද්දේ හෝ බද්දේ වාරිකය අයවිය යුතු කාල සීමා කිරීම පළමුවැනි මාසය ඇතුළත ගෙවුවහොත් ඒ වාරිකයේ ප්‍රමාණයෙන් සියයට පහක වට්ටමක් ද සෑම ප්‍රාදේශීය සභාවක් විසින් ම දිය යුතු ය.

135. යම් වරිපනම් බද්දකින් හෝ අක්කර බද්දකින්— ප්‍රාදේශීය සභාවක් විසින් නියම කරනු ලබන වරිපනම් බදු වලින් හා අක්කර බදු වලින් නිදහස් කිරීම.

(අ) පොදු ආගමික පූජනීය ස්ථානයක අධිපතිවරයකුගේ පදිංචිය සඳහා වෙන් කරන ලද යම් ගොඩනැගිලි සහ ඊට අනුබද්ධ ඉඩම ද ඇතුළු පොදු ආගමික පූජනීය කටයුතු සඳහා මුළුමනින්ම හෝ ප්‍රධාන වශයෙන් ප්‍රයෝජනයට ගනු ලබන සියලු ඉඩම් හෝ ගොඩනැගිලි;

(ආ) රජයේ දෙපාර්තමේන්තුවක් විසින් අනුමත කළ හෝ පිළිගන්නා ලද සංස්කෘතික, සමාජයීය, ආගමික හෝ පුණ්‍ය කාර්ය සඳහා මුළුමනින්ම හෝ ප්‍රධාන වශයෙන් ප්‍රයෝජනයට ගනු ලබන්නා වූ ද, එවැනි ආයතන විසින් අයිතිය දරන්නා වූ සියලු ඉඩම් හෝ ගොඩනැගිලි;

(ඇ) ගාස්තු අය නොකරන අධ්‍යාපනික ආයතන විසින් හෝ රාජ්‍ය අරමුදල්වලින් ආධාර ගෙවනු ලබන්නා වූ හෝ එවැනි ආධාර කලින් ගෙවනු ලැබූ නමුත් දැන් ඒවා නො-

ගෙවනු ලබන්නා වූ අධ්‍යාපනික ආයතන විසින් මුළුමනින්ම හෝ ප්‍රධාන වශයෙන් භාවිත කෙරෙන සියලු ඉඩම් හෝ ගොඩනැගිලි;

(ඈ) සුසාන භූමි හා මිනීපිටි ආඥාපනත යටතේ ප්‍රකාශයට පත් කරන ලද හෝ ලියාපදිංචි කරන ලද සියලු සුසාන භූමි සහ භූමදාන බිම්; සහ

(ඉ) අයිතිකරුගේ දරිද්‍රතාවය හේතුකොටගෙන ප්‍රාදේශීය සභාව විසින් යෝජනා සම්මතයක් මගින් එම බද්දෙන් විශේෂ වශයෙන් නිදහස් කරනු ලැබිය හැකි දේපළ

නිදහස් විය යුතු ය.

රජයේ දේපළ තක්සේරු කිරීම.

136. යම් ප්‍රාදේශීය සභාවක සීමාවන් තුළ පිහිටියා වූ, රජය විසින් යම් තැනැත්තකුට බදු දෙන ලද හෝ කුලියට දෙන ලද රජයට අයත් සියලු ගෙවල්, ගොඩනැගිලි, ඉඩම් සහ ගෙවතු 134 වන වගන්තිය යටතේ අයකළ යුතු වරිපණම් බද්ද හෝ බදු හෝ අක්කර බද්ද වෙනුවෙන් තක්සේරු කිරීමට යටත් විය යුතු ය; එවැනි යම් ස්ථානයක භාම බදුකරුවකුම් එසේ දරන හෝ පදිංචිව සිටින නිවාසය, ගොඩනැගිල්ල, ඉඩම හෝ ගෙවත වෙනුවෙන් අය කරනු ලබන වරිපණම් බද්ද හෝ බදු හෝ අක්කර බද්ද ගෙවීමට යටත් වන අතර එය ප්‍රාදේශීය සභාවට ගෙවනු ලැබිය යුතු ය.

රජයේ දේපළ කුලියට ගැනීමට සහ විකිණීමට සැටන් නොහැකි බව.

137. රජය සමග හෝ රජයෙන් ඇති ප්‍රකාශිත හෝ ව්‍යංගිත යම් එකඟවීමක්, ගිවිසුමක් හෝ අවසර පත්‍රයක් යටතේ රජයේ දේපළක් වන යම් ගෙයක්, ගොඩනැගිල්ලක්, ඉඩමක් හෝ ගෙපතක් දරන්නා වූ, හෝ එහි පදිංචිව සිටින්නා වූ හෝ බුක්ති විඳින්නා වූ යම් තැනැත්තකුගෙන් අයවිය යුතු යම් වරිපණම් බද්දක් හෝ එය වරිපණම් බදු, බද්දක් හෝ බදු අයකර ගැනීම සඳහා රජයට අයත් වංචල හෝ නිශ්චල කවර ආකාරයේ හෝ දේපළක් තහනමට ගැනීම හෝ විකිණීම කරනු නොලැබිය යුතු ය.

තක්සේරු කිරීමේදී දේපළ බෙදීම හෝ ඒකාබද්ධ කිරීම.

138. (1) තක්සේරු කිරීමේ කාර්යය සඳහා සහ ඒ සඳහා ප්‍රමාණවත් හේතු ඇති කවර වූ හෝ විටෙක ප්‍රාදේශීය සභාව විසින් කලින් කල, යම් ගෙයක්, ගොඩනැගිල්ලක්, ඉඩමක් හෝ ගෙපතක් බෙදා වෙන් කිරීම සහ යම් ප්‍රාදේශීය සභාවක සීමා තුළ වූ කවර ආකාරයේ හෝ වෙන් වෙන්ව ඇති ගෙවල්, ගොඩනැගිලි ඉඩම් හෝ ගෙපත් ඒකාබද්ධ කිරීම කරනු ලැබිය හැකි අතර, මේ යටතේ අය කළ යුතු යම් වරිපනම් බද්දක් හෝ වරිපනම් බදු සඳහා ඒ එක් එක් බෙදා වෙන් කළ කොටස වෙන් වෙන්වත්, ඒකාබද්ධ කළ එක් එක් ස්ථානයක් සමස්තයක් ලෙසත් තක්සේරු කරනු ලැබිය හැකි ය :

එසේ වුව ද, එවැනි යම් ඒකාබද්ධ කිරීමක දී, ඒ ස්ථානයට සංයුක්ත වන වෙන් වෙන්වූ ගෙවල්වල, ගොඩනැගිලිවල, ඉඩම්වල හෝ ගෙපත්වල වාර්ෂික වටිනාකමෙහි එකතුව අනුව ඒකාබද්ධ කරන ලද ස්ථානය තක්සේරු කළ යුතු ය.

(2) ඒ එක් එක් ගෙයි, ගොඩනැගිල්ලේ, ඉඩමේ, ගෙපතේ හෝ සෑම පදිංචි කරුවකුටම, එම පදිංචිකරුවකු, අයිතිකරු, කුලී කරුවකු හෝ කුලී නිවැසියකු වුවද ඒ බෙදා වෙන් කිරීම හෝ ඒකාබද්ධ කිරීම පිළිබඳ දැන්වීමක් ප්‍රාදේශීය සභාව විසින් භාරදීමට සැලැස්විය යුතු ය.

(3) එසේ කටයුතු කරනු ලැබූ යම් ස්ථානයක තක්සේරු කරන ලද වාර්ෂික වටිනාකම, ඒ බෙදා වෙන් කිරීම හෝ ඒකාබද්ධ කිරීම හේතුකොටගෙන, ඒ බෙදා වෙන් කිරීම හෝ ඒකාබද්ධ කිරීම කරනු ලැබූ වර්ෂය සඳහා, වැඩි කිරීම හෝ අඩු කිරීම නොකළ යුතු ය.

තක්සේරු කිරීමේ කාර්ය සඳහා වූ වාර වාර්තා.

139. (1) වරිපනම් බදු පැනවීමට යටත් යම් ගෙයක, ගොඩනැගිල්ලක, ඉඩමක හෝ ගෙපතක වාර්ෂික වටිනාකම තක්සේරු කිරීමට හෝ අක්කර බද්දේ කාර්යය සඳහා යම් වගා කළ ඉඩමක විශාලත්වය තක්සේරු කිරීමට ප්‍රාදේශීය සභාවට හැකි පරිදි පිණිස ඒ ගෙයි, ගොඩනැගිල්ලේ, ඉඩමේ හෝ ගෙපතේ අයිතිකරුට සහ පදිංචිකරුට එහි කුලිය හෝ වාර්ෂික වටිනාකම හෝ එහි විශාලත්වය පිළිබඳ වාර වාර්තා සපයන ලෙස ප්‍රාදේශීය සභාව විසින් නියම කළ හැකි ය. තව ද, ප්‍රාදේශීය සභාව විසින්, තත් කාර්යය සඳහා බලය පවරන ලද යම් නැනැත්තකු විසින්, ඒ කාර්යය සඳහා ඉරු නැගීමේ සිට ඉරු බැසීම තෙක් වූ කාලය අතරතුර යම් වේලාවක ඒ ගෙයට, ගොඩනැගිල්ලට, ඉඩමට හෝ ගෙපනට ඇතුළුවීම ද එය පරීක්ෂා කිරීම හා මැනීම ද නීත්‍යානුකූල විය යුතු ය.

(2) යම් අලුත් ගොඩනැගිල්ලක් හෝ පවත්නා යම් ගොඩනැගිල්ලකට යම් එකතු කිරීමක් ඉදිකිරීම සම්පූර්ණ වූ බව, ඒ සම්පූර්ණ කිරීම හෝ එකතුකිරීම කොට දින 14 ක් ඇතුළත ප්‍රාදේශීය සභාව වෙත ලියවිල්ලකින් දැනුම් දීම, දියුණු කළ ප්‍රදේශයක ඇති යම් නිශ්චල දේපළක අයිතිකරුගේ කාර්යය වන්නේ ය.

(3) (අ) මෙහි නිශ්චිතව සඳහන් වාර වාර්තාව සපයන ලෙස නියම කරනු ලැබූ දින සිට දවස් හතක් ඇතුළත එම වාර වාර්තාව සැපයීම පැහැර හරින හෝ නොසලකා හරින ; හෝ

(ආ) දැනුවත්වම අසත්‍ය හෝ සාවද්‍ය වාර වාර්තාවක් සපයන ; හෝ

(ඇ) ඉහත කී පරිදි බලය පවරන ලද යම් නැනැත්තකුට එවැනි යම් ගෙයකට, ගොඩනැගිල්ලකට, ඉඩමකට හෝ ගෙපතකට ඇතුළුවීමට හෝ පරීක්ෂා කිරීමට හෝ අවශ්‍ය වුවහොත් නම් මැනීමට අවහිර කරන, බාධා කරන හෝ වළක්වාලන ; හෝ

(ආ) (2) වන උපවගන්තිය අනුව කටයුතු කිරීම පැහැර හරින සෑම තැනැත්තකුම වරදකට වරදකරු විය යුතු අතර, වරදකරු කරනු ලැබූ විට, රුපියල් එක් දහසකට නොවැඩි දඩයකට යටත් විය යුතු ය.

දේපළවල වාර්ෂික වටිනාකම තක්සේරු කිරීම.

140. (1) අළුත් තක්සේරුවක් සකස් කිරීම සඳහා මේ ප්‍රාදේශීය සභාවක සීමාව ඇතුළත වූ එක් එක් ගෙයි, ගොඩනැගිල්ලේ, ඉඩමේ සහ ගෙපළේ වාර්ෂික වටිනාකම ප්‍රධාන තක්සේරුකරු විසින් හෝ සහකාර කොමසාරිස්වරයාගේ අනුමතය ඇතිව ප්‍රාදේශීය සභාව විසින් පත් කරනු ලබන යම් තැනැත්තකු හෝ තැනැත්තන් විසින් තක්සේරු කරනු ලැබිය යුතු ය.

(2) අක්කර බද්ද සඳහා සියලු වගාකල ඉඩම්වල ප්‍රමාණය නිර්ණය කිරීමේ කාර්යය සඳහා, තක්සේරුකරුවන් ලෙස ක්‍රියා කිරීම පිණිස එක් තැනැත්තකු හෝ ඊට වැඩි තැනැත්තන් සංඛ්‍යාවක් පත් කිරීමට සෑම ප්‍රාදේශීය සභාවකටම බලය ඇත්තේ ය.

(3) වාර්ෂික වටිනාකම හෝ වගාකර ඇති ඉඩමේ ප්‍රමාණය තක්සේරු කිරීමේ හෝ එය සත්‍යාපනය කිරීමේ කාර්යය සඳහා ප්‍රධාන තක්සේරුකරු විසින් හෝ ප්‍රාදේශීය සභාව විසින් (1) වන උපවගන්තිය හෝ (2) වන උපවගන්තිය යටතේ පත් කරන ලද යම් තැනැත්තකු හෝ තැනැත්තන් විසින් ඉරු නැගීමේ සිට ඉරු බැසීම තෙක් වූ කාලය අතරතුර යම් වේලාවක යම් ගොඩනැගිල්ලකට හෝ ඉඩමකට ඇතුළුවීම ද, එහි වාර්ෂික වටිනාකම හෝ ඒ ඉඩමේ ප්‍රමාණය නිර්ණය කිරීම පිණිස අවශ්‍ය සියලු ක්‍රියා කිරීම හෝ කිරීමට සැලැස්වීම ද නීත්‍යනුකූල විය යුතු ය.

තක්සේරු ලැයිස්තුව සහ අක්කර බදු ලැයිස්තුව.

141. (1) තක්සේරු ලැයිස්තුවක් හෝ අක්කර බදු ලැයිස්තුවක් පිළියෙල කිරීම අවසන් කල පසු, ඒ පිළිබඳව සහ ඒ තක්සේරු ලැයිස්තුව හෝ අක්කර බදු ලැයිස්තුව පරීක්ෂා කර බැලිය හැකි ස්ථානය පිළිබඳව, ප්‍රාදේශීය සභාව විසින් ප්‍රසිද්ධ දැන්වීමක් කිරීමට සලස්වනු ලැබිය යුතු ය.

(2) ඒ තක්සේරු ලැයිස්තුවේ හෝ අක්කර බදු ලැයිස්තුවේ යම් කොටසක් පරීක්ෂා කර බැලීමට අය කිරීමකින් තොරව යම් තැනැත්තකුට අවසර දිය යුතු ය.

(3) තක්සේරු කරන ලද ගෙයක, ගොඩනැගිල්ලක, ඉඩමක හෝ ගෙපළක නැතහොත් ප්‍රමාණය සත්‍යාපනය කරන ලද වගා කළ ඉඩමක පදිංචිකරු එම ස්ථානයේ අයිතිකරු හෝ කුලී නිවැසියා වුවද, ඒ සෑම පදිංචිකරුවකුටම එහි වාර්ෂික වටිනාකම පිළිබඳව හෝ සත්‍යාපනය කරන ලද ප්‍රමාණය පිළිබඳව තක්සේරු දැන්වීමක් භාරදීමට හෝ එම ස්ථානයේ තැබීමට ප්‍රාදේශීය

සභාව විසින් සැලැස්විය යුතු ය. එකී දැන්වීම තුන්වන උපලේඛන යෙහි දක්වා ඇති ආකෘතියට සාරානුකූල විය යුතු ය. තක්සේරුව හෝ සත්‍යාක්ෂණය සම්බන්ධයෙන් ලිඛිත විරෝධතා ඇත්නම් භාර දෙනු ලැබූ දින සිට දින තිහක් ඇතුළත ප්‍රාදේශීය සභා කාර්යාල යේදී භාර ගනු ලබන බව ඒ දැන්වීමෙන් වැඩිදුරටත් දන්වනු ලැබිය යුතු ය.

(4) ප්‍රාදේශීය සභාව විසින් "විරෝධතා පොත" යනුවෙන් හඳුන්වනු ලබන පොතක් තබා ගැනීමට සැලැස්විය යුතු අතර එකී තක්සේරුවකට හෝ සත්‍යාක්ෂණය කිරීමකට විරුද්ධව වූ සෑම විරෝධතාවක්ම ලියාපදිංචි කිරීමට සලස්වනු ලැබිය යුතු ය. ඒක් එක් විරෝධපාර්ශවකරුට හා ඒ ගෙයෙහි, ගොඩනැගිල්ලෙහි, ඉඩ මෙහි, ගෙපනෙහි. නැතහොත් වගා කළ ඉඩමෙහි අයිතිකරුට හෝ පදිංචිකරුට ඒ විරෝධතාවය විමර්ශනය කරනු ලබන දිනය. ස්ථා නය සහ වේලාව ප්‍රාදේශීය සභාව විසින් ලියවිල්ලකින් දැනුම් දීමට සලස්වනු ලැබිය යුතු ය.

(5) එසේ නියම කරන ලද වේලාවේ දී හා ස්ථානයේ දී ප්‍රාදේශීය සභාව විසින්, විරෝධපාර්ශවකරු, අයිතිකරු සහ පදිංචිකරු හෝ ඔවුන්ගේ බලය ලත් අනුයෝජිතයන් පැමිණ සිටින්නේ නම් ඔවුන් ඉදිරියේ දී විරෝධතා විමර්ශනය කිරීමට සැලැස්විය යුතු ය. යුක්තිසහගත හේතුවක් මත ඒ විමර්ශනය කිරීම කලින් කල අඩාලව කල් තැබිය හැකි ය.

(6) තක්සේරුවක් හෝ සත්‍යාක්ෂණය කිරීමක් සම්බන්ධ යෙන් වූ යම් විරෝධතාවක් පිළිබඳ සුදුස්සක් කරනු ලැබූ කල්හි, ඒ පිළිබඳ තීරණය, ප්‍රාදේශීය සභාව විසින්, විරෝධපාර්ශවකරුට, අයිති කරුට හා පදිංචිකරුට දැන්වීමට සැලැස්වීමට ද ඒ තීරණය විරෝ ධතා පොතෙහි සටහන් කිරීමට ද සලස්වනු ලැබිය යුතු ය. තවද අවස්ථාවෝචිත පරිදි තක්සේරු ලැයිස්තුවෙහි හෝ අක්කර බදු ලැයිස්තුවෙහි අවශ්‍ය යම් සංශෝධනයක් කිරීම ද ප්‍රාදේශීය සභාව විසින් කරනු ලැබිය යුතු ය.

(7) කිසිම විරෝධතාවක් නොකරන ලද සෑම තක්සේරුවක්ම, අවස්ථාවෝචිත පරිදි. ඒ තක්සේරු ලැයිස්තුව හෝ අක්කර බදු ලැයිස්තුව බලාත්මකව පවතින කාලසීමාව සඳහා අවසානාත්මක විය යුතු ය.

142. (1) යම් ගෙයක, ගොඩනැගිල්ලක, ඉඩමක හෝ ගෙපනක තක්සේරුව සම්බන්ධයෙන් හෝ වගා කළ ඉඩමක ප්‍රමාණය සම්බන්ධයෙන් 141 වන වගන්තිය යටතේ වූ තීරණයෙන් අතෘප් තියට පත් සභා නැතහොත් [illegible] ලැබී දවස් තිහක් ඇතුළත දී, ඒ ගෙයි, ගොඩනැගිල්ලේ, ඉඩමේ හෝ ගෙපනේ වාර්ෂික වටිනාකම හෝ ඒකාබද්ධ කරනු ලැබූ අවස් ථාවක නම්. එසේ ඒකාබද්ධ කරන ලද ඒ ගෙවල්වල, ගොඩනැගිලි වල. ඉඩම්වල හෝ ගෙපන්වල වාර්ෂික වටිනාකම මත වූ වරිපනම් බද්දේ හෝ බලපත්‍ර ප්‍රමාණය නැතහොත් සත්‍යාක්ෂණය කරන ලද ප්‍රමාණය අනුව වූ අක්කර බද්දේ ප්‍රමාණය රුපියල් එක්

තක්සේරුව ආදියට විරුද්ධතාවයක් ඇති අවස්ථාවක කාර්ය පටිපාටිය

දහස් පන්සියය නොඉක්මවන විට ඒ ගෙය, ගොඩනැගිල්ල, ඉඩම හෝ ගෙපළ තිබෙන්නේ නම් වගා කළ ඉඩම පිහිටි ස්ථානය විෂයයෙහි අධිකරණ බලය ඇති මහේස්ත්‍රාත් අධිකරණයෙහි හෝ ඒ මුදලේ ප්‍රමාණය රුපියල් එක්දහස් පන්සියය ඉක්මවන විට ඒ අධිකරණ බලය ඇති දිසා අධිකරණයෙහි ඒ තීරණයට විරුද්ධව නඩුවක් පවරනු ලැබිය හැකි ය.

(2) මේ වගන්තිය යටතේ වූ යම් නඩුවක්, විභාග කිරීමේ දී පැමිණිලිකරු විසින් තක්සේරුවට හෝ සන්තෝෂණය කිරීමට විරුද්ධව ඉදිරිපත් කරන ලද සිය ලිඛිත විරුද්ධතාවයෙන් සඳහන් නොවුණු යම් විරුද්ධතා හේතුවක් පිළිබඳ සාක්ෂි ඉදිරිපත් කිරීමට පැමිණිලිකරුට ඉඩ නොදිය යුතු ය.

(3) සිවිල් නඩු විභාග කිරීම හා තීරණය සඳහා නත් කාලයෙහි බලපවත්නා නීතියෙන් නියමකර ඇති කාර්ය පටිපාටියට අනුව, ඒ සෑම අධිකරණයක් ම විසින් එවැනි නඩු විභාගකොට තීරණය කළ යුතු ය. තවද සෑම විටම ඒ අධිකරණයේ තීරණය අභියාචනාධිකරණය වෙත අභියාචනය කිරීමට යටත් විය යුතු ය.

(4) ඒ සෑම අභියාචනයක්ම අවශ්‍යාවෝචිත පරිදි, මහේස්ත්‍රාත් අධිකරණයක හෝ දිසා අධිකරණයක යම් නඩු තීන්දුවක, තීන්දු ප්‍රකාශයකට හෝ ආඥාවකට විරුද්ධව අභියාචනාධිකරණයට අභියාචනය කිරීම විධිමත් කෙරෙන්නා වූ යම් ලිඛිත නීතියක විධි විධානවලින් පාලනය විය යුතු ය.

(5) යම් තක්සේරුවකට හෝ සන්තෝෂණය කිරීමට විරුද්ධව යම් විරුද්ධතාවක් ඉදිරිපත් කර තිබීම හෝ එවැනි නඩුවක් පවරා තිබීම හෝ ඒ පිළිබඳව යම් අභියාචනයක් කර තිබීම හේතුකොටගෙන ඒ වරිපනම් බද්ද, හෝ වරිපනම් බද්ද හෝ බද්ද මුළුමනින් ම හෝ යම් කොටසක් අය කිරීම නතර නොකළ යුතු අතර, අයකරනු ලැබූ මුදලෙහි යම් අතිරික්තයක් වේ නම් එම අතිරික්තය විරෝධතාවය ලබා කෙරෙන තීරණය අනුව හෝ අභියාචනයක් නොමැති නම්, ඒ මහේස්ත්‍රාත් අධිකරණයේ හෝ දිසා අධිකරණයේ තීරණය අනුව හෝ අභියාචනයක් වේ නම්, අභියාචනාධිකරණයේ තීරණය අනුව ආපසු ගෙවනු ලැබිය යුතු ය.

වාර්ෂික වටිනාකම සකසෙනු ලබන පදනම්වලට කරන ලද වෙනස් කිරීම් මත තක්සේරුව අඩු කිරීම.

113. (1) යම් ගෙයක, ගොඩනැගිල්ලක, ඉඩමක හෝ ගෙපළක තක්සේරුව හෝ වගා කළ ඉඩමක ප්‍රමාණය ඉහතින් වූ වගන්තිය ප්‍රකාර අවසානාත්මක වීමෙන් පසු, එකී ගෙයි, ගොඩනැගිල්ලේ, ඉඩමේ හෝ ගෙපළේ වාර්ෂික වටිනාකමට හෝ වගා කළ ඉඩමේ ප්‍රමාණය බලපාන ලෙස එහි භෞතික වෙනස් කිරීම් කරන ලද අවස්ථාවක, ඉහතින් වූ වගන්තිවල පටහැනිව කුමක් සඳහන් වුවද ප්‍රාදේශීය සභාවක් විසින් යම් අවස්ථාවක ඒ ස්ථානය සඳහා අළුත් තක්සේරුවක් හෝ සන්තෝෂණය කිරීමක් පිළියෙල කරනු ලැබිය හැකි ය.

(2) ඒ සෑම අළුත් තක්සේරුවක්ම හෝ සන්තෝෂණය කිරීමක්ම, අවශ්‍යාවෝචිත පරිදි, එය තක්සේරු ලැයිස්තුවේ හෝ අක්කර බදු ලැයිස්තුවේ ඇතුළත් කිරීමට යෙදුණු මාසයට පසුව එළඹෙන මාසයේ පළමු වන දින සිට බලපැවැත්විය යුතු ය:

එසේ වුවද, ඒ අළුත් තක්සේරුව හෝ සංතොෂණය කිරීම් කැමවිටම හැකිතාක් දුරට ඉහතින් වූ වගන්තිවලින් නියම කර ඇති ආකාරයට කළ යුතු අතර එහි සඳහන් විරුද්ධතාවලට, විමර්ශන කිරීම්වලට, කඩුවලට හා අභියාචනාවලට යටත් විය යුතු ය.

144. සඳහන් යයි ප්‍රාදේශීය සභාවට පෙනී යන පරිදි යම් තක්සේරුවක් හෝ සංතොෂණය කිරීමක් වැඩි කිරීමෙන් හෝ අඩු කිරීමෙන් තත්කාර්ය සඳහා ප්‍රමාණවත් හේතු ඇති බවට ප්‍රාදේශීය සභාව සෑහීමට පත් වෙතොත්, එය ප්‍රතිශෝධනය කිරීමට සහ ප්‍රතිශෝධිත තක්සේරුව හෝ සංතොෂණය කිරීම බලපවත්වන දිනය නියම කිරීමට ප්‍රාදේශීය සභාවට කවර විටක හෝ බලය සහ අධිකාරය ඇත්තේ ය. ඇතැම් අවස්ථාවල දී තක්සේරුව සංශෝධනය හෝ වරිපනම් සංතොෂණය කිරීම

145. (1) ගෘහභාණ්ඩ තබා ඇති ගොඩනැගිල්ලක් හැර යම් ගොඩනැගිල්ලක නිවැසිභාවය නොමැතිව තිබෙන්නේ නම්, හෝ පවතින්නේ නම් ඒ ගොඩනැගිල්ල වෙනුවෙන් ගෙවිය යුතු වරිපනම් බදුවලින් ඒ ගොඩනැගිල්ල නිවැසිභාවය නොමැතිව තිබෙන හෝ පවතින කාල සීමාව සඳහා සමානුපාතික අඩු කිරීමක් සඳහා ඉඩදිය හැකි ය. නිවැසි භාවය නොමැති කාල සීමාව සම්බන්ධයෙන් වරිපනම් ගාස්තු අඩු කිරීම

(2) ගෘහ භාණ්ඩ තබා ඇත්තා වූ සහ ගෘහ භාණ්ඩ සහිතව කුලියට දීමට අදහස් කරනු ලබන ගොඩනැගිල්ලක් ලෙස ප්‍රාදේශීය සභාවේ ලියාපදිංචිකර ඇත්තා වූ ද යම් ගොඩනැගිල්ලක් නිවැසිභාවය නොමැතිව තිබෙන්නේ නම් හෝ පවතින්නේ නම්, ඒ ගොඩනැගිල්ල වෙනුවෙන් ගෙවිය යුතු වරිපනම් බදුවල එක් අර්ධයකින්, ඒ ගොඩනැගිල්ල එසේ නිවැසිභාවය නොමැතිව තිබෙන හෝ පවතින කාල සීමාව සඳහා සමානුපාතික අඩුකිරීමක් සඳහා ඉඩදිය හැකි ය.

(3) යම් ගොඩනැගිල්ලක් වෙනුවෙන් (1) වන හා (2) වන උපවගන්ති යටතේ අඩු කිරීමක් සඳහා ඉඩ දෙනු ලබන කාල සීමාව එම ගොඩනැගිල්ලේ නිවැසිභාවය නොමැතිව පවතින බවට වූ ලිඛිත දැන්වීමක් ප්‍රාදේශීය සභාවට ලැබුණු දිනයෙන් ආරම්භව එය නැවත පදිංචියට ගත් දිනයෙන් අවසන් විය යුතු ය:

එසේ වුව ද, නැවත පදිංචියට ගැනීමෙන් පසු දවස් තුනක් ඇතුළත ඒ පිළිබඳ දන්වීමක් ප්‍රාදේශීය සභාවට දෙනු නොලැබුවේ නම්, එකී කාල සීමාව, ඒ ගොඩනැගිල්ල නැවත පදිංචියට ගත් දිනයට මාසයකට කලින් වූ දිනයේ දී අවසන් විය යුතු ය. මේ උපවගන්තිය යටතේ වූ සෑම දැන්වීමක් සම්බන්ධයෙන් දැන ගැනිය හැකි සියලු ලියකියවිලි හැසැල් කර ගැනිය හැකි වන ලිපිනයක්, එකී සෑම දැන්වීමකම ඇතුළත් විය යුතු ය.

(4) මේ වගන්තිය යටතේ වූ අඩු කිරීමක් සඳහා වන යම් ඉල්ලීමක් සම්බන්ධයෙන් යම් ගොඩනැගිල්ලක් නිවැසිභාවය නොමැතිව තිබෙන හෝ පවතින කාලසීමාව පිළිබඳව ආරවුලක් පැන නැගුණු කල්හි, ඒ ගැන වූ ප්‍රාදේශීය සභාවේ තීරණය පිළිබඳ ලිඛිත දැන්වීමක් (3) වන උපවගන්තිය යටතේ දෙන ලද ලිපිනයට අනුවින්

අන්තිමට වූ ලිපිනයට තැපැල් මගින් යැවිය යුතු ය. තව ද ඒ දැන්වීම තැපැල් මගින් යවන ලද දිනයේ සිට දවස් තිහක් ඇතුළත එම තීරණය ප්‍රතිශෝධනය කිරීම සඳහා ලිඛිත ඉල්ලීමක් ප්‍රාදේශීය සභාවට ඉදිරිපත් කළහොත් මිස සහ එහි ප්‍රතිඵලයක් වශයෙන් ප්‍රාදේශීය සභාව විසින් ඒ තීරණය ප්‍රතිශෝධනය කළ හොත් මිස ඒ තීරණය අවසානාත්මක විය යුතු ය.

සකස් කරන ලද තක්සේරු හෝ සත්‍යක්ෂණය කිරීම සම්මත කර ගැනීම.

**146.** (1) අමාත්‍යවරයා විසින් සාමාන්‍යයෙන් හෝ විශේෂයෙන් විධානය කරනු ලබන විට පමණක් ප්‍රාදේශීය සභාව විසින් අළුත් තක්සේරුවක් හෝ සත්‍යක්ෂණය කිරීමක් සකස් කළ යුතු ය. යම් ප්‍රාදේශීය සභා ප්‍රදේශයක සීමා ඇතුළත අළුත් සේවාවක් සැලසීම හෝ දැනට පවත්නා සේවාවන් වැඩි දියුණු කිරීම සැලකිල්ලට ගෙන ඒ ප්‍රාදේශීය සභාවේ සීමාව ඇතුළත සියලු නිශ්චල දේපළ හෝ යම් පන්තියකට හෝ වර්ගයකට අයත් නිශ්චල දේපළ සම්බන්ධයෙන් අළුත් තක්සේරුවක් හෝ සත්‍යක්ෂණය කිරීමක් සකස් කිරීමට අමාත්‍යවරයා විසින් විධාන කළ හැකි ය. අමාත්‍යවරයාගේ විධාන මත අළුත් තක්සේරුවක් හෝ සත්‍යක්ෂණය කිරීමක් කරන ලද විටක දී හැර, හෝ දැනට පවත්නා සේවාවක් වැඩි දියුණු විශේෂ අවස්ථාවල දී අවශ්‍ය යයි සලකනු ලැබිය හැකි වෙනස් කිරීම් සමග ඉහතින් වූ වර්ෂය සඳහා වූ තක්සේරුව හෝ සත්‍යක්ෂණය කිරීම, පසුව එළඹෙන වර්ෂය සඳහා තක්සේරුව හෝ සත්‍යක්ෂණය කිරීම සභාව විසින් සම්මත කරනු ලැබිය යුතු ය.

(2) තක්සේරුව හෝ සත්‍යක්ෂණය කිරීම පිළිබඳ දැන්වීම නියමිත ආකාරයෙන් දෙනු ලැබිය යුතු ය.

බදු සහ බලපත්‍ර ගාස්තු නියම කිරීමට ප්‍රාදේශීය සභාවට ඇති බලය.

**147.** (1) ප්‍රාදේශීය සභාවක් විසින් එම ප්‍රාදේශීය සභා ප්‍රදේශයේ සීමාව ඇතුළත පහත දැක්වෙන බදු සහ බලපත්‍ර ගාස්තු නියම කිරීම හා අයකිරීම කරනු ලැබිය හැකි ය :—

(අ) වාහන සහ සතුන් පිළිබඳ බද්දක් ;

(ආ) ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන බලපත්‍ර සඳහා ගාස්තුවක් ; සහ

(ඇ) අමාත්‍යවරයා විසින් අනුමත කොට පාර්ලිමේන්තුව විසින් යෝජනා සම්මතයක් මගින් ස්ථිර කරන ලද වෙනත් යම් ආකාරයක බද්දක්.

(2) ප්‍රාදේශීය සභාව විසින් මේ වගන්තිය යටතේ යම් වර්ෂයක් සඳහා යම් බද්දක් නියම කිරීමේ දී, ඉහතින් වූ වර්ෂය තුළ බලාත්මකව පැවැති බද්ද වෙනස් කිරීමක් නොමැතිව, එලෙසින් ම අය කිරීමට සම්මත කරන විට, ඒ බද්ද නියම කිරීම හෝ අය කිරීම සඳහා අමාත්‍යවරයාගේ අනුමැතිය ලබා ගැනීම අවශ්‍ය නොවන්නේ ය.

වාහන සහ සතුන් පිළිබඳ බද්ද.

**148.** (1) 147 වන වගන්තියෙන් යම් ප්‍රාදේශීය සභාවකට නියම කිරීමට බලය ලැබෙන වාහන සහ සතුන් පිළිබඳ බද්ද, හතරවන උපලේඛනයේ සඳහන් වූ ද, සාමාන්‍යයෙන් එම ප්‍රාදේශීය සභා සීමාව තුළ ඇති හෝ පාවිච්චි කරනු ලබන්නා වූ සියලු වාහන සහ සතුන් වෙනුවෙන් ඒ උපලේඛනයේ සඳහන් වූ අනු ප්‍රමාණ අනුව වූ වාර්ෂික බද්දක් විය යුතු ය.

(2) වාහන සහ සතුන් පිළිබඳ බද්ද—

(අ) රජයේ හෝ ප්‍රාදේශීය සභාවේ දේපළක් වන්නා වූ යම් වාහනයක් හෝ සතකු සම්බන්ධයෙන් ; හෝ

(ආ) වෙනත් යම් කාර්යයක් සඳහා පාවිච්චි නොකර සද්භාවයෙන් ක්‍රියාකරන වාහන වෙළෙන්දන් විසින් විකිණීම සඳහා තබා ඇති වාහන සම්බන්ධයෙන් ; හෝ

(ඇ) රථවාහන ආඥාපනතේ 3 වන වගන්තිය යටතේ බලපත්‍ර ගාස්තුවකට හෝ මෝටර් වාහනවලට අදාළව තත්කාලයේ බලාත්මකව පවත්නා යම් ප්‍රඥප්තියක් යටතේ බද්දකට යටත් වන වාහන සම්බන්ධයෙන්

අය කිරීම හෝ ගෙවීම නොකළ යුතු ය.

(3) වාහන සහ සතුන් පිළිබඳ බද්ද වාර්ෂිකව, ප්‍රාදේශීය සභාව විසින් නියම කරනු ලබන හෝ අතුරු ව්‍යවස්ථාවලින් නියමිත දිනයක දී කලින් ගෙවනු ලැබිය යුතු ය.

(4) වාහන සහ සතුන් පිළිබඳ බද්ද, ඊට ගෙවීමට යටත් වන යම් වාහනයක් හෝ සතකු තම සන්තකයේ හෝ භාරයේ හෝ පාලනය යටතේ තබා ගන්නා එක් එක් තැනැත්තා විසින් ප්‍රාදේශීය සභාවේ පාලන සීමාව ඇතුළත එකී වාහනය හෝ සතා තබාගෙන සිටි හෝ ප්‍රයෝජනයට ගනු ලැබූ කාලය දවස් තිහක් වූ විගසම ගෙවනු ලැබිය යුතු ය. එහෙත් දවස් තිහකට අඩුවෙන් තම සන්තකයේ වූ යම් වාහනයක් හෝ සතකු සම්බන්ධයෙන් වූ විට, කිසිම තැනැත්තකු මේ වගන්තිය යටතේ බදු ගෙවීමට යටත් නොවිය යුතු ය.

(5) අයිතිය පවරන ලද වර්ෂය වෙනුවෙන් බද්ද එවකටත් ගෙවා ඇති යම් වාහනයක් හෝ සතකු පිළිබඳව අයිතිය පවරනු ලැබීමේ හේතුවෙන් කිසිම තැනැත්තකු බද්ද ගෙවීමට යටත් නොවිය යුතු ය.

(6) මේ පනත යටතේ යම් බද්දකට යටත් යම් වාහනයක් හෝ සතකු ප්‍රාදේශීය සභා එකකට වඩා වැඩි ප්‍රාදේශීය සභා සීමාවන් ඇතුළත පාවිච්චි කරනු ලබන්නා වූ හෝ පාවිච්චි කරනු ලැබීමට අදහස් කරනු ලබන්නා වූ අවස්ථාවක, එම වාහනය හෝ සතා ප්‍රධාන වශයෙන්ම පාවිච්චි කරනු ලබන්නා වූ හෝ පාවිච්චි කරනු ලැබීමට අදහස් කරනු ලබන්නා වූ ප්‍රාදේශීය සභා සීමාව සම්බන්ධයෙන් වැනි එක බද්දකට පමණක් එම වාහනය හෝ සතා යටත් කළ යුතු ය. තවද, එවැනි යම් බද්දකට යටත් යම් වාහනයක් හෝ සතකු

ප්‍රධාන වශයෙන් පාවිච්චි කරනු ලබන්නා වූ හෝ පාවිච්චි කරනු ලැබීමට අදහස් කරනු ලබන්නා වූ සීමාවන් සම්බන්ධයෙන් යම් ප්‍රශ්නයක් උද්ගත වුවහොත්, එම ප්‍රශ්නය සහකාර කොමසාරිස්වරයා විසින් තීරණය කරනු ලැබිය යුතු ය.

(7) මේ වගන්තිය යටතේ අය කළ හැකි බද්ද ගෙවීමට යටත් යම් තැනැත්තකු විසින් ඒ බද්ද ඉල්ලා සිටීමෙන් පසුව දින හතක් ඇතුළත එය ගෙවීම පැහැර හැරිය හොත්, ප්‍රාදේශීය සභාවේ ලේකම්වරයා විසින්, එම පැහැර හැරීම සම්බන්ධයෙන් ඒ ප්‍රාදේශීය සභාව සංයුක්ත වන්නේ යම් ප්‍රදේශයක් සඳහා ද ඒ ප්‍රදේශය කෙරෙහි අධිකරණ බලය ඇති මහේස්ත්‍රාත් අධිකරණය වෙත වාර්තා කරනු ලැබිය යුතු අතර, මහේස්ත්‍රාත්වරයකු විසින්, ඒ මුදල ස්වකීය සාමාන්‍ය අධිකරණ බලය ක්‍රියාත්මක කිරීමේ දී නියම කරනු ලැබිය හැකි දඩ මුදල ඉක්මවනු ලැබුවද, අධිකරණය විසින් නියම කරන ලද දඩයක් වශයෙන් සලකා අයවිය යුතු මුදල අයකර ගැනීමට අධිකරණය විසින් කටයුතු කළ යුතු අතර, එසේ අයකර ගනු ලැබූ මුදල ප්‍රාදේශීය සභා අරමුදලට ගෙවිය යුතු ය.

ඇතැම් බලපත්‍ර ගාස්තු අයකිරීම සඳහා ප්‍රාදේශීය සභාවලට ඇති බලය

**149.** මේ පනතේ හෝ ඒ යටතේ සාදන ලද යම් අතුරු ව්‍යවස්ථාවක විස්තර කර ඇති කාර්යය අතුරින් කිසිවක් සඳහා යම් පරිශ්‍රයක් හෝ ස්ථානයක් පාවිච්චි කිරීමට බලය දෙමින් ප්‍රාදේශීය සභාවක් විසින් නිකුත් කරන ලද යම් බලපත්‍රයක් සම්බන්ධයෙන් 147 වන වගන්තිය යටතේ අය කිරීමට ප්‍රාදේශීය සභාවකට බලය දෙනු ලබන ගාස්තුව එසේ බලපත්‍රය දෙන ලද—

(අ) ස්ථානයේ වාර්ෂික වටිනාකම;

(ආ) ඒ වෙළෙඳ ව්‍යාපාරයේ පිළිවැටුම;

(ඇ) ඒ වෙළෙඳ ව්‍යාපාරයෙන් උපයනු ලැබිය හැකි ලාභය; සහ

(ඈ) ඒ වෙළෙඳ ව්‍යාපාරය මගින් සපයනු ලබන බඩුවල හෝ සේවාවල අත්‍යවශ්‍ය ස්වභාවය

සැලකිල්ලට ගෙන ප්‍රාදේශීය සභාව විසින් කලින් කල තීරණය කරනු ලැබිය යුතු ය:

එසේ වුවද ඒ ස්ථානයේ වාර්ෂික වටිනාකම, පහත දැක්වෙන I වන තීරුවේ සඳහන් යම් විෂයාංකයක සීමාවන් ඇතුළත පවතින අවස්ථාවක, උපරිම ගාස්තුව, II වන තීරුවේ අනුරූප සටහනේ දක්වා ඇති මුදල නොඉක්මවිය යුතු ය:

| I වන තීරුව | II වන තීරුව<br>රු. |
| --- | --- |
| වාර්ෂික වටිනාකම රු. 750 නොඉක්මවන අවස්ථාවක | ... 500 |
| රු. 750 ඉක්මවන, එහෙත් රු.1500 නොඉක්මවන අවස්ථාවක | ... 750 |
| රු. 1500 ඉක්මවන අවස්ථාවක | ... 1000 |

එසේම තව දුරටත් එවැනි යම් ස්ථානයක, හෝටලයක, ආපන ශාලාවක හෝ නවාතැන් පොලක කාර්යය සඳහා පාවිච්චි කරනු ලබන්නේද 1968 අංක 14 දරන සංචාරක සංවර්ධන පනතේ කාර්යය සඳහා එම හෝටලය, ආපන ශාලාව හෝ නවාතැන් පොල ශ්‍රී ලංකා සංචාරක මණ්ඩලයේ ලියාපදිංචි කරනු ලැබ ඇත්තා වූ ද අනුමත කර හෝ පිළිගත්තා වූ ද අවස්ථාවක, එසේ කරනු ලැබූ ගාස්තුව ඒ ගාස්තුව අය කරනු ලැබූ අවුරුද්දට පෙරාතුවම වූ අවුරුද්දේ ඒ හෝටලයේ, ආපනශාලාවේ, හෝ නවාතැන් පොලේ ආදායම අනුව විය යුතු අතර, එම ආදායමින් සියයට එකක් නොඉක්මවිය යුතු ය. ඒ හෝටලය, ආපනශාලාව හෝ නවාතැන් පොල ක්‍රියාත්මක වන පළමුවන අවුරුද්ද වන අවස්ථාවක, ඒ ගාස්තුව ඒ ස්ථානයේ වාර්ෂික වටිනාකම අනුව තීරණය කොට අය කරනු ලැබිය යුතු ය.

මේ වගන්තියේ කාර්ය සඳහා, හෝටලයක, ආපනශාලාවක හෝ නවාතැන් පොලක "ලැබීම්" යන්නෙන්, ඒ හෝටලය, ආපනශාලාව හෝ නවාතැන් පොල සම්බන්ධයෙන් ඇතුළත් වූ ගනුදෙනුවලින් ඒ හෝටලය, ආපනශාලාව හෝ නවාතැන් පොල පවත්වාගෙන යාමේ දී ඉටු කරන ලද සේවාවන් සඳහා ලැබුණු නැතහොත් ලැබීමට ඇති සම්පූර්ණ මුදල අදහස් වේ.

150. (1) යම් ප්‍රාදේශීය සභාවක් විසින් ඒ ප්‍රාදේශීය සභාවේ සීමාවන් ඇතුළත පවත්වා ගෙනයනු ලබන යම් කර්මාන්තයක් සම්බන්ධයෙන් යෝජනා සම්මතයක් මගින් බද්දක් නියම කොට අය කිරීම කළ හැකි ය. ඇතැම් වෙළෙඳාම් සම්බන්ධයෙන් වූ බද්ද

(2) (1) වන උපවගන්තිය යටතේ අය කරනු ලබන බද්ද එම කර්මාන්තය පවත්වාගෙන යනු ලබන ස්ථානයේ වාර්ෂික වටිනාකම අනුව ප්‍රාදේශීය සභාව විසින් තීරණය කරනු ලබන වාර්ෂික බද්දක් විය යුතු ය :

එසේ වුවද, ඒ ස්ථානයේ වාර්ෂික වටිනාකම, පහත දැක්වෙන I වන තීරුවේ යම් විෂයාංකයක සීමාවන් ඇතුළත පවතින අවස්ථාවක අය කරනු ලබන බද්ද IIවන තීරුවේ අනුරූප සටහනෙහි දක්වා ඇති මුදල නොඉක්මවිය යුතුය :

| I වන තීරය | II වන තීරය |
| --- | --- |
| වාර්ෂික වටිනාකම රු. 750 | රු. |
| නොඉක්මවන අවස්ථාවක | ... 500 |
| රු. 750 ඉක්මවන එහෙත් | |
| රු. 1500 නොඉක්මවන අවස්ථාවක | ... 750 |
| රු. 1500 ඉක්මවන අවස්ථාවක | ... 1000 |

එසේම, තව දුරටත් මේ පනතේ හෝ ඒ යටතේ සාදනු ලැබූ යම් අතුරු ව්‍යවස්ථාවක විධිවිධාන යටතේ බලපත්‍රයක් අවශ්‍ය වන්නා වූ යම් කර්මාන්තයක් සම්බන්ධයෙන් එවැනි බද්දක් අය කිරීම හෝ ගෙවීම නොකළ යුතු ය.

(3) වන උපවගන්තිය යටතේ අය කරන ලබන බද්ද ප්‍රාදේශීය සභාව විසින් තීරණය කරනු ලබන හෝ අතුරු ව්‍යවස්ථා මගින් නියම කරනු ලබන යම් දිනයක ඒ කර්මාන්තය පවත්වා ගෙන යනු ලබන තැනැත්තා විසින් ගෙවිය යුතු ය.

(4) මේ වගන්තිය යටතේ අය කළ හැකි බද්ද ගෙවීමට යටත් යම් තැනැත්තකුගෙන් එම බද්ද ගෙවීමට ඉල්ලා සිටීමෙන් පසුව, දින හතක් ඇතුළත ගෙවීමට පැහැර හැරියහොත් ප්‍රාදේශීය සභාවේ ලේකම්වරයා විසින්, එම පැහැර හැරීම සම්බන්ධයෙන් ඒ ප්‍රාදේශීය සභාව සංයුක්ත වන ප්‍රදේශය විෂයයෙහි අධිකරණ බලය ඇති මහේස්ත්‍රාත් අධිකරණය වෙත වාර්තා කළ යුතු අතර මහේස්ත්‍රාත්වරයකු විසින්, එම මුදල ස්වකීය සාමාන්‍ය අධිකරණ බලය ක්‍රියාත්මක කිරීම නියම කරනු ලැබිය හැකි දඩ මුදල ඉක්මවුවද අධිකරණය විසින් නියම කරන ලද දඩයක් වශයෙන් සලකා අයවිය යුතු මුදල අය කර ගැනීමට අධිකරණය විසින් කටයුතු කළ යුතු අතර, අධිකරණය විසින් එසේ අයකර ගනු ලැබූ මුදල ප්‍රාදේශීය සභා අරමුදලට ගෙවිය යුතු ය.

කර්මාන්ත කිහිපයක් කර ගෙන යන අවස්ථාවක දී ගාස්තුව හෝ බද්ද තීරණය කිරීම.

151. 149 වන වගන්තිය යටතේ වූ බලපත්‍රයක් සඳහා ගාස්තුවක් හෝ 150 වන වගන්තිය යටතේ වූ කර්මාන්තයක් සම්බන්ධයෙන් බද්දක් පැනවීමට සහ අය කිරීමට ප්‍රාදේශීය සභාවක් සම්මත කරන අවස්ථාවක සහ ඒ කර්මාන්තය එකම ස්ථානයේ කරගෙන යනු ලබන වෙනත් කර්මාන්ත ගණනාවකින් එකක් වූ අවස්ථාවක, ඒ ගාස්තුව හෝ බද්ද, ඒ කර්මාන්තයේ කාර්ය සඳහා ඒ ස්ථානයේ යොදා ගනු ලැබ ඇති වර්ග ප්‍රමාණයේ කොටස් කළ වාර්ෂික වටිනාකම පදනම් කරගෙන ප්‍රාදේශීය සභාව විසින් තීරණය කරනු ලැබිය යුතු ය.

ඇතැම් වෙළෙඳ ව්‍යාපාර හා වෘත්තීය සම්බන්ධයෙන් බදු.

152. (1) මේ පනතේ හෝ ඒ යටතේ සාදන ලද යම් අතුරු ව්‍යවස්ථාවක විධිවිධාන යටතේ බලපත්‍රයක් හෝ 150 වන වගන්තිය යටතේ යම් බද්දක් ගෙවීම අවශ්‍ය නොවන්නා වූ යම් වෙළෙඳ ව්‍යාපාරයක් යම් ප්‍රාදේශීය සභාවක සීමාවන් ඇතුළත පවත්වාගෙන යන සෑම තැනැත්තකු මත බද්ද ගෙවිය යුතු වර්ෂයට පෙර වර්ෂය සඳහා වූ වෙළෙඳ ව්‍යාපාරයේ ආදායම අනුව සහ පහත දැක්වෙන අනුප්‍රමාණයන් නොඉක්මවන්නා වූ අනුප්‍රමාණයන්ට අනුකූලව බද්දක් ඒ ප්‍රාදේශීය සභාව විසින් යෝජනා සම්මතයක් මගින් වාර්ෂිකව නියම කිරීම හා අය කිරීම කළ හැකි ය :

| I වන තීරය | II වන තීරය<br>රු. ශ. |
|---|---|
| වර්ෂය සඳහා වූ ව්‍යාපාරයේ ආදායම | |
| (i) රු. 6,000 නොඉක්මවන අවස්ථාවක | කිසිවක් නොමැත |
| (ii) රු. 6,000 ඉක්මවන එහෙත් රු. 12,000 නොඉක්මවන අවස්ථාවක | ... 90 |
| (iii) රු. 12,000 ඉක්මවන එහෙත් රු. 18,750 නොඉක්මවන අවස්ථාවක | ... 180 |
| (iv) රු. 18,750 ඉක්මවන එහෙත් රු. 75,000 නොඉක්මවන අවස්ථාවක | ... 360 |
| (v) රු. 75,000 ඉක්මවන එහෙත් රු. 150,000 නොඉක්මවන අවස්ථාවක | ... 1,200 |
| (vi) රු. 150,000 ඉක්මවන අවස්ථාවක | ... 3,000 |

එසේ වුව ද, ස්ථිර ස්ථානවල වෙළෙඳ ව්‍යාපාරයක් පවත්වාගෙන යනු නොලබන්නා වූ හෝ ඒ වෙළෙඳ ව්‍යාපාරයේ කාර්ය සඳහා පොදු මාර්ගවල හෝ වෙනත් පොදු ස්ථානයක තම වෙළෙඳ ව්‍යාපාර පවත්වා ගෙන යනු නොලබන්නා වූ සංචාරක වෙළෙන්දන් කෙරෙහි මේ වගන්තියේ ඉහත සඳහන් විධිවිධාන අදාළ නොවන්නේ ය.

(2) ප්‍රාදේශීය සභා ප්‍රදේශය තුළ යම් වෘත්තියක් කරගෙන යනු ලබන සෑම තැනැත්තකුගෙන් ම, ඒ ප්‍රාදේශීය සභාව විසින් එසේ පනවා අයකර ගැනීමට අමාත්‍යවරයා විසින් නිශ්චිතව සඳහන් කරන ලද නියෝගයක් මගින් නියම කළ මුදල නොඉක්මවන මුදලක බද්දක් ප්‍රාදේශීය සභාව විසින් සභා සම්මුතියකින් පනවා අයකරනු ලැබිය හැකි ය.

(3) ප්‍රාදේශීය සභාව විසින් නිශ්චිතව සඳහන් හෝ අතුරු ව්‍යවස්ථා මගින් නියම කරනු ලබන දිනයක (1) වන වගන්තිය හෝ (2) වන වගන්තිය යටතේ ගෙවිය යුතු බද්ද ගෙවනු ලැබිය යුතු ය.

(4) මේ වගන්තිය යටතේ අය කළ හැකි බද්ද ගෙවීමට යටත් යම් තැනැත්තකු, බද්ද ගෙවීමට ඉල්ලා සිටීමෙන් පසුව, දින සතක් ඇතුළත ගෙවීම පැහැර හැරිය හොත් ප්‍රාදේශීය සභාවේ ලේකම්වරයා විසින් එම පැහැර හැරීම සම්බන්ධයෙන් ඒ ප්‍රාදේශීය සභාව සංයුක්තවන ඒ ප්‍රදේශය විෂයයෙහි අධිකරණ බලය ඇති මහේස්ත්‍රාත් අධිකරණය වෙත වාර්තා කළ යුතු අතර මහේස්ත්‍රාත්වරයකු විසින් ඒ මුදල ස්වකීය සාමාන්‍ය අධිකරණ බලය ක්‍රියාත්මක කිරීමේ දී නියම කරනු ලැබිය හැකි දඩ මුදල ඉක්මවුව ද, අධිකරණය විසින් නියම කරන ලද දඩයක් වශයෙන් සලකා අයවිය යුතු මුදල අය කර ගැනීමට අධිකරණය විසින් කටයුතු කළ යුතු අතර අධිකරණය විසින් එසේ අයකර ගනු ලැබූ මුදල ප්‍රාදේශීය සභා අරමුදලට ගෙවිය යුතු ය.

මේ වගන්තියේ කාර්ය සඳහා--

(අ) "වෙළෙඳ ව්‍යාපාරය" යන්නට, යම් කර්මාන්තයක් හෝ නිෂ්පාදකයකුගේ හෝ යම් ගනුදෙනුවක් හෝ ඉටු කළ සේවා සම්බන්ධයෙන් කොමිස් මුදලක් හෝ ගාස්තුවක් ලබාගන්නා යම් තැනැත්තකුගේ වෙළෙඳ ව්‍යාපාරය හෝ ස්වාධීන කොන්ත්‍රාත්කරුවකුගේ ව්‍යාපාරය ඇතුළත් වන නමුත්, හාණ්ඩ, බඩු හෝ ද්‍රව්‍ය පෞද්ගලික පොළක විකිණීමේ රක්ෂාව හෝ රාජ්‍ය අරමුදලින් ප්‍රදානයක් ගෙවනු ලබන්නා වූ හෝ කලින් එවැනි ප්‍රදානයක් ගෙවන ලද නමුදු දැනට ගෙවනු නොලබන්නා වූ යම් අධ්‍යාපන ආයතනයක් හෝ පාසැලක් පවත්වාගෙන යාමේ රක්ෂාව ඊට ඇතුළත් නොවේ; තවද

(ආ) යම් ව්‍යාපාරයක් සම්බන්ධයෙන් වූ "ආදායම" යන්නෙන්, එම වෙළෙඳ ව්‍යාපාරය සම්බන්ධයෙන් ඇතුළත් වූ ගනුදෙනු වලින් හෝ එම ව්‍යාපාරය පවත්වාගෙන යාමෙහි ලා ඉටු කළ සේවය සඳහා ලැබුණු හෝ ලැබිය යුතු මුළු මුදල අදහස් වන අතර, ඊට මේවා ද ඇතුළත් වේ—

(i) මුදල් දෙන්නකු, මුදල් ණයට දෙන්නකු හෝ බඩු උගස් ගන්නකු සම්බන්ධයෙන් වන අවස්ථාවක, ණය වශයෙන් ඔහු විසින් දෙන ලද මුදල්, ඒ ණය සඳහා ඔහුට ලැබුණු හෝ ලැබිය යුතු පොලිය සහ ඒ ණය සම්බන්ධයෙන් ගාස්තු හෝ වෙනත් අයකිරීම් වශයෙන් ඔහුට ලැබුණු මුදල් ;

(ii) වෙන්දේසිකරුවකු සම්බන්ධයෙන් වන විට සහ (iii) ඡේදයේ විධිවිධානවලට යටත් ව තැරැව්කරුවකු හෝ කොමිස් නියෝජිතයකු සම්බන්ධයෙන් වන අවස්ථාවක—

(අ) ඔහු විසින් විකුණන ලද ඉඩම් හෝ ඔහු විසින් හේතු කාරක වූ විකිණීම සම්බන්ධයෙන් වූ විට, ඒ විකිණීම සම්බන්ධයෙන් ඔහු විසින් ක්‍රියාත්මක කරන ලද ගනුදෙනු හෝ ඉටු කරන ලද සේවා සඳහා ඔහුට ලැබුණු හෝ ලැබිය යුතු කොමිස් මුදල් හෝ ගාස්තු ;

(ආ) ඔහු විසින් විකුණන ලද යම් බඩු හෝ ඔහු විසින් හේතු කාරක වූ විකිණීම සම්බන්ධයෙන් වූ විට, ඒ බඩු ගැනුම්කරු විසින් ගෙවන ලද හෝ ගෙවිය යුතු මුළු මුදල ;

(iii) (අ) ශ්‍රී ලංකාවේ නේවාසිකයකු නොවන, යම් තැනැත්තකු වෙනුවෙන්, ඒ අනේවාසික තැනැත්තාගේ යම් බඩු විකුණන හෝ විකිණීමෙහිලා හේතු කාරක වන්නා වූ;

(ආ) ශ්‍රී ලංකාවේ නිෂ්පාදිත යම් බඩු අපනයන කරන්නකු වෙනුවෙන් ක්‍රියා කරන්නා වූ; හෝ

(ඇ) ශ්‍රී ලංකාවේ ව්‍යාපාරයක් පවත්වා ගෙන යන වෙනත් යම් තැනැත්තකු වෙනුවෙන්, යම් බඩු විකිණීමෙන් ලත් මුදල ඒ වෙනත් තැනැත්තාගේ වෙළෙඳ ව්‍යාපාරයේ ආදායමට ඇතුළත් කරනු ලැබූ ඒ වෙනත් තැනැත්තාගේ ඒ බඩු ශ්‍රී ලංකාවේ විකිණීමෙහි ලා හේතු කාරක වන්නා වූ—

යම් තැරැව්කරුවකු හෝ කොමිස් නියෝජිතයකු සම්බන්ධයෙන් වන අවස්ථාවක, එසේ විකිණීමෙහි, ක්‍රියා කිරීමෙහි ලා හෝ එසේ විකිණීම සඳහා හේතු කාරක වීමෙහි ලා ඒ තැරැව්කරු හෝ කොමිස් නියෝජිතයා විසින් ක්‍රියාත්මක කරන ලද යම් ගනුදෙනු හෝ ඉටු කරන ලද සේවා සම්බන්ධයෙන් ඔහුට ලැබුණු හෝ ලැබිය යුතු කොමිස් හෝ ගාස්තු සහ කොටස් තැරැව්කරුවකු හෝ නිෂ්පාදන තැරැව්කරුවකු සම්බන්ධයෙන් වන අවස්ථාවක, ඒ

තැරැව්කරු හෝ කොමිස් නියෝජිතයා විසින් ක්‍රියාත්මක කරන ලද යම් ගනුදෙනු හෝ ඉටු කරන ලද සේවා සම්බන්ධයෙන් ඔහුට ලැබුණු හෝ ලැබිය යුතු කොමිස් මුදල් හෝ ගාස්තු ; සහ

(iv) යම් අධ්‍යාපනික ආයතනයක් හෝ පාසැලක් පවත්වාගෙන යන යම් තැනැත්තකු සම්බන්ධයෙන් වන අවස්ථාවක ඒ අධ්‍යාපනික ආයතනය හෝ පාසල හෝ සතු මුදල් ආයෝජන කිරීමෙන් ලැබුණු ලාභ අතහැර, එම අධ්‍යාපනික ආයතනය හෝ පාසල පවත්වාගෙන යාමෙන් ඒ තැනැත්තාට ලැබුණු හෝ ලැබීමට ඇති මුළු මුදල අදහස් වන නමුත් ප්‍රාග්ධන වත්කම් විකිණීමෙන් ලැබුණු හෝ ලැබිය යුතු යම් මුදලක් ඊට ඇතුළත් නොවේ.

153. (1) ප්‍රාදේශීය සභා ප්‍රදේශයක සීමාවන් ඇතුළත වූ යම් ඉඩමක් ගොඩනැගිලි ඉදි කිරීමේ කාර්ය සඳහා හෝ නිත්‍ය හෝ විධිමත් ලෙස වගා කිරීමේ කාර්ය සඳහා යෝග්‍ය වන හෝ ප්‍රාදේශීය සභාවේ මතය අනුව සාධාරණ යයි සැලකෙන වියදමකින් එවැනි යම් කාර්යයක් සඳහා ඒ ඉඩම සංවර්ධනය කළ හැකි වන අවස්ථාවක, සහ— සංවර්ධනය නොකළ ඉඩම් සඳහා බදු.

(අ) ඒ ඉඩමෙහි කිසිම ගොඩනැගිල්ලක් ඉදිකර නොමැති වූ; හෝ

(ආ) සැබවින්ම ගොඩනැගිලිවලින් ආවරණය වූ ඒ ඉඩමේ බිම් ප්‍රමාණය, ඒ ඉඩමේ මුළු බිම් ප්‍රමාණයට නියමිත සමානුපාතයට වඩා අඩු සමානුපාතයක් ප්‍රාදේශීය සභා යෝජනා සම්මතයක් මගින් දරන්නා වූ; හෝ

(ඇ) ඒ ඉඩම විධිමත් හෝ නිත්‍ය ලෙස වගා කිරීමට යටත් කර නොමැත්තා වූ

අවස්ථාවක, ප්‍රාදේශීය සභාව විසින්, ඒ ඉඩමේ ප්‍රාග්ධන බිම් අගයෙන් සියයට දෙකක් නොඉක්මවන බද්දක් වාර්ෂිකව ඒ ඉඩමේ අයිතිකරුගෙන් අයකර ගත යුතු ය.

(2) මේ පනතේ 135 වන සහ 136 වන වගන්තිවල විධිවිධාන, අවශ්‍ය සුළු වෙනස් කිරීම් සහිතව, (1) වන උපවගන්තිය යටතේ සාදන ලද ප්‍රාග්ධන බිම් අගය පිළිබඳ සෑම තක්සේරුවක් සම්බන්ධයෙන්ම අදාළ විය යුතු ය.

මේ වගන්තියේ කාර්ය සඳහා “ ප්‍රාග්ධන බිම් අගය ” යන්න යම් ඉඩමක් සම්බන්ධයෙන් පාවිච්චි කරනු ලැබූ විට, සියලු උකස් කිරීම්, බදු දීම්, බැඳීම් හෝ වෙනත් අය භාරවලින් තොරව, එම ඉඩම විවෘත වෙළෙඳ පොළෙහි විකුණනු ලැබුවේ නම් එහි ඇති සියලු ගොඩනැගිලි හැර, ඒ ඉඩම සඳහා ගෙවනු ලැබිය හැකි මුදල අදහස් වේ.

154. (1) ප්‍රාදේශීය සභාවක සීමාවන් ඇතුළත වූ යම් ඉඩමක්, වෙන්දේසිකරුවකු හෝ තැරැව්කරුවකු හෝ ඔහුගේ සේවකයා හෝ අනුයෝජිතයා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ හෝ අන්‍යාකාරයකින් විකුණනු ලබන අවස්ථාවක, ඒ ඉඩම විකිණීමෙන් ලත් මුදලින් සියයට එකකට සමාන බද්දක් විකුණුම්කරු හෝ ඒ ඇතැම් ඉඩම් විකිණීම මත බදු. අය කිරීම.

වෙන්දේසිකරු හෝ තැරැව්කරු හෝ ඔහුගේ සේවකයා හෝ අනියෝජිතයා විසින් එම ඉඩම විකිණීමෙන් ලත් මුදලින් ප්‍රාදේශීය සභාව වෙත ගෙවිය යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ ගෙවිය යුතු බද්ද ඉල්ලා සිටීමෙන් පසුව දින දහහතරක් ඇතුළත ගෙවනු නොලැබුවහොත්, ප්‍රාදේශීය සභාවේ ලේකම්වරයා විසින් පැහැර හැරීම සම්බන්ධයෙන් ඒ ප්‍රාදේශීය සභාව සංයුක්ත වන ප්‍රදේශයේ අධිකරණ බලය ඇති මහේස්ත්‍රාත් අධිකරණය වෙත වාර්තා කරනු ලැබිය යුතු අතර, මහේස්ත්‍රාත්වරයකු විසින්, එම මුදල, ස්වකීය සාමාන්‍ය අධිකරණ බලය ක්‍රියාත්මක කිරීමේ දී නියම කරනු ලැබිය හැකි දඩ මුදල ඉක්ම වුව ද, අධිකරණය විසින් නියම කරන ලද දඩයක් වශයෙන් සලකා අයවිය යුතු මුදල අයකර ගැනීමට අධිකරණය විසින් කටයුතු කළ යුතු අතර, එසේ අයකර ගනු ලැබූ මුදල ප්‍රාදේශීය සභා අරමුදලට ගෙවිය යුතු ය.

වරිපනම් බදු ආදිය සම්බන්ධයෙන් තහනමට ගැනීමෙන් චංචල දේපළ නිදහස් බව.

155. මේ පනත යටතේ යම් වරිපනම් බද්දක් හෝ වරිපනම් බදු නියම කළ හැකි යම් නිවසක, ගොඩනැගිල්ලක, ඉඩමක හෝ ගෙපනක නැතහොත් ඒ මත තිබූ කිසිදු චංචල දේපළක්, තහනමට ගැනීමකට ඉහතින් වූ කාර්තු දෙකක් ඉක්මවා ඒ වරිපනම් බද්ද හෝ වරිපනම් බදු පිළිබඳ යම් හිඟ නැම්මක් සම්බන්ධයෙන් තහනමට ගනු ලැබීම, ඒ කාර්තු දෙක ඉක්මවා එම හිඟ මුදල් උපචිත වූ හෝ ලැබිය යුතුව පැවති අවස්ථාවේ දී එකී නිවසේ, ගොඩනැගිල්ලේ, ඉඩමේ හෝ ගෙපනේ අයිතිකරු හෝ හවුල් අයිතිකරු වූ යම් තැනැත්තකුට ඒ චංචල දේපළ හිමිවන්නේ නම් මිස නැතහොත් එකී හිඟ මුදල උපචිත විය යුතුව හෝ ලැබිය යුතුව පැවති අවස්ථාවේ දී ඒ නිවසේ, ගොඩනැගිල්ලේ, ඉඩමේ හෝ ගෙපනේ පදිංචි වී සිටි යම් තැනැත්තකුට ඒ චංචල දේපළ හිමිවන්නේ නම් මිස, ප්‍රාදේශීය සභාව විසින් එසේ තහනමට නොගත යුතු ය.

අය විය යුතු කුලියෙන් ගෙවන ලද මුදල් ප්‍රමාණය අඩු කිරීම.

156. යම් නිවසක, ගොඩනැගිල්ලක, ඉඩමක හෝ ගෙපනක අයිතිකරු හෝ හවුල් අයිතිකරු නොවන්නා වූ ද දැනට එහි පදිංචි තමාගේ දේපළ තහනමට ගනු ලැබුවා වූ ද නැතහොත් එම තහනමට ගැනීම වැළැක්වීම සඳහා හෝ තහනමට ගැනීමෙන් පසුව, එම දේපළ විකිණීම වැළැක්වීම සඳහා එම නිවස, ගොඩනැගිල්ල, ඉඩම හෝ ගෙපන සම්බන්ධයෙන් ලැබිය යුතු ගාස්තුව හෝ බදු ගෙවනු ලැබුවා වූ ද එකී නිවසේ, ගොඩනැගිල්ලේ, ඉඩමේ හෝ ගෙපනේ පදිංචිකරු විසින්, තමා විසින් එසේ ගෙවන ලද මුදල, එකී නිවස, ගොඩනැගිල්ල, ඉඩම හෝ ගෙපන වෙනුවෙන් තමාගෙන් එහි අයිතිකරුට හෝ අයිතිකරුවන්ට ලැබිය යුතු කුලියෙන් අඩු කළ හැකි ය; තව ද එසේ ගෙවන ලද මුදල සඳහා වූ ප්‍රාදේශීය සභාවේ කුවිතාන්සිය ඒ හා සමාන පූර්ණ ගෙවල් කුලී මුදලක් සම්බන්ධයෙන් වූ ණය නිදහස් කිරීමේ කුවිතාන්සියක් වශයෙන් සලකනු ලැබිය යුතු ය:

එසේ වුවද, සිය බදු ගිවිසුමේ හෝ එකඟවීමේ නියමයන් ප්‍රකාර ඒ වරිපනම් බද්ද හෝ වරිපනම් බදු ගෙවීමට බැඳී සිටින හෝ යටත් වන යම් පදිංචිකරුවකු විසින් කුලියෙන් වූ එවැනි අඩු කිරීමක් සම්බන්ධයෙන් මෙහි ඇතුළත් කිසිවකින් බලපෑමක් ඇති නොවිය යුතු ය.

නම ආදිය සම්බන්ධයෙන් ඇති යම් වැරදීමක් නිසා තක්සේරුව යනාදිය කෙරෙහි දෝෂාභියෝග හෝ බලපෑමකට යටත් නොවිය යුතු බව.

157. වරිපනම් බද්ද හෝ බද්ද ගෙවීමට බැඳී ඇති යම් තැනැත්තකුගේ නාමයෙහි වූ යම් වැරදීමකින් හෝ වරිපනම් බද්දට හෝ බද්දට යටත් යම් දේපළක් හෝ දෙයක් සම්බන්ධයෙන් වූ විස්තරයෙහි වූ යම් වැරදීමක් නැතහොත් තක්සේරු කිරීමේ හෝ සත්‍යක්ෂණය කිරීමේ මුදල් ප්‍රමාණයෙහි හෝ තහනමට ගැනීම හා විකිණීම කළ ආකාරයෙහි යම් වැරදීමක් හේතු කොට ගෙන කිසිදු තක්සේරුවක්, අගැයීමක් හෝ සත්‍යක්ෂණය කිරීමක් සහ මේ පනතේ අධිකාරය යටතේ වූ කිසිදු අයකරයක් හෝ යම් ගාස්තුවක් හෝ බද්දක් ගෙවීමක් සහ කිසිදු තහනමකට ගැනීමක් හෝ විකිණීමක් දෝෂාභියෝග කිරීමකට හෝ බලපෑමකට යටත් නොකළ යුතු ය; තවද, මේ පනතේ විධිවිධානවල හෝ ඒ යටතේ සාදන ලද යම් අතුරු සංස්ථාවක විධිමත් භාවය නොතිබීම නිසා මේ පනත හෝ ඒ අතුරු ව්‍යවස්ථාව යටතේ වූ කිසිදු නඩු කටයුතු යම් අධිකරණයක් විසින් ඉවතලීම නොකරනු ලැබිය යුතු ය.

වරිපනම් හා බදු අයකර ගැනීම සඳහා වූ බලපත්‍රය

158. (1) මේ පනත යටතේ ගෙවිය යුතු යම් වරිපනම් බද්දක් හෝ ඒ යටතේ නියම කරන ලද යම් බද්දක මුදල ප්‍රාදේශීය සභාව විසින් විධානය කරනු ලබන කාල සීමාව ඇතුළත ප්‍රාදේශීය සභා කාර්යාලයට නොගෙවනු ලැබී නම්—

(අ) යම් වරිපනම් බද්දක් හෝ අක්කර බද්දක් නොගෙවීම සම්බන්ධයෙන් වූ විට, ඒ වරිපනම් බද්ද හෝ අක්කර බද්ද අයවිය යුතුව ඇති ස්ථානයේ අයිතිකරුගේ සියලුම හා සෑම දේපළක් සහ එවැනි යම් ස්ථානයක් තුළ හෝ ඒ මත ඇති කවර වූ හෝ තැනැත්තකුට වුව ද අයත් සියලුම චංචල දේපළක්ම සහ ඒ වරිපනම් බද්ද හෝ අක්කර බද්ද අය විය යුතුව ඇත්තේ යම් නිශ්චල දේපළක් සම්බන්ධයෙන්ද ඒ නිශ්චල දේපළක්ම, තහනමට ගෙන විකිණීමෙන් ඒ වරිපනම් බද්ද හෝ අක්කර බද්ද සහ අයකර ගැනීමේ ගාස්තු අයකිරීම පිණිස;

(ආ) වෙනත් යම් බද්දක් නොගෙවීම සම්බන්ධයෙන් වූ විට, ඒ බදු අයවීමට ඇති දේපළ සහ ගෙවීම පැහැර හැරි තැනැත්තාගේ චංචල හෝ නිශ්චල සියලුම හා සෑම දේපළක්ම තහනමට ගෙන විකිණීමෙන් ඒ බද්ද හා අයකර ගැනීමේ ගාස්තු අය කිරීම පිණිස

විධානය කරමින්, ලේකම්වරයා විසින් අත්සන් කරනු ලැබූ බල පත්‍රයක් එහි නම සඳහන් ප්‍රාදේශීය සභාවේ මුදල් එකතු කරන්නකුට හෝ වෙනත් නිලධරයකුට නිකුත් කරනු ලැබිය යුතු ය.

(2) අත්හැර දමනු ලබන මුදල නොසැලකිය යුතු තරම් වන බව හෝ අයකරගත නොහැකි බව හෝ එම මුදල ගෙවීමට යටත් තැනැත්තාගේ දිළිඳු බව උඩ එම මුදල ලියා අත්හැරිය යුතු බව ප්‍රාදේශීය සභාවකට පෙනී ගියහොත් යම් වරිපනම් බද්දක් හෝ

බද්දක් සම්පූර්ණයෙන් හෝ ඉන් යම් කොටසක් හා එම වරිපනම් බද්ද හෝ බද්ද අයකරගැනීමේ කාර්ය දරන ලද යම් වියදමක් යෝජනා සම්මතයක් මගින් අත්හැර දැමීම ප්‍රාදේශීය සභාවක් විසින් කළ හැකි ය. තවද, එකී යම් යෝජනාවක් සම්මත වූ යම් විටක, (1) වන උපවගන්තිය යටතේ කිසිම බලපත්‍රයක් නිකුත් නොකළ යුතු අතර, නිකුත් කරනු ලැබ ඇති එවැනි යම් බලපත්‍රයක් වේ නම්, එය ප්‍රත්‍යායනය කළ යුතුය.

ප්‍රාදේශීය සභාවට ලැබිය යුතු කුලී හා ගාස්තු අයකර ගැනීම සඳහා වූ බලපත්‍රය.

**159.** (1) ප්‍රාදේශීය සභාව විසින් කුලියට දෙන යම් ස්ථානයක කුලිය වශයෙන් අයවිය යුතු මුදල, ඒ මුදල අයවිය යුතුව තිබූ දින සිට දින දහහතරක් ඇතුළත ප්‍රාදේශීය සභා කාර්යාලයට ගෙවනු නොලැබුවහොත් ප්‍රාදේශීය සභා ප්‍රදේශය ඇතුළත පිහිටි හා ඒ කුලී නිවැසියාට අයිති වූ සියලුම චංචල හා නිශ්චල දේපළ තහනමට ගෙන විකිණීමෙන් ද කුලිය ලැබිය යුත්තේ යම් ස්ථානයක් වෙනුවෙන් ද ඒ ස්ථානයෙහි හෝ ඒ මත ඇති කවර හෝ තැනැත්තකුට අයත් සියලු චංචල දේපළ තහනමට ගෙන විකිණීමෙන් ද ඒ මුදල හා අය කර ගැනීමේ ගාස්තු අයකිරීම සඳහා තමා විසින් අත්සන් කරනු ලබන බලපත්‍රයක් මගින් එහි නම සඳහන් ප්‍රාදේශීය සභාවේ නිලධරයකුට සහ ඔහුගේ සහායකයන්ට බලය දීම ලේකම්වරයාගේ කාර්යය විය යුතුය.

(2) වෙළෙඳාමක් පවත්වා ගෙන යනු ලබන ස්ථානයක යම් අපද්‍රව්‍ය ඉවත් කිරීම සඳහා වූ ගාස්තු වශයෙන් ගෙවිය යුතු මුදල ඉල්ලා සිටීමෙන් පසුව දින දහහතරක් ඇතුළත එය ප්‍රාදේශීය සභා කාර්යාලයට ගෙවනු නොලැබුවහොත්, ලේකම්වරයා විසින්, ප්‍රාදේශීය සභාවේ සීමාවන් තුළ පිහිටි සහ පැහැර හරින්නාට අයත් චංචල හා නිශ්චල දේපළ තහනමට ගෙන විකිණීමෙන් ඒ මුදල සහ අයකර ගැනීමේ ගාස්තු අයකිරීම සඳහා බලපත්‍රයක් මගින්, එහි නම සඳහන් ප්‍රාදේශීය සභාවේ නිලධරයකුට සහ ඔහුගේ සහායකයන්ට බලය දිය හැකි ය.

දේපළ තහනමට ගැනීම සම්බන්ධයෙන් වූ සීමාවන්.

**160.** මේ පනත යටතේ නිකුත් කරනු ලබන යම් බලපත්‍රයක් ක්‍රියාවේ යෙදවීමෙහිලා මේ යටතේ දැක්වෙන යම් පන්තියකට හෝ විස්තරයකට අයත් දේපළ කිසිවක් තහනමට ගැනීම හෝ විකිණීම නොකළ යුතුය :—

(අ) දේපළ තහනමට ගැනීමට යටත් වූ තැනැත්තාගේ හෝ ඔහුගේ බිරිඳගේ සහ දරුවන්ගේ අවශ්‍ය ඇඳුම් පැළඳුම්, ඇඳන් හා ඇඳ ඇතිරිලි සහ පිසීමේ උපකරණ ;

(ආ) ඒ තැනැත්තාගේ කර්මාන්තයට හෝ වෙළෙඳ ව්‍යාපාරයට අයත් මෙවලම් උපකරණ සහ උවාරණ සහ එම තැනැත්තා කෘෂිකාර්මිකයකු වූ විට, එසේ තම ජීවිකාව උපයා ගැනීම සඳහා සාධාරණ වශයෙන් අවශ්‍ය විය හැකි කෘෂිකාර්මික උවාරණ සහ ගවයින් හා ධාන්‍ය බීජ ; සහ

(ඇ) ඒ තැනැත්තාගේ වෘත්තිය හෝ ව්‍යාපාරය පවත්වා ගෙන යාම සඳහා අවශ්‍ය රුපියල් පන් සියයක වටිනාකම ඇති වෘත්තීය උපකරණ හා පුස්තකාල පොත්.

**161.** මේ කොටස යටතේ නිකුත් කරනු ලබන යම් බලපත්‍රයක් යටතේ අයකිරීම සඳහා බලය දී ඇති අය කර ගැනීමේ ගාස්තු ප්‍රමාණය පහත දැක්වෙන විධිවිධාන අනුව තීරණය කරනු ලැබිය යුතුය :— ගාස්තු ප්‍රමාණය.

(අ) බලපත්‍රය නිකුත් කිරීමේ ගාස්තුව සම්බන්ධයෙන්—

(i) අයවිය යුතු බද්දේ හෝ කුලියේ ප්‍රමාණයෙන් සියයට දහයක ;

(ii) ගිස් බිම් හා නිවාස ස්ථාන සම්බන්ධයෙන් අයවිය යුතු වරිපනම් බද්දේ ප්‍රමාණයෙන් සියයට පහ ලොවක ; සහ

(iii) ගිස් බිම් හා නිවාස ස්ථාන නොවන දේපළ සම්බන්ධයෙන් අයවිය යුතු වරිපනම් බද්දේ ප්‍රමාණයෙන් සියයට විස්සක්

අය කිරීමක් වේ ;

(ආ) බලපත්‍රය යටතේ තහනමට ගැනීමෙන් පසුව බඩු ඉවත් කරනු ලැබූ විට බලපත්‍රය යටතේ අයකළ යුතු වරිපනම් බද්දේ, බද්දේ, කුලියේ හෝ ගාස්තුවේ ප්‍රමාණයෙන් සියයට දහයක අය කිරීමක් කළ හැකි අතර, ඒ බඩු ආරක්ෂක භාරයේ රඳවා තබා ගැනීමේ කාලය තුළ එක් දිනකට ශත විසිපහක් නොඉක්මවන අතිරේක අයකිරීමක් කළ යුතු ය. කෙසේ වුවද, මාස එකකට වැඩි කාලයක් රඳවා තබා ගැනීම සම්බන්ධයෙන් එවැනි කිසිම අය කිරීමක් නොකළ යුතු ය ;

(ඇ) නිශ්චල දේපළක් තහනමට ගනු ලැබූ විට හෝ තහනමට ගැනමෙන . පුව එසේ තහනමට ගනු ලැබූ බඩු ඉවත් කර නොගනු ලැබූ අවස්ථාවක, දේපළ හෝ බඩු සන්තකයේ තබා ගැනීම සඳහා තැනැත්තකු යෙදවීම පිණිස එක් දිනකට රුපියල් තුනකට නොවැඩි අය කිරීමක් කළ යුතු ය ;

(ඈ) තහනමට ගත් දේපළ විකිණීම සඳහා ඒ සම්බන්ධයෙන් දැනවීම් පළ කර ඇති නමුදු විකිණීමට පෙර වරිපනම් බදු, බදු, කුලී හෝ ගාස්තු හා වියදම් ගෙවීම හේතු කොට ගෙන විකිණීම සිදු නොකළ අවස්ථාවක, බලපත්‍රය යටතේ අයකරනු ලැබිය යුතු වරිපනම් බද්දේ, බද්දේ, කුලියේ හෝ ගාස්තුවේ ප්‍රමාණයෙන් සියයට දහයක අය කිරීමක් කළ හැකි ය ;

(ඉ) නිශ්චල දේපළක් තහනමට ගනු ලැබූ විට, තහනමට ගැනීමේ දැන්වීම නිකුත් කිරීමේ වියදම සම්බන්ධයෙන් බලපත්‍රය යටතේ අය කළ යුතු වරිපනම් බද්දේ, බද්දේ කුලියේ, ගාස්තුවේ ප්‍රමාණයෙන් සියයට දහයක අය කිරීමක් කළ හැකි ය ; සහ

(ඊ) විකිණීමක් සිදු වන අවස්ථාවක, විකිණීමේ වියදම සම්බන්ධයෙන් විකිණීමෙන් ලත් මුදල් ප්‍රමාණයෙන් සියයට දෙකහමාරකට නොවැඩි අය කිරීමක් කළ යුතු ය.

දේපළ තහනමට ගැනීම

162. (1) 160 වන හා 161 වන වගන්තිවල විධිවිධානවලට යටත් ව, මේ වගන්තියේ විධිවිධානවලට හැකි තරම් දුරට අනුකූලව දේපළක් යම් තහනමකට ගැනීම සිදු කිරීම, මේ කොටස යටතේ ඒ දේපළ තහනමට ගැනීම හා විකිණීම සඳහා බලපත්‍රය නිකුත් කරනු ලැබූ බදු එකතු කරන්නාගේ හෝ වෙනත් නිලධරයාගේ කාර්යය වන්නේ ය.

(2) බලපත්‍රය ක්‍රියාවේ යෙදවීමෙහිලා යම් දේපළක් තහනමට ගැනීමට හෝ බදු එකතු කරන්නාගේ හෝ වෙනත් නිලධරයාගේ මතය අනුව අය කළ යුතු මුදල පියවීමට තරම් ප්‍රමාණවත් වන සහ සාධාරණ තැනක පිහිටිය ද අයිතිකරු සතු සොයාගත හැකි චංචල දේ පළ තහනමට ගෙන විකිණිය යුතු ය.

(3) අයිතිකරුගේ චංචල දේපළක් සොයාගත නොහැකි අවස්ථාවක හෝ (2) වන උපවගන්තිය යටතේ තහනමට ගන්නා ලද චංචල දේපළ විකිණීමෙන් උපලබ්ධවූ මුදල අයකළ යුතු මුදල පියවීමට තරම් ප්‍රමාණවත් නොවන අවස්ථාවක, බලපත්‍රය අදාළ වන්නේ යම් දේපළකටද ඒ දේපළ තුළ හෝ මත සොයාගත හැකි චංචල දේපළ තහනමට ගෙන විකිණිය යුතු ය.

(4) මේ වගන්තියේ ඉහතින් වූ විධිවිධාන යටතේ කිසිම චංචල දේපළක් තහනමට ගෙන විකුණනු නොලැබූ අවස්ථාවක, හෝ එසේ තහනමට ගනු ලැබූ යම් චංචල දේපළක් විකිණීමෙන් ලත් මුදල අයකර ගත යුතු මුදල පියවීමට තරම් ප්‍රමාණවත් නොවන අවස්ථාවක, බදු එකතු කරන්නාගේ හෝ වෙනත් නිලධරයාගේ මතය අනුව, අයකර ගත යුතු මුදල පියවීම සඳහා ප්‍රමාණවත් වන කාලසීමාවක් සඳහා බලපත්‍රයට අදාළ දේපළින් ලැබෙන කුලී හා ලාභ බදු එකතු කරන්නා හෝ වෙනත් නිලධරයා විසින් තහනමට ගෙන විකිණිය යුතු ය.

(5) එවැනි කුලී සහ ලාභ නොමැති අවස්ථාවක හෝ, (2) වන හෝ (3) වන උපවගන්තිය යටතේ චංචල දේපළ හෝ (4) වන උපවගන්තිය යටතේ වූ කුලී හෝ ලාභ විකිණීමෙන් උපලබ්ධ වූ මුදල අයකර ගත යුතු මුදල පියවීමට ප්‍රමාණවත් නොවන අවස්ථාවක, ලේකම්වරයා විසින් තත්කාර්යය සඳහා නිකුත් කරනු ලබන විධානයකට අනුකූලව බලපත්‍රයට අදාළ නිශ්චල දේපළ බදු එකතු කරන්නා හෝ වෙනත් නිලධරයා විසින් තහනමට ගත යුතු ය.

(6) ඒ නිශ්චල දේපළ තහනමට ගනු ලැබූ විට, පදිංචිකරු තහනමට ගනු ලැබූ දේපළෙහි අයිතිකරු හෝ කුලී නිවැසියා වුවද තහනමට ගැනීමේ දැන්වීම, තහනමට ගනු ලැබූ දේපළෙහි පදිංචිකරු වෙත භාරදීමට හෝ ඔහුගේ ස්ථානයෙහි තැබීමට ලේකම්වරයා විසින් සලස්වනු ලැබිය යුතු ය. දැන්වීමේ නිශ්චිතව සඳහන් වන දිනයට පෙර තහනමට ගනු ලැබූ දේපළ පිළිබඳ අයවිය යුතු වරිපනම් බදු සහ ගාස්තු ගෙවනු නොලැබුවහොත් ඒ දේපළ ප්‍රාදේශීය සභාවට පවරා ගනු ලබන බව එකී දැන්වීමෙහි දැක්විය

යුතු ය. එසේ නිශ්චිතව දැක්විය යුතු දිනය, තහනමට ගන්නා ලද දින සිට දින විසි අටක කාලයක් අවසන්වීමෙන් පසුව වූ එහෙත් එම තහනමට ගන්නා ලද දින සිට දින හතලිස් දෙකකට පසුව නොවිය යුතු දිනයක් විය යුතු ය.

(7) (5) වන උප වගන්තිය යටතේ තහනමට ගනු ලැබූ නිශ්චල දේපළ ද අවස්ථාවෝචිත පරිදි අයවිය යුතු සියලුම වරිපනම් බදු, බදු කුලී හෝ ගාස්තු හා ඒ සම්බන්ධයෙන් වූ වියදම (6) වන උප වගන්තියෙහි සඳහන් දිනයට පෙර ගෙවනු නොලැබුවහොත්, ඒ දේපළ ප්‍රාදේශීය සභාව වෙත පැවරෙන ඒ දිනයද දක්වන්නා වූ දැන්වීමක් ගැසට් පත්‍රයෙහි සහ ප්‍රදේශයෙහි සංසරණය වන ප්‍රවෘත්ති පත්‍රයක පළ කිරීමට ලේකම්වරයා විසින් සැලැස්විය යුතු ය. මේ දැන්වීම යටත් පිරිසෙයින් (6) වන උපවගන්තියේ සඳහන් නිශ්චිත දිනයට දින විසිහතරකට පෙර පළ කරනු ලැබිය යුතු ය.

(8) යම් තැනැත්තකුගේ දේපළ තහනමට ගනු ලැබූ අවස්ථාවේ දී ඔහු විසින් හෝ ඔහු වෙනුවෙන් වෙනත් තැනැත්තකු විසින් අය කළ යුතු මුදල පියවීමට ප්‍රමාණවත් වන්නා වූ ද, මෙහි මින් ඉහත විධිවිධාන සලස්වා ඇති පරිදි මුල් අවස්ථාවේ දී නීත්‍යනුකූලව තහනමට ගනු ලැබිය හැක්කා වූ ද නිදහස් හා හිමිකම් නොදක්වා ඇති දේපළක් බදු එකතු කරන්නාට හෝ නිලධරයාට පෙන්නා දෙනු ලැබූ බවත්, එසේ පෙන්නා දෙන ලද දේපළ තහනමට ගැනීමට බදු එකතු කරන්නා හෝ නිලධරයා අපොහොසත් වූ බවත්, අධිකරණය සෑහීමට පත්වන පරිදි අලාභ සඳහා හිමිකම් පාන තැනැත්තා විසින් ඔප්පු කරනු ලැබුවහොත් මිස, මේ වගන්තියේ විධිවිධාන අනුව යම් තහනමට ගැනීමක් සහ විකිණීමක් ක්‍රියාවේ යෙදවීම පැහැර හැරීමේ හේතුවෙන් කිසිදු බදු එකතු කරන්නකු හෝ නිලධරයකු හෝ අලාභ ගෙවීමට යටත් නොවන්නේ ය.

(9) ඒ ඉල්ලීම කරන තැනැත්තා විසින්, අයකළ යුතු මුදල පියවීමට ප්‍රමාණවත් වූ ද මෙහි මින් පෙර විධිවිධාන සලසා ඇති පරිදි මුල් අවස්ථාවේ දීම නීත්‍යනුකූලව තහනමට ගත හැකිව තිබුණා වූ ද නිදහස් හා හිමිකම් නොපාන ලද දේපළ දක්වමින් සහ ප්‍රකාශිත පරිදි දේපළ තහනමට ගැනීමට බදු එකතු කරන්නා හෝ නිලධරයා හෝ ඒ ලේකම්වරයා පැහැර හැරිය බව දක්වමින් බදු එකතු කරන්නා හෝ නිලධරයා හෝ ප්‍රාදේශීය සභාවේ ලේකම්වරයා වෙත ලිඛිත ප්‍රකාශයක් කරනු ලැබ ඇත්නම් මිස, දේපළ තහනමට ගත යුතු වූ අනුපිළිවෙල අනුගමනය නොකිරීමේ හේතුවෙන් නැතහොත් තහනමට ගත හැකිව තිබූ සහ පිළිගත නොහැකිව තිබූ චංචල දේපළ තහනමට නොගැනීමේ හා නොවිකිණීමේ හේතුවෙන්, (5) වන උපවගන්තිය යටතේ යම් නිශ්චල දේපළ තහනමට ගැනීමක් බලරහිත බවට හෝ දෝෂාභියෝගයට හෝ බලපෑමකට යටත් වූ බවට නොසැලකිය යුතු ය.

**චංචල දේපළ විකිණීම.**

163. (1) මේ කොටස යටතේ නිකුත් කරන ලද යම් බලපත්‍රයක් ක්‍රියාවේ යෙදවීමෙහිලා තහනමට ගනු ලැබූ චංචල දේපළ, බලපත්‍රයට නිකුත් කරනු ලැබූ බදු එකතු කරන්නා හෝ නිලධරයා විසින් හෝ කොමසාරිස්වරයා විසින් තත්කාර්යය සඳහා බලය දෙන ලද වෙනත් යම් නිලධරයකු විසින් හෝ මේ වගන්තියේ විධිවිධානවලට අනුකූලව ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතුය.

(2) යම් දේපළක් තහනමට ගනු ලබන බදු එකතු කරන්නාගේ හෝ නිලධරයාගේ මතය අනුව වටිනාකමින් රුපියල් එක්දහසක් ඉක්මවන දේපළ කිසිවක්—

(අ) තහනමට ගනු ලැබූ දින සිට දින විසිහතරක කාලයක් අවසන් වීමෙන් පසුව හැර ; සහ

(ආ) විකිණීමට නියමිත දිනට දින එකොළහකට නො අඩුව, එසේ නියමිත දිනය, කාලය හා ස්ථානය දක්වෙන දැන්වීමක් ගැසට් පත්‍රයේ සහ ශ්‍රී ලංකාවේ සංසරණය වන ප්‍රවෘත්ති පත්‍රයක පළ කරනු ලැබ ඇත්නම් මිස

මේ වගන්තිය යටතේ නො විකිණිය යුතු ය.

(3) යම් බලපත්‍රයක් ක්‍රියාවේ යෙදවීමෙහි ලා තහනමට ගන්නා ලද යම් චංචල දේපළක්, ඒ තහනමට ගත් දින සිට දින හැටක කාලසීමාවක් ඇතුළත විකිණීමට ප්‍රාදේශීය සභාවේ ලේකම්වරයා විසින් සැලැස්විය යුතු ය.

(4) යම් බලපත්‍රයක් ක්‍රියාවේ යෙදවීමෙහි ලා තහනමට ගන්නා ලද කිසිම දේපළක්, ඒ දේපළ විකිණීම සඳහා නියමිත වේලාවේ දී හෝ ඊට පෙර එම බලපත්‍රය යටතේ අයකර ගත හැකි මුදල සහ ගාස්තු, ලේකම් වරයාට නිසි ලෙස ගෙවනු ලැබුවහොත්, මේ වගන්තිය යටතේ නොවිකිණිය යුතු ය.

විකිණීමෙන් ලැබෙන මුදලෙහි අතිරික්ත ගෙවීම.

164. බලපත්‍රයක් ක්‍රියාවෙහි යෙදවීමෙහිලා තහනමට ගන්නා ලද යම් දේපළක් මේ කොටස යටතේ විකුණනු ලද අවස්ථාවක, ප්‍රාදේශීය සභාවේ ලේකම්වරයා විසින්, එම බලපත්‍රය යටතේ අය කර ගත හැකි මුදල සහ ගාස්තුව විකිණීමෙන් ලැබෙන මුදලින් අඩු කර ගැනීමෙන් පසුව, යම් අතිරික්තයක් වේ නම් එය දේපළෙහි අයිතිකරු හෝ හවුල් අයිතිකරුවන් විසින් කරන ඉල්ලීමක් මත, අවස්ථාවෝචිත පරිදි, ඒ දේපළෙහි අයිතිකරුට හෝ අයිතිකරුවන්ට ගෙවිය යුතු ය :

එසේ වුවද, යම් චංචල දේපළක් විකිණීමේ දින සිට එක් අවුරුද්දක් ඉකුත් වීමට පෙර එවැනි ඉල්ලීමක් කරනු නොලැබූ අවස්ථාවක දී ඒ අතිරික්තයේ මුදල ප්‍රාදේශීය සභා අරමුදලට බැර කරනු ලැබිය යුතු අතර, ඊට පසුව ඒ මුදල ඉල්ලා සිටීමට හෝ ලබා ගැනීමට කිසිම තැනැත්තකුට හිමිකම් නොලැබිය යුතු ය.

ගෙවල් කඩා විවෘත කිරීමට ඇති බලය.

165. මේ කොටස යටතේ බලපත්‍රයක් යොමු කරනු ලැබූ තැනැත්තා විසින්, ඒ බලපත්‍රය ප්‍රකාර යම් දේපළක් තහනමට ගැනීමේ කාර්යය සඳහා දිවා කාලයේ කවර හෝ වේලාවක යම් නිවසක් හෝ ගොඩනැගිල්ලක් කඩා විවෘත කළ හැකි ය.

වරිපනම් බදු හෝ කිසි මුදලක් අය කර ගැනීම.

166. (1) 160 වන වගන්තියේ සඳහන් දේපළ නොවන යම් විස්තරයකට අයත් චංචල දේපළක් සොයාගත නොහැකි සෑම අවස්ථාවක හෝ බලපත්‍රය නිකුත් කරනු ලැබූ බදු එකතු කරන්නා හෝ වෙනත් නිලධරයා චංචල දේපළ තහනමට ගැනීමට කළ නොහැකි බවට වාර්තා කර ඇති අවස්ථාවක, ලේකම්වරයා විසින් මෙහි පස් වන උපලේඛනයේ දක්වා ඇති ආකෘතිය අනුව ලිඛිත දැන්වීමක්, එම දැන්වීම භාර දීමේ දින සිට දින තිහක කාලයක් ඇතුළත බලපත්‍ර ගාස්තුව සමග ඒ වරිපනම් බද්ද හෝ බද්ද ගෙවා

ලෙස නියම කරමින් ද එම කාලසීමාව ඇතුළත ඒ වරිපනම් බද්ද හෝ බද්ද සහ ගාස්තු ගෙවීම පැහැර හැරියහොත් වරිපනම් බද්ද හෝ බද්ද අයවිය යුතු වන්නේ යම් ගොඩනැගිල්ලක් හෝ ඉඩමක් සම්බන්ධයෙන් ද ඒ ගොඩනැගිල්ල හෝ ඉඩම තහනමට ගෙන විකිණීම සඳහා පියවර ගන්නා බව දැනුම් දෙමින් ද ඒ වරිපනම් බද්ද හෝ බද්ද ගෙවීම පැහැර හැරි තැනැත්තාට භාර දිය යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ යම් දැන්වීමක් භාර දෙනු ලැබූයේ යම් තැනැත්තකුටද ඒ තැනැත්තා ඒ දැන්වීමේ නිශ්චිත කාලසීමාව ඇතුළත ඒ දැන්වීමට අනුකූලව ක්‍රියා කිරීම පැහැර හළ අවස්ථාවක, ලේකම්වරයා විසින් ඒ තැනැත්තාගෙන් අයවිය යුතු මුදල රුපියල් එක්දහස් පන්සියයක් නො ඉක්මවන විට, එම දේපළ පිහිටි ප්‍රදේශය විෂයෙහි අධිකරණ බලය ඇති මහේස්ත්‍රාත් අධිකරණයට ද එම මුදල රුපියල් එක්දහස් පන්සියයක් ඉක්මවන විට, එම දේපළ පිහිටි ප්‍රදේශය විෂයෙහි අධිකරණ බලය ඇති දිසා අධිකරණයට ද එම මුදලේ සමස්තය සහතික කළ යුතු අතර, එවැනි ඉල්ලීමක් කළ පසු අධිකරණය විසින්, එම නිශ්චල දේපළ තහනමට ගෙන විකුණා එම වරිපනම් බදු හෝ බදු මුදල සහ ගාස්තු අයකර ගැනීම සඳහා රිට් ආඥාවක් පිස්කල්වරයාට නිකුත් කළ යුතු ය.

(3) අධිකරණය විසින් නිකුත් කරනු ලැබූ රිට් ආඥාවක් ක්‍රියාවේ යෙදීමෙහි ලා පිස්කල්වරයා විසින් දේපළ තහනමට ගැනීම හා විකිණීම සම්බන්ධයෙන් වූ සිවිල් නඩු විධාන සංග්‍රහයේ විධිවිධාන, ලේකම්වරයා විසින් සහතික කරන ලද මුදල අයකර ගැනීම සඳහා නිශ්චල දේපළ තහනමට ගැනීම හා විකිණීම සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

(4) ඒ විධිවිධාන අදාළ කිරීමේ කාර්ය සඳහා එසේ නිශ්චිත මුදල් ප්‍රමාණය, අධිකරණය විසින් සටහන් කරන ලද තීන්දු ප්‍රකාශයක් යටතේ අයවිය යුතු මුදල් ප්‍රමාණයක් ලෙස සලකනු ලැබිය යුතු අතර ලේකම්වරයා නිශ්චිත ණයහිමියා වශයෙන්ද ඒ මුදල් ප්‍රමාණය ගෙවීමට යටත් තැනැත්තා විනිශ්චිත ණයකරු වශයෙන් ද සලකනු ලැබිය යුතු ය.

(5) මෙම වගන්තිය යටතේ ගෙවනු ලබන හෝ අය කරනු ලබන සෑම මුදල් ප්‍රමාණයක්ම, ප්‍රාදේශීය සභා අරමුදලට බැර කරනු ලැබිය යුතු ය.

**167.** (1) මේ පනත යටතේ හෝ ඒ යටතේ සාදන ලද යම් අතුරු ව්‍යවස්ථාවක් යටතේ හෝ තත්කාර්යය සඳහා නිකුත් කරන ලද බලපත්‍රයක් නොමැතිව යම් කර්මාන්තයක් හෝ ව්‍යාපාරයක් සඳහා යම් ස්ථානයක් පාවිච්චි කිරීමේ වරදට යම් අධිකරණයක් විසින් වරදකරු කරනු ලැබූ තැනැත්තකු ඒ කර්මාන්තය හෝ ව්‍යාපාරය සඳහා බලපත්‍රයක් නොමැතිව තමා විසින්ම හෝ තමා වෙනුවෙන් වෙනත් යම් තැනැත්තකු විසින් හෝ ඒ ස්ථානය නොකඩවා පාවිච්චි කරනු ලබන අවස්ථාවක, ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා හෝ ලේකම්වරයා විසින් හෝ අවස්ථාවෝචිත පරිදි, ඒ සභාපතිවරයා හෝ ලේකම්වරයා විසින් තත්කාර්යය සඳහා බලය දෙන ලද යම් නිලධරයකු විසින් හෝ කරන ලද සමාප්ති ආඥාවක් සඳහා වූ ඉල්ලීමක් මත, මහේස්ත්‍රාත්වරයකු විසින් ඒ තැනැත්තා ප්‍රාදේශීය සභාවෙන් බලපත්‍රයක් ලබා ගන්නා තෙක්, ඒ ස්ථානයෙහි ඒ කර්මාන්තය හෝ ව්‍යාපාරය කරගෙන යාම සමාප්ත කිරීමට ආඥාවක් කළ හැකි ය.

**මහේස්ත්‍රාත්වරයා විසින් සමාප්ති ආඥාව කිරීම.**

(2) (1) වන උපවගන්තිය යටතේ වූ යම් නඩුකටයුත්තක දී සහතිකයේ සඳහන් තැනැත්තා, යම් වෘත්තියක් හෝ ව්‍යාපාරයක් සඳහා බලපත්‍රයක් ලබා නොගෙන ඒ ස්ථානය නොකඩවා පාවිච්චි කරන බව දක්වමින්, ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා හෝ ලේකම්වරයා විසින් හෝ, අවස්ථෝචිත පරිදි, ඒ සභාපතිවරයා හෝ ලේකම්වරයා විසින් තත්කාර්යය සඳහා බලය දෙන ලද යම් නිලධරයකු විසින් හෝ නිකුත් කරන ලද සහතිකයක්, එහි සඳහන් කාරණා සම්බන්ධයෙන් බැලු බැල්මේ සාක්ෂි වන්නේ ය.

(3) (1) වන උපවගන්තිය යටතේ නිකුත් කරන ලද සමාප්ති ආඥවකට අනුකූලව කටයුතු කිරීමට යම් තැනැත්තකු පැහැර හරින යම් අවස්ථාවක දී ඒ ආඥව නිකුත් කිරීමේ දින සිට පැහැදිලි දින තුනකට පෙර හෝ පැහැදිලි දින හතකට පසුව දිනයක් නො වන්නා වූ ද ඒ ආඥවේ සඳහන් කරනු ලබන්නාවූ ද දිනයකට පෙර ඒ ස්ථානයෙහි ඇති යම් කර්මාන්තයක් හෝ ව්‍යාපාරයක් සමාප්ත කිරීමට අධිකරණයේ පිස්කල්වරයාට නියම කරමින් සහ බලය දෙමින් ඒ පිස්කල්වරයාට මහෙස්ත්‍රාත්වරයා විසින් නො පමාව ආඥවක් කළ යුතු ය. ඒ ස්ථානයෙහි යම් කර්මාන්තයක් හෝ ව්‍යාපාරයක් සමාප්ත කිරීමට අවශ්‍ය යයි එකී පිස්කල්වරයා හෝ තත්කාර්යය සඳහා ඔහු විසින් බලය දෙනු ලැබූ යම් පොලිස් නිලධරයකු සහ සහායකයන් සමග ඒ ස්ථානයට ඇතුළු වීමට ඒ පිස්කල්වරයාට හෝ ඒ පොලිස් නිලධරයාට ඒ ආඥව ප්‍රමාණවත් අධිකාරයක් වන්නේ ය.

## VI වන කොටස

### ප්‍රාදේශීය සභා අධීක්ෂණය කිරීම සහ පාලනය කිරීම

අයවැය ලේඛනය.

**168.** (1) සෑම ප්‍රාදේශීය සභාවක ම සභාපතිවරයා විසින් එක් එක් වර්ෂයක දී රීතිවලින් නියම කරනු ලැබ ඇති දිනයක දී හෝ ඊට පෙර සහ රීතිවල දක්වා ඇති ආකෘතිය අනුව, ඊළඟ වර්ෂය සඳහා අයවැය ලේඛනයක්, ඒ ඉදිරි වර්ෂයේ දී ලබාගත හැකි ආදායම සහ යෝජිත වියදම පිළිබඳ විස්තර ඇතුළත්ව පිළියෙල කොට, ප්‍රාදේශීය සභාව වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

(2) ඒ අයවැය ලේඛනය අදාළ වන වර්ෂය ආරම්භ වීමට පෙර සෑම ප්‍රාදේශීය සභාවක් විසින් ම, ඒ අයවැය ලේඛනය, එහි යම් සංශෝධන කිසිවක් තිබේ නම්, ඒවා ද සමග අවසාන වශයෙන් සැළකිල්ලට භාජන කොට සම්මත කරනු ලැබිය යුතු ය.

(3) ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා විසින් කවර හෝ අවස්ථාවක දී පරිපූරක අයවැය ලේඛනයක් පිළියෙල කොට ප්‍රාදේශීය සභාවට ඉදිරිපත් කරනු ලැබිය හැකි ය.

(4) යම් අයවැය ලේඛනයක හෝ පරිපූරක අයවැය ලේඛනයක අඩංගු සියලු විෂයයන් නැතහොත් ඉන් කිසිවක් සම්මත කිරීම, වෙනස් කිරීම හෝ ප්‍රතික්ෂේප කිරීම නැතහොත් යම් විෂයයක් එකතු කිරීම, ප්‍රාදේශීය සභාව විසින් කරනු ලැබිය හැකි ය.

අයවැය ලේඛනය සම්බන්ධයෙන් සභාපතිවරයා සතු බලතල.

**169.** යම්කිසි අයවැය ලේඛනයක හෝ පරිපූරක අයවැය ලේඛනයක ඇතුළත් සියලු විෂයයන් නැතහොත් විෂයයන් කිසිවක් ප්‍රාදේශීය සභාව විසින් සංශෝධනය කරනු ලැබුවහොත්, හෝ ප්‍රතික්ෂේප කරනු ලැබුවහොත් හෝ ඒ විෂයයන්ට යම් කිසිවක් එකතු කරනු ලැබුවහොත්, සහ ප්‍රාදේශීය සභාවේ එවැනි යම් තීරණයකට සභාපතිවරයා එකඟ නොවූවහොත්, තවදුරටත් සලකා බලනු ලැබීම සඳහා ඒ අයවැය ලේඛනය හෝ පරිපූරක

අයවැය ලේඛනය සභාපතිවරයා විසින් ප්‍රාදේශීය සභාව වෙත නැවත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය. යම් අයවැය ලේඛනයක් හෝ පරිපූරක අයවැය ලේඛනයක් එසේ නැවත ඉදිරිපත් කරනු ලැබීමෙන් පසු දෙසතියක් ඇතුළත දී ප්‍රාදේශීය සභාව විසින් එය සම්මත කරනු නොලැබූ අවස්ථාවක, ඒ අයවැය ලේඛනය හෝ පරිපූරක අයවැය ලේඛනය ප්‍රාදේශීය සභාව විසින් සම්මත කරනු නොලැබුව ද එය ඒ ප්‍රාදේශීය සභාව විසින් යථා පරිදි සම්මත කරන ලද අයවැය ලේඛනය හෝ පරිපූරක අයවැය ලේඛනය ලෙස සලකනු ලැබිය යුතු ය.

අයවැය ලේඛනයෙන් යෝජනා කොට ඇති වියදම විචලනය කිරීම.

**170.** යම් වර්ෂයක් තුළ දී අවශ්‍යතාවක් උද්ගත වූ විටක, ඒ වර්ෂය සඳහා පිළිගන්නා ලද අයවැය ලේඛනයෙහි හෝ යම් පරිපූරක අයවැය ලේඛනයක යම් ශීර්ෂයක් යටතේ සඳහන් වියදම් අඩු කිරීම හෝ වැඩි කිරීම හෝ එක් ශීර්ෂයක් යටතේ වෙන් කොට ඇති මුදල් වෙනත් ශීර්ෂයකට මාරු කිරීම හෝ සභාපතිවරයා විසින් කරනු ලැබිය හැකි ය. එහෙත් එසේ කිරීමෙ දී, ඒ අයවැය ලේඛනයෙන් හෝ පරිපූරක අයවැය ලේඛනයෙන් අනුමත කොට ඇති මුළු වියදම් ප්‍රමාණය නොඉක්මවනු ලැබිය යුතු ය.

අරමුදල සහ දේපළ පරිපාලනය කිරීම සම්බන්ධයෙන් රීති.

**171.** ප්‍රාදේශීය සභා අරමුදල සහ ප්‍රාදේශීය සභාව වෙත සතු කරනු ලැබූ හෝ ප්‍රාදේශීය සභාව විසින් පාවිච්චි කරනු ලබන හෝ දරනු ලබන දේපළ, ඒ ප්‍රාදේශීය සභාව විසින් පරිපාලනය කරනු ලැබීම පහත සඳහන් කරුණු නියම කරමින් මේ වගන්තිය යටතේ සාදනු ලබන කාර්ය පටිපාටිය පිළිබඳ රීතිවලට වැඩිදුරටත් යටත් විය යුතු ය :—

(අ) ඇස්තමේන්තු සහ අයවැය ලේඛන පිළියෙල කිරීමේ දී අනුගමනය කළ යුතු ආකෘතිය ;

(ආ) අයවැය ලේඛනය සම්බන්ධයෙන් අමාත්‍යවරයාගේ හෝ සහකාර කොමසාරිස්වරයාගේ හෝ අනුමතිය අවශ්‍ය වන කාරණයක් සම්බන්ධයෙන් එය ලබාගත යුතු කාලසීමාව සහ ආකාරය ;

(ඇ) අමාත්‍යවරයා විසින් හෝ සහකාර කොමසාරිස්වරයා විසින් හෝ අයවැය ලේඛනයකට අදළ යම් කරුණක් අනුමත නොකරනු ලැබූ අවස්ථාවක දී ගනු ලැබිය යුතු පියවර ;

(ඈ) ප්‍රාදේශීය සභාවක් විසින් ගිණුම් පොත් පිළියෙල කිරීම හා තැබීම කළ යුත්තේ කවර ආකාරයකින් ද යන වග ;

(ඉ) ප්‍රාදේශීය සභාවක් විසින් පිළියෙල කරනු ලැබිය යුතු වාර ගිණුම් ප්‍රකාශවල ආකෘතිය ;

(ඊ) ප්‍රාදේශීය සභාවක පොත්, ගිණුම්, ලේඛන සහ වෙනත් වාර්තා, ප්‍රාදේශීය සභාවක් විසින් භාර ගනු ලැබූ හෝ සිදු කරනු ලැබූ ඉදිකිරීම් වැඩ, නඩත්තු හෝ අළුත්වැඩියා කිරීම් සහ ප්‍රාදේශීය සභාවක් වෙත සතු කර දෙනු ලැබූ හෝ ප්‍රාදේශීය සභාවක් විසින් පාවිච්චි කරනු ලබන හෝ දරනු ලබන ඉඩම් සහ ගොඩනැගිලි පරීක්ෂා කරනු ලැබිය යුත්තේ කවර කාලසීමාවන්හි දී ද ; කවර තැනැත්තන් විසින් ද සහ කවර ආකාරයකින් ද යන වග ; සහ

(උ) ප්‍රාදේශීය සභාවක මූල්‍ය යෝජනා පිළිබඳ දැන්වීම් ප්‍රාදේශීය සභාවේ ප්‍රදේශයේ සීමා ඇතුළත දැන්වීම් දිය යුතු ආකාරය සහ වාර ගිණුම් ප්‍රකාශ ප්‍රසිද්ධ කළ යුතු ආකාරය.

ගිණුම් විගණනය කිරීම සහ අධිභාර කිරීම.

**172.** (1) සෑම ප්‍රාදේශීය සභාවක ගිණුම් විගණනය කිරීම සම්බන්ධයෙන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 වන ව්‍යවස්ථාව අදාළ විය යුතු ය.

(2) ඒ විගණනයේ වියදම වෙනුවෙන් දයක මුදලක් වශයෙන්, කලින් කල මුදල් විෂයය භාර අමාත්‍යවරයා විසින් තීරණය කරනු ලබන අනුප්‍රමාණයන් මත වූ ගාස්තුවක් සෑම ප්‍රාදේශීය සභාවක් විසින් ම ආණ්ඩුවට ගෙවිය යුතු ය.

(3) මේ වගන්තිය යටතේ ප්‍රාදේශීය සභාවක ගිණුම් විගණනය කිරීමේ දී නීතියට පටහැනි සෑම ගිණුම් විෂයයක්ම විගණකාධිපතිවරයා විසින් ප්‍රතික්ෂේප කරනු ලැබිය යුතු අතර, නීතිවිරෝධී ගෙවීම කරන හෝ කිරීමට බලය දෙන තැනැත්තා විෂයෙහි එය අධිභාරයක් කළ යුතු ය. තව ද, යම් තැනැත්තකුගේ ගනාසැලකිල්ල හෝ විෂමාචාරය නිසා දරන ලද යම් ඌණතාවක හෝ පාඩුවක මුදල ද තව ද, ගිණුම් දැක්විය යුතු වූ එහෙත් එසේ දක්වනු නොලැබූ, මුදල ද ඒ තැනැත්තාට විරුද්ධව අයකරනු ලැබිය යුතුය. ඒ සෑම අවස්ථාවකදීම ඒ තැනැත්තාගෙන් ලැබිය යුතු මුදල සහතික කරනු ලැබිය යුතු අතර, පළාත් පාලන කොමසාරිස්වරයා මගින් තම තීරණය ලියවිල්ලකින් ඒ තැනැත්තාට දැනුම් දිය යුතු ය. පළාත් පාලන කොමසාරිස් වරයා විසින් ඒ දැන්වීම ලියාපදිංචි තැපෑලෙන් ඒ තැනැත්තා වෙත යැවිය යුතු ය. එසේ යවනු ලැබුවහොත් සාමාන්‍ය තැපැල් කටයුතු කිරීමේ දී ඒ තීරණය ඇතුළත් ලිපිය භාර දෙනු ලබන අවස්ථාවේ දී ඒ තැනැත්තා විසින් එය භාරගනු ලැබූ ලෙස සැලකිය යුතු ය. තව ද, ඒ ලිපිය තැපැල් කළ බව ඔප්පු කිරීමට ඒ ලිපියෙහි නිසි ලෙස ලිපිනය ලියා තැපෑලට දැමූ බව ඔප්පු කිරීම ප්‍රමාණවත් වන්නේ ය:

එසේ වුව ද, ප්‍රාදේශීය සභාවක් විසින් දරන ලද වියදම් කිසිවක් අමාත්‍ය වරයා විසින් අනුමත කරනු ලැබූ වියදම් වේ නම් විගණකාධිපතිවරයා විසින් ඒවා ප්‍රතික්ෂේප නොකරනු ලැබිය යුතු ය.

(4) යම් ප්‍රාදේශීය සභාවක යෝජනා සම්මතයකින් බලය දෙනු ලැබූ වියදම් කිසිවකට අදාළ ඒ ප්‍රාදේශීය සභාවේ ගිණුම් විෂයයක් මේ වගන්තියේ (3) වන උපවගන්තිය යටතේ නීතියට පටහැනි වේතැයි විගණකාධිපතිවරයා විසින් ප්‍රතික්ෂේප කරනු ලබන අවස්ථාවක, ඒ යෝජනා සම්මතයට පක්ෂව ඡන්දය දුන් ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා සහ ඒ ප්‍රාදේශීය සභාවේ වෙනත් සෑම සභිකයකුම සහ එක් එක් තැනැත්තා ඒ උප වගන්තියේ කාර්යය සඳහා ගෙවීම කළ හෝ ගෙවීම කිරීමට බලය දුන් තැනැත්තකු ලෙස සලකනු ලැබිය යුතු ය.

(5) යම් තැනැත්තකුට විරුද්ධව යම් අධිභාරයක් හෝ ඉඩ නොදීමක් කිරීමට පෙර ඒ තැනැත්තාට කරුණු ප්‍රකාශ කිරීමට හෝ සුදුසු යයි ඔහු කල්පනා කරන කාරණා සම්බන්ධයෙන් කරුණු ඉදිරිපත් කිරීමට අවස්ථාවක් විගණකාධිපතිවරයා විසින් දෙනු ලැබිය යුතු ය. තව ද, විගණකාධිපතිවරයා විසින් ඒ අධිභාරය හෝ ඉඩ නොදීම කරනු ලබන අවස්ථාවක දී ඔහු ගෙන් ඉල්ලීමක් කරනු ලැබූ විට ඒ අධිභාරය හෝ ඉඩ නොදීම සම්බන්ධයෙන් තම තීරණය සඳහා හේතු ඒ තැනැත්තා වෙත ලියවිල්ලකින් ඉදිරිපත් කළ යුතු ය.

(6) (අ) යම් අධිභාරයකින් හෝ ඉඩනොදීමකින් අතෘප්තියට පත් යම් තැනැත්තකු විසින්, ඊට විරුද්ධව අභියාචනාධිකරණය වෙත අභියාචනයක් කරනු ලැබිය හැකි ය. ඒ අධිභාරය හෝ ඉඩනොදීම නීතියට අනුකූල නොවන බව අභියාචනාධිකරණයේ මතය වන්නේ නම් ඒ අධිභාරය හෝ ඉඩනොදීම ස්ථිර කරනු ලැබිය හැකි ය. නැතහොත් ඒ අධිභාරය හෝ ඉඩ නොදීම ලිහිල් කිරීම හෝ පසෙක තැබීම කරනු ලැබිය හැකි ය.

(ආ) (අ) ඡේදය යටතේ වූ සෑම අභියාචනයක් ම, දිසා අධිකරණවල අතුරු ආඥාවලට විරුද්ධව අභියාචන ඉදිරිපත් කිරීමේ දී නියම කොට ඇති සහ අනුගමනය කරනු ලැබිය යුතු රීතිවල සඳහන් කාලය ඇතුළත දී එසේ සඳහන් ආකාරයට ඒ රීතිවලට යටත්ව ඉදිරිපත් කිරීම ද විභාග කිරීම සහ බලාත්මක කිරීම ද කරනු ලැබිය යුතු ය.

(7) (අ) (6) වන උපවගන්තිය යටතේ වූ අභියාචනයක් වෙනුවට යම් අධිභාරයකින් හෝ ඉඩනොදීමකින් අතෘප්තියට පත් යම් තැනැත්තකු විසින්, ඔහුට විගණකාධිපතිවරයාගේ තීරණය දැනුම් දෙනු ලැබූ දින සිට දින තිහක් ඇතුළත ඒ තීරණයට විරුද්ධව අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත අභියාචනයක් කරනු ලැබිය හැකි ය. තව ද, එවැනි යම් අභියාචනයක් මත ඒ කාරණයේ කුසලතාවලට අනුකූලව උද්ගතවී ඇති ප්‍රශ්නය ලේකම්වරයා විසින් තීරණය කිරීම නීත්‍යනුකූල වන්නේ ය.

(ආ) අධිභාර කරනු ලැබූ හෝ ඉඩ දෙනු නොලැබූ මුදල සම්පූර්ණයෙන්ම හෝ ඉන් යම් කොටසක් හෝ එවැනි අභියාචනයක් කරන තැනැත්තාගෙන් අයකර ගැනීම සඳහා ප්‍රදානයන් ඇති බව අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා අදහස් කරන්නේ නම්, ලේකම්වරයා විසින් නියමයක් මගින් එකී තැනැත්තාගෙන් ඒ මුදල අයකර ගැනීමට විධාන කරනු ලැබිය හැකි අතර, යම් අධිභාරයක් හෝ ඉඩ නොදීමක් නීත්‍යනුකූලව කරන ලද්දක් වන නමුත් ඊට අදාළ විෂය කාරණා සිදුවූ අවස්ථාගත තත්ත්වයන් අනුව ඒ අධිභාරය හෝ ඉඩ නොදීම ඉවත් කිරීම සාධාරණ හා යුක්තිසහගත බව ලේකම්වරයා නිගමනය කළ විටක, ඔහු විසින් නියමයක් මගින්, එය ඉවත් කළ යුතු යයිද එසේ නම් ඒ අධිභාරය හෝ ඉඩනොදීම ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් විගණකාධිපතිවරයා විසින් දරන ලද වියදම්වල සහ පිරිවැයවල මුදල් ප්‍රමාණය නැතහොත් ලේකම්වරයා විසින් තීරණය කරනු ලබන ඉන් යම් කොටසක් ඒ තැනැත්තාගෙන් අයකර ගනු ලැබිය යුතු යයි ද නියමයක් කරනු ලැබිය හැකි ය.

(8) ඉහත සඳහන් පරිදි යම් තැනැත්තකුගෙන් අයවිය යුතු යයි විගණකාධිපතිවරයා විසින් සහතික කරනු ලැබූ සෑම මුදල් ප්‍රමාණයක් ම, ඒ තීරණයට විරුද්ධව අභියාචනයක් ඉදිරිපත් කර ඇත්තේ නම් මිස, විගණකාධිපතිවරයාගේ තීරණය ඒ තැනැත්තා වෙත දැනුම් දෙනු ලැබූ දින සිට දින දහහතරක් ඇතුළත දී ඒ තැනැත්තා විසින් පළාත් පාලන කොමසාරිස්වරයා වෙත ගෙවනු ලැබිය යුතු ය. තවද, ඒ මුදල් ප්‍රමාණය එසේ ගෙවා නොමැති නම් සහ අභියාචනයක් ඉදිරිපත් කර නොමැති නම්, ඒ තැනැත්තාගෙන් අයවිය යුතු ඒ මුදල් ප්‍රමාණය (9) වන උපවගන්තියේ හෝ (10) වන වන උපවගන්තියේ සඳහන් ආකාරයට ඒ තැනැත්තාගෙන් අය කර ගැනීම පළාත් පාලන කොමසාරිස්වරයාගේ කාර්යය වන්නේ ය.

(9) (8) වන උපවගන්තියේ සඳහන් යම් මුදලක් ඒ උපවගන්තියේ සඳහන් කාලපරිච්ඡේදය තුළ දී ඒ තැනැත්තා විසින් පළාත් පාලන කොමසාරිස්වරයාට නො ගෙවනු ලැබුවහොත්, ඒ තැනැත්තාගේ නිශ්චල දේපළ තහනමට ගෙන විකුණා ඒ මුදල අයකර ගැනීම සඳහා ඉල්ලීමක් ඒ තැනැත්තා පදිංචි ප්‍රදේශය විෂයයෙහි අධිකරණ බලය ඇති දිසා අධිකරණය වෙත එකී කොමසාරිස්වරයා විසින් ඉදිරිපත් කරනු ලැබිය හැකි අතර එවැනි ඉල්ලීමක් ලැබුණු විට එකී දේපළ තහනමට ගෙන විකුණා ඒ මුදල අයකර ගැනීම සඳහා රිට් ආඥාවක් ඒ අධිකරණය විසින් පිස්කල්වරයා වෙත නිකුත් කරනු ලැබිය යුතු ය. අධිකරණය විසින් නිකුත් කරන ලද රිට් ආඥාවක් ක්‍රියාත්මක කිරීමෙහි ලා පිස්කල්වරයා විසින් නිශ්චල දේපළ තහනමට

ගෙන විකිණීමට සහ පිස්කල්වරයා විසින් තහනමට ගන්නා ලද නිශ්චල දේපළ සම්බන්ධයෙන් හිමිකම් පෑම් ඉදිරිපත් කිරීමට විනිශ්චය කිරීමට අදාළ සිවිල් නඩු විධාන සංග්‍රහයේ එන විධිවිධාන කොමසාරිස්වරයා විසින් ඉදිරිපත් කරන ලද ඉල්ලීමෙහි සඳහන් මුදල් ප්‍රමාණ අයකර ගැනීම සඳහා නිශ්චල දේපළ තහනමට ගෙන විකිණීමට සහ එසේ තහනමට ගන්නා ලද දේපළ සම්බන්ධයෙන් හිමිකම් පෑම් ඉදිරිපත් කිරීමට හා විනිශ්චය කිරීමට අදාළ විය යුතු ය. එකී විධිවිධාන අදාළ කිරීමේ කාර්ය සඳහා, එසේ සඳහන් කරනු ලබන මුදල් ප්‍රමාණය අධිකරණය විසින් සටහන් කරන ලද තීන්දු ප්‍රකාශයක් අනුව අයවිය යුතු මුදල් ප්‍රමාණයක් ලෙස සලකනු ලැබිය යුතු අතර ඒ කොමසාරිස්වරයා විනිශ්චිත ණයහිමියා ලෙස ද එකී මුදල ගෙවීමට යටත් තැනැත්තා විනිශ්චිත ණයකරු ලෙස ද සලකනු ලැබිය යුතු ය.

(10) (8) වන උපවගන්තියෙහි සඳහන් යම් මුදලක්, යම් තැනැත්තකුගේ නිශ්චල දේපළ තහනමට ගැනීමෙන් සහ විකිණීමෙන් ඒ තැනැත්තාගෙන් අයකර ගැනීම ප්‍රායෝගික නො වන බව හෝ අයෝග්‍යවන බව පළාත් පාලන කොමසාරිස්වරයාගේ මතය වන අවස්ථාවක හෝ එකී සම්පූර්ණ මුදල එසේ අයකර ගනු නොලැබූ අවස්ථාවක කොමසාරිස්වරයා විසින් එම තැනැත්තාගෙන් අයවිය යුතු මුදල් ප්‍රමාණය සහ එම තැනැත්තාගේ නම සහ ඔහුගේ ව්‍යාපාර ස්ථානය හෝ පදිංචිය පිළිබඳ අවසන් වරට දැන සිටි විස්තර අඩංගු සහතිකයක් එම තැනැත්තා පදිංචිව සිටින ස්ථානය විෂයයෙහි අධිකරණ බලය ඇති මහෙස්ත්‍රාත්වරයා වෙත නිකුත් කරනු ලැබිය හැකි ය. එවිට එම මහෙස්ත්‍රාත්වරයා විසින් ඒ තැනැත්තාගෙන් ලැබිය යුතු මුදල අයකර ගැනීම සඳහා ඔහුට විරුද්ධව නඩු නො පැවරිය යුත්තේ මන්දැයි හේතු දැක්වීමට ඒ තැනැත්තා තමා ඉදිරියට කැඳවිය යුතු ය. තවද, ඒ තැනැත්තා විසින් ප්‍රමාණවත් හේතු නොදැක්වුව හොත්, ඒ ලැබිය යුතු මුදල, දඩයකින් පමණක් දඬුවම් කරනු ලැබිය යුතු, නැතහොත් බන්ධනාගාරගත කිරීමෙන් දඬුවම් කළ නොහැකි, වරදක් සඳහා, ඒ පැහැර හරින්නා මත මහෙස්ත්‍රාත්වරයාගේ දණ්ඩන නියමයක් මගින් නියම කරනු ලැබ ඇති දඩයක් ලෙස සලකනු ලැබිය යුතු අතර, එම දඩය ඒ අනුව අයකර ගනු ලැබිය හැකි ය.

(11) මේ වගන්තිය යටතේ අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් කරනු ලැබූ යම් නියමයක් මගින් එවැනි යම් තැනැත්තකුගෙන් අයකර ගනු ලැබීමට විධාන කරන ලද යම් මුදලක්, මේ වගන්තියේ විධිවිධාන යටතේ විගණකාධිපතිවරයා විසින් සහතික කරනු ලැබූ යම් මුදලක් අයකර ගනු ලබන ආකාරයට ම පළාත් පාලන කොමසාරිස්වරයා විසින් වහාම අය කර ගනු ලැබිය හැකි ය.

(12) මේ වගන්තියේ (3) වන උපවගන්තිය යටතේ විගණකාධිපතිවරයා විසින් කරන ලද යම් සහතිකයක හෝ අධිභාරයක හෝ ඉඩ නො දීමක හෝ, (7) වන උපවගන්තිය යටතේ අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් කරන ලද නියමයක හෝ (10) වන උපවගන්තිය යටතේ පළාත් පාලන කොමසාරිස්වරයා විසින් දෙන ලද සහතිකයක හෝ නිරවද්‍යතාව හෝ වලංගුභාවය, මේ වගන්තිය යටතේ ලැබිය යුතු යම් මුදලක් අයකර ගැනීම සඳහා යම් දිසා අධිකරණයක් හෝ මහෙස්ත්‍රාත් අධිකරණයක් ඉදිරියේ දී වූ නඩු කටයුත්තක දී ප්‍රශ්න කරනු නොලැබිය යුතු ය

(13) යම් අධිභාරයක් හෝ ඉඩනොදීමක් ක්‍රියාත්මක කිරීමේ දී දරන ලද ගාස්තු සහ වියදම් වශයෙන් ගෙවන ලද හෝ අයකර ගන්නා ලද යම් මුදලක් හැර, මේ වගන්තිය යටතේ ගෙවන ලද හෝ අයකර ගන්නා ලද සෑම මුදලක්ම, ප්‍රාදේශීය සභාවේ ප්‍රාදේශීය සභා අරමුදලට බැර කළ යුතු ය.

*නියමිත සීමාව ඉක්මවා යන්නේ නම්, වැඩ ක්‍රියාත්මක කිරීම සඳහා වූ ගිවිසුම් ලිඛිතව තිබිය යුතු බව.*

**173.** නියෝගවලින් නියම කරනු ලබන සීමාවන් ඉක්මවන තක්සේරු කළ වියදම් හෝ ආදායම් සම්බන්ධ වන්නා වූ හෝ එක් අවුරුද්දකට වැඩි කාලයක් පවතින හෝ පවතී යයි අපේක්ෂා කරනු ලබන යම් වැඩක් හෝ සේවාවක් ක්‍රියාත්මක කිරීම හෝ ඉටු කිරීම සඳහා හෝ යම් ද්‍රව්‍ය හෝ භාණ්ඩ සැපයීම සඳහා හෝ මේ පනතේ කාර්ය සඳහා අවශ්‍ය වෙනත් යම් කටයුත්තක් සඳහා හෝ වන ගිවිසුමක් ලිඛිතව සකස් කළ යුතු අතර, ප්‍රාදේශීය සභාව වෙනුවෙන් ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා සහ ලේකම්වරයා විසින් අත්සන් කර, ප්‍රාදේශීය සභාවේ පොදු මුද්‍රාවෙන් මුද්‍රා තැබිය යුතු ය. තවද එවැනි යම් ගිවිසුමක් එහි ඇතුළත් කිරීම අවශ්‍ය යයි සලකනු ලැබිය හැකි වෙනත් කරුණු වලට අමතරව,—

(i) ක්‍රියාත්මක කළ යුතු හෝ ඉටු කළ යුතු, වැඩ හෝ සේවාවන් හෝ සැපයිය යුතු ද්‍රව්‍ය හෝ භාණ්ඩ ;

(ii) වැඩ, සේවාවන්, ද්‍රව්‍ය හෝ භාණ්ඩ සඳහා ගෙවිය යුතු මිළ හෝ ප්‍රමාණ ;

(iii) වැඩ හෝ සේවාවන් සම්පූර්ණ හෝ සැපයිය යුතු කාල සීමාව හෝ ද්‍රව්‍ය හෝ භාණ්ඩ;

(iv) කඩ කිරීමක් සිදු වූ අවස්ථාවකදී නියම වන යම් දණ්ඩනයක් හෝ දණ්ඩන

නිශ්චිතව දැක්විය යුතු ය.

*173 වන වගන්තියෙහි සඳහන් ගිවිසුම්වලට ඇතුළත්වීමේ කාර්ය පටිපාටිය.*

**174.** 173 වන වගන්තියේ සඳහන් පරිදි යම් ගිවිසුමකට ඇතුළත් වීමට පෙර —

(i) ගිවිසුම යථා පරිදි ඉටු කරනු ලබන බවට ප්‍රමාණවත් ඇපයක් ගතයුතු යයි ප්‍රාදේශීය සභාව විධාන කළහොත්, ලේකම්වරයා විසින් එවැනි ඇපයක් ගනු ලැබිය යුතු ය ;

(ii) නියමිත ආකාරයට ලේකම්වරයා හෝ සභාපතිවරයා විසින් ටෙන්ඩර් හෝ මිළ ගණන් කැඳවනු ලැබිය යුතු ය ;

(iii) ටෙන්ඩර් සඳහා වූ කැඳවීමද ටෙන්ඩර් පත්‍ර හෝ මිළ ගණන් තිබේ නම්, ඒ ටෙන්ඩර් පත්‍ර හෝ මිළ ගණන් හෝ ඒවායේ පිටපත් ද සභාව ඉදිරියේ තැබිය යුතු අතර, සභාව විසින් ඒ ටෙන්ඩර් පත්‍ර වලින් හෝ මිළ ගණන්වලින් එක් ටෙන්ඩර් පත්‍රයක් හෝ මිළ ගණනක් හෝ භාර ගැනීම හෝ ඒ සියල්ල ප්‍රතික්ෂේප කිරීම හෝ කළ යුතු ය. තවද, වියදමට අදාළව අඩුම ටෙන්ඩර් පත්‍රය හෝ මිළ ගණන නොවන ටෙන්ඩර් පත්‍රයක් හෝ මිළ ගණනක් භාරගත් විටද ආදායමට අදාළව ඉතාම වැඩි ටෙන්ඩර් පත්‍රය හෝ මිළ ගණන නොවන ටෙන්ඩර් පත්‍රයක් හෝ මිළ ගණනක් භාරගත් විටද අවස්ථෝචිත පරිදි, ඉතාම අඩු හෝ ඉතාම වැඩි ටෙන්ඩර් පත්‍රය හෝ මිළ ගණන භාර නොගැනීම පිළිබඳව සතුටුදායක හේතු යෝජනා සම්මතයෙන් දැක්විය යුතු ය ; තවද

(iv) ගිවිසුම සඳහා අවශ්‍ය අරමුදල් අනුමත කරන ලද අයවැය ලේඛනයකින් හෝ පරිපූරක අයවැය ලේඛනයකින් ප්‍රතිපාදනය කර ඇති බවට සෑහීමට පත්වීමෙන් පසු ඒ ගිවිසුම ප්‍රාදේශීය සභාව විසින් අනුමත කරනු ලැබිය යුතු ය :

එසේ වුවද, වැඩක් හෝ සේවාවක් කිරීම හෝ යම් භාණ්ඩයක් හෝ ද්‍රව්‍යයක් සැපයීම හෝ මේ පනතේ කාර්යය සඳහා අවශ්‍ය වෙනත් යම් කටයුත්තක් හෝ ආණ්ඩුවේ දෙපාර්තමේන්තුවකින්, රාජ්‍ය සංස්ථාවකින් හෝ ලියාපදිංචි කරනු ලැබූ සමූපකාර සමිතියකින් ක්‍රියාවේ යොදවනු ලබන්නේ නම්, ඒ සඳහා ප්‍රාදේශීය සභාවේ ලේකම්වරයා විසින් හෝ සභාපතිවරයා විසින් හෝ ටෙන්ඩර් පත් හෝ මිල ගණන් කැඳවීම අවශ්‍ය නොවිය යුතු ය.

වැය විෂයක නීත්‍යානුකූලතාව පිළිබඳ සැක දුරු කිරීම.

175. (1) ප්‍රාදේශීය සභාවක යෝජනා සම්මතයක් මගින් බලය දෙනු ලැබූ යම් වැය විෂයක නීත්‍යානුකූලතාව පිළිබඳ සැක කිසිවක් දුරු කිරීමේ කාර්යය සඳහා ප්‍රාදේශීය සභාවක සභාපතිවරයා විසින්, එම කරුණ තීරණයක් ලබා ගැනීම පිණිස සහකාර කොමසාරිස්වරයා මගින් පළාත් පාලන කොමසාරිස්වරයා වෙත යොමු කරනු ලැබිය හැකි ය. එවැනි යම් යොමු කිරීමක් පිළිබඳ තමාගේ තීරණය, කොමසාරිස්වරයා විසින් සහකාර කොමසාරිස්වරයා මගින් සභාපතිවරයාට දන්වා සිටිය යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ තමා වෙත කරන ලද යම් යොමු කිරීමක් මත, ප්‍රාදේශීය සභාවක යෝජනා සම්මතයකින් බලය දෙනු ලැබූ යම් වැය විෂයක නීත්‍යානුකූලතාව පළාත් පාලන කොමසාරිස්වරයා විසින් ස්ථිර කරනු ලැබූ අවස්ථාවක, 172 වන වගන්තියේ පටහැණිව කුමක් සඳහන් වුවද, ඒ වැය විෂයට අදාළ යම් ගෙවීමක් සම්බන්ධයෙන් ඒ වගන්තිය යටතේ විගණකාධිපතිවරයා විසින් කරනු ලබන අධිභාරයකට, සභාවේ සභාපතිවරයා සහ එහි වෙනත් සෑම සභිකයකුම යටත් නොවිය යුතු ය.

විශ්‍රාම වැටුප්, වාර්ෂික, පාරිතෝෂික හෝ විශ්‍රාම ගැනීමේ දීමනා තාරුණ්‍ය සහගතව ගෙවීම.

176. (1) මුදල් විෂයය භාර අමාත්‍යවරයා විමසීමෙන් පසුව දෙන ලද අමාත්‍යවරයාගේ අනුමතය ඇතිව, ප්‍රාදේශීය සභාවේ ප්‍රාදේශීය සභා අරමුදලින් :–

(අ) ඒ ප්‍රාදේශීය සභාවේ නිලධරයකු හෝ සේවකයකු වශයෙන් සේවයෙන් විශ්‍රාම යන හෝ විශ්‍රාම ගිය ; හෝ

(ආ) එම සේවයෙන් රජයේ සේවයට මාරු කරනු ලබන හෝ මාරු කරනු ලැබූ සහ රජයේ සේවයෙන් විශ්‍රාම යන හෝ විශ්‍රාම ගිය,

යම් තැනැත්තකුට, ඒ ප්‍රාදේශීය සභාවේ අතුරු ව්‍යවස්ථා හෝ රීති කිසිවක් යටතේ හෝ ජාතික රාජ්‍ය සභාවේ 1974 අංක 16 දරන පළාත් පාලන සේවා පනත යටතේ පිහිටුවනු ලැබූ යම් විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයක් යටතේ හෝ විශ්‍රාම වැටුපක්, පාරිතෝෂිකයක් හෝ විශ්‍රාම ගැනීමේ දීමනාවක් හෝ ප්‍රමාණවත් විශ්‍රාම වැටුපක්, පාරිතෝෂික හෝ විශ්‍රාම ගැනීමේ දීමනාවක් එම නිලධරයා හෝ සේවකයා වශයෙන් වූ ඔහුගේ සේවා කාලය වෙනුවෙන් ගෙවිය නොහැකි නම්, ඒ කාලය වෙනුවෙන් විශ්‍රාම වැටුපක්, පාරිතෝෂිකයක් හෝ විශ්‍රාම ගැනීමේ දීමනාවක් ඒ ප්‍රාදේශීය සභාව විසින් ප්‍රදානය කරනු ලැබිය හැකි ය.

(2) යම් ප්‍රාදේශීය සභාවක අතුරු ව්‍යවස්ථා හෝ රීති කිසිවක් යටතේ හෝ ජාතික රාජ්‍ය සභාවේ 1974 අංක 16 දරන පළාත් පාලන සේවා පනත යටතේ පිහිටුවනු ලැබූ යම් යෝජනා ක්‍රමයක් හෝ අරමුදලක් යටතේ හෝ ඒ ප්‍රාදේශීය සභාවේ යම් මියගිය නිලධරයකුගේ හෝ සේවකයකුගේ වැන්දඹුවට, දරුවන්ට, ළඟම නෑයාට හෝ යැපෙන්නන්ට විශ්‍රාම වැටුපක්, වාර්ෂිකයක් හෝ පාරිතෝෂිකයක් හෝ ප්‍රමාණවත් විශ්‍රාම වැටුපක් වාර්ෂිකයක් හෝ පාරිතෝෂිකයක් නොගෙවිය හැකි අවස්ථාවක, ඒ ප්‍රාදේශීය සභාව විසින් මුදල් විෂයය භාර අමාත්‍යවරයා විමසීමෙන් පසුව දෙන ලද අමාත්‍යවරයාගේ අනුමැතිය ඇතිව, සභාවේ ප්‍රාදේශීය සභා අරමුදලින්, ඒ වැන්දඹුවට, දරුවන්ට, ළඟම නෑයාට හෝ යැපෙන්නන්ට විශ්‍රාම වැටුපක්, වාර්ෂිකයක් හෝ පාරිතෝෂිකයක් ප්‍රදානය කරනු ලැබිය හැකි ය.

(3) මේ වගන්තියේ (1) වන උපවගන්තියේ හෝ (2) වන උපවගන්තියේ සඳහන් කිසිවක් යම් තැනැත්තකුට යම් විශ්‍රාම වැටුපක්, වාර්ෂිකයක්, පාරිතෝෂිකයක් හෝ විශ්‍රාම ගැනීමේ දීමනාවක් හෝ ප්‍රදානය කරනු ලැබීමේ හිමිකමක් පිරිනමන ලෙස අර්ථ නිරූපණය නොකළ යුතු ය.

**පාරිතෝෂික යෝජනා ක්‍රමයක් පිහිටුවීමට ඇති බලය.**

177. (1) මුදල් විෂයය භාර අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව අමාත්‍යවරයා විසින් දෙනු ලබන අනුමැතිය අනුව, ප්‍රාදේශීය සභාවක් විසින් ඒ ප්‍රාදේශීය සභාවේ තාවකාලික නිලධරයන් සහ සේවකයන් ඒ ප්‍රාදේශීය සභාවේ සේවය අවසන් කළ විට, ඔවුන්ට පාරිතෝෂික ගෙවීම සඳහා වූ යෝජනා ක්‍රමයක් පිහිටුවීම පිණිස අතුරු ව්‍යවස්ථා සාදනු ලැබිය හැකි අතර ඒ අතුරු ව්‍යවස්ථාවලට අනුකූලව පිහිටුවනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ සාදනු ලැබූ අතුරු ව්‍යවස්ථා ඒවා ක්‍රියාත්මකවීමට පෙර, ඒ ප්‍රාදේශීය සභාවේ සේවය අවසන් කරනු ලැබූ ඒ ප්‍රාදේශීය සභාවේ තාවකාලික නිලධරයන් සහ සේවකයන්ට අදාළ විය හැකිය.

ණය

**ප්‍රාදේශීය සභාව සතු වරිපනම් බදු හා බදු ඇපයට තබා ණයට ගැනීමේ බලය.**

178. (1) ප්‍රාදේශීය සභාවේ කාර්ය අතුරෙන් යම් කාර්යයක් සඳහා අවශ්‍ය විය හැකි යම් මුදල් ප්‍රමාණයක් හෝ මුදල් ප්‍රමාණ අමාත්‍යවරයාගේ අනුමතයට යටත්ව, ශ්‍රී ලංකා ආණ්ඩුවෙන් හෝ යම් තැනැත්තකුගෙන් හෝ තැනැත්තන්ගෙන් හෝ සංස්ථාගත හෝ සංස්ථාගත නොවූ පුද්ගල මණ්ඩලයකින් ප්‍රාදේශීය සභාවක් විසින් ණයට ලබා ගැනීම නීත්‍යනුකූල විය යුතු ය:

එසේ වුවද, එවැනි ප්‍රාදේශීය සභාවක් විසින් දැනටම ලබා ගෙන ඇති සියලු ණය සම්බන්ධයෙන් ගෙවීමට ඇති මුදල් ප්‍රමාණය මුදල ණයට ලබා ගැනීමට ඇති වර්ෂයට පෙරාතුව ම වූ වර්ෂ තුන ඇතුළත දී එම ප්‍රාදේශීය සභාව විසින් ලබාගන්නා ලද සම්පූර්ණ ආදායම නො ඉක්මවන්නේ නම්, ඒ මුදලක් ණයට ගැනීම සඳහා අමාත්‍යවරයාගේ අනුමතය අවශ්‍ය නොවිය යුතු ය.

(2) ප්‍රාදේශීය සභාවක් විසින් ලබා ගන්නා සෑම ණය මුදලක්ම ඒ ණය මුදල අමාත්‍යවරයාගේ අනුමතය ඇතිව ගන්නා ලද අවස්ථාවක අමාත්‍යවරයා විසින් අනුමත කරනු ලබන්නා වූද වෙනත් අවස්ථාවකදී ප්‍රාදේශීය සභාව විසින් තීරණය කරනු ලබන්නා වූද පොලී ප්‍රමාණයකට සහ ආපසු ගෙවීමේ කොන්දේසිවලට යටත් විය යුතුය.

(3) ප්‍රාදේශීය සභාවක් විසින් ණයට ගන්නා මුදල හෝ මුදල්, සහ ඒ වෙනුවෙන් උපචිත වන පොලිය, ආපසු ගෙවීම සුරැකීමේ කාර්යය සඳහා මේ පනත යටතේ අය කරනු ලැබූ හෝ නියම කරනු ලැබූ යම් වරිපනම් බදු හෝ

බදු එකතු කිරීම් හෝ එයින් යම් කොටසක් හෝ ප්‍රාදේශීය සභාවට අයත් යම් දේපළක් හෝ ප්‍රාදේශීය සභාවට, උපචිත වන වෙනත් යම් ආදායම් මාර්ගයක් හෝ ඉන් යම් කොටසක් හෝ ප්‍රාදේශීය සභාව විසින්, එම මුදල හෝ මුදල් හෝ ඉන් යම් කොටසක් හෝ කොටස් ණයට දෙනු ලැබිය හැකි වනුයේ යම් තැනැත්තකු විසින් හෝ යම් තැනැත්තකු වෙනුවෙන්ද, එම ණය දෙන්නාට හෝ ණය දෙන්නන්ට උකස්කර පවරා දෙනු ලැබිය හැකි ය.

ණයට ගැනීමේ බලතල සීමා කිරීම.

**179.** (1) ප්‍රාදේශීය සභාවෙන් අය විය යුතු (මේ පනතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක අධිකාරය යටතේ ලබාගත්) සියළු ණය සම්බන්ධයෙන් යම් අවස්ථාවක දී ආපසු ගෙවිය යුතුව තිබෙන ප්‍රමාණය මුළුමනින් ඊට පෙරාතුවම වූ වර්ෂ පහ සඳහා සියළුම වරිපනම් සහ බදු, දේපළ සහ වෙනත් ආදායම් මාර්ගවලින් ප්‍රාදේශීය සභාව විසින් ලබාගන්නා ලද සාධාරණ සාමාන්‍ය වාර්ෂික ආදායමේ දස ගුණය නොඉක්ම විය යුතු අතර, වර්ෂ පහක් පැවති නැති ප්‍රාදේශීය සභාවක් සම්බන්ධයෙන් වන විට අමාත්‍ය වරයාගේ අනුමතයට යටත්ව ප්‍රාදේශීය සභාව මගින් තක්සේරු කරනු ලබන එහි වාර්ෂික ආදායමේ දස ගුණය නොඉක්ම විය යුතු ය.

(2) ණය සම්බන්ධයෙන් මේ කොටස යටතේ දෙනු ලබන සියළු ඇප මුද්දර ගාස්තුවෙන් නිදහස් විය යුතු ය.

ඇප ආදියෙහි ආකෘතිය.

**180.** මේ කොටස යටතේ යම් ණයක කාර්ය සඳහා දෙනු ලැබූ යම් ඇපය හා එය ලියා අත්සන්කිරීම පිළිබඳ ආකෘතිය සහ ආකාරය, ණයටගන්නාලද යම් මුදල් නැවත ගෙවීමේ ක්‍රමය සහ පිළිවෙල සහ, යම් ණයක් ඇවර කිරීම සඳහා වූ වැඩ පිළිවෙල දේශීය ණය සහ සංවර්ධන ආඥපනත යටතේ විධිවිධානවලට යටත්ව මේ පනත යටතේ සාදනු ලැබූ අතුරු ව්‍යවස්ථා මගින් නියම කරනු ලැබිය හැකි ආකාරයට විය යුතු අතර, එවැනි යම් අතුරු ව්‍යවස්ථා නොමැති විටෙක මහ නගර සභා ආඥපනතේ විධිවිධාන වලට අනුකූල විය යුතුය ; තවද එකී විධිවිධාන අවශ්‍ය වෙනස් කිරීම් සහිතව මේ පනත යටතේ යම් ප්‍රාදේශීය සභාවකට දෙන ලද යම් ණයකට, එවැනි අවස්ථාගත කරුණුවල දී අදාළ විය යුතු ය.

ණය ලබාගැනීමට අදාළ ප්‍රාදේශීය සභාවේ බලතල, සභාපතිවරයා විසින් ක්‍රියාත්මක කළ හැක්කේ කවර විටක ද යන බව.

**181.** සභාපතිවරයා විසින් අවශ්‍ය යයි සලකනු ලබන ප්‍රාදේශීය මණ්ඩලය වෙත පවරණ ලද යම් කාර්යයක් ඉටුකිරීමේ හෝ යම් කටයුත්තක් කරගෙන යාමේ කාර්ය සඳහා ණයක් ලබාගැනීම අනුමත කිරීමට ප්‍රාදේශීය සභාව අපොහොසත් වුවහොත්, 178 වන වගන්තියේ විධිවිධාන යටතේ ප්‍රාදේශීය සභාව වෙත සතු කරනු ලැබූ සියළු බලතල, එම වගන්තියෙන් සභාපතිවරයා වෙත පවරනු ලැබූ පරිද්දෙන් සභාපතිවරයා විසින් කොමසාරිස්වරයාගේ අනුමැතිය ඇතිව එම ණය ලබා ගැනීම සහ, එම බලතල ක්‍රියාත්මක කරනු ලැබිය හැකි ය.

ප්‍රාදේශීය සභාවට අය විය යුතු මුදල් අත්හැරීම.

**182.** යම් තැනැත්තකුගෙන් ප්‍රාදේශීය සභාවකට අයවියයුතු යම් මුදල් ප්‍රමාණයක් සම්පූර්ණයෙන් ම හෝ ඉන් යම් කොටසක් හෝ එම මුදල් ප්‍රමාණයේ නොවැදගත් කම හෝ එය අයකර ගැනීමට නොහැකිවීම හෝ එම තැනැත්තාගේ දුප්පත් කම යන හේතුව මත, යෝජනා සම්මතයක් මගින් ප්‍රාදේශීය සභාවක් විසින් අත්හරිනු ලැබිය හැකි ය. රුපියල් පණහක් ඉක්මවන මුදලක් අත්හැර දැමීමට අදාළ යෝජනා සම්මතයක් අමාත්‍ය වරයාගේ අනුමැතියට යටත් විය යුතු ය.

## VII වන කොටස

### ප්‍රාදේශීය සභාවලට අදාළ පරිපූරක විධිවිධාන

ප්‍රාදේශීය සභාවකට එරෙහිව ප්‍රදානය කරන ලද ගාස්තු ගෙවීම.

**183.** ප්‍රාදේශීය සභාවක් විසින් ගෙවිය යුතු යම් සිවිල් හෝ අපරාධ නඩුවකින් හෝ යම් නඩු කටයුත්තකින් උද්ගත වන සියළු හෝ ඊට අදළ සියලු ගාස්තු අයකිරීම සහ වියදම්, ප්‍රාදේශීය සභා අරමුදලින් ගෙවනු ලැබිය යුතු ය. තවද ප්‍රාදේශීය සභාවේ කිසිම සභිකයකු හෝ ප්‍රාදේශීය සභා ප්‍රදේශය තුළ වාසය කරන්නකු එය ගෙවීමට පෞද්ගලිකව බැඳී සිටිය යුතු ය.

රැස්වීම පිළිබඳ රීති සහ බදු සහ මුදල්.

**184.** (1) මේ පනතේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම සහ බලාත්මක කිරීමට අදළ යම් කරුණක් සම්බන්ධයෙන්, මේ පනතේ විධිවිධාන වලට අනුකූල නොවන රීති සෑදීම අමාත්‍යවරයා විසින් කරනු ලැබිය හැකි අතර, මෙයින් පිරිනැමෙන බලතල වල ව්‍යාප්තියට හානියක් නොමැතිව පහත සඳහන් සියළුම කරුණු හෝ ඉන් යම් කරුණක් සම්බන්ධයෙන් ඒ රීති සාදනු ලැබිය හැකිය :—

(අ) ප්‍රාදේශීය සභාවක රැස්වීම් කැඳවන දැන්වීමේ ආකෘතිය සාමාන්‍ය රැස්වීම පැවැත්විය යුතු කවර කාල සීමාවකට වරක් ද යන වග සහ රැස්වීම් පැවැත්වීමේ දී අනුගමනය කළ යුතු කාර්ය පටිපාටිය ;

(ආ) ප්‍රාදේශීය සභාවක් මගින් සාදනු ලැබූ අතුරු ව්‍යවස්ථා යටතේ කලින් ගෙවිය යුතු නොවන යම් කුලියක් හෝ ගාස්තුවක් ගෙවීම පැහැර හරිනු ලැබූ අවස්ථාවක ප්‍රාදේශීය සභාව විසින් ලඝු ලෙස අයකරගනු ලැබිය හැකි ආකාරය ;

(ඇ) මුදල් සහ අරමුදල් හා වෙනත් දේපළ පරිපාලනය කිරීම පිළිබඳව 171 වන වගන්තිය යටතේ රීති සෑදීම අවශ්‍ය විවිධ කරුණු සහ ඒවාට සම්බන්ධ හෝ ආනුෂංගික වෙනත් සියලු කරුණු ;

(ඈ) යම් කාර්යයක් කිරීම සඳහා දරන ලද වියදම් ප්‍රතිපූරණය කිරීමක් වශයෙන් ප්‍රාදේශීය සභාවල සභිකයන්ට සහ නිලධරයන්ට හෝ සේවකයන්ට ගෙවිය යුතු යැපීම් සහ ගමන් දීමනා ප්‍රමාණ ;

(ඉ) ප්‍රාදේශීය සභාවක සභා රැස්වීම්වලට සහභාගී වීම වෙනුවෙන් ප්‍රාදේශීය සභාවේ සභිකයන්ට ගෙවිය යුතු ගමන් ගාස්තු ප්‍රමාණ ;

(ඊ) ප්‍රාදේශීය සභාවක සභාපතිවරයාට, උපසභාපතිවරයාට සහ සභිකයන්ට ගෙවිය යුතු දීමනා ප්‍රමාණ ;

(උ) ප්‍රාදේශීය සභා මගින් කලින් කල අමාත්‍යවරයා වෙත ඉදිරිපත් කළ යුතු වාර වාර්තා ;

(ඌ) ගබඩා භාණ්ඩ සහ උපකරණ ලබා ගැනීම සහ බැහැර කිරීම, භාණ්ඩ ලේඛන පොත් පවත්වාගෙන යාම සහ එවැනි භාණ්ඩ ලේඛන පවත්වාගෙන යා යුතු ආකාරය ;

(එ) පළාත් පාලන සේවයේ සාමාජිකයන් නොවන, ප්‍රාදේශීය සභාවල නිලධරයන් සහ සේවකයන් පත්කිරීම, ඔවුනගේ විනය, සේවය අත්හිටුවීම සහ සේවයෙන් පහ කිරීම ; සහ

(i) ජාතික රාජ්‍ය සභාවේ 1974 අංක 16 දරන පළාත් පාලන සේවා පනතේ අර්ථය ඇතුළත පළාත් පාලන සේවයට අයත් නොවන තනතුරුවලට හා නිලවලට පත් කිරීම් සඳහා අවශ්‍ය සුදුසුකම් ;

(ii) ඒ තනතුරුවලට හෝ නිලවලට නියම කරනු ලබන වැටුප් පරිමාණ;

(iii) ඒ නිලධරයන්ට හෝ සේවකයන්ට දෙනු ලබන නිවාඩු පිළිබඳ නියම සහ කොන්දේසි සහ ඒවායේ කාල සීමාව;

(iv) පළාත් පාලන සේවයේ සාමාජිකයින් නොවන ප්‍රාදේශීය සභාවේ නිලධරයන්ගේ සහ සේවකයන්ගේ ශුභ සිද්ධිය සඳහා අර්ථ සාධක අරමුදල්.

(ඒ) ප්‍රාදේශීය සභාවේ ප්‍රධාන විධායක නිලධරයා වශයෙන් සභාපතිවරයාගේ බලතල සහ කාර්ය ;

(ඔ) 126 (xii) වගන්තිය යටතේ වූ අතුරු ව්‍යවස්ථා අදාළ කිරීමට ඇති යම් ප්‍රදේශයක් වෙන් කිරීමට පෙරාතුව ප්‍රාදේශීය සභාවක් විසින් අනුගමනය කළ යුතු ක්‍රියා මාර්ගය.

(2) මේ වගන්තිය යටතේ අමාත්‍යවරයා විසින් සාදනු ලබන සෑම රීතියක්ම ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු අතර, එසේ පළ කිරීමෙන් පසු හැකිතාක් ඉක්මණින් අනුමතය සඳහා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ යුතු ය.

(3) අමාත්‍යවරයා විසින් සාදනු ලැබූ සෑම රීතියක් ම පාර්ලිමේන්තුව විසින් අනුමත කරනු ලැබූ විට, එම කාරණාවම හෝ ඒ තත් කාර්යයම සඳහා ප්‍රාදේශීය සභාව විසින් සාදනු ලැබ් හෝ සාදනු ලැබූ යයි සලකනු ලබන යම් අතුරු ව්‍යවස්ථාවක් අභිභවා බලාත්මකවිය යුතු ය. ඒ අනුමතය පිළිබඳ නිවේදනය ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු ය.

සභාපතිවරයා ඉවත් කිරීම සහ ප්‍රාදේශීය සභාව විසුරුවා හැරීම.

185. (1) යම් ප්‍රාදේශීය සභාවක සභාපතිවරයා සම්බන්ධයෙන් හෝ සභිකයින් අතුරින් කිසිවකු සම්බන්ධයෙන් හෝ,

(අ) අකාර්යක්ෂමතාව සහ නොමනා පාලනය ; හෝ

(ආ) මේ පනතින් නියම කරන ලද කාර්ය කිරීම නිරතුරුවම ප්‍රතික්ෂේප කිරීම සහ සිතාමතා නොසලකා හැරීම ;

(ඇ) ඒ කාර්ය කිරීමෙහිලා විෂමාචාරය ; හෝ

(ඈ) අමාත්‍යවරයාගේ හෝ කොමසාරිස්වරයාගේ විධාන හෝ උපදෙස් හෝ නිර්දේශ කෙරෙහි නිරතුරුව අකීකරු වීම හෝ නොසැලකිලිමත්වීම ; හෝ

(ඉ) ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයකු විසින් හෝ ප්‍රාදේශීය සභාවේ යම් සාමාජිකයකු විසින් මේ පනතින් පැවරුණු බලතල අනියි ලෙස පාවිච්චි කිරීම.

ගැන ප්‍රමාණවත් සාක්ෂි ඇති බවට කවර වූ හෝ අවස්ථාවක අමාත්‍යවරයා සෑහීමට පත් වන්නේ නම්, ඒ එක් එක් අවස්ථාවේ අවස්ථා ගත කරුණු අනුව අවශ්‍ය වන පරිදි ගැසට් පත්‍රයේ පළකරනු ලබන නියමයක් මගින්, අමාත්‍යවරයා විසින්—

(i) සභාපතිවරයා ධුරයෙන් ඉවත් කරනු ලැබිය හැකිය ; නැතහොත්

(ii) සාමාජිකයන් සියලු දෙනාම හෝ යම් සාමාජිකයකු හෝ ධුරයෙන් ඉවත් කරනු ලැබිය හැකිය ; නැතහොත්,

(iii) ප්‍රාදේශීය සභාව විසුරුවා හරිනු ලැබිය හැකිය ;

තවද, ඒ නියමය හැකිතාක් ඉක්මනින් පාර්ලිමේන්තුව ඉදිරියේ තබනු ලැබිය යුතු ය.

(2) අමාත්‍යවරයා විසින් (1) වන උපවගන්තිය යටතේ නියමයක් කිරීමට පෙර, (1) වන උපවගන්තියේ සඳහන් යම් කාරණයක් සම්බන්ධයෙන් තමා සෑහීමට පත්වනු පිණිස, ඒ කාරණය ගැන මාස තුනක කාල සීමාවක් ඇතුළත පරීක්ෂා කොට වාර්තා කිරීම සඳහා විශ්‍රාමලත් අධිකරණ නිලධරයකු පත් කළ යුතු අතර, එම නිලධරයාට ඒ පරීක්ෂණයට අදාළව, පරීක්ෂණ කොමිෂන් සභා පනත යටතේ පත් කරන ලද පරීක්ෂණ කොමිෂන් සභාවක බලතල තිබිය යුතු ය.

(3) (අ) යම් කාරණයක් ගැන පරීක්ෂා කිරීම සඳහා අමාත්‍යවරයා විසින් (2) වන උපවගන්තිය යටතේ විශ්‍රාමලත් අධිකරණ නිලධරයකු පත් කරනු ලබන විටක, එක් එක් අවස්ථාවේ තත්ත්වයන් අනුව අවශ්‍ය විය හැකි පරිදි, අමාත්‍යවරයා විසින් ගැසට් පත්‍රයෙහි පළකරනු ලබන නියමයන් මගින්,

(i) සභාපතිවරයා, ධුරය දැරීම අත් හිටවා උපසභාපතිවරයාට හෝ, උපසභාපතිවරයාගේ ධුරය පුරප්පාඩු වී ඇති අවස්ථාවක දී හෝ උපසභාපතිවරයා ධුරයෙන් අත්හිටවන ලද අවස්ථාවක, ප්‍රදේශයේ සහකාර කොමසාරිස්වරයාට සභාපතිවරයාගේ බලතල ක්‍රියාත්මක කිරීමටත්, ඔහුගේ කාර්යය ඉටු කිරීමටත්, විධාන කරනු ලැබිය හැකි ය ; නැතහොත්

(ii) සභිකයන් අතුරින් යම් සභිකයකු අත්හිටවනු ලැබිය හැකි ය නැතහොත්

(iii) ප්‍රාදේශීය සභාව අත්හිටවා, එම ප්‍රාදේශීය සභාවේ සහ එහි සභාපතිවරයාගේ බලතල ක්‍රියාත්මක කිරීමටත්, කාර්ය ඉටු කිරීමටත්, ප්‍රදේශයේ සහකාර කොමසාරිස්වරයාට විධාන කරනු ලැබිය හැකි ය.

(ආ) (2) වන උපවගන්තිය යටතේ පත් කරනු ලැබූ තැනැත්තාගේ වාර්තාව ලැබීමෙන් පසු අමාත්‍යවරයා විසින් (1) වන උපවගන්තිය යටතේ නියමයක් කරනු ලැබිය හැකි ය ; නැතහොත් මේ උපවගන්තියේ (අ) ඡේදය යටතේ කරනු ලැබූ නියමය ප්‍රත්‍යාදිෂ්ට කරනු ලැබිය හැකි ය.

(4) (1) වන උපවගන්තිය යටතේ වූ නියමයක් මගින් ප්‍රාදේශීය සභාවක යම් සභිකයකු අමාත්‍යවරයා විසින් ඉවත් කරනු ලබන අවස්ථාවක සභිකයා ඉවත් කරනු ලබන ඒ සභිකයා වෙනුවෙන් පත් කරනු ලබන තම පූර්ව ගාමියාගේ ධුරයෙහි ඉකුත් නොවූ කාලය හෝ කොටස තුළ ධුරය දැරිය යුතු ය.

(5) අමාත්‍යවරයා විසින් (1) වන උපවගන්තිය යටතේ වූ නියමයක් මගින් ප්‍රාදේශීය සභාවක් විසුරුවා හරිනු ලබන අවස්ථාවක ඔහු විසින්, එම නියමයෙන් හෝ තදනන්තර නියමයකින් :—

(අ) ප්‍රාදේශීය සභාවේ කටයුතු පරිපාලනය කිරීම සඳහා සහ ඒ කාර්ය සඳහා, නියමයේ නිශ්චිතව දක්වනු ලබන කොන්දේසි හෝ සීමා කිරීම් වලට යටත්ව, මේ පනත යටතේ ප්‍රාදේශීය සභාවක බලතල ක්‍රියාත්මක කිරීම සහ කාර්ය ඉටු කිරීම සඳහා නියමිත කාල සීමාවකට හෝ කලින් කලට හෝ විශේෂ කොමසාරිස්වරයකු හෝ කොමසාරිස්වරයන් හෝ පත් කරනු ලැබිය හැකි ය. තවද,

(ආ) අවස්ථාවෝචිත යයි තමාට පෙනී යන පරිදි සභිකයින් වැඩි ගණනකින් හෝ අඩු ගණනකින් සමන්විත වූ අළුත් ප්‍රාදේශීය සභාවක් ඒ ප්‍රාදේශීය සභා ප්‍රදේශය සඳහා සංස්ථාපනය කිරීම පිණිස අවශ්‍ය විධාන කරනු ලැබිය හැකි ය.

(6) (5) වන උපවගන්තිය යටතේ, අමාත්‍යවරයා විසින් යම් විශේෂ කොමසාරිස්වරයකු හෝ කොමසාරිස්වරයන් හෝ පත් කරනු ලබන අවස්ථාවක ප්‍රාදේශීය සභාව වෙත සතු කරන ලද සියලු දේපළ සහ ගිවිසුම් යටතේ ඇති හිමිකම් සහ සියලු බලතල එම විශේෂ කොමසාරිස්වරයා හෝ කොමසාරිස්වරයන් වෙත සතු කරනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතු ය. තවද, නියමයෙහි ප්‍රකාශිත කාලසීමාවේ අවසානය දක්වා හෝ අමාත්‍යවරයා විසින් අන්‍යාකාරයකින් විධාන කරනු ලබනතෙක් හෝ ප්‍රාදේශීය සභාවේ සියලු වගකීම් සහ කාර්ය එම විශේෂ කොමසාරිස්වරයා හෝ කොමසාරිස්වරයන් වෙත පවරනු ලැබිය යුතු අතර ඔහු හෝ ඔවුන් විසින් ඒවා ඉටු කරනු ලැබිය යුතු ය.

(7) ප්‍රාදේශීය සභාවක කටයුතු පරිපාලනය විශේෂ කොමසාරිස්වරයකු හෝ කොමසාරිස්වරුන් විසින් අවසන් කිරීමෙන් පසු ඒ ප්‍රාදේශීය සභා ප්‍රදේශය සඳහා අළුත් ප්‍රාදේශීය සභාවක් සංස්ථාපනය කළ අවස්ථාවක, ඒ අළුත් ප්‍රාදේශීය සභාව, අවස්ථාවෝචිත පරිදි, ඒ විශේෂ කොමසාරිස් වරයාගේ හෝ කොමසාරිස්වරුන්ගේ අනුප්‍රාප්තිකයා විය යුතු ය.

අතුරු ව්‍යවස්ථා කඩ කිරීම.

**186.** මේ පනත යටතේ සාදනු ලැබූ හෝ සාදනු ලැබුවේ යැයි යම් ලිඛිත නීතියක් යටතේ සලකනු ලැබූ සෑම අතුරු ව්‍යවස්ථාවක් කඩකිරීමක්ම, ඒ කඩ කිරීම සිදු වූ ප්‍රදේශය කෙරෙහි අධිකරණ බලය ඇති මහේස්ත්‍රාත් අධිකරණය විසින් 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනතින් විධිවිධාන සලසා ඇති ආකාරයට නඩු විභාග කළ හැකි වරදක් විය යුතු ය.

ප්‍රාදේශීය සභා පැහැර හැරීම් ආදිය කරනු ලැබූ විට අමාත්‍යවරයා සතු බලය.

**187.** (1) යම් ප්‍රාදේශීය සභාවක් විසින් මේ පනත යටතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක් යටතේ ප්‍රාදේශීය සභාව වෙත නියම කර ඇති යම් කාර්යයක් ඉටු කිරීම හෝ යම් වැඩක් කිරීම අත්හැර දමා ඇති බව හෝ මේ පනත යටතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක් යටතේ වූ ප්‍රාදේශීය සභාව කාර්ය කිසිවක් කිරීම හෝ එහි වගකීම් කිසිවක් ඉටු කිරීම අන්‍යාකාරයකින් පැහැර හැර ඇති බව අමාත්‍යවරයාට කවර හෝ අවස්ථාවක දී පෙනී යන්නේනම්, අමාත්‍යවරයා විසින් ඒ ප්‍රාදේශීය සභාව වෙත ලිඛිත දැන්වීමක් කරමින් දැන්වීමේ නිශ්චිතව සඳහන් කාලය තුළ, ප්‍රාදේශීය සභාව විසින් පටහැණිව හේතු නොදක්වන්නේනම්, අමාත්‍යවරයා විසින්, එම අත්හැරීම හෝ පැහැර හැරීම පිළිබඳව පරීක්ෂා කර අමාත්‍යවරයාට වාර්තාවක් ඉදිරිපත් කිරීම සඳහා සහ ඒ කාර්ය කිරීම සහ එම වැඩ කර ගෙනයාමේ හෝ එම පැහැර හැරීම යථාවත් කිරීමේ කාර්ය සඳහා ගත යුතු ක්‍රියා මාර්ග පිළිබඳව නිර්දේශ කිරීම සඳහා අමාත්‍යවරයා විසින් යම් තැනැත්තකු හෝ තැනැත්තන් පත් කරනු ලබන බව දැන්විය යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ දෙන ලද දැන්වීම සම්බන්ධයෙන් යම් ප්‍රාදේශීය සභාවක් විසින් යම් හේතුවක් හෝ ප්‍රමාණවත් හේතුවක් හෝ නොදක්වනු ලබන අවස්ථාවක, දැන්වීමෙහි සඳහන් පරීක්ෂණය පැවැත්වීම සඳහා අමාත්‍යවරයා විසින් තැනැත්තකු හෝ තැනැත්තන් පත් කරනු ලැබිය යුතු ය. හැකිතාක් දුරට එම පරීක්ෂණය ප්‍රසිද්ධියේ පවත්වනු ලැබිය යුතු ය.

187 වන වගන්තිය යටතේ වාර්තාව ලැබුණු විට ගත යුතු පියවර, අමාත්‍යවරයා විසින් තීරණය කරනු ලැබිය යුතු බව.

188. (1) 187 වන වගන්තිය යටතේ පරීක්ෂණයක් පැවැත්වීම සඳහා පත් කරන ලද තැනැත්තා හෝ තැනැත්තන්ගේ වාර්තාව ලැබුණුවිට, ප්‍රාදේශීය සභාව අත්හැර දැමූ කාර්යයක් හෝ වැඩක් හෝ පැහැර හැරීම කර ඇත්තේ යම් කාර්යයක් හෝ වැඩක් සම්බන්ධයෙන් ද ඒ කාර්යය කිරීමේ හෝ වැඩය හෝ ඉටු කිරීමේ හෝ කරගෙන යාමේ කාර්යය සඳහා ගත යුතු පියවර අමාත්‍යවරයා විසින් තීරණය කරනු ලැබිය යුතු අතර, ඒ අනුව ප්‍රාදේශීය සභාවට ලිඛිතව කෙරෙන නියමයක් මගින් ඒ පියවර, නියමයෙහි සඳහන් කාලසීමාව ඇතුළත ගනු ලැබිය යුතු යයි ද, මේ පනත යටතේ අයකළ හැකි වරිපනම් බදු හෝ බදු අතුරෙන් එකක් හෝ වැඩිගණනක් අය කිරීමෙන් හෝ ණයක් මගින් ඒ කාර්යය සඳහා අවශ්‍ය මුදල් ලබා ගත යුතු යයි ද නියම කළ යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ කරනු ලැබූ නියමයක නිශ්චිතව දක්වා ඇති කාලසීමාව ඇතුළත දී එම නියමයට අනුකූලව කටයුතු කිරීමට ප්‍රාදේශීය සභාවක් අපොහොසත් වන්නේ නම්, එම නියමයේ නිශ්චිතව දක්වා තිබූ පියවර ගැනීමට අමාත්‍යවරයා විසින් යම් තැනැත්තකු ලිඛිතව පත් කරනු ලැබිය හැකි අතර ලිඛිතව, එම තැනැත්තාට ගෙවිය යුතු පාරිශ්‍රමිකය නියම කිරීම, එම පාරිශ්‍රමිකය සහ අමාත්‍යවරයාගේ නියමයට අනුකූලව ගන්නා ලද පියවර සම්බන්ධ වියදම ද, ප්‍රාදේශීය සභාවේ ප්‍රාදේශීය අරමුදලින් ගෙවීමට හෝ පියවීමට විධාන කිරීම ද කළ හැකි ය. නැතහොත් දැරිය යුතු ය. තවද අවශ්‍යනම්, මේ පනත යටතේ අය කළ හැකි වරිපනම් බදු හෝ බදු එකක් හෝ ඊට වැඩි ගණනක් නියම කිරීම හෝ වැඩි කිරීම සහ අය කිරීම හෝ කළ යුතු යයි ද විධාන කළ හැකි ය.

(3) (2) වන උපවගන්තිය යටතේ අමාත්‍යවරයාගේ විධානයක් ක්‍රියාත්මක කිරීමේ කාර්යය සඳහා, ඒ උපවගන්තිය යටතේ පත් කරනු ලැබූ යම් තැනැත්තකුට,—

(අ) එම විධානයෙන් බලපෑමක් ඇති වූ ප්‍රාදේශීය සභාව විසින් නියම කළ හැකි හෝ වැඩි කළ හැකි සහ අයකළ හැකි වරිපනම් බදු හෝ බදු කිසිවක් නියම කිරීමට හෝ වැඩි කිරීමට සහ අය කිරීමට ; සහ

(ආ) ප්‍රාදේශීය සභාවේ, ප්‍රාදේශීය සභා අරමුදලින් යම් මුදලක් ආපසු ගැනීම සඳහා චෙක්පතක් හෝ ගෙවීම් අණකරයක් අත්සන් කිරීමට හා නිකුත් කිරීමට සහ මුදලක් ආපසු ගැනීමට

බලය තිබිය යුතු අතර, ඒ තැනැත්තාට එම නියමයෙන්, ඔහු විසින් ගෙවීමට හෝ පියවීමට බලය දෙන ලද සියලු මුදල් සහ වියදම් ගෙවීමෙන් හෝ පියවීමෙන් පසු, මේ උපවගන්තිය යටතේ ඔහුගේ බලතල ක්‍රියාත්මක කිරීමේ දී ඔහු විසින් ලබාගන්නා ලද මුදලින් යම් අතිරික්තයක් තිබේ නම්, එම අතිරික්තය ප්‍රාදේශීය සභාවේ ප්‍රාදේශීය සභා අරමුදලට ඔහු විසින් ගෙවනු ලැබිය යුතු ය.

11—ඒ 094615 (86/12)

ණය ලබාගැනීම සඳහා විධාන කිරීමට අමාත්‍යවරයා සතු බලය.

**189.** 188 වන වගන්තියේ (2) වන උපවගන්තිය යටතේ යම් ප්‍රාදේශීය සභා ප්‍රදේශයක් සම්බන්ධයෙන් පත් කරනු ලැබූ තැනැත්තකුට, එම ප්‍රාදේශීය සභා ප්‍රදේශ සීමා තුළ යම් වරිපනම් බදු හෝ බදු නියම කිරීම හෝ වැඩි කිරීම හා අය කිරීමට අමතරව, හෝ ඒ වෙනුවට, ඒ වගන්තිය යටතේ යම් කාර්යයක් ඉටුකිරීමේ හෝ යම් වැඩක් ක්‍රියාත්මක කිරීමේ හෝ යම් පැහැර හැරීමක් යථාවත් කිරීමේ කාර්ය සඳහා ඒ ප්‍රාදේශීය සභා ප්‍රදේශයේ යම් වරිපනම් බදු හෝ බදු ආදියෙහි ඇපය මත ප්‍රාදේශීය ණය සහ සංවර්ධන කොමසාරිස්වරුන් ගෙන් ණයක් ලබාගත යුතු යයි අමාත්‍යවරයා විසින් විධාන කරනු ලැබිය හැකි ය.

වියදම් සහතික කිරීමේ බලය.

**190.** 188 වන වගන්තියේ (2) වන උපවගන්තිය යටතේ පත් කරනු ලැබූ යම් තැනැත්තකු විසින් දරන ලද වියදම් ප්‍රමාණය හෝ දැරීමට සිදුවන වියදම් වල ඇස්තමේන්තුව සහ දැනටමත් දරා ඇති හෝ දැරීමට සිදුවේ යයි ඇස්තමේන්තු කර ඇති මුදල පියවීමේ කාර්යය සඳහා ලබා ගැනීමට අවශ්‍ය යම් ණය මුදල් ප්‍රමාණය අමාත්‍යවරයා විසින් කලින් කල සහතික කරනු ලැබිය හැකි ය. තවද, අමාත්‍යවරයාගේ සහතිකය අදාළ වන්නා වූ සියලු කරුණු සම්බන්ධයෙන්, එම සහතිකය අවසානාත්මක විය යුතු ය.

ණය අත්තිකාරම් කිරීම සඳහා ප්‍රාදේශීය ණය කොමසාරිස් වරුන් සතු බලය.

**191.** (1) යම් ප්‍රාදේශීය සභාවක් සම්බන්ධයෙන් අවශ්‍ය විය යුතු ණයක් අමාත්‍යවරයා විසින් 188 වන වගන්තිය යටතේ සහතික කරනු ලබන කවර හෝ විටක දී ද, ප්‍රාදේශීය ණය සහ සංවර්ධන කොමසාරිස්වරුන් විසින්, පළාත් පාලන කොමසාරිස්වරයාට හෝ 188 වන වගන්තියේ (2) වන උපවගන්තිය යටතේ පත් කරනු ලැබූ තැනැත්තාට හෝ වෙනත් යම් ඇපයක් නොඉල්ලා ඒ ප්‍රාදේශීය සභා ප්‍රදේශයේ සීමා ඇතුළත යම් වරිපනම් බදු වල හෝ බදුවල ඇපය මත ඒ ණය මුදල් ප්‍රමාණය දෙනු ලැබිය හැකි ය.

(2) පළාත් පාලන කොමසාරිස්වරයා හෝ 188 වන වගන්තියේ (2) වන උපවගන්තිය යටතේ පත් කරනු ලැබූ තැනැත්තා විසින් ප්‍රාදේශීය සභාවක් සඳහා ලබාගත් (1) වන උපවගන්තියේ සඳහන් ණය මුදලක් සඳහා ඇප වශයෙන් ඒ ප්‍රදේශයේ යම් වරිපනම් බදු හෝ බදු උකස් තැබිය හැකි අතර ඒ උකස ප්‍රාදේශීය සභාව විසින් කරන ලද පරිද්දෙන්ම බලාත්මක විය යුතුය.

මුල් මුදල සහ පොලිය ප්‍රාදේශීය සභාවෙන් අයකර ගැනීම.

**192.** (1) යම් ප්‍රාදේශීය සභා ප්‍රදේශයක සීමා තුළ මේ කොටස යටතේ වැය කරන ලද හෝ වැය කිරීමට ඇති වියදම් කිසිවක් ගෙවීම සඳහා ගනු ලැබූ යම් ණයක් සම්බන්ධයෙන් ගෙවිය යුතු මුල් මුදල සහ පොලිය, ඒ ප්‍රාදේශීය සභාවෙන් අයවිය යුතු ණයක් ලෙස සැලකිය යුතු අතර, වෙනත් ප්‍රතිකර්ම වලට අමතරව, ප්‍රාදේශීය ණය සහ සංවර්ධන ආඥාපනතින් විධිවිධාන සලස්වා ඇති ආකාරයට ඒ ණය අයකරගනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තියෙහි සඳහන් පරිදි යම් ප්‍රාදේශීය සභාවක් සම්බන්ධයෙන් වූ වියදම් ගෙවීමෙන් පසු ණය මුදලකින් යම් මුදල් ප්‍රමාණයක් අතිරික්ත වේ නම්, අමාත්‍යවරයා විසින් ඒ අතිරික්තය සහතික කරනු ලැබීමෙන් පසු, ඒ අතිරික්තය ප්‍රාදේශීය සභා අරමුදලට ගෙවනු ලැබිය යුතු ය.

පළාත් පාලන කොමසාරිස්වරයාගේ බලතල හෝ කාර්ය සහකාර කොමසාරිස්වරයාට පවරනු ලැබීම.

**193.** මේ පනත මගින් හෝ ඒ යටතේ පළාත් පාලන කොමසාරිස්වරයා වෙත සතු කරනු ලැබූ හෝ නියම කරනු ලැබූ හෝ පවරනු ලැබූ යම් බලයක්, කාර්යයක් හෝ කර්තව්‍යයක් කොමසාරිස්වරයා විසින් ඒ සම්බන්ධයෙන් සාමාන්‍යයෙන් හෝ විශේෂයෙන් ලිඛිතව බලය දෙනු ලැබූ යම් සහකාර කොමසාරිස්වරයකු විසින් කොමසාරිස්වරයාගේ විධිවිධානවලට සහ පාලනය යට යටත් ව, ඒ ලිඛිත බලය දීමෙහි නිශ්චිතව සඳහන් කරනු ලැබිය හැකි යම් කාලසීමාවක් තුළ සඳහා සහ ඒ ප්‍රමාණයට ක්‍රියාත්මක කිරීම හෝ ඉටු කිරීම හෝ සපුරාලීම කරනු ලැබිය හැකි ය.

**194.** අමාත්‍යවරයා විසින් ප්‍රාදේශීය සභාවක යම් කටයුත්තකට අදාළ වන්නා වූ යම් පොතක් හෝ ලේඛනයක් තමාගේ පරීක්ෂාව සඳහා එවන මෙන් ඒ ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයාට ලිඛිතව විධාන කරනු ලැබිය හැකි ය.

ප්‍රාදේශීය සභාවක යම් පොතක් හෝ ලේඛනයක් ගෙන්වා පරීක්ෂා කිරීමට අමාත්‍යවරයා සතු බලය.

**195.** අමාත්‍යවරයා හෝ කොමසාරිස්වරයා විසින්—

ප්‍රතිපත්ති සම්බන්ධයෙන් නිර්දේශ කිරීමට ඇති බලය.

(අ) මහජන සෞඛ්‍යයේ හෝ ආරක්ෂාවේ යහපත සඳහා යම් ප්‍රාදේශීය සභාවක් මගින් පාලනය වන ප්‍රදේශය ඇතුළත ගනු ලැබිය යුතු ය යි අමාත්‍යවරයා හෝ කොමසාරිස්වරයා අදහස් කරන යම් වැඩ පිළිවෙලක්, ප්‍රාදේශීය සභාවෙ දැන ගැනීම සඳහා ඉදිරිපත් කරනු ලැබිය හැකි ය ; නැතහොත්

(ආ) අමාත්‍යවරයාගේ හෝ කොමසාරිස්වරයාගේ මතය අනුව, යම් ප්‍රාදේශීය සභාවක් විසින් එහි ප්‍රතිපත්ති, පොදුවේ ශ්‍රී ලංකාවේ හෝ ශ්‍රී ලංකාවේ කවර හෝ කොටසක හෝ බලපවත්නා පරිපාලන ප්‍රතිපත්තිය හා සමඟ සමායෝජනය කිරීම යෝග්‍ය වන්නා වූ පරිපාලන ප්‍රතිපත්තිය පිළිබඳ යම් පොදු ප්‍රශ්නයක් ප්‍රාදේශීය සභාවේ දැන ගැනීම සඳහා ඉදිරිපත් කරනු ලැබිය හැකි ය.

**196.** (1) අමාත්‍යවරයා හෝ කොමසාරිස්වරයා හෝ ඒ වෙනුවෙන් අමාත්‍යවරයා හෝ කොමසාරිස්වරයා විසින් සාමාන්‍යයෙන් හෝ විශේෂයෙන් බලය දෙනු ලැබූ යම් තැනැත්තකු විසින්—

අමාත්‍යවරයාගේ සහ කොමසාරිස්වරයාගේ බලතල.

(අ) ප්‍රාදේශීය සභාවක් මගින් හෝ එහි පාලනය යටතේ භාවිත කරන හෝ පදිංචිව සිටින, යම් පොදු ගොඩනැගිල්ලක්, නිශ්චල දේපළක් හෝ ආයතනයක් නැතහොත්, ප්‍රාදේශීය සභාවේ විධානය යටතේ කරගෙන යන යම් වැඩක් පරීක්ෂා කරනු ලැබිය හැකිය ;

(ආ) ප්‍රාදේශීය සභාවේ සන්තකයට හෝ පාලනයට යටත් ව ඇති පොත් හෝ ලේඛන කිසිවක් ඉල්ලා සිටීම හා පරීක්ෂා කිරීම හෝ භාරයට ගැනීම කරනු ලැබිය හැකි ය ;

(ඇ) යම් ප්‍රාදේශීය සභාවක මුදල් හෝ දේපළ කිසිවක් භාර දී ඇති හෝ ඒ සම්බන්ධ ආධිපත්‍යයක් ඇති යම් තැනැත්තකුට ඒ මුදල් හෝ දේපළ පරීක්ෂා කිරීම සඳහා හෝ සත්‍යායනය කිරීම සඳහා ඉදිරිපත් කරන ලෙස විධාන කරනු ලැබිය හැකිය ;

(ඈ) ප්‍රාදේශීය සභාවේ පරිපාලනයට අදාළ යම් කාරණයක් සම්බන්ධයෙන් හෝ, ප්‍රාදේශීය සභාව මේ පනත හෝ වෙනත් යම් නීතියක් යටතේ වූ බලතල ක්‍රියාවේ යෙදවීම හා කාර්ය හා කර්තව්‍ය ඉටු කිරීම සම්බන්ධයෙන් පරීක්ෂා කරනු ලැබිය හැකි ය ;

(ඉ) ප්‍රාදේශීය සභාවට හෝ එහි යම් කාරක සභාවකට අදාළ වන්නා වූ ප්‍රකාශ, ගිණුම්, වාර්තා හෝ ලේඛනවල පිටපත් ඉදිරිපත් කිරීමට යම් ප්‍රාදේශීය සභාවකට නියම කරනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ පොත්, ලේඛන, මුදල් හෝ දේපළ කිසිවක් හෝ ප්‍රකාශ, ගිණුම්, වාර්තා හෝ ලේඛනවල පිටපත් කිසිවක් ඉදිරිපත් කිරීමට නියම කරනු ලැබූ විට, එසේ කිරීම නොසලකා හරින

හෝ එසේ ඉදිරිපත් කිරීම ප්‍රතික්ෂේප කරන යම් තැනැත්තකු වරදකට වරද කරු වන අතර, වරදකරු කිරීමේ දී රුපියල් එක් සියයක් නොඉක්මවන දඩයකට යටත් විය යුතු ය. තවද, ඒ වරදකරු කිරීමෙන් පසු එම වරද කරගෙන යන එක් එක් දිනය සඳහා රුපියල් පණහක් නොඉක්මවන වැඩිපුර දඩයකට යටත් විය යුතු ය.

කොමසාරිස් වරයාගේ අතිරේක බලතල.

197. කොමසාරිස්වරයාට හෝ ඒ වෙනුවෙන් බලය දෙනු ලැබූ යම් නිලධරයකුට යම් ප්‍රාදේශීය සභා ප්‍රදේශයක සීමා ඇතුළත ප්‍රාදේශීය සභාවේ නිලධරයන් මෙන්ම ඔවුන්ගේ ඒ ඒ බලතල ක්‍රියාත්මක කිරීමෙහි සහ ඉටුකිරීමෙහි ලා අවශ්‍ය බලතල සහ අධිකාරිය තිබිය යුතු ය :

එසේ වුව ද, මේ වගන්තිය යටතේ ස්වකීය බලතල සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ දී සහ ඉටු කිරීමේ දී, කොමසාරිස්වරයා හෝ බලයලත් නිලධරයා විසින් ඒ ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා විමසා ක්‍රියා කරනු ලැබිය යුතු ය.

පාරක් හෝ පටු මගක් නම් කිරීම.

198. අමාත්‍යවරයා විසින් සිය මෙහෙයීමෙන් හෝ ඒ වෙනුවෙන් ප්‍රාදේශීය සභාවක් විසින් කරනු ලැබූ ඉල්ලීමක් මත, ප්‍රාදේශීය සභා ප්‍රදේශයේ යම් පාරක් හෝ පටු මගක් හැඳින්විය යුතු නාමය තීරණය කරනු ලැබිය යුතු අතර, ඒ ආකාරයටම කවර හෝ අවස්ථාවක දී යම් පාරක් හෝ පටු මගක නාමය වෙනස් කළ හැකි ය.

## VIII වන කොටස

### සාමාන්‍ය කරුණු

### ගාස්තු සහ වියදම් අය කර ගැනීම

අයිතිකරු හෝ පදිංචිකරු විසින් කරන ලද පැහැර හැරීමක දී වැඩ ක්‍රියාත්මක කර, වියදම් අයකර ගැනීම සඳහා ප්‍රාදේශීය සභාවක් සතු බලය.

199. මේ පනතේ හෝ වෙනත් යම් ප්‍රඥප්තියක හෝ ඒ යටතේ සාදනු ලැබූ යම් අතුරු ව්‍යවස්ථාවක, රීතියක හෝ නියෝගයක විධිවිධාන යටතේ, යම් නිවාසයක, ගොඩනැගිල්ලක හෝ ඉඩමක අයිතිකරු හෝ පදිංචි කරු විසින් ක්‍රියාත්මක කළ යුතු යම් වැඩක් කරන ලෙස ප්‍රාදේශීය සභාවක් විසින් නියම කරනු ලැබ, එම වැඩය ක්‍රියාත්මක කිරීමේදී යම් පැහැර හැරීමක් සිදුවී ඇති කවර හෝ විටක දී එම පැහැර හැරීම සම්බන්ධයෙන් යම් දණ්ඩනයක් නියම කර තිබුණ ද නොතිබුණ ද ප්‍රාදේශීය සභාව විසින් එම වැඩය ක්‍රියාත්මක කිරීමට සැලැස්විය හැකි අතර, ඒ වෙනුවෙන් ප්‍රාදේශීය සභාව විසින් දරන ලද වියදම්, එම වැඩය ක්‍රියාත්මක කළ යුතුව සිටි තැනැත්තා විසින් ගෙවිය යුතු අතර, මේ කොටසින් විධිවිධාන සලසා ඇති පරිදි එය අයකර ගනු ලැබිය යුතු ය.

පදිංචිකරුගෙන් ගාස්තු අයකර ගැනීමේ බලය සහ ඔහුට එම ගාස්තු තම කුලියෙන් අඩුකර ගතහැකි බව.

200. (1) 199 වන වගන්තියෙහි සඳහන් යම් පැහැර හැරීමක් කරන තැනැත්තා නිවාසයේ, ගොඩනැගිල්ලේ හෝ ඉඩමේ අයිතිකරු වූයේ නම්, ප්‍රාදේශීය සභාව විසින් අතිරේක ප්‍රතිකර්මයක් වශයෙන් එම අයිතිකරුට විරුද්ධව යම් නඩුවක් හෝ නඩු කටයුත්තක් ඉදිරිපත් කර හෝ අවරා තිබුණද නොතිබුන ද, තත්කාලයේ අයිතිකරු විසින් ගෙවිය යුතු වියදම් වලින් සියල්ලම හෝ ඉන් යම් කොටසක් හෝ ඒ අවස්ථාවේ දී හෝ ඊට පසු යම්කිසි අවස්ථාවක දී එම අයිතිකරු යටතේ එම නිවාසයේ ගොඩනැගිල්ලේ හෝ ඉඩමේ පදිංචි ව සිටින තැනැත්තා ගෙවිය යුතු යයි නියම කරනු ලැබිය හැකිය.

(2) (1) වන උපවගන්තියෙහි සඳහන් සියලුම වියදම් හෝ එයින් යම් කොටසක් හෝ පදිංචිකරුගෙන් ඉල්ලා සිටි විට එය ගෙවීම පැහැර හැරිය හොත්, එම පදිංචිකරුගේ බඩු බාහිරාදිය තහනමට ගැනීමෙන් එම මුදල අයකර ගනු ලැබිය යුතු ය.

(3) ප්‍රාදේශීය සභාව විසින් දරනු ලැබූ වියදම් කිසිවක් සම්බන්ධයෙන් වූ යම් මුදලක් (1) වන උපවගන්තිය හෝ (2) වන උපවගන්තිය යටතේ පදිංචිකරු විසින් ගෙවනු ලැබූ හෝ ඔහුගෙන් අය කර ගනු ලැබූ අවස්ථාවක පදිංචිකරුට ඒ මුදල, ඔහු විසින් ගෙවනු ලබන කුලියෙන් අඩුකර ගැනීමට සහ ඒ මුදල සම්පූර්ණයෙන් තමා වෙත ආපසු ලබාගන්නා තුරු නිවාසයේ, ගොඩනැගිල්ලේ හෝ ඉඩමේ සන්තකය රඳවා තබා ගැනීමට හිමිකම තිබිය යුතු ය.

ගෙවිය යුතු කුලී ප්‍රමාණයට වඩා වැඩි මුදලක් ගෙවීමට පදිංචි කරුවන් යටත් නොවන බව.

**201.** (1) මේ පනත මගින් හෝ වෙනත් යම් ප්‍රඥප්තියක් මගින් හෝ ඒ යටතේ සාදන ලද යම් අතුරු ව්‍යවස්ථාවක්, රීතියක් නැතහොත් නියෝගයක් මගින් යම් නිවසක, ගොඩනැගිල්ලක හෝ ඉඩමක අයිතිකරුගෙන් අය කරනු ලැබූ වියදම් කිසිවකට අදාළව යම් පදිංචිකරුවකු වෙත ඉල්ලීමක් කරනු ලැබූ අවස්ථාවේ දී ඒ වියදම් අදාළ ස්ථානය සඳහා ගෙවිය යුතුව ඇති හෝ එවැනි ඉල්ලීමක් ඔහු වෙත ඉදිරිපත් කිරීමෙන් පසු ඒ ස්ථානයේ අයිතිකරුට උපචිත වී ඇති හා පදිංචිකරු විසින් ගෙවිය යුතු වී ඇති කුලියට වැඩි මුදලක්, ගෙවීමට, ප්‍රාදේශීය සභාව විසින් තත් කාර්යය සඳහා ඔහු වෙත කරනු ලැබූ ඉල්ලීමක් ප්‍රකාර ඔහුගේ කුලී ප්‍රමාණය සහ ඒ කුලිය ගෙවනු ලැබිය යුතු තැනැත්තාගේ ලිපිනය සත්‍ය වශයෙන් අනාවරණය කිරීම ඔහු විසින් නොසලකා හරිනු ලැබුව හොත් මිස, යම් නිවාසයක, ගොඩනැගිල්ලක හෝ ඉඩමක කිසිම පදිංචිකරුවකු බැඳී නොසිටිය යුතු ය.

(2) යම් පදිංචිකරුවකුගෙන් ඉල්ලා සිටි මුදල, ඒ ඉල්ලීම කළ අවස්ථා වේදී ඔහුගෙන් අයවිය යුතුව තිබූ හෝ ඉන්පසු උපචිත වූ කුලියට වඩා විශාල බව ඔප්පු කිරීමේ භාරය පදිංචිකරු වෙත පැවතිය යුතු ය.

(3) ඉහත කී යම් වැඩ පිළිබඳ වූ වියදම් ගෙවීම සම්බන්ධයෙන් යම් අයිතිකරුවකු සහ පදිංචිකරුවකු අතර ඇතිකර ගත් යම් විශේෂ ගිවිසුමකට මෙහි ඇතුළත් කිසිවක් බලපාන්නේ යයි නොසැලකිය යුතු ය.

අයිතිකරු පැහැර හැරීමක් කළ විට පදිංචිකරුවකුට වැඩ ක්‍රියාත්මක කර, කුලියෙන් වියදම් අඩුකර ගත හැකි බව.

**202.** (1) තමා විසින් ක්‍රියාත්මක කළ යුතු යයි නියම කරනු ලැබූ යම් වැඩක් ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් යම් නිවාසයක, ගොඩනැගිල්ලක හෝ ඉඩමක අයිතිකරු විසින් පැහැර හැරීමක් කරනු ලැබූ කවර හෝ විටක දී ඒ නිවාසයේ, ගොඩනැගිල්ලේ හෝ ඉඩමේ පදිංචිකරු විසින්, ප්‍රාදේශීය සභාවේ අනුමැතිය ඇතිව ඒ වැඩ ක්‍රියාත්මක කිරීමට සැලැස්විය යුතු අතර, ඊට වැය වූ වියදම් අයිතිකරු විසින් ඔහුට ගෙවනු ලැබිය යුතු ය. නැතහොත් ඔහුගෙන් ඒ අයිතිකරුට කලින් කලට අයවිය යුතු ගෙවල් කුලියෙන් ඒ මුදල අඩු කර ගනු ලැබිය හැකි ය.

(2) යම් නිවාසයක, ගොඩනැගිල්ලක හෝ ඉඩමක අයිතිකරු එහි පදිංචිකරුට (1) වන උපවගන්තිය මගින් විධිවිධාන සලස්වා ඇති පරිදි පදිංචිකරු විසින් ඒ උපවගන්තිය යටතේ දරන ලද වියදම් කිසිවක් සම්පූර්ණයෙන් ම ගෙවා අවසන් වන තෙක් හෝ අඩුකර ගනු ලබන තෙක් එම පදිංචිකරු එයින් නෙරපීමට හිමිකමක් නොතිබිය යුතු ය.

පදිංචි කරුවන් විසින් අවහිර කිරීම.

**203.** මේ පනතේ විධිවිධාන යටතේ හෝ ඒ යටතේ සාදන ලද යම් අතුරු ව්‍යවස්ථාවක් යටතේ හෝ යම් නිවාසයක්, ගොඩනැගිල්ලක් හෝ ඉඩමක් සම්බන්ධයෙන් වූ යම් විධිවිධානයක් ක්‍රියාත්මක කිරීමට තමා අදහස් කරන බව එහි පදිංචිකරුට අයිතිකරු විසින් දැන්වීමක් දීමෙන් පසු යම් නිවාසයක, ගොඩනැගිල්ලක හෝ ඉඩමක පදිංචිකරු විසින් එහි අයිතිකරු වළක්වන්නේ නම්, ඒ බව ප්‍රාදේශීය සභාවට ඔප්පු කරනු ලැබූ විට සහ අයිතිකරු විසින් කරනු ලබන ඉල්ලීමක් මත මේ පනතේ

විධිවිධාන හෝ ඒ යටතේ සාදන ලද යම් අතුරු ව්‍යවස්ථාවක විධිවිධාන බලගැන්වීම සඳහා අවශ්‍ය කටයුතු කිරීම සඳහා අවශ්‍ය විය හැකි එම නිවාසය, ගොඩනැගිල්ල සහ ඉඩම සම්බන්ධයෙන් වූ ඒ වැඩ ක්‍රියාත්මක කිරීමට අයිතිකරුට ඉඩදෙන ලෙස එම පදිංචිකරුට නියම කරමින් ලිඛිත නියමයක් කරනු ලැබිය හැකි අතර, සුදුසු යයි සභාව අදහස් කරන්නේ නම්, එම ඉල්ලීම හෝ නියමයට අදාළ වන්නා වූ වියදම අයිතිකරුට ගෙවීමට පදිංචිකරුට නියම කළ හැකිය. තවද, නියමයේ දින සිට දින අටක් ඉකුත්වීමෙන් පසුවත්, ඒ වැඩ ක්‍රියාත්මක කිරීම සඳහා ඒ අයිතිකරුට අවසර දීම ප්‍රතික්ෂේප කිරීම ඒ පදිංචිකරු දිගටම කරගෙන යන්නේ නම්, ඒ ප්‍රතික්ෂේප කිරීම එසේ කරගෙන ගිය සෑම දිනයක් සඳහාම රුපියල් පන්සියයකට නොවැඩි දඩයකින් දඬුවම් කළ හැකි වරදකට ඒ පදිංචිකරු වරදකරු විය යුතු අතර, ඒ ප්‍රතික්ෂේප කිරීමේ කාලය තුළ ඒ නිසා තොවේ නම් ඒ වැඩ ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් අයිතිකරු ඔහු කළ පැහැර හැරීම හේතු කොටගෙන ඔහු යටත් විය හැකිව තිබුණු දණ්ඩන කිසිවකින් ඔහු නිදහස් කරනු ලැබිය යුතු ය.

අයිතිකරු හෝ පදිංචිකරු වියදම නොගෙවන්නේ නම්, ප්‍රතිකර්මය.

**204.** ප්‍රාදේශීය සභාව විසින් දරන ලද වියදම්, යම් නිවාසයක, ගොඩනැගිල්ලක හෝ ඉඩමක අයිතිකරු හෝ පදිංචිකරු නොගෙවන්නේ නම්, වියදම් ප්‍රමාණය, වියදම් දරන ලද්දේ යම් නිවාසයක්, ගොඩනැගිල්ලක් හෝ ඉඩමක් සම්බන්ධයෙන් ද ඒ නිවාසය, ගොඩනැගිල්ල හෝ ඉඩම මත වැය බරක් වන අතර, ප්‍රාදේශීය සභාවට අයවිය යුතු ණයක් වශයෙන් ගෙවනු ලැබිය යුතු ය.

අලාභ, ගාස්තු ආදිය නිශ්චය කිරීම සහ ආපසු අයකර ගැනීම.

**205.** මෙහි අන්‍යාකාරයකින් විධිවිධාන සලස්වා ඇති පරිදි හැර, මේ පනතේ හෝ වෙන යම් ප්‍රඥප්තියක හෝ ඒ යටතේ සාදන ලද යම් අතුරු ව්‍යවස්ථාවක, රීතියක විධිවිධාන යටතේ අලාභ, ගාස්තු හෝ වියදම් ගෙවිය යුතු සියලු අවස්ථාවලදී ප්‍රාදේශීය සභාව විසින් හෝ ඒ අලාභය, ගාස්තු හෝ වියදම් ලැබිය යුතු වෙනත් යම් තැනැත්තකු විසින්, ප්‍රාදේශීය අධිකරණ බලය ඇති මහෙස්ත්‍රාත් අධිකරණය වෙත තත් කාර්යය සඳහා ඉල්ලීමක් කරනු ලැබූ විට, ආරාවුලට පාත්‍ර වී ඇති මුදලේ ප්‍රමාණය සහ, අවශ්‍ය නම්. ඒ මුදලේ බෙදා වෙන් කළ යුතු කොටස ඒ මහේස්ත්‍රාත්වරයා විසින් නිශ්චය කොට තීරණය කරනු ලැබිය යුතු ය.

අලාභ අයකර ගැනීම.

**206.** 205 වන වගන්තිය යටතේ මහෙස්ත්‍රාත්වරයා විසින් නිශ්චය කරන ලද අලාභ, ගාස්තු හෝ වියදම් ප්‍රමාණය, එම වියදම් ප්‍රමාණය ගෙවීමට යටත් තැනැත්තා විසින්, ඉල්ලීම කිරීමෙන් පසු දින හතක් ඇතුළත ගෙවනු නොලැබුවහොත්, ගෙවීම පැහැර හැරීම ඒ මහෙස්ත්‍රාත්වරයා වෙත වාර්තා කරනු ලැබිය හැකි අතර, ඒ මුදල ඒ මහෙස්ත්‍රාත්වරයා විසින් නියම කරන ලද දඩයක ආකාරයෙන් අය කරනු ලැබිය යුතු ය.

පෞද්ගලික දේපළ වැඩි දියුණු කිරීම වෙනුවෙන් වියදම් අය කර ගැනීම.

**207.** මේ පනත හෝ වෙන යම් ප්‍රඥප්තියක් හෝ ඒ යටතේ සාදන ලද යම් අතුරු ව්‍යවස්ථාවක් හෝ රීතියක් යටතේ යම් නිවාසයක, ගොඩනැගිල්ලක හෝ ඉඩමක අයිතිකරු විසින් ක්‍රියාත්මක කරනු ලැබීමට හෝ කිරීමට නියමිත වැඩ අතුරෙන් යම් වැඩක් ක්‍රියාත්මක කිරීමේ දී හෝ ක්‍රියා අතුරෙන් යම් ක්‍රියාවක් කිරීමේ දී ප්‍රාදේශීය සභාවක් වියදම් කිසිවක් දරන අවස්ථාවක, සභාව විසින් ඒ වැය වූ මුදල 205 වන වගන්තියෙහි විධිවිධාන සලස්වා ඇති ආකාරයට අය කිරීම හෝ, සුදුසු යයි සභාව සලකන්නේ නම්, අවුරුදු පහකට නොවැඩි කාලයක් තුළ දී වර්ෂයකට සියයට නවයක පොළී ප්‍රමාණයක් සහිතව වැය වූ මුළු මුදල පියවීමට ප්‍රමාණවත් වන්නා වූ යම් මුදල් වාරික

වලින් ගෙවීම සඳහා අයිතිකරු විසින් දෙන ලද යම් පොරොන්දුවක් පිළිගැනීම, සභාව විසින් කරනු ලැබිය හැකි අතර, ඒ මුදල් අය විය යුතු විට, මේ පනත යටතේ ගෙවිය යුතු වරිපනම් බදු අය කර ගනු ලැබිය හැකි ක්‍රියා පිළිවෙලටම අයකර ගනු ලැබිය හැකි ය.

### වන්දි ගෙවීම

ප්‍රාදේශීය සභා විසින් ප්‍රාදේශීය සභා අරමුදලින් වන්දි ගෙවනු ලැබිය හැකි බව.

**208.** මේ පනත යටතේ සහ මේ පනත ප්‍රකාර හෝ ඒ යටතේ සාදන ලද යම් අතුරු ව්‍යවස්ථාවක් යටතේ සහ ඒ ප්‍රකාර ප්‍රාදේශීය සභාව එහි නිලධරයන් හෝ සේවකයන් වෙත සතු කරන ලද බලතල කිසිවක් ක්‍රියාත්මක කිරීමේ හේතුවෙන් යම් අලාභයක් විඳීමට සිදු වූ සියලු තැනැත්තන්ට ප්‍රාදේශීය සභාවක් විසින් ප්‍රාදේශීය සභා අරමුදලින් වන්දි ගෙවනු ලැබිය හැකි ය.

වන්දිය තීරණය කිරීම සහ ගෙවීම.

**209.** මෙහි මින් මතු අන්‍යාකාරයකින් විධිවිධාන සලසනු ලැබ ඇති පරිදි හැර මේ පනතින් හෝ ඒ යටතේ සාදන ලද යම් අතුරු ව්‍යවස්ථාවකින් වන්දි ගෙවීමට විධාන කර ඇති සියලු අවස්ථාවල දී යම් ආරාවුලක් සම්බන්ධයෙන් වන විට වන්දි මුදල් ප්‍රමාණය සහ අවශ්‍ය වෙතොත් ඒ වන්දියේ බෙදා වෙන් කිරීම 205 වන වගන්තිය යටතේ අලාභ ගාස්තු හෝ වියදම් සඳහා හිමිකම් පදනමක් තීරණය කෙරෙන ආකාරයෙන්ම තීරණය කරනු ලැබිය යුතු අතර ඒ වගන්තියේ විධිවිධාන, අවශ්‍ය සුළු වෙනස් කිරීම් සහිතව, මේ වගන්තිය යටතේ සියලු ප්‍රශ්න තීරණය කිරීමෙහි ලා අදාළ විය යුතු ය.

### කාර්ය පටිපාටිය සහ නඩු කටයුතු

දැන්වීම භාරදීම.

**210.** (1) මේ පනත යටතේ හෝ ඒ යටතේ සාදන ලද යම් අතුරු ව්‍යවස්ථාවක් යටතේ භාර දෙනු ලැබීමට නියමිත හෝ බලය දෙන යම් දැන්වීමක්, නියමයක් හෝ වෙනත් ලේඛනයක් එහි ලිපිනය ලියා ඇත්තේ යම් තැනැත්තකුට ද ඒ තැනැත්තාගේ පදිංචි ස්ථානය වෙත හෝ එහි දී හෝ දීමෙන් එය භාර දෙනු ලැබිය හැකි ය. නැතහොත් එහි ලිපිනය ලියා ඇත්තේ යම් ස්ථානයක අයිතිකරුට හෝ එහි පදිංචිකරුට නම් ලේඛනය හෝ එහි සත්‍ය පිටපතක් ඒ ස්ථානයේ සිටින යම් තැනැත්තකුට දීමෙන් හෝ එය දීමට ඒ ස්ථානයෙහි යම් තැනැත්තකු නොමැති නම්, ඒ ස්ථානයෙහි යම් ප්‍රකට කොටසක ඒ ලේඛනය ඇලවීමෙන් එය භාර දෙනු ලැබිය හැකි ය.

(2) යම් දැන්වීමක්, නියමයක් හෝ වෙනත් ලේඛනයක් ලියාපදිංචි තැපැල් මගින් ද භාර දෙනු ලැබිය හැකි අතර එසේ භාර දෙනු ලැබුයේ නම් එය ඇතුළත් ලිපිය සාමාන්‍ය තැපැල් කටයුතු කිරීමෙන් භාර දෙනු ලැබූ වේලාවේ දී භාර දෙනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතු ය. එය එසේ භාර දෙනු ලැබූ බව ඔප්පු කිරීමේ දී දැන්වීම, නියමය හෝ වෙනත් ලේඛනය නිසි ලෙස ලිපිනය ලියා තැපැලට දැමූ බව ඔප්පු කිරීම ප්‍රමාණවත් විය යුතු ය.

(3) යම් ස්ථානයක අයිතිකරුට හෝ පදිංචිකරුට දෙනු ලැබීමට මේ පනතින් නියමිත යම් දැන්වීමක්, නියමයක් හෝ වෙනත් ලේඛනයක් ඒ දැන්වීම දෙනු ලබන්නේ යම් ස්ථානයක් සම්බන්ධයෙන් ද ඒ ස්ථානයේ (නම සඳහන් කර) "අයිතිකරු" හෝ "පදිංචිකරු" විස්තරයක් මගින් වැඩිදුර නමක් හෝ විස්තරයක් නොමැතිව, ලිපිනය දක්වනු ලැබිය හැකි ය.

ලේකම් විසින් හෝ තත් කාර්ය සඳහා බලය දෙනු ලැබූ වෙනත් යම් නිලධරයකු විසින් දන්වීම් දීම හෝ භාරගැනීම කරනු ලැබිය හැකි බව.

**211.** ප්‍රාදේශීය සභාවක් විසින් හෝ එහි යම් නිලධරයකු විසින් හෝ දීමට හෝ භාර ගැනීමට බලය දෙනු ලැබූ හෝ නියමිත වූ සියළු දන්වීම් සහ ප්‍රාදේශීය සභාව විසින් දීමට හෝ භාර ගැනීමට අන්‍යාකාරයකින් සිදු වන සියළු දන්වීම් ප්‍රාදේශීය සභාවේ ලේකම් විසින් හෝ තත් කාර්යය සඳහා අතුරු ව්‍යවස්ථා මගින් බලය දෙනු ලැබූ ප්‍රාදේශීය සභාවේ නිලධරයන්ගෙන් යම් නිලධරයකු විසින් හෝ දීම හෝ භාර ගැනීම කරනු ලැබිය හැකි ය.

මහෙස්ත්‍රාත්වරයකු විසින් වැරදි විභාග කළ යුතු බව.

**212.** මේ පනත යටතේ වූ සැම වරදක්ම ප්‍රාදේශීය අධිකරණ බලය ඇති මහෙස්ත්‍රාත් වරයකු විසින් ලඝු ලෙස විභාග කරනු ලැබිය යුතු අතර, මේ පනතින් නියමිත යම් දණ්ඩනයක්, ඒ දණ්ඩනය වෙනත් යම් ලිඛිත නීතිය කින් මහෙස්ත්‍රාත්වරයාගේ අධිකරණ බලය මත තබන ලද සීමාවන් ඉක්මවන්නේ විය හැකි වුවද ඒ මහෙස්ත්‍රාත්වරයා විසින් පනවනු ලැබිය හැකි ය.

අපරාධ නඩු සීමා කිරීම.

**213.** යම් වරදක් සම්බන්ධයෙන් වූ පැමිණිල්ලක් ඒ වරද කිරීමෙන් පසු එළඹෙන මාස හයක් ඇතුළත කරනු ලැබූ හොත් මිස මහෙස්ත්‍රාත්වරයකු විසින් විභාග කරනු ලැබිය යුතු වැරදි ක්‍රියාවක් සඳහා මේ පනත යටතේ හෝ ඒ යටතේ සාදන ලද යම් අතුරු ව්‍යවස්ථාවක් යටතේ හෝ කිසිම තැනැත්තකු යම් දඩයකට හෝ දණ්ඩනයකට යටත් නොවිය යුතු ය.

දන්වීම් කරනු ලැබ එක් මාසයක් පසු වන තෙක් හෝ නඩු නිමිත්ත ඇති වීමෙන් පසු මාස හයක් ගත වූ පසු ප්‍රාදේශීය සභාවට විරුද්ධව කිසිම නඩුවක් පවරනු නොලැබිය යුතු බව.

**214.** (1) මේ පනතින් හෝ ඒ යටතේ සාදන ලද යම් අතුරු ව්‍යවස්ථාවකින් පවරන ලද බලතල යටතේ කරන ලද හෝ කිරීමට අදහස් කරනු ලබන ක්‍රියාවක් සඳහා යම් ප්‍රාදේශීය සභාවකට හෝ ප්‍රාදේශීය සභාවේ යම් සභිකයකුට හෝ යම් නිලධරයකුට හෝ ප්‍රාදේශීය සභාවේ විධානය යටතේ ක්‍රියා කරන යම් තැනැත්තකුට විරුද්ධ කිසිම නඩුවක් එහි නඩු නිමිත්ත සාධාරණ නිශ්චිත තාවයකින් යුතුව සඳහන් කරමින් ද අදහස් කරනු ලැබූ පැමිණිලිකරු ගේ නම සහ පදිංචි ස්ථානය ද ඒ නඩුව සම්බන්ධයෙන් ඔහුගේ නීතිඥ වරයකු හෝ අනුයෝජිතයකු වේ නම් ඔහුගේ නම සහ පදිංචි ස්ථානය ද ප්‍රකාශ කරමින්ද ප්‍රාදේශීය සභාවට හෝ විත්තිකරුට ලිඛිත දන්වීමක් දෙනු ලැබීමෙන් පසුව මාසයක් ඉකුත්වන තෙක් පවරනු නොලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තියේ සඳහන් සැම නඩුවක්ම නඩු නිමිත්ත උද්ගත වීමෙන් මාස හයක් ඇතුළත ආරම්භ කරනු ලැබිය යුතු අතර, ඉන් පසුව ආරම්භ නොකළ යුතු ය.

(3) (1) වන උපවගන්තිය යටතේ නඩු පැවරීම පිළිබඳ දැනුම් දීමක් කරන ලද්දේ යම් තැනැත්තකුට ද ඒ තැනැත්තා විසින් නඩු පැවරීමට පෙරාතුව පැමිණිලිකරු වෙත ප්‍රමාණවත් හානිපූරණයක් කළහොත් එවැනි යම් නඩුවක් පවරනු ලැබූ විට, ඒ පැමිණිලිකරු විසින් ක්‍රියාවක් අය කර ගනු නොලැබිය යුතු අතර, පැමිණිලිකරුගෙන් සිය ගාස්තු අයකර ගැනීමට විත්තිකරු හිමිකම ලැබිය යුතු ය.

(4) (3) වන උපවගන්තිය යටතේ කිසිම හානිපූරණයක් කරනු නොලැබුනහොත්, නඩුව හබ කිරීමට පෙර වූ යම් අවස්ථාවක දී නඩු විභාග වෙමින් ඇත්තේ යම් අධිකරණයක් ඉදිරියේ ද ඒ අධිකරණයේ අවසරය ඇතිව, සුදුසු යයි තමා සිතන යම් මුදලක් විත්තිකරු විසින් අධිකරණයට ගෙවීම නීත්‍යානුකූල වන අතර, ඉක්බිතිව, ඒ නඩු කටයුත්ත, අධිකරණයට මුදල් ගෙවීමට විත්තිකරුවන්ට අවසර දී ඇති වෙනත් නඩු මෙන් පවත්වා ගෙන යනු ලැබිය යුතු ය.

(5) (1) වන උපවගන්තියේ සඳහන් යම් නඩුවක් විභාගයට ගනු ලැබූ විට ඒ උපවගන්තිය යටතේ තමා විසින් කරන ලද දැනුම් දීමෙන් ප්‍රකාශිත නඩු නිමිත්ත නොවන යම් නඩු නිමිත්තක් ඔප්පු කිරීම සඳහා පැමිණිලිකරුට අවසර නොදෙනු ලැබිය යුතු ය ; තවද ඒ දැනුම් දීම ඔප්පු කරන්නේ නම් මිස, අධිකරණය විසින් විත්තිකරුට පක්ෂව නඩුව තීන්දු කරනු ලැබිය යුතු ය.

215. (1) යම් ප්‍රාදේශීය සභාවක් විසින් කරන ලද කිසිම වැඩක් හෝ දෙයක් සහ ඇතුළත් වූ කිසිම ගිවිසුමක් සහ යම් ප්‍රාදේශීය සභාවක විධානය යටතේ ඒ ප්‍රාදේශීය සභාවේ යම් සභිකයකු විසින් හෝ නිලධරයකු විසින්, නැතහොත් කවර වූ හෝ වෙන යම් තැනැත්තකු විසින් කරන ලද කිසිම වැඩක් හෝ දෙයක්, එසේ කරන ලද වැඩය හෝ දෙය නැතහොත් එසේ ඇතුළත් වූ ගිවිසුම කරන ලද්දේ හෝ ඇතුළත් වූයේ මේ පනතේ හෝ ප්‍රාදේශීය සභාවක බලතල හෝ කාර්යවලට අදාළ වූ වෙන යම් ප්‍රඥප්තියක හෝ ඒ යටතේ සාදන ලද යම් අතුරු ව්‍යවස්ථාවක හෝ රීතියක කාර්ය සඳහා සද්භාවයෙන් නම්, ප්‍රාදේශීය සභාවක යම් සභිකයකු හෝ යම් නිලධරයකු හෝ වෙනත් තැනැත්තකු ස්වකීය පෞද්ගලික තත්ත්වයෙන් යම් නඩුවකට, බැඳීමකට හිමිකම් පෑමකට හෝ කවර වූ හෝ ඉල්ලීමකට යටත් නොවිය යුතු ය ; තවද එවැනි යම් ප්‍රාදේශීය සභාවක් විසින් හෝ ඉහත කී පරිදි ක්‍රියා කරන යම් සභිකයකු, නිලධරයකු හෝ වෙනත් තැනැත්තකු විසින් හෝ කරන ලද වියදම් කිසිවක් දැරීම හා ආපසු ගෙවීම ප්‍රාදේශීය සභා අරමුදලින් කරනු ලැබිය යුතු ය.

ප්‍රාදේශීය සභා සහ එහි නිලධරයන් ආරක්ෂා කිරීම.

(2) වෙනත් යම් බලතලවලට යටත්ව සහ හානියක් නොමැතිව, යම් නඩුවක, නඩු පැවරීමක හෝ වෙනත් නඩු කටයුත්තක විත්තිකරු ප්‍රාදේශීය සභාවක සභිකයකු හෝ එහි නිලධරයකු, අනුයෝජිතයකු හෝ සේවකයකු වන යම් අවස්ථාවක ප්‍රාදේශීය සභාව විසින් සුදුසු යයි සිතන්නේ නම්, නඩුව, නඩු පැවරීම හෝ වෙනත් නඩු කටයුත්ත විභාග කර තීරණය කරනු ලබන අධිකරණය විසින් අන්‍යාකාරයෙන් විධාන කරන තාක් දුරට හැර, ගාස්තු අය කිරීම්, වියදම්, අලාභ දඩ හෝ අන්‍යාකාරයෙන් නඩුවේ දී, නඩු පැවරීමේ දී හෝ නඩුකටයුත්තේ දී හෝ එහි ප්‍රතිඵලයක් වශයෙන් හෝ විත්තිකරු විසින් ගෙවනු ලැබිය යුතු මුදල් සියල්ලම හෝ ඉන් යම් කොටසක් හෝ ප්‍රාදේශීය සභා අරමුදලින් ගෙවනු ලැබිය හැකි ය :

එසේ වුවද, යම් ප්‍රාදේශීය සභාවක ගිණුම් විගණනයේ දී අවසර දෙනු නොලබන්නා වූ සහ යම් සභිකයකු විසින් බලය දෙනු ලැබූ හෝ බලය දීමේ දී හවුල් වූ යම් මුදලක් පිළිබඳ අධිභාර වගකීමෙන් ඒ ප්‍රාදේශීය සභාවේ ඒ සාමාජිකයා මේ වගන්තියේ කිසිවකින් නිදහස් නොවිය යුතු ය.

## නිලධරයන්ගේ බලතල හා වගකීම්

216. යම් ප්‍රාදේශීය සභාවක් විසින්, යෝජනා සම්මතයක් මගින්, කලින් කල අවශ්‍ය විය හැකි වන පරිදි, සභාපතිගේ පොදු පාලනයට යටත්ව මේ පනතින් හෝ වෙන යම් ප්‍රඥප්තියකින් හෝ ඒ යටතේ සාදන ලද යම් අතුරු ව්‍යවස්ථාවක් හෝ රීතියක් මගින් කිරීමට, දීමට හෝ ලැබීමට ප්‍රාදේශීය සභාවකට බලය පවරන ලද සියළු ක්‍රියා ලැබීම් හා අනුමත කිරීම් දීම හෝ ලැබීම සඳහා ප්‍රාදේශීය සභාවේ යම් නිලධරයකුට පොදු අධිකාරයක් දෙනු ලැබිය හැකි අතර ඒ නිලධරයා විසින් කරන ලද හෝ දෙන ලද හෝ ලබන ලද සියලු ක්‍රියා, ලැබීම් හා අනුමති, ඒ යෝජනා සම්මතය බලපවත්නා තාක් දුරට, ඒ ක්‍රියා ලැබීම් සහ අනුමති ප්‍රාදේශීය සභාව විසින් කරන ලද්දක් හෝ දෙන ලද්දක් මෙන් බැඳීම් ඇති කරන්නේ ය. තවද වලංගු වන්නේ ය.

ප්‍රාදේශීය සභාවේ නිලධරයන්ට පොදු අධිකාර දීමේ ප්‍රාදේශීය සභාව සතු බලතල.

ප්‍රාදේශීය සභාවේ නිලධරයන්ට බාධා කිරීම සම්බන්ධ යෙන් දඬුවම.

**217.** මේ පනතේ හෝ වෙන යම් ප්‍රඥප්තියක හෝ ඒ යටතේ සාදන ලද යම් අතුරු ව්‍යවස්ථාවක, රීතියක හෝ නියෝගයක යම් විධිවිධානයක් යටතේ හෝ යම් විධිවිධානයක් ප්‍රකාර තමා වෙත සතු වූ හෝ පැවරුණු යම් කාර්යයක් කිරීමේදී හෝ යම් අධිකාරයක් ක්‍රියාවේ යෙදවීමේ දී ප්‍රාදේශීය සභාවක යම් නිලධරයකුට ඕනෑකමින් බාධා පමුණුවන කවරකු හෝ වරදකට වරදකරු වන අතර මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියේ පැවැත්වෙන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට, රුපියල් පන්සියයකට නොවැඩි දඩයකට හෝ මාස හයකට නොවැඩි දෙයාකාරයකින් එක් ආකාරයක වූ බන්ධනාගාරගත කිරීමකට හෝ ඔහු යටත් විය යුතු ය.

ප්‍රාදේශීය සභා විසින් බලය අනිසි ලෙස යෙදවීම සඳහා දඬුවම.

**218.** මේ පනතේ හෝ යටතේ සාදන ලද යම් අතුරු ව්‍යවස්ථාවක හෝ රීතියක බලය යටතේ යම් ක්‍රියාවක් කිරීමේ ව්‍යාජයෙන් යම් තැනැත්තකුට ප්‍රචණ්ඩ ක්‍රියාවක් කරන හෝ යම් පීඩාවක් ගෙන දෙන හෝ කරදර පමුණුවන ප්‍රාදේශීය සභාවක යම් නිලධරයකු වරදකට වරදකරු වන අතර, ඒ සම්බන්ධයෙන් වරදකරු කරනු ලැබූ විට, මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියේ පැවැත්වෙන ලඝු නඩු විභාගයකින් පසු රුපියල් පන්සියයකට නොවැඩි දඩයකට ඔහු යටත් විය යුතු ය.

ප්‍රාදේශීය සභාවල නිලධරයන්ට සහ සේවකයින්ට ගිවිසුම් කෙරෙහි සම්බන්ධතාවක් නො තිබිය යුතු බව.

**219.** (1) යම් ප්‍රාදේශීය සභාවක කිසිම සභිකයකුට හෝ සේවකයකුට ප්‍රාදේශීය සභාව සමඟ ඇති කරන ලද හෝ ක්‍රියාවේ යොදවන ලද යම් ගිවිසුමක හෝ වැඩයක සම්බන්ධතාවක් හෝ මූල්‍ය සම්බන්ධතාවක් කෙළින්ම හෝ අන්‍යාකාරයකින් නොතිබිය යුතු ය.

(2) යම් ප්‍රාදේශීය සභාවක යම් සභිකයකුට හෝ සේවකයකුට එවැනි යම් ගිවිසුමක් හෝ වැඩක් හා සම්බන්ධතාවක් හෝ මූල්‍ය සම්බන්ධතාවක් තිබේ නම්, ඔහු රුපියල් පන්දහසකට නොවැඩි දඩයකින් දඬුවම් කරනු ලැබිය හැකි වරදකට වරදකරු විය යුතු අතර, අවස්ථාවෝචිත පරිදි, ඔහු ප්‍රාදේශීය සභාව යටතේ සභිකයකු වශයෙන් සිටීමෙහිලා හෝ යම් ධුරයක් දැරීමෙහිලා හෝ සේවයේ නියුක්ත කර වීමෙහිලා නුසුදුස්සකු කරනු ලැබිය යුතු ය :

එසේ වුවද, යම් සංස්ථාගත සමාගමක කොටස්කරුවකු වන කිසිම තැනැත්තකු ඒ සමාගම සහ ප්‍රාදේශීය සභාව අතර යම් ගිවිසුමක් තිබීමේ හෝ ඒ සමාගම විසින් ප්‍රාදේශීය සභාව සඳහා යම් වැඩක් ක්‍රියාවේ යෙදවීමේ එකම හේතුව නිසාම පමණක් ඒ දඩයට යටත් නොවිය යුතු ය.

ප්‍රාදේශීය සභාවල නිලධරයන් හා සේවකයින් රජයේ සේවකයින් විය යුතු බව.

**220.** ප්‍රාදේශීය සභා අරමුදලින් ගෙවීම් ලබන සෑම නිලධරයකු සහ සේවකයකුම සහ ප්‍රාදේශීය සභාවක බලය මගින් හෝ ඒ යටතේ ප්‍රාදේශීය සභාවක යම් ඉඩමක් හෝ ගොඩනැගිල්ලක් වෙනුවෙන් යම් බද්දක් හෝ යම් ගෙවීමක් එකතු කිරීම භාර කරන ලද සෑම කොන්ත්‍රාත්කරුවකු හෝ අනුයෝජිතයකුම, සහ ඒ බද්ද හෝ ගෙවීම එකතු කිරීම සඳහා ඒ කොන්ත්‍රාත්කරු හෝ අනුයෝජිතයා විසින් සේවයේ නියුක්ත කරවන ලද සෑම සේවකයකු හෝ වෙනත් තැනැත්තකුම, දණ්ඩ නීති සංග්‍රහයේ භාවිත ඒ යෙදුමේ අර්ථානුකූලව රජයේ සේවකයකු වශයෙන් සලකනු ලැබිය යුතු ය.

## අන්තර් කාලීන වැඩ පිළිවෙලවල් සහ විවිධ විධිවිධාන ඉවත් කිරීම

සුළු නගර සභාවක් හෝ ගම් සභාවක් හෝ පළාත් පාලන ආයතනයක් හෝ පිළිබඳව කවර හෝ ලිඛිත නීතියක ඇති සඳහනක බලපෑම.

221. මේ පනතේ 1 වන වගන්තිය යටතේ තීරණය කරනු ලබන දිනයේ දී ක්‍රියාත්මකව පවත්නා කවර හෝ ලිඛිත නීතියක —

(අ) සුළු නගර සභාවක් හෝ ගම් සභාවක් පිළිබඳව ඇති සඳහනක් ප්‍රාදේශීය සභාවක් පිළිබඳව කරන ලද සඳහනක් ලෙස සැලකිය යුතු ය ; තව ද

(ආ) පළාත් පාලන ආයතනයක් පිළිබඳව ඇති සඳහනකට, පද සම්බන්ධය අනුව අන්‍යාර්ථයක් අවශ්‍ය වේ නම් මිස, ප්‍රාදේශීය සභාවක් ද ඇතුළත් වන ලෙය සැලකිය යුතු ය.

ඉවත්කිරීම.

222. මෙහි හය වන උපලේඛනයේ සඳහන් කොට ඇති ප්‍රඥප්ති, යම් ප්‍රාදේශීය සභාවක් පිහිටුවනු ලැබූ දින සිට ඒ ප්‍රාදේශීය සභාවේ කාර්ය සඳහා ඉවත් කරනු ලැබිය යුතු ය:

එසේ වුව ද යම් ප්‍රාදේශීය සභාවක බල සීමා තුළ පිහිටි ප්‍රධාන මංමාවත් හෝ ඒවායේ කොටස් කිසිවක් සම්බන්ධයෙන් මේ පනතේ අන්‍යාකාරයකින් ප්‍රකාශිතවම විධිවිධාන සලස්වා නොමැති වූ ද අමාත්‍යවරයා සතු වූ ද අයිතිවාසිකම්වලට, බලතලවලට සහ කාර්යවලට මේ වගන්තියේ ඇතුළත් කිසිවකින් බලපෑමක් සිදු වේ යයි නොසලකනු ලැබිය යුතු අතර කිසිදු අන්දමකින් ඒ අයිතිවාසිකම්වල, බලතලවල සහ කාර්යවල හානිවීමක් එමගින් සිදු වන්නේ යයි නොසැලකිය යුතු ය.

විධිවිධාන සලස්වා නොමැති ප්‍රශ්න යථාවත් කිරීම.

223. ශ්‍රී ලංකාව මුළුල්ලෙහිම හෝ යම් නිශ්චිත ස්ථානයක් හෝ ප්‍රදේශයක් තුළ මේ පනත ක්‍රියාත්මක කිරීමෙහි ලා අවශ්‍ය මූලික කටයුතු හා සම්බන්ධව, සාමාන්‍ය වශයෙන් හෝ යම් විශේෂ කරුණක් හෝ කරුණුවලට අදාළව හෝ අනපේක්ෂිත හෝ විශේෂ අවස්ථාවක් උද්ගත වූ විට විධිවිධාන සැලැස්වීමේ හෝ මේ පනතින් කිසිම විධිවිධානයක් හෝ කිසිම ඵලදායී විධිවිධානයක් කර නොමැති යම් ප්‍රශ්නයක් හෝ කරුණක් තීරණය කිරීමේ හෝ යථාවත් කිරීමේ අරමුණින්, අමාත්‍යවරයා විසින් අවශ්‍ය යයි සලකනු ලබන සියලු විධාන ගැසට් පත්‍රයේ පළකරනු ලබන නියමයක් මගින් අමාත්‍යවරයා විසින් නිකුත් කරනු ලැබිය හැකි ය.

අන්තර් කාලීන විධිවිධාන.

224. යම් ප්‍රාදේශීය සභාවක බල සීමා තුළ පිහිටි යම් මැතිවරණ කොට්ඨාසයක් සඳහා තෝරා පත් කර ගනු ලැබූ හෝ තෝරා පත් කර ගන්නා ලදැයි සලකනු ලබන පළමුවන පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරයකු විසින් ඒ ප්‍රාදේශීය සභාවේ රැස්වීම්වලට පැමිණ ඒවා අමතනු ලැබිය හැකි නමුත් ඒ සභාවේ තීරණයක් සඳහා ඉදිරිපත් කරනු ලබන යම් කරුණක් සම්බන්ධයෙන් ඡන්දය දීමේ හිමිකම ඔහු සතු නොවේ.

ඉවත් කිරීම් සහ අන්තර්කාලීන ප්‍රතිපාදන.

225. (1) සුළුනගර සභා ආඥාපනත සහ ගම්කාර්ය සභා ආඥාපනත මෙයින් ඉවත් කරනු ලැබේ.

(2) නගරයක් සඳහා සංස්ථාපිත සුළුනගර සභාවක් විසින් හෝ ගම් ප්‍රදේශයක් සඳහා සංස්ථාපිත ගම් සභාවක් විසින් හෝ සාදන ලදුව, සංවර්ධන සභාවක් විසින් සාදන ලද අතුරු ව්‍යවස්ථා ලෙස 1980 අංක 35 දරන සංවර්ධන සභා පනතේ 18 වන වගන්තියේ (2) වන උපවගන්තියේ (ඉ) ඡේදය යටතේ, සලකනු ලබන සියලු අතුරු ව්‍යවස්ථා, ඒ නගරය හෝ ගම් ප්‍රදේශය පිහිටා ඇත්තේ යම් ප්‍රාදේශීය සභා ප්‍රදේශයක් ඇතුළත ද ඒ ප්‍රදේශය සඳහා සංස්ථාපිත ප්‍රාදේශීය සභාව විසින් සාදන ලද අතුරු ව්‍යවස්ථා ලෙස, 1 වන වගන්තිය යටතේ තීරණය කරන ලද දිනයේ සිට බලපවත්වන පරිදි, සලකනු ලැබිය යුතු ය.

අර්ථ නිරූපණය.

226. පද සම්බන්ධ අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස, "වාර්ෂික වටිනාකම" යන්නෙන්, කුලීනිවැසියා සියලු සහ බදු ගෙවීමට භාරගනී නම් සහ ගෙවල් කුලී සඳහා වූ සත්ත්වයකින් නිවස, ගොඩනැගිල්ල, ඉඩ ගෙය පවත්වාගෙන යාමට අවශ්‍ය රක්ෂණ, අළ නඩත්තු හා පවත්වාගෙන යාමේ ගාස්තු කිසිවක් ... ගෙවීමට ඉඩම් හිමියා භාරගනී නම්, එවැනි යම් නිවසක්, ගොඩනැගිල්ලක්, ඉඩමක් හෝ පේළි ගෙයක් සඳහා එක් වර්ෂයක් වෙනත් වර්ෂයක් සමග සැලකිල්ලට ගනිමින් කුලී නිවැසියකු ගෙන් යුක්ති සහගතව බලාපොරොත්තු විය හැකි වාර්ෂික ගෙවල් කුලිය අදහස් වේ;

එසේ වුව ද, වාර්ෂික වටිනාකම ගණන් බැලීමේ දී සහ තක්සේරු කිරීමේ දී —

(අ) රක්ෂණ, අළුත්වැඩියා කිරීම්, නඩත්තු සහ පවත්වාගෙන යාමේ ශක්‍ය වාර්ෂික සාමාන්‍ය වියදම් අඩුකරනු ලැබිය යුතු ය ;

(ආ) කුලියට නොදුන් කවර වූ හෝ කාලසීමාවක් සඳහා කිසිම ඉඩදීමක් හෝ අඩුකිරීමක් නොකළ යුතු ය ;

"සහකාර කොමසාරිස්" යන්න යම් ප්‍රාදේශීය සභා ප්‍රදේශයකට අදාළව යෙදී ඇති විට, ඒ ප්‍රදේශය සඳහා පත් කරනු ලැබූ පළාත් පාලන සහකාර කොමසාරිස් ඉන් අදහස් වේ ;

"පළාත් පාලන කොමසාරිස්" යන්නට, යම් නියෝජ්‍ය පළාත් පාලන කොමසාරිස්වරයෙක් ද ඇතුළත් වේ ;

"සමූපකාර සමිතිය" යන්නෙන්, සමූපකාර සමිතිවලට අදාළ ... කත් කාලයෙහි බලපවත්නා යම් නීතියක් යටතේ ලියා පදිං ... කරන ලද යම් සමිතියක් අදහස් වේ ;

"දිස්ත්‍රික්කය" යන්නෙන්, පරිපාලන දිස්ත්‍රික්කයක් අදහස් වේ

"පළමුවන පාර්ලිමේන්තුව" යන්නෙන්, ආණ්ඩු ක්‍රම ව්‍යවස් ... වේ 161 වන ව්‍යවස්ථාවේ සඳහන් පළමුවන පාර්ලිමේන්... අදහස් වේ ;

"පිස්කල්" යන්නට පිස්කල්වරයකුගේ පළාත ඇළ ... නියෝජ්‍ය පිස්කල්වරයෙක්ද ඇතුළත් වේ;

"දිසාපති" යන්නට සහකාර දිසාපති වරයෙක් ද ඇතුළත් වේ ;

"ග්‍රාම සේවා නිලධාරි" යන්නට පොලිස් විදානේ කෙනෙක් ... ඇතුළත් වේ ;

"පළාත් පාලන ආයතනය" යන්නෙන්, මහ නගර සභාවක් හෝ නගර සභාවක් අදහස් වන අතර, එවැනි සභාවක් විසින් ක්‍රියාත්මක ... යොදවනු ලබන බලතල භාවිත කරනු ලබන කාර්ය සහ කරනු ... ලබන කටයුතුවලට අනුරූප වන හෝ සමාන වන බලතල, කාර්ය සහ කටයුතු ක්‍රියාවේ යෙදවීම, ඉටු කිරීම සහ කිරීම ... සඳහා යම් ලිඛිත නීතියක් මගින් හෝ ඒ යටතේ ඇති කරන ... ලද්ද වූ සහ පිහිටුවන ලද්ද වූ යම් අධිකාරියක් ද ඊට ඇතුළත් වේ ...

ාමසාරිස්වරු " යන්නෙන්
ා සහ සංවර්ධන ආඥාපනතේ
ත් කරන ලද ප්‍රාදේශීය ණය සහ
අදහස් වේ ;

සේවය " යන්නෙන්, ජාතික රාජ්‍ය සභාවේ 1974 අංක 16 දරන පළාත්පාලන සේවා පනත යටතේ සංස්ථාපනය කරන ලද පළාත් පාලන සේවය අදහස් වේ.

'ගංගාව', 'පාර', 'මංමාවත්' සහ 'ඇල' යන වචනවලට (193 වන අධිකාරය වන) මංමාවත් ආඥාපනතේ පිළිවෙළින් ඒවාට දී ඇති අර්ථයම ඇත්තේ ය.

පළමුවන උපලේඛනය (129 වන වගන්තිය)

වල පහත දක්වෙන විධිවිධාන කඩකිරීම සම්බන්ධයෙන් යම් ප්‍රාදේශීය හෝ ප්‍රාදේශීය සභාවක බල ප්‍රදේශය විෂයෙහි අධිකරණ බලය ඇති මහෙස් ණයක් විසින් හෝ අයකරනු ලබන සියලු දඩ මුදල්, දණ්ඩන සහ වෙනත් මුදල් ;

නත යටතේ සාදන ලද හෝ යම් ලිඛිත නීතියක් ප්‍රකාර මේ පනත යටතේ දා ලදයි සැලකෙන අතුරු ව්‍යවස්ථා.

ාඥාපනත.

ීය සභාවක බල සීමා තුළ දක්වෙන ප්‍රඥප්ති යටතේ අයකර ගන්නා ලද ලු දඩ සහ දණ්ඩන :—

) සුරාබදු ආඥාපනත ;

) වීථිවල කසල එකතු කිරීම (විධිමත් කිරීමේ) ආඥාපනත ;

) විෂ වර්ග අබිං සහ අන්තරාදායක ඖෂධ ආඥාපනත ;

) 1980 අංක 26 දරන ආහාර ආඥාපනත ;

) බඩු උකස්ගන්නන් පිළිබඳ ආඥාපනත ;

) ප්‍රසිද්ධ රඟදැක්වීම පිළිබඳ ආඥාපනත ;

) සත්ව හිංසා වැළැක්වීමේ ආඥාපනත ;

) පළාත් පාලන ආයතන මැතිවරණ ආඥාපනත ;

දෙවන උපලේඛනය (129 වන වගන්තිය)

බෝට්ටු ආඥාපනත ;

ගෝසාකක ආඥාපනත

) ආඥාපනත ;

) ශ්‍රී ලාංකීයකරණ ප්‍රාදේශීය සභාව දක්වා පුළුල් කරන ලද වෙනත් යම් ප්‍රඥප්තියක් යටතේ ප්‍රාදේශීය සභා ප්‍රදේශයේ වැසියන් විසින් ගෙවනු ලැබූ හෝ ඔවුන්ගෙන් අය කරනු ලැබූ සියලු මුද්දර ගාස්තු සහ ගාස්තු.

(අ) වරාය කොමසාරිස් නිලධාරී ආඥාපනත ;

(ආ) ඛනිජ තෙල් ආඥාපනත ;

(ඇ) පුපුරන ද්‍රව්‍ය ආඥාපනත ;

(ඈ) තුවක්කු ආඥාපනත ;

(ඉ) විෂ වර්ග අබිං සහ අන්තරායක ඖෂධ ආඥාපනත ;

(ඊ) ප්‍රසිද්ධ රඟදැක්වීම් ආඥාපනත

ප්‍රාදේශීය සභා ප්‍රදේශයේ වැසියන් විසින් බලපත්‍ර සම්බන්ධයෙන් ගෙවනු ලැබූ මුද්දර ගාස්තු සහ ගාස්තු.

3. (1) (අ) නීති වෘත්තිකයන් පිළිබඳ ආඥාපනතේ 2 වන වගන්තිය යටතේ ඇතුළත් කර ගැනීමේ සහතික වෙනුවෙන් හෝ ඒ ආඥාපනතේ 4 වන වගන්ති යටතේ කරන ලද ප්‍රකාශය මත නීතිඥයන් වශයෙන් ;

(ආ) නොතාරිස් ආඥාපනතේ 3 වන, 27 වන සහ 28 වන වගන්ති යටතේ නිකුත් කරන ලද බලපත්‍ර, සහතික සහ ප්‍රකාශ මත නොතාරිස්වරුන් වශයෙන් ;

(ඇ) නොතාරිස්වරයකු වශයෙන් සුදුසුකම් ලැබීම සඳහා යම් කැනැත්තකු ප්‍රථමයෙන් බැඳෙන ආධුනිකත්ව ගිවිසුම් සම්බන්ධයෙන් හෝ එම ගිවිසුම් මත ;

(ඈ) බදු උකස්ගන්නන්ගේ ආඥාපනතේ 3 වන වගන්තිය යටතේ නිකුත් කරන ලද බලපත්‍ර මත බදු උකස්ගන්නන් වශයෙන්

ප්‍රාදේශීය සභා ප්‍රදේශයේ වැසියන් විසින් ගෙවනු ලබන සියලු මුද්දර ගාස්තු.

(2) ප්‍රාදේශීය සභා ප්‍රදේශය තුළ පදිංචිකරුවකු වන නීතිඥවරයකුට නීතිඥ වෘත්තිකයන්ගේ ආඥාපනතේ 3 වන වගන්තිය යටතේ නිකුත් කරනු ලැබූ වාර්ෂික සහතිකයක් මත අය කරනු ලැබූ මුද්දර ගාස්තුවෙන් යම් කොටසක් 1960 සැප්තැම්බර් මස 15 වන දින එවැනි සහතිකයක් සඳහා ගෙවිය යුතු මුද්දර ගාස්තුවට සමාන වන්නේද එසේ සමාන වන කොටස.

4. ප්‍රාදේශීය සභා ප්‍රදේශයේ පරිපාලන සීමා තුළ පිහිටි යම් ඉඩමකට අදාළ විකුණුම්කර, උකස්කර, බැඳුම්කර, තෑගි ඔප්පු සහ බදුකර සම්බන්ධයෙන් 1982 අංක 43 දරන මුද්දර ගාස්තු පනත යටතේ ගෙවනු ලබන මුළු මුද්දර ගාස්තු.

තුන්වන උපලේඛනය (141 වන වගන්තිය)

තක්සේරු දැන්වීම පිළිබඳ ආකෘතිය

ප්‍රාදේශීය සභාව

කාර්යාලය,

19..............................

අංකය : ..........................................

.................................................................. වෙත

මෙහි පහත දැක්වෙන දේපළ සම්බන්ධයෙන් මෙහි පහත දක්වා ඇති මුදල් ප්‍රාදේශීය සභා පනත ප්‍රකාර බදුවලින් අය කර ගැනීම පිණිස තක්සේරු කිරීමට ප්‍රාදේශීය සභාව නියම කර තිබෙන බව දැන ගත යුතුය :—

| තක්සේරු කළ දේපළ සහායයනය කළ වර්ග ප්‍රමාණය | තක්සේරු කළ පරිදි වාර්ෂික වටිනාකම සහායයනය කළ වර්ග ප්‍රමාණය |
| --- | --- |

භාර දුන් දිනය :—

19 මස වන දින.

මෙම තක්සේරු කිරීමෙන් හෝ සහායයනය කළ වර්ග ප්‍රමාණයෙන් ඔබ අතෘප්තියට පත් වී ඇත්නම්, මෙම දැන්වීම භාරදුන් දින සිට දින තිහක් ඇතුළත ඔබේ විරෝධතාව ප්‍රාදේශීය සභා කාර්යාලයේ සටහන් කරනු ලැබිය යුතු ය. ඒ විරෝධතාව වීමට හේතු ද ඇතුළත් වූ ලිඛිත ප්‍රකාශයක් මගින් ඉදිරිපත් කළ යුතු ය.

සභාපති,
ප්‍රාදේශීය සභාව.

(ඵෟ) දුප්පත් පංතිය සඳහා නිවාස පහසුකම් සැපයීම ;

(ඵ) පිහිටුවීමට, පවත්වාගෙන යෑමට හෝ සැලසීමට මේ පනතේ වෙනත් යම් විධිවිධානයකින් හෝ වෙනත් යම් ලිඛිත නීතියක් යටතේ බලය ලැබී ඇති වෙනත් යම් ආකාරයක පොදු සේවාවක්.

**109.** පිහිටුවීමට හෝ පවත්වා ගෙන යාමට 108 වන වගන්තියෙන් හෝ ඒ යටතේ ප්‍රාදේශීය සභාවකට බලය දෙනු ලැබ ඇති යම් පොදු උපයෝගිතා සේවාවක් පිහිටුවීමේ හෝ පවත්වාගෙන යාමේ කාර්යය සඳහා ප්‍රාදේශීය සභාව විසින්— පොදු උපයෝගිතා සේවා සඳහා වූ වියදම් ගෙවීමේ ආකාරය

(අ) ප්‍රාදේශීය සභාවේ ආදායමෙන් වැයවන යම් වියදමක් සඳහා මුදල් සැපයීම ; හෝ

(ආ) අතුරු ව්‍යවස්ථා මගින් නියම කළ හැකි සීමාවන්ට සහ නිදහස් කිරීම් වලට යටත්ව, එකී සේවාවෙන් ප්‍රයෝජනය ලබන ප්‍රදේශ සඳහා විශේෂ වරිපනම් බදු ප්‍රමාණයක් අය කිරීම ; හෝ

(ඇ) එම සේවය සැලැස්වීම සඳහා ස්ථානවල අයිතිකරුවන් හෝ පදිංචිකරුවන් සමග, ගිවිසුමකට එළඹීම සහ එකී සේවාව සම්බන්ධයෙන් අතුරු ව්‍යවස්ථා මගින් නියම කළ හැකි වරිපනම් බදු ප්‍රමාණ අය කිරීම හෝ බලාත්මක කිරීම ; හෝ

(ඈ) එකී සේවයෙන් ප්‍රයෝජනය ලබන තැනැත්තන්ගෙන් සාධාරණ යයි සැලකිය හැකි අන්දමේ ගාස්තු අය කිරීම ; හෝ

(ඉ) ප්‍රාදේශීය සභාව සමග ඇතුල් වූ යම් ගිවිසුමක් අනුව හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද යම් බලපත්‍රයක් යටතේ යම් අනුග්‍රාහකයකු හෝ අනුග්‍රාහක මණ්ඩලයක් මගින් එබඳු යම් පොදු සේවාවක් පිහිටුවන ලද සහ පවත්වාගෙන යන අවස්ථාවක දී එම සේවාවෙන් ප්‍රයෝජනය ලබන තැනැත්තන්ගෙන් ප්‍රාදේශීය සභාව විසින් අනුමත කරනු ලැබිය හැකි ගාස්තු අය කිරීම

කළ හැකි ය.